87 වන කාණ්ඩය
13 වන කලාපය

සිකුරාදා
1969 සැප්තැම්බර් 12

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 2909]

පානදුර මන්ත්‍රී (ලෙස්ලි ගුණවර්ධන මයා.) පෞද්ගලිකව කරුණු පැහැදිලි කිරීම [තී. 2927]

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න [තී. 2929] :

I "දිනපති" පත්‍රයේ 69.9.11 වන දින පළවූ ප්‍රවෘත්තිය.

II මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු පිළිබඳව 69.9.11 දින "ඩේලි නිව්ස්" පත්‍රයේ පළවූ වාර්තාව.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත [තී. 2931] :

Ceylon Pentecostal Mission (Incorporation) Bill—
[එම්. රස්කින් ප්‍රනාන්දු මයා.]

පළමුවන වර කියවන ලදී.

විසර්ජන පනත් කෙටුම්පත (1969-70) [විසිදෙවන වෙන් කළ දිනය] [තී. 2932] :

134 වන ශීර්ෂය කාරක සභාව විසින් සලකා බලන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 87
இல. 13

வெள்ளிக்கிழமை
12 செப்ரெம்பர் 1969

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2909]

பாணந்துறை அங்கத்தவர் (திரு. லெஸ்லி குணவர்தன) அவர்களின் சொந்த விளக்கம் [ப. 2927]

சிறப்புரிமை விடயங்கள் :

11.9.69 தினபதியின் செய்தி [ப. 2929]

11.9.69 " சிலோன் டெயிலி நியூஸ் " இன் சபை நிகழ்ச்சி அறிக்கை [ப. 2930]

தனி அங்கத்தவர் மசோதா [ப. 2931] :

Ceylon Pentecostal Mission (Incorporation) Bill—[திரு. எம். றஸ்கின் பெர்ணண்டோ]
முதன்முறை மதிப்பிடப்பட்டது

ஒதுக்கீட்டு மசோதா (1969–70) [ஒதுக்கப்பட்ட இருபத்திரண்டாம் நாள்] [ப. 2932] :
குழுவில் ஆராயப்பட்டது [தலைப்பு 134]

---

Volume 87
No. 13

Friday
12th September 1969

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 2909]

PERSONAL EXPLANATION BY MEMBER FOR PANADURA (MR. LESLIE GOONEWARDENE) [Col. 2927]

QUESTIONS OF PRIVILEGE :

News item in the " Dinapathi " of 11.9.69 [Col. 2929]

Report of Proceedings of the House in the " Ceylon Daily News " of 11.9.69 [Col. 2930]

PRIVATE MEMBER'S BILL [Col. 2931] :

Ceylon Pentecostal Mission (Incorporation) Bill—[Mr. M. Ruskin Fernando]
Read the First time

APPROPRIATION BILL (1969-70) [Twenty-Second Allotted Day] [Col. 2932] :
Considered in Committee [Head 134]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

### 1969 සැප්තැම්බර් 12 වන සිකුරාදා

வெள்ளிக்கிழமை, 12 செப்ரெம்பர் 1969

*Friday, 12th September 1969*

---

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை மு. ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ என். சீ. ஷேலி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 10* A.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

### வினாக்களுக்கு வாய்மூல விடைகள்

### ORAL ANSWERS TO QUESTIONS

### මැල්ලවගෙදර උප තැපැල් කාර්යාලය

மல்லவகெதற உபதபால் நிலையம்

MELLAWAGEDERA SUB-POST OFFICE

1. **ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)

(*திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய*)

(Mr. Lakshman Jayakody—Divulapitiya)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) මැල්ලවගෙදර උප තැපැල් කාර්යාලය දැන් ලියුම් බෙදාහැරීමේ පහසුකම් ඇති කාර්යාලයක් බැවින් එම උප තැපැල් කාර්යාලයට ටෙලිපෝන් පහසුකම් ලබාදීමට එතුමා වහාම පියවර ගන්නවාද ? (ආ) නොඑසේ නම් ඒ මන්ද ?

*அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா : (அ) இப்பொழுது தபால் ஒப்படைக்கும் வசதிகொண்டுள்ள ஒரு உப-தபால் நிலையமான மல்லவகெதற உப-தபால் நிலையத்திற்குத் தொலைபேசி வசதிகளை வழங்க அவர் உடனடி நடவடிக்கை எடுப்பாரா ? (ஆ) இல்லையெனில் ஏன் ?*

asked the Minister of Public Works, Posts and Telecommunications : (*a*) Will he take immediate steps to give telephone facilities to Mellawagedera Sub-Post Office which is now a sub-post office having delivery facilities ? (*b*) If not, why ?

**විජයපාල මෙන්ඩිස් මයා. (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(*திரு. விஜயபால மெண்டிஸ்—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி*)

(Mr. Wijayapala Mendis—Parliamentary Secretary to the Minister of Public Works, Posts and Telecommunications)

(අ) වහාම කළ නොහැක. (ආ) ලබාගැනීමට සලසන සීමිත මුදලින් එක් වර්ෂයක දී ටෙලිපෝන් පහසුකම් සැපයිය හැක්කේ උප තැපැල් කාර්යාල සුළු සංඛ්‍යාවකට පමණකි. මෙම උප තැපැල් කාර්යාලයට විදුලි පණිවුඩ හා ටෙලිපෝන් පහසුකම් සැලසීම ගැන මේ හා සමාන අනිකුත් ඉල්ලීම් සමග අවශ්‍ය අරමුදල් ලද විටෙක සලකා බලනු ලැබේ.

**ජයකොඩි මයා.**

(*திரு. ஜயக்கொடி*)

(Mr. Jayakody)

පසුගිය පස් අවුරුදු කාලය තුළ මුළු දිවුලපිටිය මැතිවරණ කොට්ඨාශයටම ටෙලිපෝන් පහසුකම් ලැබුණේ එකම එක ස්ථානයකට පමණක් බව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා දන්නවාද ? ඒකත් ලැබුණේ කලුඅග්ගලට පමණයි. මා හිතන්නේ තමුන්නාන්සේගේ පිහිටෙන් තමයි—තමුන්නාන්සේට එහේ වතු එහෙම තිබෙනවා—ඒකත් ලැබුණේ. තමුන්නාන්සේ ඒ ප්‍රදේශය ගැන ටිකක් දන්නවා. එත කොට, ඒකත් ලැබුණේ එහෙමයි. ඒ නිසා ගරු ඇමතිතුමා ටිකක් කල්පනා කර, මේ අවුරුදු පහ ඇතුළත මා සඳහන් කරන මේ ස්ථානයටවත් ටෙලිපෝන් පහසුකම් ලබාදීම සම්බන්ධව කටයුතු කරනවාද ?

**විජයපාල මෙන්ඩිස් මයා.**

(*திரு. விஜயபால மெண்டிஸ்*)

(Mr. Wijayapala Mendis)

ඒ ගැන සලකා බලන්නම්.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## දිවුලපිටියේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි තුමාට විරුද්ධ චෝදනා

திவுலுபிட்டிய மா. ம. உ. க்கு எதிரான குற்றச்சாட்டுகள்

## COMPLAINTS AGAINST D.M.O., DIVULAPITIYA

2. ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: 1969 පෙබරවාරි 16 වන දින දිවුලපිටිය රජයේ රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිතුමාට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනා 6 සම්බන්ධව දිවුලපිටිය පාර්ලිමේන්තු මන්ත්‍රී තුමා විසින් 1969 මාර්තු 12 වන දින ඉදිරි පත් කළ කරුණු පිළිබඳ පරීක්ෂණයේ ප්‍රතිඵල මේ වන තෙක් ඔහුට හෝ පැමිණිලි කරුවන්ට ඉදිරිපත් නොකළේ මන්ද ?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: திவுலுப்பிட்டிய அரசாங்க மருத்துவமனையின் மாவட்ட மருத்துவ உத்தியோகத்தருக்கு எதிராக 16.2.69 இல் செய்யப்பட்ட 6 குற்றச் சாட்டுகளைப் பற்றிப் 12.3.69 இல் அங்கத்தவர் சமர்ப்பித்த விடயங்களையிட்டு நடாத்தப் பட்ட விசாரணையின் விளைவை திவுலுபிட்டிய பாராளுமன்ற அங்கத்தவருக்கோ முறைப் பாடு செய்தோருக்கோ தெரியப்படுத்தாத தேன்?

asked the Minister of Health: Why has he not intimated to the M.P. for Divulapitiya, or to the complainants concerned, the outcome of the inquiry into the matters submitted by the Member on 12.3.1969 in regard to the six allegations made against the District Medical Officer of the Divulapitiya Government Hospital on 16.2.1969 ?

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලි මේන්තු ලේකම්—සෞඛ්‍ය ඇමති වෙනුවට)

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்—சுகாதார அமைச்சர் சார்பாக)

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs—on behalf of the Minister of Health)

The M.P. for Divulapitiya was written to on 17.6.69, thus :

"You would recall that the Deputy Director (Medical Services) apprised you of the situation at Divulapitiya Hospital when you saw him at his office about ten days back, and that you agreed to watch the situation and bring to the notice of the Department any further complaints against the District Medical Officer. You were also informed that the Department too would watch the situation before any further action is taken."

No further complaints have been received from the M.P. for Divulapitiya subsequently.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

සෞඛ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා නැති නිසා මේ අතුරු ප්‍රශ්නය ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඇසීමෙන් ප්‍රයෝජනයක් වේදැයි කියන්නට අමාරුයි. මා කළ සාකච්ඡාව සම්පූර්ණයෙන්ම වෙනස් දෙයක්. දැන් ලැබුණේ මා ඇසූ ප්‍රශ්නයට පිළිතුරක් නොවෙයි. මා ඇසූ ප්‍රශ්නය, 1969 පෙබරවාරි 16 වැනි දින දිවුලපිටිය රජයේ රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි තුමාට විරුද්ධව ඉදිරිපත් කළ කරුණු පිළිබඳ පරීක්ෂණයේ ප්‍රතිඵල මේ වන තෙක් ඉදිරිපත් නොකළේ මන්ද යන්නයි. ඒ අනුව මට වුවමනා කරන්නේ පරීක්ෂණයේ ප්‍රතිඵල දැනගන්නටයි. එදා සාකච්ඡාවේදී මට කිව්වේ මේ දෙදෙනා ගැන සොයා බලමුය කියන එකයි. එය වෙනම දෙයක්. මට ප්‍රතිඵල දැනගන්න ටයි වුවමනා කරන්නේ. එක්කෝ ඒ චෝදනාවලට වැරදිකාරයා ; නැතිනම් වැරදිකාරයා නොවෙයි. ඒ දෙකෙන් එකක් මට දැනගන්නට ඕනෑ. මිත්‍රත්වය තබා ගැනීමට කටයුතු සලසමු කියලයි මට කිව්වේ. මා අහන්නේ පරීක්ෂණයේ ප්‍රතිඵල කුමක්ද කියන ප්‍රශ්නයයි.

to know the result of the inquiry—whether he is guilty or not guilty. That is all I want.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා "විම සිල්ලෙන්" සිටියොත් විභාගයේ ප්‍රතිඵල අපි දන්වන්නම්.

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

ගරු රාජ්‍ය ඇමතිතුමා කියන්නේ විම සිල්ලෙන් සිටින්නය කියායි. මාර්තු 12 වැනිදා සිට අද වන තෙක් මාස 6 ක් තිස්සෙ මා බොහොම විමසිල්ලෙන් සිටිනවා. කරුණාකර විභාගයේ ප්‍රතිඵල දැනුම් දෙන්නට පුළුවන් දිනය කවදාදැයි කියන්න.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

The English rendition is that both parties are watching the situation. In Sinhala it says "විමසිල්ලෙන්". I like to give a different word altogether and say "ඉවසිල්ලෙන්."

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

හය මාසයක් ඉවසුවා ප්‍රතිඵල ලැබෙන තෙක්. මා ඉල්ලන්නේ ඉක්මනින් ප්‍රතිඵල දැනුම් දෙන ලෙසයි. කරුණාකර ගරු අගමැතිතුමාවත් ඒ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙනවාද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

I shall inform the Minister when he comes.



## දිසාගෙවත්ත—කටාන පාර

*திச்சாகேவத்தை—கட்டான பாதை*

**DISSAGEWATTA-KATANA ROAD**

3. **ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දිසාගෙවත්ත-කටාන පාරේ ඉතිරි කොටසට ගල් අතුරා තාර දැමීමට එතුමා වහා පියවර ගන්නේද ? (ආ) නො එසේ නම් මන්ද ?

*அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) திச்சாகேவத்தை—கட்டான பாதையின் எஞ்சிய பாகத்தைக் கல் பதித்துத் தாரிடுவதற்கு உடன் நடவடிக்கை எடுப்பாரா? (ஆ) இன்றேல், ஏன்?*

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Will he take immediate steps to metal and tar the balance portion of the Dissagewatta-Katana Road? (*b*) If not, why?

**විජයපාල මෙන්ඩිස් මයා.**

*(திரு. விஜயபால மெண்டிஸ்)*

(Mr. Wijayapala Mendis)

(අ) නැත. මෙම කොටස හුණු සමග පස් තදකිරීමෙන් වැඩිදියුණු කිරීමට ක්‍රියා කරගෙන යනු ලැබේ. (ආ) ඉහත (අ) අනුව පැන නොනගී.

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

හුණු සමග පස් දමා තද කිරීම නිසා ඒ පාරේ අද කිසිම වාහනයකට යන්න බැරි වී තිබෙන බව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා හොඳින් දන්නවා. අඩි දෙකහමාරක් පමණ එරෙනවා. සමහර තැන්වල වී පවා වපුරා තියෙනවා. කරුණාකර ඒ පාර ශුද්ධ කර ගල් ටිකක් සහ තාර ටිකක් දමා ඒක හරිගස්සා දෙනවද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜயபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)

මේ පිළිවෙළ අනුගමනය කරන්නේ පරීක්ෂණයක් වශයෙනුයි. සමහර පළාත් වල හුණු සමග පස් දමා තැනූ පාරවල් හොඳට තියෙනවා. ඒ අනුවයි, මන්ත්‍රීතුමා සඳහන් කරන පාරත් සකස් කළේ. තවම වැඩ අවසාන නැහැ. පාර තළා ඉවර වුණාම මන්ත්‍රීතුමා කියන විධියට එරෙන එකක් නැහැ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ඔය පරීක්ෂණය අනුව, බස්නාහිර පළාත වැනි වර්ෂාව අධික පළාත්වල ඔය ක්‍රමය අනුගමනය කරන්න එපාය කියා නිර්දේශ කර තිබෙනවානේද?

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜயபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)

එහෙම නිර්දේශ කර නැහැ. නිර්දේශයක් තියෙනවා නම් එහෙම කරන්නෙ නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 4.

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**
*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

The department wants two weeks' time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

වාචික පිළිතුරු

## මහවැලි ගඟ හැරවීම

*மகாவலி கங்கையைத் திருப்பும் திட்டம்*

MAHAWELI-GANGA DIVERSION SCHEME

5. **ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)
*(திரு. டீ. பி. இலங்கரத்ன—கொலொன்னாவ)*
(Mr. T. B. Ilangaratne—Kolonnawa)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති සම්මේලනය පහත සඳහන් යෝජනාව එතුමා වෙත ඉදිරිපත් කළ බව දන්නවාද? "වාරිමාර්ග කටයුතු සඳහා උතුරට සහ නැගෙනහිරට මහවැලි ගඟ හරවා යැවීමේදී, ගන්නොරුව-හල්ලොලුව ප්‍රදේශයට ආසන්න අතිරේක ස්ථානයකින්ද ගඟ හරවා එම වතුර අරඹකඩේ-ගලගෙදර ප්‍රදේශයේ ස්ථානයකින් කොස්පොතු ඔය සහ දැදුරු ඔයට එක්කළහොත් එමගින් (දැනට අස්වද්දන සහ අස්වැද්දීමට ඇති) වයඹ පළාතේ කුඹුරු අක්කර පන්ලක්ෂයකට පමණ වතුර ලබාදීමට හැකිවේයයි අදහස් කරන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති සම්මේලනය රජයේ සැලකිල්ලට එම අදහස ඉදිරිපත් කරයි" (ආ) මෙම යෝජනාවේ අඩංගු අදහස විමර්ශනය කිරීම සඳහා ක්‍රියා කර තිබේද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) "நீர்ப்பாய்ச்சல் தேவைக்காக வடக்கிற்கும், கிழக்கிற்கும் மகாவலி கங்கையின் நீரைத்திருப்பும் போது, கொன்னருவை ஹல்லொலுவைக்கண்மையில் ஓரிடத்தில் கங்கையின் நீரைத் திருப்பிப் பாய்ச்சிச்சென்று கோபொத்து ஓய, தெதுரு ஓய ஆகியவற்றுடன் சேர்ப்பதால் வட மேற்கு மாகாணத்திலுள்ள ஐந்து லட்சமளவு விவசாயத்திற்குட்படுத்தப்பட்ட காணிகளுக்கும் புதிய காணிகளுக்கும் நீர்ப்பாய்ச்சல் வசதியளிக்கக் கூடுமென விவசாய திணைக்களத்தின் தொழிற் சங்க சம்மேளனம் கருதுவதோடு இதை அரசாங்கத்துக்குச் சிபாரிசு செய்கிறது", என்ற பிரேரணையை அமைச்சுக்கு அனுப்பியுள்ளதென்பதை அறிவாரா? (ஆ) இப் பிரேரணையிலடங்கியுள்ள ஆலோசனையை ஆராய்ந்து பார்ப்பதற்கான நடவடிக்கை எதுவும் எடுக்கப்பட்டுள்ளதா? (இ) இல்லையெனில், ஏன்?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Land, Irrigation and Power : (*a*) Is he aware that the following resolution has been submitted to him by the Trade Union Federation of the Department of Agriculture ?

"That whilst diverting the waters of the Mahaweliganga to the North and East for irrigation purposes, the Trade Union Federation of the Department of Agriculture is of opinion that by providing an additional diversion point near the Gannoruwa-Halloluwa area and taking the waters across to a point near the Arambakade-Galagedara area and putting the waters to the Kospothu Oya and Deduru Oya it would be possible to irrigate about 5 lakhs of acres of paddy (presently asweddumized and lands to be asweddumized) in the North-Western Province and recommends this for consideration by Government".

(*b*) Has any action been taken to investigate the proposal contained in this resolution ? (*c*) If not, why not ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

(*a*) I am not aware. (*b*) Does not arise. But at the request of the Hon. Minister of Finance, who represents Yapahuwa and who has strongly urged that water from the Mahaweliganga be made available for irrigating land between the Kala-oya and the Deduru oya—this land comprises part of the Kurunegala District and almost the entire Puttalam District—we are investigating the matter, to see whether it is possible to do so. As you know, these diversions are difficult matters.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න යක් අසන්න තිබෙනවා. මෙය ගරු ඇමති තුමාට ඉදිරිපත් කර තිබෙන යෝජනා මාලා වෙන් එකක් නිසා ඒ ගැන තව දුරටත් සොයා බලනවාද ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මම දන්නේ නැහැ. මට ඒවා ලැබිල නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඒක වෙන්න බැහැ. සම්මේලනයේදී සාකච්ඡා කර ඔබතුමාගේ ඉල්ලීම පිට ඔබ තුමාට ඉදිරිපත් කර තිබෙන යෝජනාව කුයි, මේ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මට ඒවා ලැබිල නැහැ. ගරු මුදල් ඇමති තුමාගේ ඡන්ද කොට්ඨාශයටත් ජලය ලබා දෙන්නය කියා ඉල්ලා තිබෙනවා. අපි ඒ කටයුතු ගැන පරීක්ෂා කර බලනවා. මට එය හෙට අනිද්දටම කරන්න බැහැ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති සම්මේලනයෙන් මෙම යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේදී ඒ අය පැහැදිලි වශයෙන් ප්‍රකාශ කළා, රාජ වන්නි පළාත, කුමාර වන්නිපළාත, දෙමළ හත්පත්තුව, දඹදෙනි හත්පත්තුව දක්වා [බාධාකිරීම්]

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා කියන්නේ මට එය ලැබී නැති බවයි.

இ. நி. சே. 5 ஆந் தரம் ; வெற்றிடங்கள்

**ලං. ප. සේ., 5 ශ්‍රේණිය : ඇබෑර්තු**

**CLASS 5, C.A.S. : VACANCIES**

6. **බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)
*(திரு. பி. எச். பண்டார—பதுளை)*
(Mr. B. H. Bandara—Badulla)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ලංකා පරිපාලන සේවය පිහිටුවූයේ කවදාද ? (ආ) එදා සිට මෙදා දක්වා එම සේවයේ 5 වැනි ශ්‍රේණියට—(1) විවෘත තරඟ විභාගයෙන්, (2) සීමිත තරඟ විභාග යෙන් සහ (3) කුසලතාවය අනුව වෙන් කළ ඇබෑර්තු සංඛ්‍යාව සහ බඳවා ගත් නිල ධාරීන් සංඛ්‍යාව කොපමණද ? (ඉ) සීමිත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

තරඟ විභාගයට වෙන් කර තිබෙන මුළු ඇබෑර්තු සංඛ්‍යාව කොපමණද? ඒ සියල්ල පිරවූයේද? (ඊ) නොඑසේ නම්, එයට හේතූන් කවරේද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கை நிர்வாகச் சேவை எப்பொழுது தாபிக்கப்பட்டது? (ஆ) தாபிக்கப்பட்ட கால முதல் இன்றுவரை அச்சேவையின் 5 ஆந் தரத்திற்கென (1) வரையறுக்கப்படாத போட்டிப் பரீட்சைக்கும் (2) வரையறுக்கப் பட்ட போட்டிப் பரீட்சைக்கும் (3) சிறப்புத் திறமைக்கும் ஒதுக்கப்பட்ட வெற்றிடங்களின் எண்ணிக்கையும் சேர்க்கப்பட்ட உத்தியோகத்தர்களின் எண்ணிக்கையும் யாது? (இ) மட்டுப்படுத்தப்பட்ட போட்டிப் பரீட்சையின் பெறுபேறுகளைக்கொண்டு நிரப்பப்பட வேண்டிய பதவிகளின் மொத்த எண்ணிக்கை என்ன? இப்பதவிகள் யாவும் நிரப்பப்பட்டுள்ளனவா? (ஈ) இல்லையெனில் ஏன்?*

asked the Minister of Finance: (*a*) When was the Ceylon Administrative Service established? (*b*) Will he state the cadre provided for in Class 5 of the Ceylon Administrative Service from its inception up to date to be filled on the results of (1) the open competitive examination. (2) the limited competitive examination, (3) on merit, and the number of officers recruited respectively? (*c*) What is the total number of posts to be filled on the results of the limited competitive examination? Have all these posts been filled? (*d*) If not, why?

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

පිළිතුරු සභාගත කරමි.

**සභාගත කරන ලද පිළිතුර මෙසේ යි:**
*சபா பீடத்தில் வைக்கப்பட்ட விடைவருமாறு:*
*The Answer tabled is as follows:*

(අ) 63.5.1 වැනි දිනය.

(ආ) ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි විය :

| | | |
|---|---|---|
| 63.5.1 වැනි දින | — | තනතුරු 795 |
| 1966 අගෝස්තු මස | — | තනතුරු 845 |
| 1969 ජනවාරි මස | — | තනතුරු 880 |

ආරම්භයේදී ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තිය, I වැනි ශ්‍රේණිය හා II වැනි ශ්‍රේණිය යනුවෙන් ශ්‍රේණි දෙකකට අතුරු කොටස් වශයෙන් බෙදන ලදී. මෙම ශ්‍රේණි දෙක 66.7.5 වැනි දින සිට ඒකාබද්ධ කරන ලදී.

V වැනි පන්තියේ ඇබෑර්තු, සේවය ආරම්භයේ සිට මෙද දක්වා පහත සඳහන් පරිදි පුරවා ඇත :—

| | | ප්‍රසිද්ධ කර තිබුණු ඇබෑර්තු සංඛ්‍යාව | පිරවූ සංඛ්‍යාව | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| (1) | 1964 විවෘත තරඟ විභාගයෙන් ... | 40 ... | 47 ... | බඳවාගත් අවස්ථාවේ ඇබෑර්තු සංඛ්‍යාව වැඩිවීම නිසා මෙම වෙනස ඇතිවිය. |
| | 1966 විවෘත තරඟ විභාගයෙන් ... | 50 ... | 73 ... | එම |
| | 1968 විවෘත තරඟ විභාගයෙන් ... | 80 ... | — ... | ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින 1968 විභාගයේ ප්‍රතිඵල අනුව පිරවීම සඳහාය. |
| (2) | 1966 සීමිත තරඟ විභාගයෙන් ... | 20 ... | 44 ... | බඳවාගත් අවස්ථාවේ ඇබෑර්තු සංඛ්‍යාව වැඩිවීම නිසා මෙම වෙනස ඇති විය. |
| | 1968 සීමිත තරඟ විභාගයෙන් ... | 26 ... | 32 ... | එම |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | ප්‍රසිද්ධ කර තිබුණු ඇබෑර්තු සංඛ්‍යාව | පිරවූ සංඛ්‍යාව | වෙනත් කරුණු |
|---|---|---|---|
| 1969 සීමිත තරඟ විභාගයෙන් ... | 15 ... | — ... | ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින 1969 විභාගයේ ප්‍රතිඵල අනුව පිරවීම සඳහායි. |
| (3) 65.11.18 වැනි දින කුසලතා උසස්කිරීම් වලින් ... ... | 52 ... | 52 ... | |
| කුසලතා උසස් කිරීම්වලින්— 67.2.1 — 67.9.18 —35 ... | 35 ... | 35 | |
| කුසලතා උසස් කිරීම්වලින් 69.3.27 ... | 26 ... | 26 | |
| කුසලතා උසස් කිරීම්වලින් ... | 12 ... | — ... | පිරවීමට තිබේ. |

(ඉ) 76. මෙතෙක් පවත්වන ලද සීමිත තරඟ විභාග වලින් පිරවීමට තිබුණු සියළුම ඇබෑර්තු පුරවා ඇත.

(ඊ) පැන නොනගී.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
7 වැනි ප්‍රශ්නය.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට මාස දෙකක් කල් අවශ්‍යයි.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினா மற்றொரு தினத்திற்குச் சமர்ப்பிக்க கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## ලං. ප. සේ., 5 ශ්‍රේණිය: පත්වීම් දීමේ පදනම

*இ. நி. சே. 5 ஆந் தரம்: நியமன அடிப்படை*

CLASS 5, C.A.S.: BASIS OF APPOINTMENT

**8. බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකා පරිපාලන සේවයේ පස්වැනි ශ්‍රේණියේ වැඩ බැලීමේ පත්වීම් දීමේදී දැනට රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය කුමක්ද? (ආ) එම සේවය එක් දෙපාර්තමේන්තුවකට හෝ එක් අමාත්‍යාංශයකට හෝ අයත් නොවන බවත් එය මුළු රජයේ සේවයටම පොදු සේවයක් බවත් එතුමා දන්නවාද? (ඉ) එසේ නම් ලංකා පරිපාලන සේවයේ 5 වැනි ශ්‍රේණියේ වැඩ බැලීමේ පත්වීම් දෙපාර්තමේන්තුවක ප්‍රධානියෙකුට හෝ අමාත්‍යාංශයක ස්ථිර ලේකම්වරයෙකුට හෝ රිසි ලෙස පිරවීමට ඉඩදීම සාධාරණ නොවන බව එතුමා දන්නවාද? (ඊ) එම සේවයේ ස්ථිර පත්වීම් දීමේදීත් වැඩ බැලීමේ පත්වීම් දීමේදීත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින්ම පවත්වනු ලබන සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵලවල විශිෂ්ඨත්වයේ අනුපිළිවෙල අනුව ඇබෑර්තු පිරවීම සුදුසුම ක්‍රමය බව එතුමා දන්නවාද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கை நிர்வாகச் சேவையின் 5 ஆந் தரத்தில் பதிற் கடமைபார்க்கும் நியமனம் வழங்க அரசாங்கம் தற்பொழுது பின்பற்றும் கொள்கை யாது? (ஆ) அச்சேவை ஒரு திணைக்களத்தையோ ஓரமைச்சையோ சார்ந்ததாகாதென்பதையும், அது முழு அரசாங்க சேவைக்கும் பொதுவானதொரு சேவையென்பதையும் அவர் அறிவாரா? (இ) ஆமெனில், இலங்கை நிர்வாகச் சேவையின் 5 ஆந் தரத்தில் பதிற்கடமை பார்க்கும் நியமனத்தை ஒரு திணைக்களத்தின் தலைவரோ, ஓரமைச்சின் நிரந்தரச் செயலாளரோ ஏற்படுத்த இடமளிப்பது நியாயமற்றதென்பதை அவர் அறிவாரா? (ஈ) இச் சேவைக்கு நிரந்தர நியமனமளிக்கும் பொழுதும், பதிற்கடமை பார்க்கும் நியமனமளிக்கும் பொழுதும் அரசாங்க சேவை ஆணைக் குழு மூலமாக நடத்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

[බී. එච්. බන්ඩාර මයා.]

தப்படும் வரையறுக்கப்பட்ட போட்டிப் பரீட்சைப் பெறுபேற்றின் திறமை நிலைகளுக்கேற்ப வெற்றிடங்கள் நிரப்பப்படுதலே சிறந்த முறையாகுமென்பதை அவர் அறிவாரா ?

asked the Minister of Finance: (*a*) What is the policy at present followed by Government in making acting appointments to Grade V of the Ceylon Administrative Service? (*b*) Is he aware that this service is not exclusive to any particular department or Ministry and that it is a component of the general Public Service? (*c*) If so, is he aware that it would be unjust to permit any particular head of department or the Permanent Secretary of any particular Ministry to make acting appointments in Grade V of the Administrative Service at his will and pleasure? (*d*) Is he aware that the most satisfactory basis for making acting appointments as well as permanent appointments would be the order of merit on the results of the limited competitive examination conducted by the P. S. C.?

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

(අ) ලංකා පරිපාලන සේවයේ පස්වැනි පන්තියට උසස් කිරීම සඳහා සුදුසුකම් ඇති ඉතාමත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතරින්, දැනට ලංකා පරිපාලන සේවයේ පස්වැනි පන්තියේ වැඩ බැලීමේ පත්වීම් දෙනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගිනි. එසේ කිරීමට නොහැකි විට, සේවයේ අවශ්‍යතා අනුව, ලංකා පරිපාලන සේවයේ පස්වැනි පන්තියට පත්කිරීම සඳහා පැවැත්වෙන සීමිත තරඟ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ඇති යෝග්‍ය නිලධාරීන්ට වැඩ බැලීමේ පත්වීම් දෙනු ලැබේ. (අ) ඔව්. (ඉ) සහ (ඊ) ලංකා පරිපාලන සේවයේ ස්ථිර පත්වීම් මෙන්ම වැඩ බැලීමේ පත්වීම් ද දෙනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසිනි.

වාචික පිළිතුරු

## පනාවල මහා විද්‍යාලය

*பனுவல மகா வித்தியாலயம்*

## PANAWALA MAHA VIDYALAYA

9. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර—ඩී. පී. ආර්. වීරසේකර මයා.—දෙහිඕවිට—වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை—திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெதியோவிற்ற—சார்பாக)*

(Mr. Leslie Goonewardene—Panadura—on behalf of Mr. D. P. R. Weerasekera—Dehiowita)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කෑ/පනාවල මහා විද්‍යාලයට ජලපහසුකම් ඇති කරන ලෙස පනාවල් කෝරළේ (නැ.හා.බ) ගම් සභාව මගින් 68.11.12 දින ඉල්ලා සිටි බව එතුමා දන්නවාද? (ආ) එම පාසැලට ජල පහසුකම් ඇති කිරීමට ඉක්මණින් ක්‍රියා කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දෙන්නේද? (ඉ) එසේ නම් කවදාද? නො එසේ නම්, ඒ මන්ද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) கே/பனுவல மகாவித்தியாலத்திற்குத் தண்ணீர் வசதியளிக்கப்பட வேண்டுமென்று பனுவல கோரளை (கிழக்கு-மேற்கு) கிராமச்சங்கம் 12.11.68 இல் வேண்டுகோள் விடுத்திருப்பதை அவர் அறிவாரா? (ஆ) இவ்விடயத்தை துரிதப்படுத்தும்படி அவர் தமது உத்தியோகத்தர்களை பணிப்பாரா? (இ) ஆமெனில் எப்போது? இல்லையெனில், ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that the Panawal Korale (East and West) V.C. made a request on 12.11.68 that කෑ/Panawala Maha Vidyalaya be provided with water? (*b*) Will he instruct his officials to expedite this matter? (c) If so, when? If not, why?

**විජයපාල මෙන්ඩිස් මයා.** (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති වෙනුවට)

*(திரு. விஜயபால மெண்டிஸ்—கல்வி, கலாசார விவகார அமைச்சர் சார்பாக)*

(Mr. Wijayapala Mendis—on behalf of the Minister of Education and Cultural Affairs)

(අ) 68.11.12 දින දරණ ලිපියෙන් ඉල්ලීමක් කර ඇති බව දනිමි. (ආ) එසේය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ඉ) විධිමත් ලෙස නල මාර්ග යෙදීමට අවශ්‍ය බිම් ප්‍රමාණය අයත් කර ගත් පසු හැකි පමණ ඉක්මණින්.

## රජයේ සංස්ථාවන්ට අකුරණ කොට්ඨාශයෙන් බඳවා ගත් අය

அக்குறனைத் தொகுதியிலிருந்து அரசாங்கத் தாபனங்களுக்குச் சேர்க்கப்பட்டோர்

## PERSONS FROM AKURANA ELECTORATE RECRUITED TO GOVERNMENT INSTITUTIONS

10. **ඉලංගරත්න මයා** (හේමචන්ද්‍ර සිරිසේන මයා.—අකුරණ පළමුවන මන්ත්‍රී—වෙනුවට)

*(திரு. இலங்கரத்ன—திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறனை முதலாம் அங்கத்தவர் சார்பாக)*

(Mr. Ilangaratne—on behalf of Mr. Hemachandra Sirisena—First Akurana)

කම්කරු හා රැකීරක්ෂා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අකුරණ ඡන්දදායක කොට්ඨාශයේ පදිංචි අයවළුන්ගෙන්, 1965 මුල් භාගයේ සිට මෙතෙක් රජයේ හා රජයට අනුබද්ධ සියළුම සංස්ථාවන්හි (ගුරුවරුන්ද ඇතුළුව) සේවය සඳහා පත්කර ගෙන ඇති සියළුම තරාතිරම්වල සේවකයින් සංඛ්‍යාව කොපමණද? (ආ) එක් එක් සේවකයාගේ නම, වයස, ලිපිනය, උසුලන තනතුර, දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව සහ දැනට සේවය කරන ස්ථානය වෙන් වෙන් වශයෙන් එතුමා දිරිපත් කරනවා ද?

*தொழில், தொழில் வசதி அமைச்சரைக் கேட்ட வினா: (அ) 1965 முற்பகுதியிலிருந்து இற்றைவரை அக்குறனைத் தொகுதியைச் சேர்ந்த எத்தனைபேருக்கு அரசாங்க சேவையிலும், அரசாங்கச் சார்புடைய கூட்டுத்தாபனங்களிலும் பல்வேறு தொழில் வகுதிகளிலும் (ஆசிரியர்கள் உட்பட) வேலையளிக்கப்பட்டுள்ளது? (ஆ) ஒவ்வொரு வேலையாளரினதும் பெயர், வயது, முகவரி, வகிக்கும் பதவி, சம்பந்தப்பட்ட திணைக்களம் அல்லது கூட்டுத் தாபனம், தற்சமயம் வேலை பார்க்குமிடம் ஆகியவற்றைக் கூறுவாரா?*

asked the Minister of Labour and Employment: (*a*) How many persons from the Akurana Electorate have been given employment in government service and in state-sponsored corporations in the various categories of employment (including teachers) since early 1965 to date? (*b*) Will he state the name, age, address, post held, the department or corporation concerned, and the present place of employment in respect of each employee?

**ඩී. පී. අතපත්තු මයා. (රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—කම්කරු හා රැකීරක්ෂා ඇමති වෙනුවට)**

*(திரு. டீ. பீ. அத்தபத்து—இராஜாங்க அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி—தொழில், தொழில் வசதி அமைச்சர் சார்பாக)*

(Mr. D. P. Atapattu—Parliamentary Secretary to the Minister of State—on behalf of Minister of Labour and Employment)

(*a*) Statistics of persons given employment under Government and in corporations on an electoral basis are not maintained by the Labour Department. (*b*) Does not arise.

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

ගරු උප ඇමතිතුමා දන්නවාද, අද නියම සංඛ්‍යා ලේඛන නැති නිසා යම් යම් ප්‍රශ්නවලදීත් තර්කවලදීත් ඉදිරිපත් කරන්නට තිබෙන රජයේ සංඛ්‍යා ලේඛන සත්‍යයෙන් තොර බව? එම නිසා ඒ සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් ඇති කර, වෙනම සංඛ්‍යා ලේඛන අංශයක් ඇති කර, වෙනම නිලධාරි කණ්ඩායමක් පත් කර සත්‍ය තත්ත්වය මහජනතාවට දැනගැනීම සඳහාත්, රජයේ කටයුතුවලට ප්‍රයෝජන ගැනීම සඳහාත් වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියා ගරු උප ඇමතිතුමා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවාද?

**අතපත්තු මයා.**

*(திரு. அத்தபத்து)*

(Mr. Atapattu)

මෙවැනි ඉල්ලීමක් කර තිබෙනවාය කියා මම ඇමතිතුමාට දන්වන්නම්. කරයිද නොකරයිද කියා මා දන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පානදුර මන්ත්‍රීතුමාගේ (ලෙස්ලි ගුණවර්ධන මයා.) පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම

பாணந்துறை அங்கத்தவர் (திரு. லெஸ்லி குணவர்தன) அவர்களின் சொந்த விளக்கம்

## PERSONAL EXPLANATION BY THE MEMBER FOR PANADURA [MR. LESLIE GOONEWARDENE]

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

Mr. Speaker, I crave your indulgence to make a very short statement in order to clear my position with regard to the travel of an officer of the Ministry of Industries, one Mr. Mylvaganam, by air from Athens to Ceylon on April 10th last.

You will probably recollect that some time ago the Hon. Minister of Industries had occasion on the Floor of this House to read some correspondence in which it was stated that I was a witness to the fact that this Mr. Mylvaganam travelled tourist class on his way back to Ceylon. On that occasion I was dragged into this matter and I had to point out that my testimony was to the contrary and that I did not see Mr. Mylvaganam in the tourist class section, and he did not travel tourist class.

He may have had a first class ticket, or he may have had a tourist class ticket, or he may not have had a ticket at all, but all that I can say is that he was not in the tourist class along with the hon. Member for Haputale (Mr. Ariyadasa) and myself.

Subsequently, I think, on the 8th of this month the Hon. Minister of Industries had occasion once more to refer to this matter, and on that occasion he produced photostat copies of several documents to show that Mr. Mylvaganam had travelled tourist class.

All I want to do is to repeat my statement that I travelled tourist class along with the hon. Member for Haputale, and this gentleman was not there. He may have been in the first class, he may have been in the cockpit, or he may have been travelling with the luggage, but certainly we did not see him there in the tourist class.

I am not bringing any charge against him or anybody else. Because my name has been dragged in I am making this statement. I recollect clearly now that I met Mr. Mylvaganam for the first time—I have no recollection of meeting him before—at the airport at Athens when I was introduced to him by the hon. Member for Haputale. When Mr. Ariyadasa and I got into the plane, Mr. Ariyadasa himself looked round and re-marked that Mr. Mylvaganam had missed the plane. He was certainly not in the tourist class. I replied that he could not have missed the plane and that he must be travelling first class, and and that was the end of it. The next time I saw Mr. Mylvaganam was when we got off at the airport in Ceylon.

I have no objection to this. I hope I am not putting anybody in difficulties because I am aware that if U.T.A allows a tourist class passenger to travel first class without a first-class ticket, then UTA would be liabel to a 2,000 dollars fine by some international association. I do not know whether UTA will be fined by anybody.

This is the position. I cannot bear witness to the fact that Mr. Mylvaganam travelled tourist class. In fact, my evidence is to the contrary.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය: 1969 සැප්තැම්බර් 11 වන දින "දිනපති" පත්‍රයේ පළවූ ප්‍රවෘත්තිය

*சிறப்புரிமை விடயம்: 11.9.69 "தினபதி" யின் செய்தி*

## QUESTION OF PRIVILEGE: NEWS ITEM IN THE "DINAPATHI" OF 11.9.69

**කා. පො. ඉරත්තිනම් මයා. (කිලිනොච්චි)**
*(திரு. கா. பொ. இரத்தினம்—கிளிநொச்சி)*
(Mr. K. P. Ratnam—Kilinochchi)

Mr. Speaker, I wish to point out to you that in the "Dinapathi" of 11th September 1969—I do not want to go into it fully—there is a news item banner-headlined in the front page to the effect that the Whip of the Thamil Arasu Katchi is not present in the House, thereby giving the impression to the people that I am irregular in my attendance.

A perusal of the attendance register will show clearly that I have been present in the House every day during the Budget Debate. And as a matter of fact you know, Sir, that I meet you almost daily to make arrangements for our party speakers to participate in the Debate. This news item also questions my conduct as whip of my party.

It is evident that the news item has been deliberately written to cause damage to my reputation as a Member of Parliament, and particularly as the whip of my party. I am reading the relevant extracts from this news item to support my statement.

"1969 செப்டெம்பர் 11, வியாழக்கிழமை: தமிழரசுக் கட்சிக் கொரடா நாடாளுமன்றத்தில் இல்லை. நாடாளுமன்றத்தில் முக்கியமான விவாதங்கள் நடைபெறும் நாட்களில் தமிழரசுக் கட்சிக் கொரடா சமூகமளிக்கத் தவறுவதால் மேற்படி கட்சியின் எம்பீக்கள் பலர் தமது தொகுதித் தேவைகள் பற்றிப் பேசுவதற்கே வாய்ப்புக் கிடைக்காமல் தவிர்கிருர்கள்.

பேசப்போகும் எம். பீக்களின் பெயர்ப்பட்டியலைச் சபாநாயகரிடம் சமர்ப்பித்து விடுவதோடு தமது கடமை முடிந்தது என்று கருதி கட்சிக் கொரடாக்கள் நாடாளுமன்றக் கூட்டங்களுக்குத் தவருமல் சமூகம் அளிக்க வேண்டியது அவசியமாகும்.

பண்டிதர் இரத்தினம் தமிழ் அரசுக் கட்சிக் கொரடாவாக இருந்த போதிலும் ஒப்புக்காகவேனும் சபையில் இருக்கிருர் இல்லை என்ருல் கட்சியின் மற்ற எம். பீக்கள் ஒழுங்காகச் சமூகமளிப்பார்களா ?"

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Will the hon. Member kindly send me a copy of that report with a translation ? On the face of it there appears to be a breach of Privilege because the hon. Member has been present every day in Parliament and, further, he has been sending me a list of names of the Members of his party who wished to speak. Sometimes he has been a bit of a nuisance also.

**ඉරත්තිනම් මයා.**
*(திரு. இரத்தினம்)*
(Mr. Ratnam)

Yes.

## වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය: මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු පිළිබඳව 1969.-9.11 දින "ඩේලි නිවුස්" පත්‍රයේ පළවූ වාර්තාව

*சிறப்புரிமை விடயம் :11. 9. 1969 "சிலோன் டெயிலி நியூஸ்" இன் சபை நிகழ்ச்சி அறிக்கை*

## QUESTION OF PRIVILEGE: REPORT OF PROCEEDINGS OF THE HOUSE IN THE "CEYLON DAILY NEWS" OF 11.9.1969

**ගරු හියු ප්‍රනාන්දු (වාණිජ හා වෙළඳ ඇමති)**
*(கௌரவ ஹியூ பெர்ஞண்டோ—வர்த்தக, வியாபார அமைச்சர்)*
(The Hon. Hugh Fernando—Minister of Commerce and Trade)

I wish to raise a quesiton of Privilege in regard to the manner in which the proceedings of this House have been reported in the "Daily News" of 11th September 1969. I refer to the matter raised by the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු හියු ප්‍රනාන්දු]

hon. Member for Yatiyantota (Dr. N. M. Perere) on the question of a claim by a buyer overseas on tea despatched by Merrill Fernando & Co., I read out a statement by Mr. Merrill Fernando and this statement has been incorrectly reported in this paper. The statement I read out is in HANSARD.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

Will the Hon. Minister kindly send me the newspaper underlining the portions which he says are incorrect?

**ගරු හියු ප්‍රනාන්දු**
*(கௌரவ ஹியூ பெர்னண்டோ)*
**(The Hon. Hugh Fernando)**

Yes.

## පෞද්ගලික මන්ත්‍රීගෙ පණත් කෙටුම්පත

*தனி அங்கத்தவர் மசோதா*

PRIVATE MEMBER'S BILL

### CEYLON PENTECOSTAL MISSION BILL

**එම්. රස්කින් ප්‍රනාන්දු මයා.** (මොරටුව)
*(திரு. எம். றஸ்கின் பெர்னண்டோ—மொறட்டுவ)*
**(Mr. M. Ruskin Fernando—Moratuwa)**

I move,

"That leave be granted to introduce a Bill to incorporate the Ceylon Pentecoastal Mission."

**පී. බී. ඒ. වීරකෝන් මයා.** (වත්තේගම)
*(திரு. பீ. பி. ஏ. வீரக்கோன்—வத்தேகம)*
**(Mr. P. B. A. Weerakoon—Wattegama)**
**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்*
*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පනත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.**

**වාර්තා කිරීම සඳහා 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පනත අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති වෙත පවරන ලදී.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப் பணிக்கப்பட்டது.

மசோதா, நிலையற்றக்கட்டளை இல. 51 (4) இன்படி கல்வி, கலாசார, விவகார அமைச்சருக்கு, அறிக்கை செய்யப்படுவதற்காகச் சாட்டப்பட்டது.

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 51 (4), to the Minister of Education and Cultural Affairs for report.*

## විසර්ජන පනත් කෙටුම්පත, 1969-70

*ஒதுக்கீட்டு மசோதா, 1969-70*

APPROPRIATION BILL, 1969-70

**කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී.—[ප්‍රගතිය සැප්තැම්බර් 11]**

**[කථානායකතුමා මූලාසනාරූඪ විය.]**

குழுவில் மேலும் ஆராயப் பெற்றது.—[தேர்ச்சி: 11, செப்டெம்பர்]

சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]

*Considered further in Committee.—[Progress : 11th September.]*

[MR. SPEAKER *in the Chair.*]

**සභාපති**
*(அக்கிராசனர்)*
**(The Chairman)**

I wish to bring to the notice of hon. Members that we have allotted ten hours for the discussion of the Votes of the Ministry of Agriculture and Food. The Hon. Minister wants two hours to reply and I have got a list of forty names. It is impossible to give every hon. Member an opportunity to speak. I shall try to follow the lists that have been given to me by the Whips. But there are some hon. Members who have not spoken at all. So, even if they are at the bottom of the lists, I shall call upon them to speak a bit early.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**134 වන ශීර්ෂය.—කෘෂිකර්ම හා ආහාර අමාත්‍යවරයා**

**1 වන සම්මතය—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 5,62,241**

*134 ஆம் தலைப்பு.—விவசாய உணவு அமைச்சர்*

வாக்குப்பணம் இல. 1.— பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும் ரூபா 5,62,241

HEAD 134.—MINISTER OF AGRICULTURE AND FOOD

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 562,241*

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
**(Mr. Leslie Goonewardene)**

"වැය සම්මතය රුපියල් 10 කින් අඩු කළ යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ කළ ඉල්ලීමත් වැදගත් එකක්. ඒ නිසා මෙම වැය ශීර්ෂය සම්බන්ධව මිනිත්තු 10 කට වඩා ගන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන්ම සමුපකාර ව්‍යාපාරය ගැන වචන ස්වල්පයක් කථා කරන්නටයි මා බලාපොරොත්තු වන්නේ.

අද සමුපකාර ව්‍යාපාරය සම්බන්ධ රට පුරාම ඇති ලොකුම චෝදනාව නම් සමුපකාර ව්‍යාපාරයේ දූෂණ තිබෙනවාය කියන එකයි. එය සමුපකාර ව්‍යාපාරය පටන් ගත් දිනයේ සිටම ඒ ව්‍යාපාරයට විරුද්ධව ගෙන යනු ලබන චෝදනාවක්. එමෙන්ම එහි සෑහෙන ප්‍රමාණයකට සත්‍යයකුත් තිබෙනවාය කියා පිළිගන්නට සිදු වී තිබෙනවා. මේ දූෂණ නැති කරන්නේ කොහොමද කියන එකයි ආණ්ඩු පක්ෂයට හෝ වේවා, විරුද්ධ පාර්ශ්වයට හෝ වේවා, මුහුණ දෙන්නට තිබෙන ලොකුම ප්‍රශ්නය. එමෙන්ම අපට ඒ ප්‍රශ්නයට මුහුණ දී යම් විසඳීමක් කරන්නට පුළුවන් වෙනවා නම්, එසේ පුළුවන්කම ඇති වන්නේ පක්ෂ භජනයෙන් තොරව කටයුතු කිරීමෙනුයි. ආණ්ඩු පක්ෂයේ කෙනෙක් හෝ වේවා, විරුද්ධ පාර්ශ්වයේ කෙනෙක් හෝ වේවා, යම් වරදක් කරනවා නම් ඒ ගැන තදින් ක්‍රියා කළොත් පමණයි, ඒ ප්‍රශ්නය විසඳන්නට පුළුවන්. එහෙත් එක්තරා කරුණක් ගැන නම් කියන්නට කණගාටුයි. ගරු කෘෂිකර්ම ඇමතිතුමාට පෞද්ගලික වශයෙන් නම් මා තුළ උසස් ගෞරවයක් තිබෙනවා. එහෙත් තමන්ගේ නිලධාරීන් නිසා මුළා වී හෝ තම ප්‍රදේශයේ සිටින පක්ෂයේ ප්‍රධානීන්ට මුළා වී හෝ, එතුමා පක්ෂපාතීත්වයෙන් කටයුතු කිරීම ගැන ඉතා කණගාටුවෙන් වුවත් කියන්නට සිදු වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මීගමුව ප්‍රදේශයේ උතුරු අලුත්කුරු කෝරළයේ සමුපකාර සංගමයේ සභාපති ගැන සඳහන් කරන්නට සිදු වී තිබෙනවා. ඒ මහත්මයා රෙගුලාසිවලට හා සම්ප්‍රදායට විරුද්ධව 1960 පමණේ සිටම තමන්ගේ පෞද්ගලික චෙක් මාරු කරමින් කටයුතු කර තිබෙනවා. ඒ අන්දමට චෙක් 300 කට අධික ගණනක් මාරු කර තිබෙනවාය කියා මට ආරංචියි. ඒ ක්‍රියාව ගැන පරීක්ෂණය කුත් තබා තිබෙනවා, බැරිම තැනට ආවාට පසු. පළමුකොටම සමුපකාර නිලධාරියෙක් පරීක්ෂණයක් කර තිබෙනවා. ඊට පසු සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් සහභාගි වූ පිරිසක් විසිනුත් පරීක්ෂණයක් තබා තිබෙනවා. මට ලැබුණු ආරංචියේ හැටියට 1969 ජූලි මාසයේ මැද හරියේදීයි පරීක්ෂණය තබා තිබෙන්නේ. එහිදී නොයෙකුත් කරුණු ඔප්පු වී තිබෙනවා කියාත් දැනගන්නට ලැබී තිබෙනවා.

ළඟදීත් චෙක් 8 ක් යවා රුපියල් 40,000 ක පමණ පාඩුවක් සංගමයට සිදු වී තිබෙනවා. ඒ චෙක් 8 ආපසු ඇවිත් තිබෙනවා. සුළු ගණනක් නම් ඒ තරම් ප්‍රශ්නයක් නොවෙයි. ඉඳ හිට චෙක් එකක් මාරු කර සුළු ගණනක් ගෙවන්නට බැරි වී එය පසුව ගෙව්වා වගේ නොවෙයි මේක. මෙය සිරිතක් වශයෙන් දිගටම කෙරී තිබෙනවා. මේ අවස්ථාවේ රුපියල් 40,000 ක් පමණ වටිනා චෙක් 8 ක් බැංකුවට යවා ඒවා ආපසු ඇවිත් තිබෙනවා. එමෙන්ම සහකාර කොමසාරිස් නියම කර තිබෙනවා, සංගමයේ රැස්වීමක් තබන්නට. එහෙත් රැස්වීමක් තබා නැහැ. නිදහසට කරුණු කියන්නය කියා ජූලි අග හරියේදී පමණ දන්වා තිබෙනවාය කියා ආරංචියි. ඒ නිසා මා විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ, ප්‍රශ්නය ගැන පක්ෂභජනයෙන් තොරව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

කටයුතු කරන්නය කියලයි. මේ සභාපති මහතාත් වැරදි කරනවා නම්, කොමිටියත් ඒ මහතාට විරුද්ධව ක්‍රියා කරන්නේ නැත් නම්, මීට කලින් අපේ සංගම්වලට කර තිබෙන අන්දමටම ඒ සංගමයත් විසුරුවා හැර එය ගරු ඇමතිතුමා අතට ගන්නය කියා මා ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමා හදිසි නීතිය පාවිච්චි කර පානදුරේ සමුප කාර සංගමය විසුරුවා හැරියා. එහි සභා පතිට හෝ කාරක සභාවට හෝ නොදන්වා, කළ වැරදි මොනවාදැයි නොකියා, පැමිණිලි ඉදිරිපත් නොකර, විභාගයක් නොපවත්වා හදිසි නීතිය යටතේ හිටි ගමන් ඒ සමුප කාර සංගමය විසුරුවා හැර එය තමුන් නාන්සේගේ පාලනය යටතට ගත්තා. ඒ විසුරුවා හැරීම සම්බන්ධයෙන් මතු කරන ලද ප්‍රශ්නවලට මේ දක්වා පිළිතුරක් ලැබී නැහැ. පිළිතුරක් නැතුව ඇතැයි මා හිතනවා. ඒ කාරණය මා අද ඉදිරිපත් කරන්නේ 4 වැනි වතාවටයි. ඒ සමුපකාර සංගමය විසුරුවා හරින්නට පෙර එහි නිල ධාරීන් පිරිසක් කොළඹ අවුත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා මුණ ගැසී, ඒ සංගමයට විරුද්ධව චෝදනා ඇති බවට දූසමාන ආරංචි ඇති බවත්, එසේ චෝදනා තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කළහොත් පිළිතුරු දෙන්නට පුළුවන් බවත් කිව්වා. එවිට ඒ කොමසාරිස්වරයා කියා තිබෙන්නේ එවැනි තත්ත්වයක් නැති බවයි. එසේ කියා ඒ පිරිස මුළා කර ගෙදර යැව්වා. ඊට පසුව සුමාන දෙකක් ඇතුළත ඒ සමුපකාර සංගමය විසුරුවා හැරියා. චෝදනා පවා ඉදිරිපත් නොකර ඒ අවස් ථාවේදී එසේ ක්‍රියා කළා නම්, සමුපකාර ව්‍යාපාරයේ දියුණුව පතනොත් මෙවැනි තත්ත්වයක් පවතින විට කිසිම පැකිළී මක් නැතිව තදින් ක්‍රියා කළයුතු බව මා ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි.

පූ. භා. 10.30

තව එක කාරණයක් ගැන කියන්නට ඕනෑ. සමුපකාර ව්‍යාපාරය ගැන සලකා බලන විට අපේ රටේ සමුපකාර ව්‍යාපාරය වැරදි විධියට හැදී තිබෙන බව කවුරුනුත් පිළිගන්නට ඕනෑ. අපේ රටේ සමුපකාර ව්‍යාපාරය හැදී තිබෙන්නේ උඩ සිටයි. පසුගිය යුද්ධ කාලයේදී ද්‍රව්‍ය බෙදා හැරීමේ මාර්ගයක් හැටියට කඩ සමිති ගණනක් ඉහළින් ඇති කළා. පහළින් ඇති වී තිබෙන්නේ ණය දෙන සමිති පමණයි. කෙසේ වුණත් ලංකාවේ සමුපකාර ව්‍යාපාර යට හොඳ අනාගතයක් තිබෙන බව මගේ විශ්වාසයයි. එසේ හොඳ අනාගතයක් ඊට ඇති වන්නට නම් නිෂ්පාදක යන්ගේ මාර්ගයෙන් සමුපකාර ව්‍යාපාරය ගොඩ නඟන්නට ඕනෑ. ඒ අනුව මා පසුගිය රජය පවතිද්දී මගේ කොට්ඨාශය තුළ සමුපකාර කුකුළු පට්ටි ඇති කර ඒවා සාර්ථක බව ඔප්පු කළා. ඊට පසුව සාකච්ඡා සම්මේලනයක් කැඳවා—සමුප කාර දෙපාර්තමේන්තුවත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත්, මහජන බැංකුවත් සැලසුම් දෙපාර්තමේන්තුවත් ඇතුළත් වන සේ සාකච්ඡා සම්මේලනයක් කැඳවා —සමුපකාර කුකුළු පට්ටි සාර්ථක ලෙස කරගෙන යන්නට පුළුවන් බව පෙන්නුම් කර දුන්නා. ඊට පසුව සැලැස්මක් යටතේ ශාස්ත්‍රානුකූලව හලාවත සිට අලුත්ගම දක්වා ප්‍රදේශය ඒ සඳහා වෙන් කර පළමුවැනි වර්ෂයේ සමිති 100 ක්ද, ඊළඟ වර්ෂයේ තවත් සමිති 100 ක්ද යනාදී පිළිවෙළට සමිති පිහිටුවා මේ වැඩ පිළි වෙළ ගෙන යන්නට කටයුතු සකස් කෙරෙව්වා. ඊට පසුව ආණ්ඩුව වෙනස් වුණා. පොල්ගහවෙල ගරු මන්ත්‍රීතුමා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් පත් වුණා. එදා පටන් ඒ වැඩ පිළිවෙළත් වෙනස් වුණා. සැලැස්මක් අනුව ක්‍රියා කිරීමේ පිළිවෙළ වෙනස් වුණා. මේ සම් බන්ධයෙන් ගරු කෘෂිකර්ම ඇමතිතුමා හෝ එතුමා යටතේ තිබෙන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ කෙළේ කුමක්ද?

මේ ව්‍යාපාරය සාර්ථක අන්දමින් ගෙන යෑම සඳහා අර "ඕප්ලිටර්" ක්‍රමයට බිත් තර දමන කිකිළියන් ඇති කිරීම අවශ්‍යයි. ඒ සඳහා පිටරටින් "පේරන්ට් ස්ටොක්" නම් වූ කුකුළු දෙමාපියන් ගෙන්වන්නට ඕනෑ. "පේරන්ට් ස්ටොක්" නම් වූ කුකුළු දෙමාපියන් ගෙන්වා ඔවුන්ගේ පැටවුන් බෙදා හරින්නට ඕනෑ. එදා ඒ "පේරන්ට් ස්ටොක්" යම්කිසි ප්‍රමාණයක් කට මේ රටට ගෙන්නුවා. එහෙත් මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණ්ඩුව බලයට පත් වුණායින් පසුව ඒ "පේරන්ට් ස්ටොක්" ගෙන්වීම සඳහා පුද්ගලයන් රාශියකට අවසර දුන්නා. ඒ අතර පුද්ගලයන්ද විශාල වශයෙන් කුකුළන් ඇති කරන්නට පටන් ගත්තා. පෞද්ගලික ධනපතියන් හා පෞද්ගලික සුළු ධනපතියන් මේ ව්‍යාපාරයට බැස්සා. ඒ අය මේ ව්‍යාපාරයට බැසීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. ඒ අය සමඟ තරඟ කරන්නට සමුපකාර ව්‍යාපාරයට පුළුවනි. සමුපකාර ක්‍රමය යටතේ ගෙවල්වල සිටින ස්ත්‍රී පක්ෂයයි කුකුළන් බලා ගන්නේ. පෞද්ගලික ධනපතියන් ඒ ව්‍යාපාරය කරගෙන යන විට ඒ සඳහා කම්කරුවන් යොදවන්නට ඕනෑ. එතකොට ඒ කම්කරුවන්ට පඩි ගෙවන්නට ඕනෑ. ඒ නිසා සමුපකාර ව්‍යාපාරයට පෞද්ගලික ධනපතියන් සමඟ තරඟ කරන්නට අමාරුවක් නැහැ. හැබැයි, මෙතැනදී ප්‍රශ්නයක් මතු වුණා. ඔය විධියට සීමාවක් නැතිව "පේරන්ට් ස්ටොක්" ගෙන්වා විශාල වශයෙන් කුකුළු පැටවුන් ඇති කරන්නට පටන් ගත් විට උන්ට වුවමනා කරන ආහාර මදි වුනා. ගමේ ගොඩේ කිකිළියන්ට වාගේ පණුවන් කා බිත්තර දමන්නට මේ කිකිළියන්ට බැහැ. මේ කිකිළියන්ට හොඳ ආහාර ඕනෑ. විශේෂයෙන්ම "මේස්" සහ "fපිෂ් මීල්" ඕනෑ. ඒවා ගෙන්වන්නේ පිටරටින්. හොඳ වර්ගවල පැටවුන් බෝ කරන්නට ඉඩ දුන්නාට පිටරටින් ගෙන්වන ඒ ආහාර ප්‍රමාණය වැඩි කළේ නැහැ. කලින් ගෙන්වූ ප්‍රමාණයමයි දිගටම ගෙන්නුවෙ. එම නිසා මේ කිකිළියන්ට ආහාර මදි වුණා. නියම විධියට ආහාර දෙන්නට බැරි වුණා. ඉතින් මොකක්ද කළේ? පුන්නක්කු මිශ්‍ර බාල ආහාර දෙන්නට පටන් ගත්තා. එම නිසා බිත්තර දැමීම පහළ බැස්සා. එයින් සමුපකාර සමිතිවලට විශාල පාඩුවක් වුණා.

මා මේ කරුණු ඉදිරිපත් කරන්නේ සැලැස්මක් අනුව මේ කටයුතු ගෙනයාමේ අවශ්‍යතාව පෙන්වා දෙන්නටයි. තමුන්නාන්සේ කෘෂිකර්ම ඇමති වශයෙන් පත් වන්නට පෙර තිබුණු සැලැස්ම තමුන්නාන්සේගේ ක්‍රියාවෙන් සම්පූර්ණයෙන්ම කණපිට පෙරළුණා. එම නිසා මේ අවසාන මොහොතේදීවත් සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්නට නම්, දූෂණ නැති කරන්නට නම්, අපක්ෂපාතව ක්‍රියා කරන අතරම, අළුත්ම පදනමක් මත විශේෂයෙන්ම නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති ඇති කිරීමටත්, මේ සැම වැඩ පිළිවෙළක්ම මුල සිට අග දක්වා යම් සැලැස්මක් අනුව කරන්නට පියවර ගන්න ලෙසත්, මා ඉල්ලා සිටිනවා.

**කේ. ඩබ්ලිව්. දේවනායගම් මයා.** (කල්කුඩා)

*(திரு. கே. டபிள்யூ. தேவநாயகம்—கற்குடா)*

(Mr. K. W. Devanayagam—Kalkudah)

Sir, permit me at the very outset to congratulate the Hon. Minister of Agriculture and Food on the tremendous effort that his Ministry and all his other departments have made in the food drive. If the food drive is what it is today, it is due to the untiring efforts of all the departments concerned and the Ministry put together. The initiative taken by the Hon. Prime Minister has been ably supported by this Ministry. In fact this step should have been taken from the day that we became politically independent. If that were done we would not be in the throes of an economic crisis today.

When I say that the departments concerned have taken a prominent part in the food drive, I specially refer to the Agriculture Department. Because of the extension services rendered by this department, the farmer has acquired a knowledge of modern methods of agriculture, and this has resulted in increased output. Today's farmer is not the ordinary farmer of a few years back. He knows exactly what he has to do in the selection of seeds, on the question of weedicides, on the question of manure. From the time of the preparation of soil right up to the time of harvesting the crop, he uses modern methods. That is why today we are on the road to self-sufficiency.

I would like to express my deep appreciation, in general, of the work done by the department and the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දේවනායගම් මයා.]

Ministry concerned and in particular of the excellent work the D. A. O. is doing in the Batticaloa District. Because of his efforts we are able today in some way to say that at least in the near future it will be possible for us to achieve self-sufficiency. I have time and again expressed in this House my disapproval of the way the cultivation committees are functioning in my area. I do not know what is happening in the cultivation committees in other areas. It was the intention of the Government, when it appointed these cultivation committees, that they should assist cultivators in these areas, but far from assisting the farmers they are a positive hindrance. It is in these cultivation committees that corruption starts. Not only do these culvitation committees not perform their duties, not only are they inefficient, they actually pocket 50 per cent of the funds provided for the works that they are expected to carry out.

True, corruption is endemic in every institution in this country. My hon. Friend the Member for Panadura (Mr. Leslie Goonewardene) said that there was corruption in the co-operative movement. Corruption is not confined to one particular movement or institution ; you find it everywhere in this country. And so long as the frailty of human nature lends itself to corruption, so long as human nature is what it is, you will find corruption in this country. The only way to prevent it is by having effective safeguards, and I hope that the Hon. Minister will take the necessary safeguards so that these cultivation committees may function properly.

In fact, in my district, at every cultivation committee meeting the farmers have requested that these committees be done away with and that we go back to the old system where the G. A. had complete disciplinary control over cultivation matters. Perhaps the Hon. Minister may think that it is a progressive step that we have taken in giving cultivators the right to control their own cultivation and that it will be a retrosgrade step to go back to the old system. But if " progressive " means inefficiency, indiscipline and corruption, then I prefer not to be progressive but to go back to the old system and be satisfied with the efficient control and supervision of cultivation that we had in these areas.

In my electorate a large section of the people belong to the Veddah community ; in fact, they form what I may describe as the backwater of my electorate, and it is they who said during the last elections, " We do not want language, we want a government that will give us something to eat. " They supported this Government despite the federal cry in my electorate. Because of their backwardness they depend mainly on chena cultivation. After this Government came into power these people were put back on the soil and a tremendous effort was made to give them a substantial means of employment. They were given land but irrigation facilities have been provided only in some parts and not in the entire area.

They are now faced with a problem. Their rations have been withdrawn from them because they were unable to pay back the loans given to them. These people have suffered losses during the rainy season due to crop failure. They are so poor that they depend mainly on their rations. I would therefore request you to give them a concession instead of applying the general rule and withdrawing the rations if they fail to pay back the loans. If they pay the interest on the loans I would request you to give back their rations and allow them to repay the loan during the following season.

I make this request because I am aware that this same concession has been made in other areas where there has been a crop failure. In those areas you have not merely given back the rations but also given them loans. In this case these people are

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

not asking for loans but that the rations should not be withdrawn from them if they pay the interest on the loans they have already taken.

පූ. භා. 10.45

The Hon. Minister is in charge of the co-operative movement. It is about 57 years since this movement was established in this country. It was your privilege, Hon. Minister, to have set up for the first time a commission to go into the entire working of the co-operative movement: to assess its benefits to the people, its weakness, corruption and various other aspects of the movement, and to make recommendations with regard to its reform and proper working. Very able persons were appointed to serve on this commission with Mr. Laidlaw as its chairman. Mr. Laidlaw is the best person one could think of to head a commission of this nature. He has had many years of experience in the International Co-operative Alliance. He has also been in India where conditions are similar to those in Ceylon and he has an intimate knowledge of local conditions there. He visited India and certain other countries along with our Ceylonese members of the commission. I think they have done a very good job of work. I believe their report is now in the hands of the Hon. Minister. I should like to request the Hon. Minister to implement this report as early as possible, because the co-operative movement in this country forms a vital element in assisting the Government at the present juncture with regard to the distribution of food. Not only the distribution of food but the entire scheme of agricultural credit depends on the co-operative societies. Perhaps those who live in the towns do not realize it, but to those who live in the villages the co-operative society is everything. Credit for the villager's agricultural purposes is siphoned through the co-operative society, what he produces is sold through the co-operative society, and his foodstuffs are distributed through the co-operative society. To effectively do this you must have a working system that functions properly.

In the co-operative movement you have a system that will always come to the assistance of this Government. During the scarcity of essential items you had competition between the private sector and the co-operative movement. With regard to milk foods, I must specially emphasize that when the distribution was given to the co-operatives the scheme was satisfactorily implemented. It is for that reason that I say that you will be pleased to implement that report as early as possible.

I must thank you on behalf of the Co-operative Federation for having given us the sole distribution of " Lakspray ". I believe this is the first time the Government has recognized the fact that if there is going to be a proper distribution it should be through the co-operatives. I shall not say it will be bereft of corruption. As I said, there is corruption everywhere, in every place. As the hon. Member for Katugampola (Mr. Subasinghe) when discussing the C. W. E. said, because there is corruption in the co-operative movement we cannot throw away the co-operative movement. I quite agree with his comment that it is not because there is corruption that the co-operative movement is bad but because we have not organized it properly. That job of organizing it is now in your hands, and I hope you will do it. Those people who have sat on this commission have gone into every aspect, especially into the aspect of corruption, and they have, I believe properly advised you in their report.

I think in the future we may be able to minimize corruption to a great extent because I believe they have done away with the system of single societies and suggested that there should be larger organizations. Chiefly the corruption is in the managers who get in as mere employees and take advantage of unknowing and ignorant villagers and then become the masters and a law unto themselves.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දේවනායගම් මයා.]

Another matter I would like to refer to with regard to the co-operative movement is the consumer union. In South East Asia there is the International Co operative Alliance, in which Ceylon also is represented, and I am the representative for Ceylon. We have on a number of occasions discussed co operative trade, but we have been unable to come to any conclusion because of the various trade agreements that are naturally entered into by the Government. Whatever proposals may be put forward by any other organization, it is impossible to have any kind of trade unless it is channelled through the Government. When I say "co-operative trade" it is a kind of barter system. There are countries from whom you now buy, and you pay in foreign exchange. But if there is a kind of co-ordination of the co-operative trade of different countries, you will not be put to the necessity of having to buy these things expending your foreign exchange. You will be able to barter the things that we produce. You can give to those countries things we produce and take from them things they produce.

Take for instance, the arrack trade. Arrack is in abundance in this country, and India wants it. At one of these discussions we found that we were unable to come to any agreement because there was some agreement with certain private dealers in regard to the arrack trade. Therefore I request you to investigate this aspect of it and to some extent permit co-operative trade in the form of barter.

There is one other matter I wish to speak on before I conclude. I understand that during the discussion of the Votes of the Home Ministry—I was not here—the hon. Member for Paddiruppu (Mr. Rasamanickam) had referred to me and to the hon. Second Member for Batticaloa (Mr. Latiff Sinnalebbe) when replying to a comment made by the latter about the Government Agent, Batticaloa, and the officers at the Batticaloa Kachcheri. The hon. Member for Paddiruppu had said that I have a phobia for getting government agents transferred. It is true that the predecessor of the present government agent was transferred as a result of representations I made, but I do not think it was fair for the hon. Member for Paddiruppu to have created the impression that I am against the present government agent. If the hon. Member for Paddiruppu wants to curry favour with the government agent, I would ask him to leave me out of it. If he wants to defend the government agent from the statements or allegations made by the hon. Second Member for Batticaloa, irresponsible or otherwise, why should I be involved ?

As far as the present government agent is concerned, I must say he does not require any defence by the hon. Member for Paddiruppu. He has been at Batticaloa for a considerable time and he has been discharging his duties well.

I do not want the hon. Member for Paddiruppu to put ideas into government servants' heads. This kind of idea is initiated by the Federal Party to give public servants the impression that it is taking up their cause.

There is another aspect to be considered. For instance, when he defends them saying that I have a phobia, it may be interpreted that Mr. Nesiah, the Government Agent, is also a pro-Federal Party government agent. It is most unfair to have made a statement like that and to have put the government agent into an embarrassing position.

**ඉරත්නම් මයා.**
*(திரு. இரத்தினம்)*
(Mr. Ratnam)

What about the Second Member for Batticaloa ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දේවනායගම් මයා.**
*(திரு. தேவநாயகம்)*
(Mr. Devanayagam)

I am not responsible for the statement made by the hon. Second Member for Batticaloa. It was very unfair to couple my name with what he had to say. Maybe the hon. Member for Paddiruppu had a reason for doing so. He may have thought he could up me on the wrong side with the government agent. But I want to say on the Floor of the House that he should not have done it. It was hardly fair. That was the last thing I expected from the hon. Member for Paddiruppu, the President of the Federal Party.

I know where I stand with the present Government Agent for Batticaloa. He is one of the finest gentlemen I have come across. It is very unfair of the hon. Member to have said that I have a phobia for betting government agents transferred.

I am making this statement because I want that gentleman to know the truth about these things. The hon. Member should not poison the minds of impartial government servants who are doing their duty and who will continue to do their duty irrespective of whether one belongs to the Federal Party or not.

In conclusion, I once more thank the Hon. Minister and the various departments under him for all that they have done.

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னக்கோன்—தம்புளை)*
(Mr. T. B. Tennekoon—Dambulla)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට ලැබුණ මේ අවස්ථාව මා ඉතාම වැදගත් කොට සලකනවා. නමුත් කෘෂිකර්මය වැනි රටට ප්‍රයෝජනවත් පළල් විෂයයක් ගැන මිනිත්තු දහයක් පහලොවක් තුල කථා කිරීම ඉතාම අසීරු කාරණයක් බව තමුන්නාන්සේ ඉදිරිපිටදී ප්‍රකාශ කරන්නට ඕනෑ.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

තමුන්නාන්සේගේ පක්ෂයේ මන්ත්‍රීවරුන් විසිඅට දෙනෙකුගේ නම් එවා තිබෙනවා. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විසිහතර දෙනෙකුගේත් පෙඩරල් පක්ෂයේ මන්ත්‍රීවරුන් තිදෙනෙකුගේත් නම් එවා තිබෙනවා. දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමාගේ නමත් එවා තිබෙනවා. ඉතින් මා මොනවා කරන්නද?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னக்கோன்)*
(Mr. T. B. Tennekoon)

තමුන්නාන්සේ කියන දේ මා භාර ගන්නවා. ඒ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මේ විෂය යටතේ කතා කරන්නට අවශ්‍ය වී තිබෙනවා. තමුන්නාන්සේට ඒ සියලු දෙනාටම අවසථාව සලසා දෙන්නට සිද්ධ වී තිබෙනවා.

කෘෂිකර්ම ඇමතිතුමාට විරුද්ධව මට කිසිම විධියකින්වත් දොසක් කියන්නට බැහැ. එතුමා බොහොම මහන්සි ගන්න ඇමතිවරයකු බව මා පළමුවෙන්ම කියන්නට සතුටුයි. එය එසේ වුණත්, මේ රටේ කෘෂිකර්මය පිළිබඳව ගෙන යන ප්‍රචාරවල හැටියට සාර්ථක ප්‍රතිඵල ලැබී නැති බව මා කණගාටුවෙන් කියන්නට ඕනෑ.

දඹුළු කොට්ඨාශය කෘෂිකර්මය අතින් විශාල දියුණුවක් ලබා තිබෙනවාය කියා ඉලක්කම් ඉදිරිපත් කරනවා. ඉලක්කම් දෙස බලන විට නම් කිසිම විධියකින්වත් අඩුවක් කියන්නට බැහැ. නමුත් දඹුළු කොට්ඨාශයේ ගෙයක් ගෙයක් පාසා ගොස් ඒ ජනතාවගෙන් මේ ඉලක්කම් හරිද කියා ඇසුවොත්, මේ ඉලක්කම් සම්පූර්ණයෙන්ම බොරුවක් බව ඔවුන් කියනවා ඇති. එපමණක් නොවෙයි.

1968 දී ගොවි රජවරුන් තේරුවා. ඒ ගොවි රජවරුන් තේරීමේදී මාතලේ දිස්ත්‍රික්කයෙන් පළමුවන තැනට ආවේ ගලේවෙල, ලබ්නගහවත්තේ සුලෙයිමාන් ලෙබ්බේ මහත්මයායි. සුලෙයිමාන් ලෙබ්බේ කළේ මොකක්ද? පැදුරක් උඩ තමයි මේ ගොයම් ගහන්නෙ. සුලෙයිමාන් ලෙබ්බේ මහත්මයා වී බුසල් දෙකක් පැදුර අස්සට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. තෙන්නකෝන් මයා.]

දැම්මා. ඒක ආදායම් පාලක නිලධාරිතුමාට අසු වුණා. මෙවැනි බොරු වැඩවලට මට එකතු වන්නට බැහැ. මා යනවා, කියා ආදායම් පාලක නිලධාරිතුමා ඒක අත්හැර ගියා. ඊට පසු වෙන කැල්ලක් කපන්නට එන කොට කුඹුරේ ගොයම් සම්පූර්ණයෙන්ම කපා අවසානයි. උන්නැහෙට කරන්නට දෙයක් නැහැ. ඉතින් පළමු ගණන ගත්තා. ඒ වී බුසල් දෙක නිසා ගණන් වැඩි වුණේ කොහොමද? එකක් නිසා 80 යි; දෙකට 160 යි. ඔය විධියට 273ක් හම්බ වුණා. ඔය මාතලේ දිස්ත්‍රික්කයේ කවදාවත් අක්කරයකට වී බුසල් 100කට වඩා කොහොමවත් අරගෙන නැහැ. හැබැයි තරඟවලදී නම් වැඩි වෙනවා. සාමාන්‍යයෙන් අස්වැන්න ලබන අය සියයකට වඩා කවදාවත් අරගෙන නැහැ. තරඟවලදී අස්වැන්න කොහෙන් වැඩි වෙනවද කියා මා දන්නෙ නැහැ. ඔය සුලෙයිමන් ලෙබ්බේ පළමුවැනි ගොවියා වුණ අතර, පනාම්පිටියේ බෙන්ජමින් පෙරේරා උන්නැහේ දෙවැනි ගොවියා වුණා. මේ ගොවි රජවරුන් සියලු දෙනාම පිළිගැනීම සඳහා තොරන් බැඳ ඔටුණු සාදා ඇඳුම් පළඳවා විශාල පෙරහැරකින් දඹුල්ලේ මහා විද්‍යාලයට ගෙන යැමේ උත්සවයක් දිසාපතිතුමා විසින් පිළියෙළ කළා. ගොවීන් 500ක් පමණ ඒ රැස්වීමට පැමිණ සිටියා. දිසාපතිතුමා ඒ උත්සව සභාවේ මුලසුන ඉසුළු අතර කථාවක් කිරීම පිණිස මටද ආරාධනා කර තිබුණා. සමුපකාර කොමසාරිස්තුමාත් සිටියා. කීප දෙනකු කථා කළාට පසුව මගේ වාරය පැමිණි අවස්ථාවේදී මා ඒ ගොවි රජවරුන් ඉදිරියේ කිව්වා, මේ ගොවි රජවරුන් අක්කරයකින් වී බුසල් දෙසිය තුන්සිය ගණන් අරන් තිබෙන බව අපට ආරංචිය, එහෙත් අපේ රටේ ඉස්පිරිතාලවලටත් බත් නැත. 12,500ක් පමණ සිටින දඹුල්ලේ ජනතාවගෙන් දෙවේල බත් කන්න පුළුවන් දෙසියයක්වත් නැත, මෙපමණ අස්වැන්න ලැබෙනවය කිව්වට කුඹුරුවලින් නම් ලැබෙන බවක් පෙනෙන්නට නැත, ඉතින් දෙසිය තුන්සිය ගණන් අස්වැන්න ලබන ගොවිරජවරුන්ට රටට වග කියන්න වේවිය කියා.

පූ. භා. 11

ඊට පසුව දඹුල්ලේ ගොවිරජකු වන බෙන්ජමින් පෙරේරා බලෙන්ම වාගේ නැගිට කතා කරමින් කිව්වා, "දිසාපතිතුමනි, මන්ත්‍රීතුමනි, මම දැන් ඇත්තක් කියන්නම්" කියා. කිව්ව ඇත්ත මොකක්ද? "ඒ ගොල්ලන් 221 හැටියට ගණන් දමා තිබුණාට මට තිබුණේ 141 යි. ඒ ගොල්ලන්ට ඕනෑ ගණන් දා ගත්තට මට කරන්න දෙයක් නැහැ" කියා ගොවිරජ්ජුරුවෝම කිව්වා. ඒ ගොවි රජ්ජුරුවන්ට මිනිස්සු ප්‍රසංසා කළා. තවත් කීප දෙනෙක් ඔය විධියටම කිව්වා.

අනික් කාරණය ග්‍රාම සේවක මහත්වරුන්ගෙන් ඇසුවාම තමන්ගේ කොට්ඨාශවල අස්වැන්න ගණන් ගන්නෙ කොහොමද කියා අපට දැනගන්න ලැබුණෙ මොකක්ද? එක වී ඇටයක් පැළ වෙන්න දමා පඳුරේ වී පැළ 11 ක් තිබුණොත් ඒ පැළ එකොළහේ ඇති කරල් 11 ගණන් අරගෙන එක කරලක ඇට 73ක් තිබුණොත් අර 11 මේ 73 න් වැඩි කර තමයි අස්වැන්න ගණන් ගන්නෙ. ඔය විධියට ඇට ගැනලයි, ගණන් සාදා තිබෙන්නෙ. ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ පසු ගිය මහ කන්නය සම්පූර්ණයෙන්ම මැරුණා. යල් කන්නය වැඩ කරගන්න බැරිවුණා. නමුත් අස්වැන්න නම් හරියාකාරව හොඳ ගණන්වලින් ලැබී තිබෙනවා. මහජනතාවගෙන් නම් වී ඇටයක්වත් නැහැ. එක කෝරළයක දැන් මිනිසුන්ට සම්පූර්ණයෙන්ම සහනදායක වැඩ දී තිබෙනවා. ඒ සහනදායක වැඩවලින් රුපියල් 30 කට වඩා මාසෙකට ලබාගන්න බැහැ. රුපියල් තිහේ ගණනට එන කොට නවත්වනවා.

ඒ සමඟම ඉනාමලුව, කෝරලේ, වග පනාහ පල්ලේ සිය පත්තුව, කෝරලේ කන්දපල්ල කෝරලේ ජීවත් වන අහිංසක දුප්පත් උදවියට, යම්කිසි සහනදායක වැඩවත් නුදුන්නොත් ඒ අයට ජීවත් වන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. විශේෂයෙන්ම කනදලම හා දේවහුව කියන්නේ විශාල වශයෙන් මුදල් වියදම් කර සකස් කළ ජනපද දෙකක් දැන් කන්දලම ජනපදයේ වතුර ඇත්තේම නැහැ. ඊයේ, විශාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොවි පිරිසක් ඇවිත් මට කීවා, අපට ජීවත් වන්න නම් පාරවල් කැපීම, ඇළ වේලි කැපීම වැනි කුලී වැඩවත් ලබා දෙන්නටය කියා. බොහොම භයානක තත්ත්වයක් ඇති වී තිබෙන බව ගරු ඇමතිතුමාටත් මෙයින් පෙනී යනවා ඇති. ඒක තමුන්නාන්සේගේ වරදක් කියා මා කියන්නේ නැහැ. නමුත් තමුන්නාන්සේට පෙන්වන ගණන්, පොත්වල තිබෙන ගණන්, රේඩියෝවෙන් ප්‍රකාශ කරන ගණන් වැරදි බව, ඒ ප්‍රදේශයෙන් එපමණ අස්වැන්න නොලැබෙන බව, පමණක් ස්ථිර වශයෙන් මතක් කර දෙන්නට මට සිදු වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය අයවැය විවාදයේදී මේවා ගැන මා සඳහන් කළ විට, කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමා (විජේසිරි මයා.) කියා තිබෙනවා. 1956 න් පස්සෙ හුළඟට ගසාගෙන ආපු මිනිහෙක් මේවා ගැන දන්නෙ කොහොම දැයි කියා. මා නම් හුළඟට හතර වාරයක් මේ ගරු සභාවට ඇවිත් තිබෙනවා. රත්නායක මහතාගෙන් පස්සෙ කිසිම කෙනෙකුට පිට පිටම හතර වාරයක් මෙම ගරු සභාවට මධ්‍යම පළාතෙන් පත් වී එන්න ලැබුණෙ නැහැ. කුණ්ඩසාලෙ මන්ත්‍රීතුමා මා ගැන දන්නේ නැතත්, උනන්නැහේගේ පියා නම් මා හොඳ හැටි දන්නවා. මහනුවර නගර සභාවට මා හත් වාරයක් පත් වුණේ හුළඟට ගසාගෙන විත් නොවන බව උන්නැහේගේ පියා නම් හොඳ හැටි දන්නවා ඇති. උන්නැහේගේ පියා, පියාගෙත් පියා—පිය මුතු පරම්පරාවම උත්සාහ කළා, මාව පරදවන්න. නමුත් බැරි වුණා. මා තව පාරක් දෙකක් හුළඟට ආවත් ඔය කියන උදවියටත් පර්වත මාර්ගයෙන් එන්නට පුළුවන් වෙයිද කියා බලමු.

කෙසේ වෙතත්, උන්නැහේ සඳහන් කර තිබෙනවා, තමන්ගේ පියා ගොවියකු නිසා ගොවිතැන ගැන කථා කරන්න පුළුවනිය කියා. ඒ මන්ත්‍රීතුමා උපදින්නටත් පෙර එතුමාගෙ පියා මා හොඳට හඳුනනවා. එතුමාගෙ පියාගෙ පියා, මව්ගෙ පියා, මව්ගෙ පියාගෙ පියා, ඔය ආදී හැම දෙනාම මා හොඳට දන්නවා. එතුමා ගොවිතැන් ගැන කථා කළත් ගොවිතැන් කරන කෙනෙක් නොවෙයි, ගොවිතැන් කරවන කෙනෙක් බව මා හොඳාකාර දන්නවා. ගොවිතැන් කරන ගොවීන්ට කෙසේ වෙතත් ගොවිතැන් කරවන ගොවීන්ට නම්, යම් යම් ආදායම් තිබෙන බව, යම් තත්ත්වයන් තිබෙන බව, මුදල් වියදම් කළ තරමට බිස්නස් එකෙන් ලාභ ලැබෙන බව, අප කවුරුත් දන්නවා. නමුත් ගොවිතැන් කරන ගොවීන් තමයි අද අමාරුවෙන් ජීවත් වන්නෙ.

අප පළාතේ දුම්කොළ ගොවිතැන ගැනත් මේ අවස්ථාවේදී යමක් සඳහන් කිරීම වැදගත් යයි මා කල්පනා කරනවා. ධනපති වෙළඳුන්ගේ ඒකාධිකාරී වැඩ පිළිවෙළ නිසා දුම්කොළ වගා කරන දුප්පත් ගොවීන් අමාරුවේ වැටී සිටින බව පෙන්නා දෙන්න ඕනැ. මෙවර පැවති නියඟය නිසා, බීඩි දුම්කොළ, සුරුට්ටු දුම්කොළ සහ සිගරට් දුම්කොළ යන වර්ග තුනම සාර්ථක අන්දමින් වගා කරන්න බැරි වුණා. විශේෂයෙන්ම සිගරට් සෑදීම සඳහා ගන්න දුම්කොළ එක්තරා ගණනකට විකුණා ගන්නට පුළුවන් කම ලැබුණත්, බීඩි දුම්කොළ සඳහා ගෙවන්නේ ඉතාමත් අඩු මුදලක් බව කියන්න ඕනැ. විශාල ධනපති වෙළඳුන්, දුම්කොළ ලබාගන්න ඕනැ මෙන්න මේ මිලටය කියා වෙළඳුන් අතරේ මිල ගණන් නියම කර ගෙන තිබෙන නිසා, සාධාරණ මිලකට දුම්කොළ ටික විකුණාගන්න ගොවීන්ට ඉඩ ප්‍රස්තාව ලැබී නැහැ. රාත්තලක් රුපියල ගණනේ අසරණ ගොවීන්ගෙන් මිල දී ගන්න වෙළඳුන් රාත්තල රුපියල් හතර පහ ගණනේ විකුණා විශාල ලාභ ලබා ගන්නවා. වගා කරන ගොවියාට ඒ ලාභය ලැබෙන්නෙ නැහැ. ලොකු කොම්පැණිකාරයන් අපේ ප්‍රදේශවලට ඇවිත් අක්කර 50, 60, 100, 200 පමණ විශාල ඉඩම් අරගෙන දුම් වගාව කරවනවා. වී වගා කරන ගොවීන්ට මෙන්ම දුම් වගා කරන ගොවීන්ටත් ඒ නිසා සිදු වී තිබෙන්නේ, කුලීකාරයන් වශයෙන් ඒ ලොකු කොම්පැණිකාරයන්ගේ ඉඩම්වල දුම් වගා කරන්නටයි. දුම්කොළ මිළයට ගන්නා කොම්පැණි එකතු වී යම්කිසි සම්මුතියක් ඇති කරගෙන ඉතා අඩු මිළකට දුම්කොළ මිළ දී ගන්නා නිසා, තමන්ගේම ඉඩම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

වල දුම් වගා කරන ගොවීන්ටවත් සාධාරණ මුදලක් ලැබෙන්නේ නැහැ. එම නිසා, පසුගිය අවුරුදුවලදීත් මා ඉල්ලා සිටි පරිදි, රජය මැදිහත් වී ඔවුන්ගේ දුම්කොළවලට සාධාරණ මිළක් ලබා දීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස මා අදත් මතක් කරනවා. එවැනි වැඩ පිළිවෙලක් ඇති නොකළොත් නම්, දුම් වගාවේ යෙදෙන ගොවීන්ට කිසිදුක යහපතක් සිදු වන්නේ නැහැ.

එක්තරා මන්ත්‍රීවරයකුගේ නැරව්ව ඇතිව කම්ස 20,000 ක් එක්තරා සමුපකාර සංගමයකට දී තිබෙන බව සමුපකාර කොමිෂන් සභාවේදී ප්‍රකාශ වී තිබෙනවා. මම 1930 සිටම සමුපකාර ව්‍යාපාරයේ යෙදුණු, සමුපකාර සමිති සමාගම්වල කාරක සභාවල වැඩ කළ කෙනෙක්. මහ නුවර සමුපකාර සංගමයේ ඉතා පැරණි හා ප්‍රබල සාමාජිකයෙක් වශයෙන් සමුපකාර ව්‍යාපාරයේ දියුණුවට මා විශාල වැඩ කොටසක් කර තිබෙනවා. සමුපකාර ව්‍යාපාරය ප්‍රචාරය කිරීම සඳහා සමුපකාර සමිති සංගම් මඟින් පැවැත්වුණු සම්මේලනවල මා දවස් ගණන් කථා කර තිබෙනවා. එසේම සමුපකාර සංවර්ධනය සඳහා උපකාරී වන පොත් රාශියක් මා ලියා තිබෙනවා. එහෙත් 1956 දී මහජන මන්ත්‍රීවරයකු වූ වහාම මා එතෙක් සේවය කළ සමුපකාර සමිති කාරක සභාවලින් ඉවත් වුණා. මහජන මන්ත්‍රීවරුන් සමුපකාර සමිති සංගම්වල කටයුතුවලට ඇඟිලි ගැසීම වරදක් ලෙස මා කල්පනා කරන නිසායි, මන්ත්‍රීවරයකු වූ වහාම මා ඒවායින් ඉවත් වුණේ. අපේ රජය පැවැති කාලයේදී අපේ පක්ෂයේ මන්ත්‍රීවරුන් සමුපකාර සමිති සංගම්වල සිටියා නම් එයත් වරදක් බව මා කියනවා. මොන පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හෝ වේවා සමුපකාර සමිති සංගම්වල වැඩ කටයුතුවලට ඇඟිලි ගැසීම වරදක්. මන්ත්‍රීවරුන් ඉතා පහත් අන්දමින් එවැනි ඇඟිලි ගැසීම් කරන නිසා සමුපකාර සමිතිවල නොයෙකුත් දූෂණ ඇති වන බවට බරපතල චෝදනා නැඟී තිබෙනවා. ඒවායේ ඇත්ත නැත්ත කොහොම වුණත් මහජනතාව එවැනි පැමිණිලි කර තිබෙන බව අප දන්නවා. එම නිසා, සමුපකාර සමිති සංගම්වල කටයුතුවලට ඇඟිලි ගැසීම මන්ත්‍රීවරුන්ට තහනම් කිරීම සඳහා නීති රීති පැනෙව්වත් කමක් නැහැ.

පපඩම් හදන්නත් අද ලොකු අමාරුකම් මැදයි, ජීවත් වන්නේ. එම නිසා පපඩම් හදන්නන්ගේ ඒ අමාරුකම් ගැනත් ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

දඹුල්ලට ලැබෙන ආහාර තොග ප්‍රමාණවත් නොවන බව දඹුල්ල නගරයෙ ප්‍රසිද්ධ වෙළඳුන් මා සමඟ කියා තිබෙනවා. එම නිසා ඒ ප්‍රදේශයේ අවශ්‍යතාවට සරිලන තරමේ ආහාර තොග සපයන ලෙස මා ඉල්ලා සිටිනවා. මට නියමිත කාලය අවසාන යයි මා හිතන නිසා මගේ වචන ස්වල්පය මෙයින් නවත්වනවා.

**වී. ඒ. අලගකෝන් මයා.** (මන්නාරම)
(திரு. வி. ஏ. அழகக்கோன்—மன்னார்)
(Mr. V. A. Alegacone—Mannar)

Mr. Chairman, I must thank you for the opportunity afforded to me to speak a few words on this Vote.

I must thank the Hon. Minister for what he is doing not only in my district but throughout the entire country towards making Ceylon self-sufficient in food.

I shall not be long. I just want to point out to the Hon. Minister certain drawbacks that are peculiar to my district.

Agricultural loans have been issued to the farmers in my electorate. Unfortunately there has not been any cultivation for the last three years because there has been no rain. Then how can the farmers repay their loans? They do only agricultural work, and if there is no cultivation how do you expect them to repay their loans? They are destitute. They are starving.

Officers in Colombo sit at their desks and draw up schemes for the whole Island but they should

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

remember that different conditions prevail in different districts. For example, the weather and climatic conditions in my district are different from those in other districts.

Those are matters that should be taken into account in the repayment of loans. But what has happened? Coupons have been cut off from the rice ration books of the cultivators for not repaying the loans. How can they repay their loans when they have not cultivated their lands? They have not deliberately defaulted? They have not been able to repay the loans through no fault of their own. It is an act of God. God has been unmerciful to these poor peasants who have had no water whatsoever to do their cultivation. And these officers who sit at their desks and make calculations should consider these things and not try to penalize the poor cultivators by forcibly cutting off the coupons from the rice ration books.

පූ. භා. 11.15

You will be surprised to hear this. I went to Vavunikulam and spent three days there. There was hardly any water to drink or for toilet purposes. I had to wash with one glass of water. The wells had gone dry. Everything had gone dry. And how can you expect the cultivators to repay the loans? As I said, Sir, the people are destitute and starving.

In the circumstances I ask that some relief be afforded to these people. I know that you may not be able to waive the loans, but at least you can give extensions of time for the repayment of the loans.

There were one or two good showers on the 15th of August and these people were able to plough the land. Now there is no seed paddy available.—[*Interruption*]. I thanked the Minister for the good work he has done and is doing not only in my district but throughout the Island.—[*Interruption*]. The food drive has nothing to do with this. I am now bringing to the notice of the Minister the reason why the cultivators in my area cannot repay their loans. It is an act of God.

පී. ජී. බී. කෙනමන් මයා. (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)
*(திரு. பி. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)*
(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

Bring a Motion of No Confidence against him!

අලෙගකෝන් මයා.
*(திரு. அழகக்கோன்)*
(Mr. Alegacone)

In fact, 90 per cent of the land has been ploughed but the people have no seed paddy to sow. I ask that seed paddy be given to them free. If that is not possible, then I say that they must be given a loan to purchase seed paddy and that loan should be recovered from. them later on.

Here, the government agent is keeping quiet. I pleaded with the government agent and the assistant commissioner of co-operative development, and I even wrote to the Ministry pointing out the necessity to help the poor peasants in my electorate. But they have not replied to me yet. I do not know what has happened. It is for that reason that I am raising this matter on the Floor of this House. It affects not only my district but also the Kilinochchi District where similar conditions prevail. I would ask the Hon. Minister to give these farmers relief immediately. If you do not give them the other loans, I would ask you to give them at least a loan to purchase their seed paddy.

A lot of talking is done by officers in the district. They tell the farmers that they must plough in time, that they must sow in time, that they must use fertilizer in time. But what happens usually? When they plough the land they find they have no seed paddy. When they get the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අලගකෝන් මයා.]

seed paddy they find that there is no fertilizer for use. These are all things that should be given in time. There is no use in cultivating the land without fertilizer because it does not give a good yield. These are matters which you must go into carefully because each district requires separate action by you. There is no use in having officers to plan for you a general programme of work for the whole of Ceylon. The districts too must be served at the same time separately.

As I told you, in my district 90 per cent of the land has been ploughed but the farmers have no seed paddy They cannot do dry cultivation. Even if they do, they would not get a good yield. Therefore, they are waiting for the necessary facilities. When they do not get them they come and complain to me. I in turn complain to the government agent. If he too does nothing, I write to you. Even after writing to you nothing has been done. If cultivation is done in time the farmers would get a good yield. If there is a good yield and if you help the farmers in time, you can do something towards increasing the farmers' enthusiasm for the food drive. I would ask the Hon. Minister to attend to my complaint immediately. There is no use in giving a loan at a later date.

I should also like to refer to the position of the co-operative societies in my district. In the Vavunikulam area there are co-operative societies belonging to the colonization schemes. Our co-operative societies are outside the scheme. There are five or six such societies not belonging to the colonization schemes but working outside the scheme. Officers pay visits to these co-operative societies. Unfortunately, most of the co-operative societies working within the colonization schemes have been taken over to the Jaffna District. I sent a letter to Mr. Silva asking him to transfer those co-operative societies back to my district. He promised to do so, but nothing has happened. They have not been transferred. I pressed for it last month. I press for it every month and they do not seem to be interested. It appears as if it is their policy to take over all the co-operative societies under the bigger unions. But that is one thing that I would not tolerate. My area must be administered by our government agent. For all administration work in my district it is the Government Agent, Mannar, who is responsible. The major portion of the land is also situated within the jurisdiction of the Mannar District. But when they hand over these co-operative societies to the Jaffna District, the people in the Vavunikulam Colonization Scheme find it difficult to travel to Jaffna. Even they are asking that those societies be transferred back to Mannar. It is only for official dealings connected with agriculture that they have to go to Jaffna ; their other matters are attended to in Mannar.

This is a situation against which I have protested all along. The people of the area too have protested against such a situation, but, unfortunately, I am unable to get the officials to do anything. It is for that reason that I am bringing all this to the notice of the Hon. Minister here. Mannar is a smaller area and if they are made to join a bigger area like Jaffna they are going to be neglected in the process. I appeal to you to return the co-operative societies in my area to Mannar District. Then they will be able to do much better work than they have been doing hitherto.

Another matter is this. There were a number of farms in the Mannar District which were being closed down day by day. There were goat breeding farms, a central poultry breeding farm. All are being gradually closed down and we are left with nothing. The animal breeding farm is gone. The poultry breeding farm is gone. All of them have been transfered somewhere else.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජෝර්ජ් රාජපක්ෂ මයා.** (මුල්කිරිගල)
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—முல்கிரிகல)*
(Mr. George Rajapaksa—Mulkirigala)

Where, to Jaffna ?

**අලගකෝන් මයා.**
*(திரு. அழகக்கோன்)*
(Mr. Alegacone)

They have been transferred outside. I do not know where. We are the people who have been suffering as a result and I hope that the Government will restore all the farms back to us. These centres for animal and poultry breeding must all be restored to us because we are people who are living in a backward area and these amenities should not be denied to us. We must also advance. We must also progress.

I am sorry that the hon. Member for Kalkudah (Mr. Devanayagam) has been mentioning certain things. There is always a party strife. It may be a matter between him and the hon. Member for Paddiruppu (Mr. Rasamanickam). In fact he never mentioned anything about the hon. Member for Kalkudah. In spite of that, these people want to drag in and belittle our party. The party is always dragged in. If there is any feud between the two of them, let them settle it, and let them not try to decry our party and bring discredit to the party. These are the usual tactics they are adopting in this House.

I am very sorry, Sir, that these things are taking place here. If the hon. Second Member for Batticaloa (Mr. Latiff Sinnalebbe) had said something against the government agent, and if it is denied by another Member, it is not for the hon. Member for Kalkudah to question him. It is his duty to talk to the hon. Member for Paddiruppu and find out what it is, instead of going and condemning the party.

I thank you very much for listening to my speech patiently.

I exhort and request the Ministers to look into the matters that I have pointed out, and to take action immediately. Otherwise our crop will be a failure this year also.

**ඩී. බී. රණතුංග මයා.** (කොත්මලේ)
*(திரு. டீ. பி. ரணதுங்க—கொத்மலே)*
(Mr. D. B. Ranatunga—Kotmale)

ගරු සභාපතිතුමනි, ජාතික රජයේ 5 වන අයවැය ලේඛනය පිළිබඳව පවත්වා ගෙන යන මෙම කාරක සභා අවස්ථාවෙහි දී අපට පැහැදිලි ලෙස පෙනී යන දෙයක් තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ ඉදිරිපස ආසනවල සිටින බලගතු මන්ත්‍රීවරුන්ගේ කොතරම් බලපෑම් තිබුණත් ඒවාට යට නොවී සිතට එකඟව අවංකව කථා කරන විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් ගරු මන්ත්‍රීවරුන් අපේ කෘෂිකර්ම ඇමතිතුමාගේ වගා ව්‍යාපාරය සම්බන්ධයෙන් ප්‍රශංසා මුඛයෙන් කථා කරන බව පෙනෙන්නට තිබෙනවා. [බාධාකිරීමක්] තමුන්නාන්සේලාගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු වන දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) තමන්ගේ කථාව ආරම්භ කළේ අපේ කෘෂිකර්ම ඇමතිතුමාගේ වගා ව්‍යාපාරයට ප්‍රශංසා කරමිනුයි. තත්ත්වය එසේව තිබියදී තමුන්නාන්සේලා මොන හේතුවක් නිසා සිතට විරුද්ධව කතා කරනවා දැයි මා දන්නේ නැහැ. මෙම විවාදයෙහි දී කෘෂිකර්මය පිළිබඳව දී ඇති ගණන් හිලව් ගැන සාකච්ඡා කරන විට යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) පෙන්වා දුන්නා එහි තිබෙන යම් යම් දෝෂයන්. එම ගණන් හිලව්වල අඩුපාඩු නැතැයි අප කියන්නේ නැහැ. සමහරවිට එම ගණන් හිලව්වල අඩුපාඩු තිබෙන්නට පුළුවනි. දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා අක්කරයකට ලැබෙන ආදායම්වල යම් යම් වෙනස්කම් තිබෙන බව. ඒ කෙසේ වෙතත්, අප අවංකව පිළිගත යුතු කාරණයක් තිබෙනවා. එනම්, 1965 සිට මේ දක්වා අප බලාපොරොත්තුවෙන් සිටියාටත් වඩා හොඳින් වගා ව්‍යාපාරය සාර්ථක වී තිබෙන බව. ඒ නිසා ගොවිජන කොට්ඨාශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මා පළමුකොටම මගේ ප්‍රශංසාව අපේ ගරු කෘෂිකර්ම ඇමතිතුමාට පුද කරන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රණතුංග මයා.]

1965 ජාතික රජය ආරම්භ වන විටම කෘෂිකර්ම ඇමතිතුමා පස් අවුරුදු සැළැස්මක් ඉදිරිපත් කළා. එතුමා විසින් 1965 දී පවත්වන ලද කථාවකින් ඒ ගැන පැහැදිලි ප්‍රකාශයක් කරන්නට යෙදුණා. විරුද්ධ පාර්ශ්වයේද සහයෝගය ඇතුව මේ රටේ වී නිෂ්පාදනය අතින් පමණක් නොව අනිකුත් දේ අතින්ද ස්වයංපොෂිත භාවයක් ඇති කිරීම සඳහා කටයුතු කරන බව එතුමා එදා කිව්වා. එම වැඩ පිළිවෙලින් සාර්ථක ප්‍රතිඵල ලැබී තිබෙන බව මේ අවුරුද්දේ ඉදිරිපත් කරන්නට යෙදුණු ඇස්තමේන්තු දෙස බලන විට අපට පෙනී ගියා. එදා අප බලාපොරොත්තු වූ ඉලක්කය පවා පැන ගොස් තිබෙන බව ඒ අනුව ඔප්පු වෙනවා. එහෙත් ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව යම් කිසි අඩු පාඩුවක් තිබෙනවා. කෘෂිකර්ම අංශයත් ඉඩම් අංශයත් වාරිමාර්ග අංශයත් අතර ඒකාබද්ධතාවයක් නැති එකයි එම අඩු පාඩුව. එම නිසා රටට ලොකු පාඩුවක් සිදු වෙනවා. අපේ කෘෂිකර්ම ඇමතිතුමාත් ජාතික රජයේ නායකතුමාත් ආහාරයෙන් රට ස්වයංපොෂිත කිරීම පිළිබඳව ලොකු ආශාවකින් සිටින බව පැහැදිලියි. මේ රට ආහාරයෙන් ස්වයංපොෂිත කිරීම සඳහා නිතරම වගා කරන්නට සූදානමින් සිටින ගොවීන් අනන්තවත් අපට දකින්නට ලැබෙනවා. විශේෂයෙන් උඩරට පළාත්වල එවැනි පිරිස් සිටින බව මතක් කරන්නට කැමතියි. මා පුද්ගලික වශයෙන් දන්නවා කොත්මලේ ආසනයේ ඒ අන්දමේ උදවිය සිටින බව. එම උදවියට අවශ්‍ය වන්නාවූ ඉඩම් ප්‍රමාණයන් ජනපද යනාදියෙන් කෙසේ හෝ ලබා දෙනවා නම් රජයේ ආධාර ඇතත් නැතත් තමන්ගේ වියදමින් වේවා එම වැඩ කටයුතුවල නිරත වන්නට ඔවුන් සූදානමින් සිටින බව කියන්නට කැමතියි. එම නිසා, කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නට කැමතියි මේ රට ආහාරයෙන් ස්වයංපොෂිත කිරීම සඳහා සූදානමින් සිටින එවැනි ජනතාවට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලෙස. අද ගොවීන්ට ඉඩම් බෙදා දීමේ කටයුතුවලදී ඉඩම් අමාත්‍යාංශයේ ඇතැම් ක්‍රියා මාර්ග, නිසා නා නා අන්දමේ අඩුපාඩු සිදු වන බව පෙනෙනවා. එහෙත් මේ රටේ වගා ව්‍යාපාරය ඉදිරියට ගෙන යාම සඳහා පුරෝගාමීව කටයුතු කරන්නට බලාපොරොත්තුවෙන් සිටින එම ගොවි ජනතාවට අවශ්‍ය වන්නාවූ ඉඩම් ලබා දීම සඳහා ක්‍රියා කරන්නට තමුන්නාන්සේට පුළුවන්කම තිබෙන බව මතක් කරන්නට කැමතියි.

පූ. භා. 11.30

ගරු ඇමතිතුමා විශේෂයෙන් දන්නවා ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ගොවීන් සම්බන්ධව. 1947 පමණ තමුන්නාන්සේලාගේම රජයක් මගින් තමන්කඩුව පළාතට එම ප්‍රදේශයේ ගොවීන් ගෙන ගොස් එහි පදිංචි කෙරෙව්වා. වගා කටයුතු අතින් ඇත්ත වශයෙන්ම අද එම ප්‍රදේශය ඉතාමත් උසස් කීර්තියක් උසුලන බවට ඒ පළාත්වල සිටින දිසාපතිවරුන් සාක්ෂි දරනවා ඇති. තත්ත්වය මෙසේ හෙයින් අපේ පළාත්වල වෙසෙන එවැනි ගොවි ජනතාවට වගාව සඳහා වුවමනා කරන ඉඩම් ලබා දීම සඳහා පියවර ගන්නා ලෙස කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඇමතිතුමා මගින් හෝ එම කටයුත්ත කෙරෙනවා නම් එතුමා බලාපොරොත්තු වෙනවාටත් වඩා ඉක්මණින් ඉලක්කය කරා අපට ළඟා වන්නට පුළුවන් වෙනවාට සැකයක් නැහැ.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම කටයුතු පිළිබඳව කතා කරන විට, නුවරඑළිය ප්‍රදේශයේ දැන් සිටින දිසාපතිතුමාට ප්‍රශංසා කරන්නට ඕනෑ. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) එම පළාතේ කෘෂිකර්ම අංශයෙහි නිලධාරීන් ගැන පමණක් නොව අනිකුත් නිලධාරීන් ගැනද ඉතා බරපතල චෝදනා ඉදිරිපත් කර තිබෙනවා. එම අවස්ථාවෙහි දී මා මෙම ගරු සභාවෙහි සිටියේ නැහැ. එහෙත් එවේලේ මෙහි සිටි වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (පර්සි සමරවීර මයා.) ඊට නිසි පිළිතුරු දී තිබෙනවා. 1969 දී නුවරඑළියේ කෘෂිකර්ම ප්‍රදර්ශනය භාරව කටයුතු කළ ඉඩම් නිලධාරීතුමා වන බන්දුල සිල්වා මහතා ගැන තමුන්නාන්සේලා හොඳින් දන්නවා. ඉඩම් පිළිබඳ කටයුතුවලදී පමණක් නොව කෘෂිකර්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කටයුතුවලදීද නුවරඑළිය දිසාපතිතුමාට ඉතා හිතවත්ව මහන්සියෙන් වැඩ කරන නිලධාරියකු හැටියට අපට ඒ මහතාව හඳුන්වා දෙන්නට පුළුවනි. වලපනේ ගරු මන්ත්‍රීතුමා බොහොම බරපතල චෝදනාවක් කළා. නුවරඑළියේ ඉඩම් නිලධාරිතුමාට රු. 250 ක් දුන්නාම ඉඩම් කෑබැල්ලක් ගන්න පුළුවන්ය කියා.

**ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)
*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனே)*
(Mr. T. B. M. Herath—Walapane)

මම කිව්ව ඒ ගැන විභාග කරන්නය, මම එය ඔප්පු කරනවාය කියා. කෝ, අද වනතුරු ඇමතිතුමා විභාග කළාද? [බාධා කිරීමක්]

**රණතුංග මයා.**
*(திரு. ரணதுங்க)*
(Mr. Ranatunga)

මේකට අවස්ථාවක් තිබෙනවා. ඇමතිතුමා ඕනෑ නැහැ; දිසාපතිතුමාට මේ ගැන විභාගයක් කරන්න පුළුවන්කම තිබෙනවා. මම තමුන්නාන්සේට අභියෝග කරනවා—

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

පෞද්ගලික අභියෝගයක් නම් මා භාර ගන්නටත් ලැහැස්තියි; පිළිතුරු දෙන්නටත් ලැහැස්තියි.

**රණතුංග මයා.**
*(திரு. ரணதுங்க)*
(Mr. Ranatunga)

දිස්ත්‍රික්ක සම්බන්ධතා කමිටුවේත් තමුන්නාන්සේ සූදනම් වුණා—[බාධා කිරීමක්]

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

දිස්ත්‍රික්ක සම්බන්ධතා කමිටුව මට වුවමනාවක් නැහැ; මම කිව්වෙ මම දන්න දේයි.

**රණතුංග මයා.**
*(திரு. ரணதுங்க)*
(Mr. Ranatunga)

දිසාපතිතුමාට මේක විභාග කරන්න පුළුවන්.

කෘෂිකර්ම කටයුතු හෝ වෙනත් කටයුතු හෝ සම්බන්ධයෙන් උනන්දුවකින් වුව මනාවකින් කටයුතු කරන යම් නිලධාරි පිරිසක් සිටිනවා නම් ඒ උදවියට විරුද්ධව මේ විධියේ අයුතු චෝදනා ඉදිරිපත් කර ඒ නිලධාරීන් මොට කරන්නට එපා කියායි මා ඉල්ලා සිටින්නේ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒ නිලධාරීන් කරන වැරදි කියන්නට බැරිද?

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

තමුන්නාන්සේගේ කථාවේදි ඒක කිව්වනෙ. දැන් උත්තර දෙන වෙලාව.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

උත්තර දෙන්න ඕනෑ, ඇමතිතුමායි.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

ඕනෑ කෙනෙකුට මෙතැන කථා කරන්ට පුළුවනි. තමුන්නාන්සේ නිශ්ශබ්දව ඉන්න.

**රණතුංග මයා.**
*(திரு. ரணதுங்க)*
(Mr. Ranatunga)

ගරු සභාපතිතුමනි, මේ වගා කටයුතුවල යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලීම් ටික ඕනෑකමින් සලකා බලන ලෙස ගරු කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඒ ඉඩම් නිලධාරිතුමා අවස්ථා කිහිපයකදී කෘෂිකර්ම නිලධාරිතුමාටත් කරුණු ඉදිරිපත් කර තිබෙන්වා. ඉඩම් අමාත්‍යාංශයේ යම් යම් ප්‍රමාද තිබෙනවා නම්, ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රණතුංග මයා.]
ප්‍රමාදයන් වළක්වා අපට ඉඩම් ලබා දීමට ඉක්මණින් ක්‍රියා කළොත් තමුන්නාන්සේ ගෙන යන වගා සංවර්ධනයට අපේ සම්පූර්ණ සහයෝගය නුවරඑළි දිස්ත්‍රික්කයෙන් ලබා දෙන්නට අපි සූදානම්. ඒ වගේම වගා කටයුතු සම්බන්ධයෙන් කෘෂිකම් හා ආහාර අමාත්‍යාංශය මීට වඩා ටිකක් උනන්දු වෙනවා නම් අපට මේ ඉලක්කය මීට වැඩිය හොඳින් සාර්ථක කර ගන්නට කොටස්කරුවන් වෙන්නට පුළුවන්.

ගරු අගමැතිතුමා ප්‍රථම වතාවට නුවරඑළි දිස්ත්‍රික්කයේ නිල ගමනක යෙදුණු අවස්ථාවේදී අපේ කෘෂිකම් ඇමතිතුමාත් ඉදිරිපිට මා ඉදිරිපත් කළ එක්තරා ඉල්ලීමක් මට මතක් වෙනවා. කොත්මලේ අල විගාව සම්බන්ධයෙන් සාර්ථක ප්‍රතිඵල ලබා තිබෙනවා. තැනින් තැන කර ගෙන ගිය සුළු අල වගාවලින් අපට විශාල ප්‍රයෝජන ලැබුණා. වැලිමඩ වගේ ප්‍රදේශවලට වඩා සාර්ථක ප්‍රතිඵල ලැබෙන අල වගාවක් කොත්මලේ ප්‍රදේශයේ තිබෙනවා. වැව්ලි සංස්ථාව මගින් තේ වැවීම සඳහා කිසිම තේරුමක් නැතිව කුඩාඔය ඉස්මත්තේ අක්කර දහස් ගණනක කැලැවක් එළි කරගෙන යනවා. අක්කර දහස් ගණනක තේ වගා කළාට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. එහෙත් ඒ අක්කර දහස් ගණනින් අඩු වශයෙන් අක්කර 500ක් වත් කොත්මලේ ජනතාවට ලබා දෙන්නට පුළුවන් නම් වැලිමඩ ජනතාවත් සමග තරඟයට අල වවා සාර්ථක ප්‍රතිඵල ලබා දෙන්නට අපි සූදානම් බව කෘෂිකර්ම ඇමතිතුමාට මතක් කරනවා.

නුවරඑළි දිස්ත්‍රික්කය ගැන කථා කරන විට සමූපකාර දෙපාර්තමේන්තුව ගැනත් කරුණක් කියන්නට ඕනෑ. දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) කිව්වා වාගේ කොත්මලේ සමූපකාර සමිති සංගමයත් දේශපාලනඥයන්ට හොඳටම ගොදුරුවෙලා තිබුණු තැනක්. සමූපකාර කොමසාරිස්තුමාගේ නියෝගය අනුව, කෘෂිකර්ම ඇමතිතුමාගේ අතිරේක ලේකම් ප්‍රනාන්දු මහත්මයාගේ උනන්දුව නිසා, දැන් නැවතත් ඒක ශුද්ධ පවිත්‍ර කර සමූපකාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරීක්ෂකවරයෙකුගෙන් හා තවත් පරීක්ෂකයකුගෙන් සමන්විත මණ්ඩලයකට භාර දී තිබෙනවා. එහෙත් අවාසනාවකට මෙන් නුවරඑළියේ සමූපකාර කාර්යාලයෙන් ඒ සංගමයට කිසිම සහයෝගයක් ලැබෙන්නෙ නැහැ. හේතුව මොකක්දැයි මා දන්නෙ නැති නිසා කිසිවෙකුට චෝදනා කරන්නට මට පුළුවන්කමක් නැහැ. අපේ කොත්මලේ සමූපකාර සමිති සංගමයෙන් ඉදිරිපත් කරන සෑම තීරණයකටම, සෑම ලියවිල්ලකටම, පිළිතුරු නොදී, අනුමැතිය නොදී, ඒවා පල් කරන සිරිතක් නුවරඑළි කාර්යාලයේ තිබෙනවා. කරුණාකර ඒ ගැන සොයා බලන ලෙස මා ඉල්ලා සිටිනවා. නුවරඑළියේ සමූපකාර උප කොමසාරිස්තුමා කොත්මලේ සමූපකාර සමිති සංගමයට නොසලකන්නේ මොකදැයි මා දන්නෙ නැහැ.

වගා ව්‍යාපාරය ගැන සඳහන් කරන විට අයවැය විවාදයේදී යම්කිසි මන්ත්‍රීවරයෙකු—මා හිතන්නෙ රත්තොට ගරු මන්ත්‍රීතුමා (යාලේගම මයා.) වෙන්නට ඕනෑ—එක්තරා ප්‍රකාශයක් කර තිබුණා. කෙලින්ම ප්‍රශ්නයක් අහලා තිබුණා. ඒ ගැන පුවත්පත්වල ලොකු අකුරින් පළ වෙළාත් තිබුණා. වගා ව්‍යාපාරය සාර්ථක වෙලා තිබෙනවාය කියනවා නම්, හාල්වලින් රට ස්වයංපෝෂිත වීමේ තත්ත්වය දැන් හුඟක් දුරට ළඟාවෙලා තිබෙනවා නම්, මුලින් දුන් ආකාරයට නැවතත් සතියකට සලාකය වශයෙන් හාල් සේරු 2 ක් නොදෙන්නේ මන්දැයි අහලා තිබුණා. ඇත්ත වශයෙන්ම මට පෙනෙන හැටියට නම් මෙය බොළඳ කථාවක් බව කියන්නට පුළුවනි. මෙවැනි බොළඳ ප්‍රකාශයක් කිරීමෙන් සිදු වන අනිෂ්ට විපාක ගැන කල්පනා කළ යුතුව තිබෙනවා. ඒ නිසා මම විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලීමක් කරන්නට කැමතියි. කරුණාකර ජාතියක් හැටියට කල්පනා කරන්න; කවදාවත් ජාතියට ඔය විධියේ පහත් හැඟීම් ඇති වන දේවල් කියන්න එපා. මෙවැනි පහත් දේවල් කියා අපේ ජාතිය නිකම් මොට කරන්නට එපා. කේරළයේත්, බොම්බායේත් දස දහස් ගණන් මිනිසුන් බඩගින්නේ මිය ගිය බව තමුන්නාන්සේ දන්නවා. හාල් සේරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙකක් දෙමින් සිට, පසු කාලයකදී එය හාල් සේරුවක් දක්වා අඩු කිරීම නිසා මේ රටේ එක් පුද්ගලයෙක්වත් බඩගින්නේ මිය ගියේ නැහැ. ඒ ගැන රටවැසියා දන්නවා. එය ආයුධයක් කරගෙන රටට අහිතකර දේවල් කරන්නට හොඳ නැහැ.

මේ රටේ දැන් වගා ව්‍යාපාරය සම්බන්ධයෙන් ප්‍රබෝධයක් ඇති වෙලා තිබෙනවා. ඒ අනුව දැන් මිනිසුන් උනන්දුවෙන් වැඩ කරගෙන යනවා. අපේ පරමාර්ථය හැටියට තිබෙන්නේ හාල්වලින්, ආහාරයෙන්, රට කවදා නමුත් ස්වයංපෝෂිත කිරීමයි. ඒ අරමුණ, ඒ ඉලක්කය කරා ගමන් කරන්න ජනතාව රුකුල් දෙන්නට ඕනෑ. ඒ ඒ දවසේ උපයා ගත් දේ ඒ ඒ දවසේ කා බී ප්‍රීති වී අනාගත පරම්පරාව නැති හංග කරන්නට යුතුකමක් අපට නැහැ. ඒක නොවෙයි අපේ පරමාර්ථය. කවර පක්ෂයකට අයත් වුවත් ආහාර වගාව පිළිබඳ උනන්දුව මොට කරන දේවල් කියන්නට හොඳ නැති බව ප්‍රකාශ කරන්නට කැමතියි. ඒ නිසා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මා ඉල්ලන්නේ, මේ හාල් සලාකයේ කතාව ඉදිරියට ගනිමින් විහිළු කරන්නේ නැතිව ජනතාවගේ අනාගත යහපතට අදාළ වැඩ කටයුතුවලට අවශ්‍ය ධෛර්‍යය දෙන ලෙසයි.

කෘෂිකර්ම ව්‍යාපාරය සම්බන්ධයෙන් අපේ ගරු ඇමතිතුමාත්, එතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීනුත්, දෙපාර්තමේන්තුවේ උදවියත් පසුගිය හතර අවුරුද්දක් පමණ වූ කාල සීමාව තුළ ගෙන ගිය වැඩ පිළිවෙළ, ඇත්ත වශයෙන්ම අවංක සේවයක් රටට සඳ ජාතියට ලබා දීමේ චේතනාවෙන් ගෙන ගිය වැඩ පිළිවෙළක් බව කියන්නට ඕනෑ. ඒ ගැන ජනතාවගේ ප්‍රසාදය අනුනව එතුමන්ලාට ලැබෙනවා. මින් ඉදිරියටත් රජයට සහයෝගය දෙමින් කෘෂිකාර්මික වැඩ කටයුතුවල යෙදෙන්නට සූදානමින් සිටින ජනකායට අවශ්‍ය ඉඩකඩම් ආදිය දී ඒ වැඩ කටයුතු ඉදිරියටත් ගෙන යෑමට සම්පූර්ණ සහයෝගය දෙනු නියතයි. ඒ නයින්, ගරු ඇමතිතුමාගේ ව්‍යාපාරය ඒකාන්ත වශයෙන්ම සාර්ථක වන බවට කිසිම සැකයක් නැති බව ප්‍රීතියෙන් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

ගරු සභාපතිතුමනි, ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කෙරෙන මේ විවාදයේදී පළමුවෙන්ම සමුපකාර දෙපාර්තමේන්තුව ගැන සඳහන් කරන්නට මම අදහස් කරනවා. එයිනුත් විශේෂයෙන්ම බදුල්ලේ විවිධ සේවා සමුපකාර සමිති සංගමය ගැනයි මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ. බදුල්ලේ විවිධ සේවා සමුපකාර සමිති සංගමය ගැන ගරු ඇමතිතුමා හොඳාකාර දන්නවා. ඒ සමිතියේ අතීතය පිළිබඳවත්, එහි දැන් පවතින තත්ත්වය පිළිබඳවත්, අනාගතයේදී ඒ සමිතියට ඇති වන්නට යන තත්ත්වය පිළිබඳවත් ගරු ඇමතිතුමා දන්නවා.

පසුගිය මහා මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා හැටියට මා සමග තරග කළ ජිනදාස සේනානායක මහත්මයා 1967 දී බදුල්ලේ විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ සභාපතිවරයා වශයෙන් ක්‍රියා කළ බව ගරු ඇමතිතුමාට මතක ඇති. සපමුකාර තොග වෙළෙඳ සංස්ථාවෙන් ලබා ගත් යකඩ හොණ්ඩර 200ක් රු. 6,445 කට හොර කඩයට විකිණූ බවට ලැබුණු චෝදනාවක් පරීක්ෂණයකින් පසු ඔප්පු වූ නිසා ගරු ඇමතිතුමා ඔහු සංගමයේ සභාපතිකමින් නෙරපා දැම්මා. ඒ ගැන ගරු ඇමතිතුමාට පළාතේ වාසීන්ගේත් මගේත් ස්තුතිය හිමි වෙනවා. තමන්ගේ පක්ෂයේම ස්තුතිය හිමි වෙනවා. තමන් පක්ෂයේම කෙනකු වුවත් හොරාට නියම දඬුවම දුන් නිසා මා ඇතුළු ජනතාව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. තවත් එක් කාරණයක් මෙහිදී සඳහන් කළ යුතුව තිබෙනවා. මොහු සභාපතිකමින් නෙරපූවා පමණයි; ඔහුට විරුද්ධව උසාවියට ගිහිල්ලා නැහැ තවම. ඒ නිසා ඒ ටිකත් කරන්නැයි මා ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි.

බදුල්ලේ විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ අද තත්ත්වය ගැන හිතා බලන්න. හිටපු සභාපතිවරයා එම තන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

තුරිත් නෙරපා දමනු ලැබීමෙන් පසු දැන් ඒ සමිති සංගමයේ දියුණුවක් ඇති වෙලා තිබෙනවා. පාඩුවට කරගෙන ගිය මේ සංගමයෙන් ලක්ෂ ගණනක් ලාභ ලැබී තිබෙනවා. දැන් හොඳින් වැඩ කරගෙන යනවා. එහෙත් ඊයේ පෙරේදා සිට ඒ ටිකත් කාබාසීනියා කර දමන විධියේ වැඩ පිළිවෙලක් ගෙන යනවා. ඒ ගැන ගරු ඇමතිතුමාට මතක් කරන්නට ඕනෑ. මේ සංගමයේ සභාපති කමට වියුඩර් සිල්වා විජේසේකර නම් වෙළෙන්දෙකු ඊයේ පෙරේදා සිට පත් කර සිටිනවා. සමුපකාර ව්‍යවස්ථාව යටතේ සකස් කරන ලද අතුරු ව්‍යවස්ථාවලට අනුව මෙවැනි සමුපකාර සංගමයක සභාපතිකමට තබා කාරක සභාවටවත් වෙළෙන්දෙකු පත් කරන්නට බැරි බව ගරු ඇමතිතුමා දන්නවා. මම එය කියවන්නම්. සමුපකාර අතුරු ව්‍යවස්ථාවල අංක 2 "උ" කොටසේ කාරක සභිකත්ව යට පත් වීමට නුසුදුසුකම් යටතේ මෙහෙම තියෙනවා :

"වෙළෙන්දෙක් හෝ මුදල් ණයට දෙන්නෙක් හෝ කම්කරු කොන්ත්‍රාත් කරුවෙක් හෝ මහා සභාවේ හෝ කොමසාරිස්තුමාගේ අදහස පරිදි, සමිතියේ දියුණුවට බාධක යම් කටයුත්තක තමාගේම හෝ අන් අයෙක් මාර්ගයෙන් හෝ යෙදී සිටින කෙනෙක්. . . . . ."

ඒ පිළිවෙළට මේ අතුරු ව්‍යවස්ථා අනුවත් වෙළෙන්දකු පත් කරන්න බැහැ. එහෙත් මොන බලපෑමක් නිසාද දන්නෙ නැහැ—ගරු ඇමතිතුමා මේ ගැන දන්නවාද දන් නෙත් නැහැ—මේ වෙළඳ මහත්මයා පත් කරන්න යන්නේ. සමුපකාර සංගමය මේ ගැන ගරු ඇමතිතුමාට ලිපියක් එවා තිබෙනවා. එහි පිටපතක් මටත් එවා තිබෙනවා. ගරු ඇමතිතුමාට එවූ ලිපියට පිළිතුරක්වත් නොලැබුණු බව මට කියා තිබෙනවා.

පූ. භා. 11.45

ඒ ලිපිය මම කියවන්නම් :

"ආහාර හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ගරු ඇමති

ඇම්. ඩී. බණ්ඩා මැතිතුමා,

ආහාර අමාත්‍යාංශය, කොළඹ.

ගරු ඇමතිතුමනි,

සී/බදුල්ල විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ සභාපති ලෙස වෙළෙන්දකු පත් කිරීමට ක්‍රියා කිරීම.

සීමාසහිත බදුල්ල විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ සාමාජික සමිතියක් වන සී/බදුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ කාරක සභා රැස්වීමක් 69.8.5 වෙනි දින පැවැත්වූ අතර එදින රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සභාසම්මත විය :—

"ඉහත නම් සඳහන් වියුඩර් විජේසේකර සිල්වා මහතා බදුල්ල නගරයේ ප්‍රසිද්ධ වෙළෙන්දෙකු පමණක් නොව වෙළඳ ඒජන්ත කෙනෙක්ය. එම නිසා ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථාව අනුව, වියුඩර් විජේසේකර සිල්වා මහතා මෙම සංගමයේ කාරක සභාවට හෝ එහි සභාපති ධුරයට නුසුදුසු බව ගරු ආහාර හා කෘෂිකර්ම ඇමතිතුමාට දන්වා යැවිය යුතු යයි, වයි. ඇම්. යූ. බංඩා මහතා කළ යෝජනාවක් කේ. ඩී. විජේසිංහ මහතා ස්ථිර කරන ලදුව සභා සම්මත විය."

ගරු ඇමතිතුමනි, අතුරු ව්‍යවස්ථාව අනුව වෙළෙන්දෙක් හෝ මුදල් ණයට දෙන්නෙක් හෝ කොන්ත්‍රාත් කරුවෙක් සමුපකාර සමිතියක හෝ සමුපකාර සංගමයක කාරක සභාවට පත් කිරීමට නුසුදුසුය. එසේ තිබියදී මෙම ව්‍යවස්ථා සහ නීති පසෙක දමා මෙම සංගමය කාබාසීනියා කළ කපටි පුද්ගලයන් කීපදෙනකුගේ උවමනාව සඳහා මේ අයුරු සංගමයේ කාරක සභාවට හෝ සභාපති ධුරයට පත්කිරීම ගැන අපගේ විරෝධය ප්‍රකාශ කරමු.

ගරු ඇමතිතුමනි, මෙම සංගමයේ මහා සභා රැස්වීමේදී කාරක සභාවට නියෝජිතයන් 9 දෙනෙකු අතුරු ව්‍යවස්ථානුකූලව පත් කර තිබේ. ඔවුන්ට සභාපති කෙනෙකු පත් කර සංගමයේ වැඩ ගෙන යාමට ශක්තියක් ඇති අතර ඒ සඳහා ඔවුන්ට අයිතියක්ද තිබේ. නමුත් සමුපකාරයේ "අ" වත් නොදත්, සමුපකාර සමිතියක සාමාජිකයෙක්වත් නොවූ වෙළෙන්දෙකුට සංගමය භාර දීම නරියාට බොක්ක සේදීම භාර කළා වැනිය. ඔබතුමා කෙරෙහි අප තුළ අචල විශ්වාසයක් තිබුණේය. එය අදත් එසේම පවතින්නේය. ඒ නිසාම මෙම ප්‍රශ්නයේදී අවංකව සහ එඩිතරව ක්‍රියා කරන ලෙස ඉල්ලන අතර සමුපකාර ව්‍යාපාරිකයින් සතු වරප්‍රසාදයන් උදුරා ඊට අයිතියක් නැති කෙනෙකුට නොදෙන ලෙස ඉල්ලා සිටිමු.

මීට,

.............................

ගරු සභාපති,

.............................

ගරු ලේකම්."

වියුටර් විජේසේකර සිල්වා මහත්මයා සමග අපේ පෞද්ගලික විරුද්ධත්වයක් නැහැ. එහෙත් අද දියුණු තත්ත්වයක තියෙන මේ සමුපකාර සංගමය ඒ ප්‍රදේශයේ පොදු වස්තුවක් නිසා එය ආරක්ෂා කිරීම කාගේත් යුතුකමක්. අතුරු ව්‍යවස්ථා අනුවත් වෙළෙන්දකු පත් කරන්න බැහැ. මේ නැනැත්තා පත් කරන්නට යන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාය කියන ආරංචිය නිසා ඒ ගැන ප්‍රදේශයේ බලවත් විරුද්ධතාවය ගරු ඇමතිතුමාට දන්වා එව්වා. ගරු ඇමතිතුමාගෙන්ද, කාගෙන්ද දන්නෙ නැහැ. ලැබුණු උපදෙස් අනුව උන්නැහෙට තිබුණු අයිතිවාසිකම් මල්ලීට පවරා ඊට පසු ඔහු සභාපති හැටියට පත් කළාය කියා ආරංචියි. මේ අතුරු ව්‍යවස්ථාවල හැටියට එහෙමවත් කරන්න බැහැ. පියුඩර් විජේසේකර සිල්වා මහත්මයා ප්‍රසිද්ධ වෙළෙන්දකු බව මහියංගනයේ මන්ත්‍රී, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාත් දන්නවා. තමන්ගේ කොටස් මල්ලීට පැවරුවත් එසේ පත් වන්නට බැහැ, පහත සඳහන් කොටසේ හැටියට :

"............සමිතියේ දියුණුවට බාධක යම් කටයුත්තක තමාගේම හෝ අන් අයකු මාර්ගයෙන් හෝ යෙදී සිටින කෙනෙක්............"

මල්ලීට පැවරුවත් අයියා එතැන සිටින බව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාත් දන්නවා. එදා සොරකම් කළ තමන්ගේම පක්ෂයේ පුද්ගලයා අස් කළා වගේ මේ පුද්ගලයාටත් මේ තනතුර නොදෙන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ තනතුර සඳහා බදුලු නගරයෙන් ඕනෑ තරම් අවංක, දක්ෂ, මේ ව්‍යාපාරයට ලැදිකමක් තියෙන අය සොයා ගන්නට පුළුවන්. වෙළෙන්දකු පත් කිරීමෙන් දැනට තියෙන දියුණුව සම්පූර්ණයෙන් නැති වෙලා සමිතිය කාබාසිනියා වන්නට පුළුවන්. ඒ නිසා මොහු වෙනස් කර ගරු ඇමතිතුමාට ඕනෑ කෙනෙක්—සුදුසු කෙනකු නම් මොන පක්ෂයට අයිති වුණත් කමක් නැහැ—පත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ සමුපකාර සමිති දියුණු කරමින් ඉදිරියට ගෙන යන්න පුළුවන් අවංක මහත්මයෙක් පත් කරන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මා ඊට වඩා යමක් ඒ ගැන කියන්න යන්නෙ නැහැ.

ඊළඟට වී ගබඩා පිළිබඳව කතා කරන්න ඕනෑ. මහියංගනය ප්‍රදේශයේ තිබෙන වී ගබඩාවල—අංක 1 සහ 2 දරණ වී ගබඩාවල—සිටින ගබඩා පාලකවරුන් විසින් කරන දූෂණ ගැන විශේෂයෙන් මතක් කළ යුතුව තිබෙනවා. මා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබෙනවා. ඒ සම්බන්ධ ලිපි ලේඛනත් මා ළඟ තිබෙනවා. ඒ ගබඩා පාලකවරුන් ඉතිමිත් තක්කඩි විධියට තමන්ගේ ප්‍රයෝජනය සඳහා පමණක් ක්‍රියා කරගෙන යනවා. වී මෝල් හිමියන් ගොස් ඒ ගබඩාවලින් වී ගන්න ගිය විට එහි බොල් සියයට 13ක් තිබෙන බව දැනගන්න ලැබුණා. සාමාන්‍යයෙන් තිබිය යුත්තේ බොල් සියයට 6 ක ප්‍රමාණයකුයි. නමුත් සියයට 13 ක් බොල් තිබෙනවා. ඒ වගේම එක මිටියකට වී සේරු 3 බැගින් අඩු කරනවා. මේ ගැන මහියංගනය ප්‍රදේශයේ ගොවිජන සේවා නිලධාරිතුමාත් පරීක්ෂා කර බැලුවා. එතුමා ඉදිරියේදීත් වී මිටි මැන බලන අවස්ථාවේදී මිටියකට සේරු 3 ක් අඩු බව පෙනී ගියා.

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**

*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*

(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

සියයට 13 ක් බොල් තිබෙනවා.

**බී. එච්. බණ්ඩාර මයා.**

*(திரு. பி. எச். பண்டார)*

(Mr. B. H. Bandara)

ඔව්, බොල් සියයට 13 ක් තිබෙනවා. ඒ වගේම මිටියකට වී සේරු තුනක් අඩු වෙන් තිබෙනවා. බදුල්ලේ ගොවිජන සේවා නිලධාරිතුමා කැඳවාගෙන ගොස් මැන බැලුවා. එතුමාටත් පෙනී ගියා වී සේරු තුනක් අඩු බව. මෙය හිතා මතා කරන දෙයක් මිස වී පරණ වීම නිසා සිදු වන, දෙයක් නොවෙයි. අපි දන්නවා සමහර ගබඩා පාලකවරුන් හිටි හැටියේ විශාල ධනවතුන් බවට පත් වී සිටිනවා. අපි ඒ ගැන ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. නමුත් මහජන මුදල් මේ විධියට කාබාසිනියා කරමින් ඒවා පුද්ගලික ප්‍රයෝජනයට යොදා ගැනීමට ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ල ඒ කෙරෙහි යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. දැනට ඒ ප්‍රදේශයේ වී මෝල් හිමියන් මෙම ගබඩාවලින් වී ගැනීම පවා ප්‍රතික්ෂේප කර තිබෙනවා. බොල් වැඩි නිසත්, අඩුවෙන් වී ලැබෙන නිසත්, ඒ අය වී ගැනීම ප්‍රතික්ෂෙප කර තිබෙනවා. මට ආරංචියි ඒ අය නුවර ප්‍රදේශයේ තිබෙන වී ගන්නවාය කියා. මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

විධියට ගබඩා පාලකවරුන් කරන දූෂණ ගැන සමහර විට ගරු ඇමතිතුමාත් දන්නවා ඇති. ඒ නිසා මේ පිළිබඳව සොයා බලා වහාම ක්‍රියා කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

අල වගාව සම්බන්ධයෙන් මා ඊළඟට කතා කරන්න අදහස් කරනවා. මා හිතන්නේ මේ පිළිබඳව ගරු ඇමතිතුමාත් නොයෙක් ප්‍රකාශනයන් කර තිබෙනවා. පසුගිය දිනවල රෝග සහිත බීජ අල බෙදා දීම නිසා ඒ ප්‍රදේශයේ අර්තාපල් අල වගාව සම්පූර්ණයෙන් විනාශ වී ගියා. මා හිතන හැටියට ඒවාට වන්දි මුදල්ද ඉල්ලා තිබෙනවා. වගාව විනාශ වීමට සම්පූර්ණයෙන්ම හේතු වී ඇත්තේ රෝග සහිත බීජ අල බෙදා දීමයි. ගහෙන් වැටුන මිනිසාට ගොනා ඇන්නා වාගේ ඊළඟට මේ ගොවියන්ට සිදු වුණේ මොකක්ද? අල වගාව විනාශ වීම නිසා ඒ අය ආර්ථික වශයෙන් පිරිහුණා. ඒ විධියට අර්තාපල් වගාව විනාශ වීම නිසා ආර්ථික පරිහාණියකට පත්ව සිටින ගොවියාට 1969-70 මහ කන්නයට ගොවිතැන් කිරීමට බීජ අර්තාපල් අල ගැනීමට සිදු වූයේ වෙනදාට වඩා වැඩි මිලකටයි. බීජ අල රාත්තලක මිල ශත 10කින් වැඩි කර තිබෙනවා. කලින් ශත 60 ට දුන්න බීජ අල රාත්තල දැන් ශත 70 කර තිබෙනවා. රෝග සහිත බීජ අල බෙදා දීම නිසා අල වගාව විනාශ වී අමාරුවේ වැටී සිටින ගොවියාට 1969-70 කන්නයට වැඩ කිරීමට බීජ අල ගැනීමේදී ශත 10 ක් වැඩිපුර ගෙවන්න සිදු වුණා. ඒ නිසා අද ඔවුන්ට බීජ අල ගන්න බැරි තත්ත්වයක් උදා වී තිබෙනවා. ඒ දුප්පත් ගොවියන්ට ඒ මිලට බීජ අල ගැනීම අමාරුයි. එක් අක්කරයක ගොවිතැන් කිරීමට අර්තාපල් බීජ අල හොණ්ඩර 20 ක් පමණ වුවමනා කරනවා. එක් ගොවියෙකුට හොණ්ඩර 20 ක් ගැනීමේදී වෙනදට වඩා රුපියල් 220 ක් වැඩිපුර ගෙවන්න සිදු වෙනවා. රුපියල් 220 ක් වැඩිපුර ගෙවන්න දුප්පත් ගොවියෙකුට පුළුවන්කමක් නැහැ. බීජ අල ගැනීම සඳහා කලින් ගණනට වඩා රුපියල් 220 ක් වැඩිපුර ගෙවීමට ඒ ගොවියාට පුළුවන්කමක් නැහැ. අපට ලැබී තිබෙන ආරංචියේ හැටියට පෙඩරල් පක්ෂය ලොකු බලපෑමක් කරනවාලු බීජ අල වැඩි හරියක් යාපනේ ප්‍රදේශයට එවන්නය කියා. පසු ගිය වතාවෙ යාපනේ ප්‍රදේශයේ වැවූ බීජ අලවල ලෙඩක් නැහැ, හොඳට වැවුණා. ඒ නිසා ඔවුන්ට මුදලුත් තිබෙනවා. එහෙත් මෙහි ගොවීන්ට වැඩි මිලට බීජ අල ගන්න පුළුවන්කමක් නැහැ. පෙඩරල් පක්ෂයේ වුවමනාව පරිදි ඒ බීජ අල ටික යාපනේ ප්‍රදේශයට බෙදා දුන්නොත් මෙහි අල වගාව සම්පූර්ණයෙන්ම විනාශ වී නැති වී යනවා. එම නිසා මේ වතාවට පමණක් එය වැඩි කරන්න එපාය කියා මා ඉල්ලන අතර ඒ ගැන ගරු ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ල යොමු වෙනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

බීජ අල බෙදා දීම සඳහා ආණ්ඩුවෙන් ඉල්ලුම්පත්‍රයක් සකස් කර තිබෙනවා. එය ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේයි මුද්‍රණය කර තිබෙන්නෙ. 1967-68 බීජ අල බෙදා දීම සඳහා මුද්‍රණය කර ඇති ඒ ඉල්ලුම් පත්‍රයේ ගොවි මහතාගේ නම, ලිපිනය, වගා කරන ප්‍රමාණය, ආදී එහි අසා තිබෙන විස්තර අතර සහල් පොතේ අංකයද අසා තිබෙනවා. එසේ සහල් සලාක පොතේ අංකය විමසීම ඉතාමත් සාධාරණයි. ඒ මොකද? එසේ නොතිබුණොත් මේ රටේ පුරවැසි අයිතිවාසිකම් නැති කල්ලතෝනීන්ටත් බීජ අර්තාපල් ලබා ගන්නට පුළුවන් වන නිසයි. ඔවුන් එසේ බීජ අල ලබා ගෙන බොහොම ලස්සණට ඔවුන්ගේ වැඩේ ගෙන යාවි. එනිසා කල්ලතෝනීන්ට බීජ අල ලබා ගැනීම වැළැක්වීම සඳහා ඒ ඉල්ලුම් පත්‍රයේ එවැනි විස්තර සඳහන් කිරීම ඉතාමත් සාධාරණයි. එහෙත් ඊට පසු, මොන බලපෑමක් නිසාදැයි මා දන්නෙ නැහැ, එම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කර දැන් අලුත් ඉල්ලුම් පත්‍රයක් රෝනියෝ කර තිබෙනවා. එහි සහල් සලාක පොතේ අංකය නැහැ. එම නිසා මේ රටේ පුරවැසි වරප්‍රසාද නැති අයටත්—කල්ලතෝනීන්ටත්—බීජ අල ලබා ගැනීමට පුළුවන්කම ඇති වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා., (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. சி. பி. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

සමුපකාර සමිති මාර්ගයෙන් නොවේද බිජ් අල ලබාගන්නට තිබෙන්නෙ? ප්‍රදේශයේ සමුපකාර සමිතියක සාමාජිකයෙක් වුණොත් ඒ මාර්ගයෙන් නොවේද ඉල්ලුම් පත්‍ර ලබාගෙන බිජ් අල ලබාගන්නට තිබෙන්නෙ?

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

කොහොම වුණත් මේ තමුන්නාන්සේ ලාම කර තිබෙන වැඩක්.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

මම ප්‍රශ්නයක් නඟනවා නොවෙයි, අදහසක් ඉදිරිපත් කළා පමණයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

එක ඉල්ලුම් පත්‍රයක තිබී අනික් ඉල්ලුම් පත්‍රයේ ඉවත් කර තිබීම ගැනයි ගරු මන්ත්‍රීතුමා කියන්නෙ?

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

ඔව්, මම කියන්නෙ සහල් සලාක පොතේ අංකය දැම්මට ඇති වරදක් නැති බවයි. පළමුවෙනි ඉල්ලුම් පත්‍රයේ තිබෙනවා. ඊළඟ ඉල්ලුම් පත්‍රයේ නැහැ. ඒකෙන් පෙනෙන්නෙ මේ රටේ පුරවැසි අයිතිවාසිකම් නැති කල්ලතෝනින්ට වුණත් මේවා ලබාගන්නට පුළුවන් බවයි. අන්න ඒ නිසා එසේ වීම වැළැක්වීම පිණිස පියවරක් ගැනීමටයි මා ඒ කාරණය සඳහන් කෙළේ.

ඊළඟට මා සැමදාම මතක් කරන කාරණයක් තමයි, කුඹුරු පනතෙ ඇති අක්කර බද්ද පිළිබඳ ප්‍රශ්නය. අක්කර බද්ද නිසා ගොවියන් විශාල හිරිහැරයකට මුහුණ පා තිබෙනවා. අක්කර බද්ද වශයෙන් රුපියල් 6 ක් ගෙවන්න ඕනෑ. මෙය ගොවීන්ට සැහෙන අමාරුවක්. අක්කර බද්ද වශයෙන් රුපියල් 6 කුත් රක්ෂණ බද්ද වශයෙන් රුපියල් 6 කුත් අක්කරයකට ගෙවිය යුතුව තිබෙනවා. යල මහ කන්න දෙකටම වැඩ කරනවා නම් අවුරුද්දකට රුපියල් 24 ක් අක්කරයකට ගෙවිය යුතුයි. දුප්පත් ගොවීන්ට මේ මුදල ගෙවීම සැහෙන අමාරුවක්. ඒ නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ අක්කර බද්ද සම්බන්ධයෙන් ගොවීන්ට සහනයක් සලසා දෙන්නය කියා. රක්ෂණය කර රක්ෂණ බද්ද අය කළත් ගොවීන්ගේ කුඹුරු පාළු වුණාම ඒ සඳහා යම්කිසි මුදලක් ලබා ගන්නට ගිය විට ඇතැම් අවසථා වල අවුරුදු ගණනක් ගත වෙනවා. ලැබෙන්නෙත් නියම වන්දි මුදලකුත් නොවෙයි. ඒ නිසා ගොවීන් අමාරුවකට පත් වී සිටිනවා. ඒ නිසා අක්කර බද්ද වෙනස් කිරීම පිළිබඳව ගරු ඇමතිතුමා ඉක්මන් පියවරක් ගන්නවා නම් එය දුප්පත් ගොවීන්ට කරන ලොකු ශාන්තියක්.

මේ රටේ වගා ව්‍යාපාරය දියුණු කරන්නට ගරු ඇමතිතුමාට ඕනෑ වී තිබෙනවා. අපිත් එසේමයි. ඒ අනුව අපේ ප්‍රදේශ වලට—ඌව වැනි ප්‍රදේශ වලට—රජයෙන් ආධාර දෙනවා නම් පළමුවෙන්ම කරන්නට ඕනෑ, ජල ප්‍රශ්නය විසඳීමයි. ප්‍රථමයෙන්ම ඒ ප්‍රශ්නය විසඳීමට යම් කිසි ඉක්මන් පියවරක් ගත්තොත් එය වගා ව්‍යාපාරයට දෙන ලොකුම උදව්ව නැත්නම් ආධාරය වෙනවා. එසේ නැතිව ප්‍රවෘත්ති පත්‍රවලිනුත් ගුවන් විදුලියෙනුත් කොතරම් කීවත් වැඩක් වන්නේ නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

වාරිමාර්ග ගැනද කියන්නේ?


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
වාරිමාර්ග අංශයෙනුත් පුළුවන්; ගොවිජන සේවා අංශයෙනුත් පුළුවන්. ඒ හැම අංශයක් විසින්ම ගොවීන්ට අවශ්‍ය ජලය ලබා දීමට ඉක්මන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලනවා.

මේ රටේ ආහාර වගාව අතින් ප්‍රධාන තැනක් ගන්නා දේවලට විශාල හානියක් සිදු වී තිබෙනවා. එක වර්ගයක් තමයි අර්තාපල්. රෝග සහිත බීජ අර්තාපල් ගෙන්වා දීම නිසා අර්තාපල් වගාව විනාශ වුණා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
තමුන්නාන්සේ කිව්වට එහෙම දෙයක් වෙලා නැහැ.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
බිබිලේ දොඩම් කීවොත් ලංකාවේ සෑම කෙනෙක්ම දන්නවා. ඒවා ඒ තරමට ප්‍රසිද්ධයි. අද එයටත් සිදු වී තිබෙන්නේ කුමක්ද? රෝග බීජ සහිත පැළ බෙදා දීම නිසා එයත් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබෙනවා. ඔවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ පිටරටවල් කරන හතුරුකමක් නිසාද මා දන්නේ නැහැ. අර්තාපල්වලටත් එය සිද්ධ වෙලා; දොඩම්වලටත් එය සිද්ධ වෙලා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
අර්තාපල්වලට නැහැ.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
ගොවීන් කියනවා. ඒ නිසයි මා කිව්වේ. එමෙන්ම අයි ආර් 8 වීවලටත් ලෙඩ තිබෙනවා. එය දැනට වඩා අස්වැන්නක් ලබා ගැනීමේ අදහසින් ගරු ඇමතිතුමා කරන දෙයක් වෙන්න පුළුවන්. එහෙත් එයටත් ලෙඩ හැදී තිබෙන බව ඇමතිතුමා නොදන්නවා වෙන්න ඇති. ඒ නිසා අයි ආර් 8 වී වලිනුත් බලාපොරොත්තු වූ අස්වැන්න ලබා ගන්නට බැරි වී තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
සමහර පළාත්වලටයි එහෙම වෙන්නේ.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
එහෙනම් ඒ ගැන උපදෙස් දෙන්න ඕනෑනේ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඒ ගැන උපදෙස් දී තිබෙනවා.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
මේ කරුණු පිළිබඳව ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන හැටියට ඉල්ලමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

**රැස්වීම තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

*அமர்வு இடைநிறுத்தப்பட்டு, மீண்டும் பி.ப. 2 மணிக்கு ஆரம்பமாயிற்று.*

*Sitting suspended till 2 P.M. and then resumed.*

**ඇස්. බී. යාලේගම මයා.** (රත්තොට)
*(திரு. எஸ். பி. யாலேகம—றத்தோட்டை)*
(Mr. S. B. Yalegama—Rattota)
ගරු සභාපතිතුමනි, ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට බලාපොරොත්තු වන මා මුලින්ම ගරු ඇමතිතුමාට පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නට කැමතියි. ආහාර දෙපාර්තමේන්තුව සමුපකාර සමිති මාර්ගයෙන් මහජනයාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෑමට නුසුදුසු හාල් බෙදා දෙනවා. මාතලේ මධ්‍යම සමුපකාර සමිතියෙන් 53 වැනි සතිය සඳහා බෙදා දෙන ලද හාල්වල සැම්පලයක් මා ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරනවා. මේ හාල් මහජනයාගේ ආහාරයට සුදුසුදැයි බලන්න. මේ සම්බන්ධයෙන් වග කිවයුතු අයට පැමිණිලි කළත් කිසිම පියවරක් ගෙන ඇති බවක් පෙනෙන්නට නැහැ. මේ හාල් ගන්නැයි මහජනයාට බල කිරීම කොයිම අන්දමකින්වත් සුදුසු නැහැ. මේ හාල්වල පණු කැදලි තිබෙනවා. මේ විධියේ දේවල් මහජනයාගේ ආහාරය සඳහා බෙදා හැරීමෙන් ලෙඩ රෝග ඇති වන්නට පුළුවනි. මාතලේ දිස්ත්‍රික්කයේ ආහාර පාලකයකු සිටිනවා. මහජනයා අතර මෙබඳු ඈ බෙදා හරින්නට පෙර ඒවා පරීක්ෂා කර බලන්නට ඔහුට පුළුවනි. මේ හාල් මහජනයාගේ ආහාරය සඳහා සුදුසුදැයි ඔහු පරීක්ෂා කර බැලුවා නම් කවදාවත් මෙවැනි තත්ත්වයක් ඇති වන්නේ නැහැ. 53 වැනි සතියට බෙදා දෙන ලද හාල් සම්බන්ධයෙන් වගකිව යුත්තන්ට දැන්වීමෙන් පසුව වුවද වරද හරිගස්සා නැහැ. මේ නිසා ඒ සතියේ වෙනත් ආහාර වර්ගවලින් යැපෙන්නටයි, මහජනයාට සිදු වුණේ. ආහාර දෙපාර්ත මේන්තුවේ නිලධාරීන් අවුරුද්දකට කීප වතාවක් හාල් බෙදා හරින ගබඩා පරීක්ෂා කරන්නට ඕනෑ. එසේ කරනවා නම් මෙවැනි දේවල් ඇති වන්නේ නැහැ. මේක බරපතල අපරාධයක්. අද හාල් සේරුවක වටිනාකම ගරු ඇමතිතුමා දන්නවා. හාල් මිළ වැඩි වී තිබෙන මේ කාලයේදී මහජනයාගේ ආහාරය සඳහා බෙදා දෙන හාල් සලාකය, ආහාරයට ගත හැකි හාලකින් යුක්ත විය යුතුයි. ආහාර යට ගත නොහැකි හාල් බෙදා දෙන්නේ නිලධාරීන්ගේ නොසැලකිල්ල නිසායි. මේ විධියේ දේවල් සිදු වන්නට ඉඩ නොදෙන ලෙස මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සමුපකාර සමිති සම්බන්ධයෙන්ද වචනයක් කියන්නට ඕනෑ. හොරුන් යම් යම් ප්‍රදේශවල සමුපකාර කඩ කඩා ඇති බව මේ කාලයේ නිතරම අසන්නට ලැබෙනවා. ඒ විධියට පෞද්ගලික කඩ කඩන බවක් නම් අසන්නට ලැබෙන්නේ නැහැ. ඒ නිසා සමුපකාර කඩ පිළිබඳව මීට වඩා තද නීති රීති පැනවිය යුතුය කියා මා සිතනවා. වැරදි කර අසු වූ අය සම්බන්ධව සමුපකාර දෙපාර්තමේන්තුව හරියාකාරව ක්‍රියා කර නැහැ. මා උදාහරණ යක් පෙන්වන්නට සතුටුයි. දඹුළු කොට්ඨාශයේ විවිධ සේවා සමුපකාර සංගමයේ පාලක ලේකම්වරයා—කළමනාකාරවරයා—විශාල වංචාවක් කර තිබෙනවා. ඔහු ගැන දෙපාර්තමේන්තුව ක්‍රියා කර තිබෙන්නේ කොහොමද? එතැන රුපියල් ලක්ෂ ගණනක වංචාවක් කෙරී තිබෙනවා. රහස් පොලීසිය ඒ ගැන පරීක්ෂා කළා. නමුත් අද ඒ පරීක්ෂණය සම්පූර්ණයෙන්ම යට පත් වී තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තිබෙනවා නම් සමුපකාර ව්‍යාපාරය දූෂණ යෙන් තොර ව්‍යාපාරයක් හැටියට පවත්වාගෙන යන්නේ කෙසේද කියා මා ප්‍රශ්න කරනවා.

නවත් උදාහරණයක් මා පෙන්වන්නට සතුටුයි. මාතලේ කච්චේරියේ අවුරුදු විස්සක් පමණ පැරණි ණය දෙන ශුභ සාධක සමුපකාර සමිතියක් තිබෙනවා. මා රජයේ නිලධාරියකු වශයෙන් මාතලේ වැඩ කරන කාලයේදීත් මේ සමිතිය තිබුණා. දැනට අවුරුදු නවයක් තිස්සේ ඒ සමිතියේ නිලධාරීන් තේරීමක් කර නැහැ. රජයේ සේවකයන්, කාර්යාල කාර්ය සහායකවරුන්, ලිපිකරුවන්, හිටපු ගම්මුලාදෑනිවරුන්, ග්‍රාම සේවක වරුන් ආදීන් ඒ සමිතියේ සාමාජිකත්වය ලබා ගෙන සිටිනවා. නමුත් ඒ සාමාජිකයන්ට හදිසි අවස්ථාවකදී ණය මුදලක් ලබා ගැනීම අමාරු වී තිබෙනවා. සාමාජිකයන් තැන්පත් කරන මුදල් භාණ්ඩාගාරික වශයෙන් කටයුතු කරන තැනැත්තා අයථා විධියට, වෙනත් කටයුතුවලට යොදනවා. ඒ මුදල් පොළියට දෙනවා. සමහර ව්‍යාපාරවලට දෙනවා. එම නිසා හදිසි අවස්ථාවකදී සාමාජිකයන්ට ණය මුදලක් ලබා ගැනීම දුෂ්කර වී තිබෙනවා. මේ තත්ත්වය ගැන සමුපකාර වල පැමිණිලි කර තිබෙනවා. පරීක්ෂණයක් පවත්වන්නය කියා නොයෙක් අවස්ථාවල ඉල්ලීම් කර තිබෙනවා. අද ඊයේ සිට නොවෙයි, අවුරුදු ගණනාවක් තිස්සේ මේ ණය දෙන සමුපකාර සමිතිය ගැන කරුණු ඉදිරිපත් කරනවා. නමුත් අද වන තෙක් සමුපකාර දෙපාතීමේන්තු වෙන් කිසිම පරීක්ෂණයක් කර නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇලේගම මයා.]

සාමාජිකයින්ගෙන් ලැබෙන මුදල් භාණ්ඩාගාරික වෙනත් කටයුතුවලට යොදනවා. ඔහුගේ හිත හොඳ කරන අයට දෙනවා. ඔහුට පක්ෂපාත අයට දෙනවා. සාධාරණ විධියට ඒ මුදල් පාවිච්චි කරන්නේ නැහැ. එම නිසා හදිසි අවස්ථාවකදී ඒ සමිතියේ සාමාජිකයන් වන රජයේ සේවකයින්ට ණය මුදලක් ලබා ගැනීම අමාරු වී තිබෙනවා.

තවත් කාරණයක් තිබෙනවා. මාතලේ සමුපකාර සංගමය මණ්ඩලයකට පවරා දැන් අවුරුදු හතරක් පමණ වෙනවා. මාතලේ පළාත් පාලන උප කොමසාරිස්වරයාගෙනුත්, පළාත් පාලන කාර්යාලයේ වැඩ අධිකාරීවරයාගෙනුත්, සමුපකාර පරීක්ෂකවරයාගෙනුත් යුක්ත මණ්ඩලයකට පවරා දැන් අවුරුදු හතරක් ගත වෙලා. ඒක ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවක්ද කියා මා ප්‍රශ්න කරනවා. ඒක සමුපකාර ව්‍යාපාරයේ න්‍යායන්වලට හෝ ප්‍රතිපත්තිවලට එකගද? යම් සමුපකාර සංගමයක අයථා ක්‍රියා සිදු වෙනවා නම් ඒක විසුරුවා හැර පාලනය මණ්ඩලයකට පැවරීම සාධාරණයි. නමුත් දිගින් දිගටම ඒ මණ්ඩලය මගින්ම පාලනය ගෙන යාම යුතුද? ඒ සංගමයේ කෙරුණු අයථා ක්‍රියා සම්බන්ධව පරීක්ෂා කර බලා නිසි පියවරවල් ගෙන ආපසු ඒ සංගමයේ පාලනය භාර දෙන්නය කියා මාතලේ දිසා සමුපකාර සංගමයත් ඒ සංගමයේ සාමාජික සමුපකාර සමිතිත් දීර්ඝ කාලයක් තිස්සේ සමුපකාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරනවා. රැස්වීමක් කැඳවන්නය කියා ඉල්ලීමක් කරනවා. නමුත් අද දක්වා ඒ ඉල්ලීමට ඇහුම්කන් දී නැහැ. අද වන තෙක් රැස්වීමක් කැඳවා නැහැ. අද වන තෙක් ඉදිරිපත් කළ චෝදනා සම්බන්ධවත් පරීක්ෂණයක් කර නැහැ. මේක බීරි අලින්ට වීණා ගායනා කරනවා වාගෙයි. සමුපකාර දෙපාර්තමේන්තුව හිතුවක්කාර විධියට වැඩ කරනවා. මේ සමුපකාර සංගමයේ පාලනය තව දුරටත් ඒ මණ්ඩලයෙන්ම කරගෙන යාමට බලාපොරොත්තු වෙනවා. මේක අසාධාරණයක්. ගරු ඇමතිතුමා නොබෝදා මාතලේට ආවා. එතුමා මේ කාරණය ගැන දන්නවා. මාතලේ දිසා සංගමයක් තිබෙනවා. මෙම සංගමය නඩත්තු කිරීමට ආණ්ඩුවෙන් ආධාර මුදලක්ද ලැබෙනවා. මෙම සංගමයෙන් අවුරුද්දකට දෙවරක් පමණ සමුපකාර ව්‍යාපාරිකයන් පුහුණු කරනවා. නමුත් මෙම අලුත් මණ්ඩලය පත් වීමෙන් පසුව දිසා සංගමයෙන් පුහුණුව ලබා පිටවන්නන් යම් යම් තනතුරුවලට පත් කර නැහැ. ඒ වෙනුවට සභාපතිවරයාගේ ඥාතීන්, හිත වතුන් බඳවා ගෙන ඇති බව පෙනී යනවා. මෙය බලවත් අසාධාරණයක් බව ගරු ඇමතිතුමා වුණත් පිළිගන්නවා ඇති. සමුපකාර ව්‍යාපාරය පිළිබඳව හය මසක හෝ තුන් මසක හෝ පුහුණුවක් ලැබීමෙන් පසුව සහතික ලබා පිට වන්නන් සේවයට බඳවා නොගෙන කිසිම සුදුසු කමක් නැති පුද්ගලයන් සමුපකාර සංගමයට බඳවා ගෙන ඇතැයි කියන මෙම චෝදනාවේ සත්‍යයක් තිබෙනවාද නැද්ද කියා ගරු ඇමතිතුමා පරීක්ෂා කර බලනවා නම් හොඳ බව කියන්න ඕනෑ. මෙබඳු දේවල් සිඩ වන විට සමුපකාර ව්‍යාපාරයෙන් බලාපොරොත්තු වන සේවය නියම අන්දමට මහජනතාවට නොලැබෙන බව අමුතුවෙන් කියන්න ඕනෑ කරන්නේ නැහැ. එම නිසා මේ සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් නැවත වරක් මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මණ්ඩලය මගින් දැනට ගෙන යන පාලනය ආපසු මාතලේ දිසා සංගමයට භාර දෙන මෙන් මාතලේ දිසා සංගමය, එමෙන්ම මාතලේ සමුපකාර සමිති අවුරුදු ගණනාවක් තිස්සේ ඉල්ලා සිටිනවා. ඒ ඉල්ලීම ගැන නැවත වරක් ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. මෙතෙක් කල් ගෙන ගිය පාලනය ගැන දොස් කියනවා නොවෙයි. කලින් තිබුණු පාලනයෙන් යම් යම් අයථා කටයුතු සිඩ වෙන්න ඇති. එනිසා මණ්ඩලයට මෙහි පාලන කටයුතු පැවරුවා වෙන්නට ඇති. නමුත් සදාකාලිකවම නැතිනම් දිගටම මණ්ඩලය යටතේ පවත්වා ගෙන යාමේ තේරුම කුමක්ද? අවුරුදු හතරක පමණ කාලයක් මණ්ඩලය මගින් පාලනය ගෙන ගියා ඇති. කටයුතු නිසියාකාර ලෙස සකස් කරන්න කල් ගත කළා හොඳටම ඇති. අඩුපාඩුකම් නැති කර දමා නැවත හොඳ පාලනයක් ගෙන යන්න, ගත කළ කාලය හොඳටම ඇති. එම නිසා නැවත වරක් සමුපකාර දිසා සංගමයටම මෙහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කටයුතු ගෙන යාමට භාර දෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, හාල් පොත් නැති වීම සම්බන්ධයෙනුත් වචනයක් ඕනෑ. හාල් සලාක පොත් වැරදි අන්දමට ලබා ගන්නා බව, පුරවැසියන් නොවන අයත් ප්‍රයෝජනයට ගන්නා බව අප අසා තිබෙනවා. ඇතැම් වෙළඳුන් තොග පිටින් සහල් සලාක පොත් අසරණ අයගෙන් ලබාගෙන අයථා අන්දමට ලාභ ලබා ගන්නා අවසථා ගැන අසා තිබෙනවා. එම නිසා සහල් පොත් නිකුත් කිරීමේදී තද බල නීතිරීති අනුගමනය කිරීම ගැන අප දෙස් නගන්නේ නැහැ. නමුත් අසරණ උදවියගෙ, යම්කිසි සාධාරණ හේතුන් උඩ, හාල් පොත් නැති වුණාම හාල් ලබා ගැනීමට විධියක් නොමැති නිසා ඉතා මත්ම කණගාටුදායක තත්ත්වයකට ඔවුන්ට මුහුණ දෙන්න වෙනවා. කිසියම් වරදක් නිසා තමන්ගේ හාල් පොත් නැති වුණොත්, තමන්ගේ හාල් සලාකය ලබා ගැනීමට කිසියම් මාර්ගයක් සලසා දීම යුතුකමක්. අඩු වශයෙන් ඒ වෙනුවට තාවකාලික බලපත්‍රයක්වත් ලබා දීමට ක්‍රියා කරනවා නම් හොඳ බව කියන්න කැමතියි. මේ කාරණය ගැන මා විශේෂයෙන්ම සඳහන් කළේ, දැනට සති දෙකකට පමණ උඩදී සහල් සලාක පොත් පහක් හයක් නැති වීම සම්බන්ධයෙන් අසරණ පුද්ගලයන් කීප දෙනකුගේ දුක් ගැනවිල්ලක් සම්බන්ධයෙන් මා මාතලේ ආහාර පාලක නිලධාරිතුමා හමු වුණා. දැනට බලපවත්වන නීතිය අනුව කොයි අන්දමකින්වත් සහල් සලාක පොත් අලුතෙන් නිකුත් කරන්නට බැරි යයි එතුමා කීවා. මේ නිසා හාල් පොත් නැති වුණු අහිංසක උදවියට සහල් ලබා ගන්න අනික් වාරයේ සහල් සලාක පොත් නිකුත් කරන තුරු බලාගෙන සිටින්න වෙනවා. ආහාර පාලක නිලධාරි මහතුන් සිටිනවා නම්, ග්‍රාම සේවක මහතුන් සිටිනවා නම්, එබඳු පැමිණිලි ලැබුණාම ඒවායේ සත්‍යයක් තිබෙනවාද නැද්ද කියා සොයා බලා, ඒවා සත්‍ය නම් සහල් ලබා ගැනීමට තාවකාලික බලපත්‍ර හෝ නිකුත් කිරීමට පියවර ගැනීම ඉතාමත්ම යෝග්‍ය බව මතක් කරන්න කැමතියි. කාලවේලාව නැති නිසා මීට වඩා කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මා සඳහන් කළ කරුණු කීපය ඇමතිතුමාගේ අවධානයට යොමු වනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 2.15

**එම්. ඒ. ඩැනියෙල් මයා.** (හේවාහැට)
(*திரு. எம். ஏ. டனியல்—ஹேவாஹெற்ற*)
(Mr. M. A. Daniel—Hewaheta)

සභාපතිතුමනි, ආහාර ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ මටත් වචන සවල්පයක් කථා කරන්නට ලැබීම ගැන මා බොහොම සන්තෝෂ වෙනවා. ජාතික රජය ගෙන ගිය වගා ව්‍යාපාරයේ ප්‍රතිඵල ගැන අමුතු වෙන් විස්තර කරන්නට ඕනෑ නැහැ. එහෙත් වී වගාව සම්බන්ධයෙන් එක කරුණක් පමණක් මතක් කරන්නට සිදු වී තිබෙනවා. ඉස්සර නම් ගස්වල කොළ පොතු ආදිය මිශ්‍ර කොට පස සකස් කර ගත් බව අප දන්නවා. එහෙත් දැන් වැඩි අස්වැන්නක් ලබා ගත හැකි කෘත්‍රිම පොහොර වර්ග නිෂ්පාදනය කොට තිබෙනවා. එහෙත් ඒවායේ මිළ නම් වැඩියි. එම නිසා තමන්ගේ කුඹුරුවලින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට බලාපොරොත්තු වන දුප්පත් ගොවීන්ට, මිළ දී ගත හැකි තරමට එම කෘත්‍රිම පෝරවල මිළ අඩු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ ඉල්ලීම ඉටු වුණොත් එයින් ගොවි ජනතාවට සැලසෙන ප්‍රයෝජනය අති විශාලයි.

සමුපකාර ව්‍යාපාරය පිළිබඳව ඉතා උනන්දුවක් දක්වමින් ගරු ඇමතිතුමා ක්‍රියා කර ගෙන යන බව අප දන්නවා. එහෙත් සමුපකාර ව්‍යාපාරයෙන් මහජනතාව බලාපොරොත්තු වන්නේ මොකක්ද යන්න ගැනත් අපේ දැඩි සැලකිල්ල යොමු වන්නට ඕනෑ. අඩු මිළට පහසුවෙන් ද්‍රව්‍ය ලබා ගැනීමට පාරිභෝගිකයන්ට අවසථාව ලබා දීම සඳහායි, සමුපකාර ව්‍යාපාරය සකස් වී තිබෙන්නේ. එහෙත් බොහෝ විට නොයෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය ලබා ගැනීමේදී ඉමහත් දුෂ්කරතාවලට ලක් වන්නටත් මහජනතාවට සිදු වී තිබෙන බව කණගාටුවෙන් වුවත් මතක් කළ යුතුව තිබෙනවා. ඒ හැරෙන්නට යම් යම් රජයේ නිලධාරීන් මහජනතාවගේත්, සමුපකාර සංගම්කයන්ගේත් දුක්ගැනවිලිවලට ඇහුම්කන් නොදෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩැනියෙල් මයා.]
බවත් කණගාටුවෙන් ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා. සමුපකාර ව්‍යාපාරයේ පවතින යම් යම් දූෂණ ගැන දෙපැත්තේම ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවලින් කියැවුණා. මම ඒ සම්බන්ධයෙන් එක නිදර්ශනයක් පමණක් දෙන්නම්. පහත හේවාහැට සමුපකාර සංගමයේ කළමනාකරුගේ —මා නම නොකීවාට හොයා ගන්නට බැරිකමක් නැහැ—සේවය සථිර කිරීම පළාතේ සහකාර සමුපකාර කොමසාරිස් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුණා. එම නිසා ඒ මහතා සේවයේ සථිර කිරීමට සමුපකාර සංගමයේ කාරක සභාවට බැරි වුණා. එපමණක් නොවෙයි, ඒ හේතුවෙන් ඒ කළමනාකාර මහතා සේවයෙන් ඉවත් කරන්නටත් අකමැත්තෙන් හෝ කාරක සභාවට සිදු වුණා. තමා සේවයෙන් ඉවත් කළ බව දන්වමින් ඒ මහතා කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාටත්, කම්කරු හා රැකිරක්ෂා ඇමතිතුමාටත් ලියුම් එවා තිබෙනවා. වඩාත් හොඳ සේවයක් සැලසීම සඳහා සමුපකාර කොමසාරිස්තුමා සතු බලතල සහකාර කොමසාරිස්වරුන්ට පවරා ඇතත්, සහකාර කොමසාරිස්වරුන් අතින් ඒ කටයුතු හරියාකාරව සිදු වෙනවාදැයි සොයා බලන්නට ඕනෑ. සමුපකාර කොමසාරිස්තුමාත්, සහකාර කොමසාරිස්වරුනුත් සාධාරණව කටයුතු කරතැයි අප බලාපොරොත්තු වෙනවා. සමහර පළාත්වල එසේ සාධාරණව කටයුතු නොසිදු වීම නිසා නොයෙකුත් දුෂ්කරතා පැන නගිනවා. එම නිසා සමහර සහකාර සමුපකාර කොමසාරිස්වරුන්ට එරෙහිව කටයුතු කරන්නට පවා සිදු වන අවසථා මතු වෙනවා. එබැවින් නීති රීති සාධාරණව ක්‍රියාවේ යෙදවීම පිළිබඳව ඇමතිතුමාගේත් එතුමාගේ කාර්ය මණ්ඩලයේත් අවධානය යොමු කරවන්නට කැමතියි.

මීළඟට, දුම්කොළ ව්‍යාපාරය සම්බන්ධයෙනුත් වචන ස්වල්පයක් කිව යුතුව තිබෙනවා. මගේ ඡන්දදායක කොට්ඨාශයේ දුම් උදුන් ව්‍යාපාරිකයන් කීප දෙනෙක්ම ඉන්නවා. රජයෙන් ණය මුදල් හා ආධාර මුදල් ලබාගෙන ඒ ව්‍යාපාරය කරගෙන ගියත්, දුම්කොළවලට සාධාරණ මුදලක් නොලැබීම ගැන ඒ අය ළතැවෙනවා. එම නිසා දැන් ඒ උදවියට මුහුණපාන්නට සිදු වී තිබෙන සේවක ප්‍රශ්න සහ පොහොර ප්‍රශ්න යනාදිය ගැන විමසා බලන්නට ඕනෑ. එම උදවියගේ දුම්කොළවලට නියම තත්ත්වයක් නොලැබෙන හෙයින් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා මේ රටේ තිබෙන දුම්කොළ සමාගම් සමග සාකච්ඡා පවත්වා එම දුම්කොළ නිෂ්පාදකයන්ට වැඩිපුර තත්ත්වයක් ලබා දීම සඳහා කටයුතු යොදන ලෙස.

ගරු සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශය යටතේ මීමැසි ව්‍යාපාරයක් තිබෙන බව අප දන්නවා. "දන්නෝ දනිති" යනුවෙන් අපේ රටේ පවතින කතාවක් තමුන්නාන්සේලා අසා ඇති. ඒ ගැනත් කියන්නට තිබෙන්නේ එම කතාවයි. කිසිම වියදමක් නැතුව රොන් ගෙන එන මීමැස්සන්ගේ උදව්වෙන් ලැබෙන එම මී පැණි ටික වත් නිසියාකාර ලබාගන්නට බැරි තත්ත්වයක් උදා වී තිබෙනවා. දෙපාර්තමේන්තුව මගින් ඒ සඳහා කොතෙක් උපදෙස් දුන්නත් ඒ උදවිය බලාපොරොත්තු වන ප්‍රයෝජනය ලබා ගන්නට අමාරුයි. මාත් මී පෙට්ටි දෙක තුනක් දමා තිබෙනවා. හැබැයි, මා නම් මී පැණි ගන්නට යන්නේ නැහැ. මට මීමැස්සෝ අණිනවා. නිලධාරි මහත්වරුන් දෙතුන් දෙනෙක් සමග මා මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. [බාධා කිරීමක්] මහත වැඩි නිසාද කියන්නට දන්නේ නැහැ, මීමැස්සන් අණින්නේ. ඒ කෙසේ වෙතත් එම කටයුත්ත බොහොම අමාරුයි. හැබැයි එම වැඩ පිළිවෙළ නිසියාකාර පවත්වා ගෙන ගියොත් විශාල ආදායමක් ලබා ගන්නට පුළුවනි.

ගරු සභාපතිතුමනි, අපේ ගරු අගමැතිතුමා චක්‍ර ලේඛනයක් යවා තිබෙනවා, ගරු මැති ඇමතිවරුන් වෙත. ගරු මැති ඇමතිවරුන්ගේ දනට තිබෙන වත්කම්වල තත්ත්වය ප්‍රකාශ කරන්නැයි එම චක්‍ර ලේඛයෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්]. වටිනාකමය කියන්නේ තත්ත්වය තමයි. මගේ මීමැසි ව්‍යාපාරයෙන් මී පැණි බෝතල් දෙක තුනක් ලබාගෙන ඉන් එන ආදායම මගේ දුවගේ හෝ පුතාගේ නමින් තැන්පත් කර තිබෙන්නට බැරි නැහැ. ඒ අන්දමට මගේ දුවගේ හෝ පුතාගේ නමින් රුපියල් 5ක් තැන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පත් කර තිබුණොත් ඒකත් මව්සින් හෙළිදරව් කළ යුතුව තිබෙනවා. මා ඒ වෙනුවෙන් වැඩිපුර ශ්‍රමයක් යෙදුවේ නැහැ. අර මීමැස්සන් හරිගස්සා පැණි ටික එකතු කොට බෝතල්වලට දමා ඉන් එකක් රුපියල් 5 ගණනේ නැතිනම් 6 ගණනේ විකුණනවා. එසේ ලබා ගන්නා මුදල තමයි දුවගේ හෝ පුතාගේ හෝ මගේ හෝ නමින් තැන්පත් කළේ. කාට වත් විරුද්ධව මා කටයුතු කර නැහැ. මා හිරිහැරයක් කළා නම් කළේ අර අහිංසක මීමැස්සාටයි. මී මැස්සන් මී කූඩුවට ගෙන්වා ගැනීම පිණිස සමහරවිට මා සීනි ටිකක් වැනි දෙයක් දමන්නට ඇති.

ගරු සභාපතිතුමනි, ඒ කෙසේ වෙතත් මේ ඇමතිතුමාගේ දෙපාර්තමේන්තුව මගින් මෙම ව්‍යාපාරය වෙනුවෙන් කරන් නේ උපදෙස් දීම පමණයි. යම්කිසි මුදල් ප්‍රමාණයක් මෙම කටයුත්ත සඳහා වෙන් කර තිබෙනවා නම් එම මුදල් යොදවා මී පෙට්ටි ගණනාවක් සකස්කොට ගමක් ගමක් පාසා ඒවා බෙදා දී ඒ පිළිබඳව නිසි පිළිවෙළේ ප්‍රචාරයක් කොට මී පෙට්ටි ආරක්ෂා කර ගන්නා අන්දම අවබෝධ කර දෙන්නට පුළුවනි. එම ව්‍යාපාරය අනුව අපට අවුරුද්දකින් පසු ප්‍රතිඵල බලා ගන්නට පුළුවනි. එමනිසා මීමැසි ව්‍යාපාරය මීට වඩා සාර්ථක කර ගැනීම පිණිස සුදුසු වැඩ පිළිවෙළක් යොදන මෙන් මා ඉල්ලා සිටිනවා. ආයුර්වේද බෙහෙත්වලට මී පැණි අවශ්‍ය වෙනවා. අද මී පැණි බෝතලයක් ලබා ගන්නට ගියොත් අපට ලැබෙන්නේ මිශ්‍රිත පැණියි. කිතුල් පැණි සහ පොල් පැණි යනාදිය මිශ්‍ර කර අද නියම මී පැණියි කියා විකුණනවා. එම තත්ත්වය නැති කළ යුතුව තිබෙනවා. ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා නියම පිරිසිදු මී පැණි අවශ්‍යයි. ගම්මානවල මෙම මීමැසි ව්‍යාපාරය දියුණු කරන්නට පුළුවනි. එසේ බැරිනම් ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යට තේ බෙදා දී තිබෙන අක්කර කාලේ බාගයේ නැත්නම් අක්කරයේ ඉඩම් කොටස්වල වගා කරන උදවිය අපේ රටේ සිටින බව අප දන්නවා. එම උදවිය මෙම ව්‍යාපාරය කෙරෙහි යොමු කරවීම පිණිස මී පෙට්ටිය බැගින් සකස් කර දී කටයුතු කළොත් අවුරුදු පතා දෙපාර්තමේන්තුව මගින් ගොස් ඔවුන් නිෂ්පාදනය කරනු ලබන මී පැණි ලබාගෙන අවුත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට දෙන්නට පුළුවන් වේවි.

දුම්කොළ ව්‍යාපාරය ගැනත් මා මුලදීම සඳහන් කළා. අද එම ව්‍යාපාරය ඉතා දුඃඛිත තත්ත්වයක පවතින බව පෙනෙන හෙයින් ඒ පිළිබඳව තමුන් නාන්සේගේ කාරුණික අවධානය යොමු කළ යුතුව ඇති බව මා නැවත වරක් මතක් කර සිටිනවා.

අපේ පළාත්වල වී වගාව පිළිබඳව යමක් කිවයුතුයි. මෙම සභාවෙහි කියන දේ නොවෙයි බොහෝ විට එම පළාත් වලට බලපාන්නේ. අපට වතුර ලැබෙන් නෙ එක්තරා කාලසීමාවකදී පමණක් නිසා අප වී වගාව කරන්නේ ඒ කාල සීමාවේදී පමණයි. අනික් කාලසීමාවේදී අපි කරන්නේ එළවළු වගා කිරීමයි. එක කන්නයක් වී වගා කිරීමත් අනික් කන්නයේ එළවළු වගා කිරීමත් කරන් නට දෙපාර්තමේන්තුව ඒ ප්‍රදේශය නිද හස් කර තිබෙනවා.

මේ කටයුතු කරගෙන යාමට බාධක පාන පොඩි ප්‍රශ්නයක් තිබෙන නිසා ඒ ගැනත් තමුන්නාන්සේගේ කාරුණික අවධානය යොමු කරනවා ඇතැයි මා බලා පොරොත්තු වෙනවා. තක්කාලි, කරවිල, වැටකොළු—[බාධා කිරීමක්]—වම්බටු පම ණක් නොවෙයි, අනිකුත් සෑම බෝග වර්ග යක්ම වගේ හේවාහැට ප්‍රදේශයේ වැවෙ නවා. ඔවුන්ට තිබෙන දුෂ්කරතාව නම් එළවළු වගා කිරීම සඳහා ලැබෙන පෝර ප්‍රමාණය මදි වීමයි; ඒ වගේම පෝරවල මිළ වැඩි වීමයි. ඒ නිසා හේවාහැට ප්‍රදේශ වාසීන්ට අවශ්‍ය පෝර පහසුවෙන් ලබා ගැනීමට පෝරවල මිළ ටිකක් අඩු කරනවා නම් කොළඹ එළවළු ව්‍යාපාරිකයන්ටත්, මහනුවර එළවළු ව්‍යාපාරිකයන්ටත් පම ණක් නොවෙයි, ලංකාවේ ඕනෑම එළවළු ව්‍යාපාරිකයෙකුට ඉතා පහසුවෙන් එළවළු සපයා දෙන්න පුළුවන්කම ලැබෙනවා. වැඩිපුර එළවළු ප්‍රමාණයක් නිෂ්පාදනය වෙන්නෙ හේවාහැට ප්‍රදේශයේ බව මා නොකිව්වාට ගරු ඇමතිතුමා දන්නවා. ඒ නිසා ලංකාවේ අස්සක් මුල්ලක් නැර එළවළු නැහැ කියන ප්‍රශ්නයට පිළිතුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩැනියෙල් මයා.]
සැපයීමට අප උදව් දීමට, අත දීමට ලැහැස්ති නිසා, ඒ ව්‍යාපාරයට තමුන්නාන්සේගේ සම්පූර්ණ සහයෝගය දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

අද වී වගාව වෙනුවට එලවළු වගාවත් කරන නිසා අපි කවදාවත් කෑ ගහන්නෙ නැහැ. "අපට වී නැහැ" කියා. හේවාහැට අපට වීත් තිබෙනවා. එලවළුත් තිබෙනවා. බිත්තර වී ප්‍රශ්නය ගැන දැන් බොහොම දෙනෙකු කෑ ගසනවා මා අසා ගෙන සිටියා. මගේ හේවාහැට ගොවි ජනතාවගේ සිරිත ලබන කන්නයට අවශ්‍ය බිත්තර වී මේ කන්නයේදී ඉතුරු කර තබා ගැනීමයි. සමහර ප්‍රදේශවල ගොවීන් වී ඔක්කොම ටික දීලා මුදල් ලබා ගන්නවා. පසුව බිත්තර වී ටිකක් කාගෙන් හෝ ලබා ගන්නට බලාපොරොත්තු වෙනවා. හොඳ බිත්තර වී තිබෙන්නෙ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙයි. ඒ නිසා බිත්තර වී ලබා ගන්න වුවමනා නම් දෙපාර්තමේන්තුවට යන්න ඕනෑ. ඒ නිසා දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන්ම ගිහින් ගොවීන්ට කියන්න ඕනෑ, බිත්තර වී දෙපාර්තමේන්තුවෙන්ම බලාපොරොත්තු නොවී ගෙදරම සකස් කර ගන්න කියා. අපේ පළාත්වල නම් ඕනෑම ගෙදරක මීළඟ කන්නයට වුවමනා කරන බිත්තර වී ප්‍රමාණය, තමන්ගේ වපසරියේ ප්‍රමාණයට සරිලන සේ සකස් කරගෙන තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙනුත් මා ඉල්ලා සිටිනවා, ඊළඟ කන්නයේ වැපිරීමට තමන්ට වුවමනා කරන බිත්තර වී ප්‍රමාණය කෙතෙක්දැයි දැනගෙන ඒ ප්‍රමාණය ඉතිරි කරගෙන අනික් වී විකුණන්නය කියා තමුන්නාන්සේලාගේ ආසනවල සිටින ගොවීන්ට උපදෙස් දෙන්න කියා. [බාධාකිරීමක්] ගොවි රජවරුන්ටත් මේක කිය යුතුමයි.

මේ බිත්තර වී අවුරුද්දක් දෙකක් තබා ගන්නේ කොහොමද කියන ප්‍රශ්නය ගැන මා දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන් සමඟ සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදී ඒ නිලධාරි මහත්වරුන් මට කියා සිටියා, එච් 4 සහ එච් 8 නමැති අළුත් වී වගී නිකම්ම තබා ගත්තොත් ටික කලකින් ඒවා බොල් වී නරක් වී යන්න පුළුවන් බව. ඒවා කල් තබා ගැනීමට නම් බොල්, කාටු ආදිය සමගම ගෝනියක දමා බැඳ සුදුසු ස්ථානයක තැන්පත් කර තැබිය යුතු බව ඒ නිලධාරීන් මට වැඩි දුරටත් කිව්වා. ඒ ක්‍රමයට අවුරුදු 3ක් පමණ තබා ගන්නට පුළුවනි. තමන්ට වුවමනා වූ විට එයින් බිත්තර වී ටිකක් තෝරා ගන්නට ඕනෑ. බිත්තර වී පමණක් වෙන් කර තැබුවොත් ඒවා ටික කලකින් බොල් වී යන බව දැනගන්නට ලැබුණා. අපේ උදවිය එහෙම නොවෙයි. වී ටික ගත්තාම, ඔක්කෝම, එක්කෝ දෙපාර්තමේන්තුවට දෙනවා; එහෙම නැත්නම් කළු කඩේට ගිහිල්ලා දෙනවා. ඊට පස්සෙ සිදු වන්නේ මොන විධියේ දෙයක්ද? ඊට පස්සේ, ගරු ඇමතිතුමා හෝ එසේ නැත්නම් දෙපාර්තමේන්තුව ඇවිත් ඔවුන්ට බිත්තර වී දෙන්නට ඕනෑ යයි ඒ උදවිය කල්පනා කරනවා. මෙයින් ඈත් වීමට උත්සාහ කරන්නට ඕනෑ. මේ තත්ත්වය තවත් දුරට ගෙන යෑම නුවණට හුරු නැහැ. තමන්ට අවශ්‍ය බිත්තර වී ටික තමන් විසින්ම සකස් කර ගැනීම සම්බන්ධයෙන් සියලු දෙනාගේම අවධානය යොමු කරනු ඇතැයි බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

අ. භා. 2.30

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම, ආහාර හා සමුපකාර කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කරුණු කිහිපයක් පමණක් තමුන්නාන්සේගේ සැලකිල්ලට භාජන කරන්නට මා බලාපොරොත්තු වෙනවා. අපේ රටේ ප්‍රධාන වගාව වී වගාව බව තමුන්නාන්සේ දන්නවා. එය එසේම බව අපි කවුරුත් පිළිගන්නවා. වී වගාව වැඩි කිරීමෙන් රටේ ජනතාව ආහාරය අතින් ස්වයංපෝෂිත කිරීමට යම්කිසි උත්සාහයක් දරනවා නම්, ඇත්ත වශයෙන්ම එසේ උත්සාහ කිරීම කළ යුතුම වැඩක් හැටියට අපි කවුරුත් පිළිගන්නට ඕනෑ. එහෙත්, වී වගාව දියුණු කිරීමේ කාර්යයට යම් යම් බාධක තිබෙන බව අපට පෙනෙනවා. ඒ බාධක මොනවාදැයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සොයා දැනගෙන ඒවාට උචිත පරිදි පිළියම් කරන්නට ඕනෑ; ප්‍රතිකර්ම දෙන්නට ඕනෑ. ගරු ඇමතිතුමාගේ වී ගොවිතැන ගැන මා වාගේම දන්නවා. වලපනේත්, හඟුරන්කෙත වාගේම කොට්ඨාශයක්. එතුමා මීට පෙර හඟුරන්කෙත මන්ත්‍රීවරයා වශයෙන් සිටියා. හඟුරන්කෙත ගැන එතුමා ඉතා හොඳින් දන්නවා.

එදා තිබුණු ප්‍රතිපත්තිත්, අද තිබෙන ප්‍රතිපත්තිත්, ආණ්ඩුවේ ප්‍රතිපත්තිත්, ජනතාවගේ වැඩ පිළිවෙළත් යන මේවා ගැන කල්පනා කර බලන විට ඒ හැම එකක්ම අනුව සමුපකාර ව්‍යාපාරය ගොවිතැන කෙරෙහි බලපාන බව පෙනී යනවා. සමුපකාර ව්‍යාපාරය මගින් තමයි, ගොවියාට ණය මුදල් ලබා ගැනීමට පුළුවන් වන්නේ. පෝර ලබා ගැනීමට පුළුවන් වන්නේත්, වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය ලබා ගැනීමට පුළුවන් වන්නේත්, වෙන එකක් තබා තමන් ගන්න අස්වැන්න විකුණා ගන්නට පුළුවන් වන්නේත් සමුපකාරය මගිනුයි. සමුපකාර ව්‍යාපාරයේ තිබෙන වැදගත්කම, ඒ කරුණු සම්බන්ධයෙන් සලකන විට, ඉතාමත් විශාල එකක් බව අවිවාදයෙන් පිළිගත යුතුව තිබෙනවා. එහෙත් අපේ ගම්බද බොහොමයක් ප්‍රදේශවල අද සමුපකාර ව්‍යාපාරය අඩපණ වී තිබෙන බව කියන්නට සිදු වීම ගැන මා කනගාටු වෙනවා. පසුගිය දවස්වල ගම් රාශියකට යන්නට මට අවස්ථාව ලැබුණා. ඒ අවස්ථාවේ ගොවීන් ඉදිරිපත් කළ පැමිණිලි ගැන කල්පනා කර බැලු විට ඉතාමත් පැහැදිලි ලෙස පෙනී ගියේ ඒ ප්‍රදේශවල සමුපකාර ව්‍යාපාරය අඩපණ වෙලා තිබෙන බවයි. තමන්ගේ සමුපකාර සමිතිවලට පණ නැතැයි කියන මිනිසුන් විශාල පිරිසක් මට මුණ ගැසුණා. රුස්වීම් පැවැත්වීම කාලයකින් නොසිදු වූ බවත්, ණය මුදල් ගෙවීම නොකෙරෙන බවත් බොහෝ දෙනා කියනවා අසන්නට ලැබුණා. ඒ නිසා සිද්ධ වෙලා තිබෙන්නේ ඉතාමත් හොඳට ගොවිතැන් කරමින් සිටි යම් යම් ගොවීන්ට, ඒ සඳහා වුවමනා කරන පෝර, ණය මුදල්, උපකරණ සහ වෙනත් දේ ලබා ගන්නට බැරි වීමෙන් ඒ උදවියගේ ගොවිතැන් කටයුතුත් සම්පූර්ණයෙන්ම වාගේ අඩපණ වූ තත්ත්වයකට පත්වීමයි. මේ තත්ත්වය වහාම වෙනස් කරන්නට ඕනෑ.

කාර්යාලවල පංකා යටට වී, සුව පහසු අසුන්වල වාඩි වී වාර්තා ලියමින් කාලය ගත කරන නිලධාරීන් ඊට අමතරව තවත් වැදගත් වැඩ කොටසක් කරන්නට ඕනෑ. ගම් ඇතුළට ගිහිල්ලා, මේ ව්‍යාපාරය ගම්වල ක්‍රියාත්මක වන්නේ කෙසේ දැයි සොයා බලන ලෙස ගරු ඇමතිතුමා මේ නිලධාරීන්ට නියම කරනවා නම් හොඳ ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. සමුපකාර සමිති දුර්වල නිසා සමහර ගම්වල ගොවීන්ට අවුරුදු දෙක තුනක්ම පෝර පවා ලබා ගන්නට බැරි වී තිබෙනවා. සමුපකාර සමිති ගැන සමාලෝචනයක් කළොත්—සොයා බැලුවොත්—ඒවා දැන් සම්පූර්ණයෙන්ම වාගේ අඩපණ වෙලා තිබෙන බව පෙනී යනවා ඇති. ඒ තත්ත්වය නිසා වගා කටයුතු සම්බන්ධයෙන් බලාපොරොත්තු වන ඉදිරි ගමන යන්නට බැරි තත්ත්වයක් ඇති වෙලා තියෙනවා. ඒ තත්ත්වය නැති කරන්නට ඕනෑ. මේ මේ දේවල් කර තිබෙනවායයි අවුරුදු පතා වාර්තා ඉදිරිපත් කර ඒවා මුද්‍රණය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නැහැ, ගමේ කෙරෙන්නේ මොනවාදැයි සොයා බලන්නේ නැත්නම්. ඒ නිසා වැඩි වැඩියෙන් මේ ව්‍යාපාරය ක්‍රියාත්මක වන අයුරු සොයා බලන්නට ඕනෑ. ගොවීන්ට මුහුණ පෑමට තිබෙන අමාරුකම් මොනවාදැයි සොයා බලා ඒවාට නිසි පිළියම් කරන්නට ඕනෑ. එතකොටයි බලාපොරොත්තු වන විධියට සංවර්ධනයක් කරන්නට පුළුවන් වන්නේ. මේ අවුරුද්දේ වාර්තාවල දහයේ ඉලක්කම් තිබුණොත් ඊළඟ අවුරුද්දේ පහළොවක් හැටියට ලකුණු කරනවා ඇති. ඊටත් පස්සෙ අවුරුද්දේ විස්සක් වෙලා තිබෙනවා යයි කියාවි. එයින් පමණක් බලාපොරොත්තු වන පරමාර්ථය ඉෂ්ට වන්නේ නැහැ.

ගම්බද කුඹුරු ගැන තමුන්නාන්සේ දන්නවා. රටේ ජනගහණය එන්න එන්නම වැඩි වෙමින් පවතිනවා. එහෙත් ගමේ තිබෙන කුඹුරු ප්‍රමාණය වැඩි වන්නේ නැහැ. අක්කරයක ඉඩමක් අයිතිකාරයා මිය යැමෙන් පසු ඔහුගේ ඉඩම් දරුවන් දෙදෙනෙකු අතර බෙදී ගියොත් එය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. එම්. හේරත් මයා.]

අක්කර භාගයේ කොටස් දෙකකට කැඩෙනවා. ඔය ආකාරයට ගොස් අන්තිමේදී දහයෙන් එකට බෙදෙන කාලයකුත් එනවා. එන්න එන්නම කුඹුරු කුඩා වෙනවා. එතකොට ඒවා ප්‍රයෝජනයක් ගන්නට පවා බැරි තත්ත්වයට වැටෙනවා. ඒ ආකාරයට කුඹුරු බෙදීම නතර කරන්නට වැඩ පිළිවෙළක් ඇති කිරීම අවශ්‍යයි. ඒ නිසා ගොවි පවුල්වල උදවියට වී වගා කිරීමට ගොවි ව්‍යාපාරවල ඉඩම් දීමේ ක්‍රමයක් තිබිය යුතුයි. එහෙත් බොහෝ විට ඉඩම් කච්චේරි වලින් ඉඩම් බෙදා දෙන විට ගොවි පවුල්වල උදවියට නොවෙයි ඉඩම් ලැබෙන්නේ. ගොවිතැන සඳහා ඉඩම් බෙදන විට කවදාවත් ගොවිතැන් නොකළ උදවියට ඉඩම් දීමේ ක්‍රමයක් තිබෙනවා. නුවරඑළියේ ඉඩම් කච්චේරියක් ගැන සඳහන් කරද්දී කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (රණතුංග මයා.) මට අභියෝගයක් කළා. එතුමාට ඒ නිලධාරියා ආරක්ෂා කරන්නට ඕනෑ කමක් තිබුණාට, මට වුවමනා කරන්නේ නැහැ. අසවල් ඉඩම් කච්චේරියේදී මේ උදවිය තෝරන්නය කියා මා කවදාවත් එතුමාට ලැයිස්තු යවා නැහැ. උන්නැහේ එහෙම ලැයිස්තු අරින නිසා ඒ නිලධාරියා ආරක්ෂා කරන්නට උන්නැහේට වුවමනා ඇති. මොන පක්ෂයට අයත් හෝ වේවා මධ්‍යස්ථව, අපක්ෂපාතව වැඩ කරන සුදුස්සාට තැන දීමයි, අපට වුවමනා කරන්නේ. නිලධාරීන්ගේ වැරදි හෙළි කිරීම මහජන නියෝජිතයන් හැටියට අපේ යුතුකමක්. කුඹුරු කැබෙලිවලට කැඩීමේ ව්‍යාපාරය නතර කිරීමට සැලැස්මක් ඇති කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ සඳහා දැන් කාලය පැමිණ තිබෙනවා.

ගරු සභාපතිතුමනි, කුඹුරු පනත යටතේ අද අද ගොවීන්ට සිදු වී තිබෙන්නේ කුමක්ද ? අද අද ගොවීන් 40,000ක් පමණ අනාථ වී සිටිනවා. සංශෝධනයක් ගෙනැවිත් එය හදනවාය කියා ගරු ඇමතිතුමා කිව්වා. අවුරුදු හතරහමාරක් ගත වෙලත් තවම හදා නැහැ. අපේ ආණ්ඩුව කාලයෙත් ඔය ප්‍රශ්නය තිබුණා. ඒ කාලයෙත් කෙරුණේ නැහැ ; මේ කාලයෙත් කෙරුණේ නැහැ. කෙසේ හෝ මේ ප්‍රශ්නය විසඳිය යුතු නිසා ඒ සඳහා ක්‍රියා මාර්ගයක් ඇති කරන්න ඕනෑ. කරනවාය කියා පත්‍ර වල පළ කළාට මදි; කරන්න ඕනෑ. අපේ පැමිණිල්ල ඒකයි.

දුම්කොළ වගාව ගැන විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. දුම්කොළ රාත්තලකට රුපියලක් වැඩි කරනවාය කියා මේ ආණ්ඩු පක්ෂයේ නියෝජිතයන් මැතිවරණ කාලයේදී වේදිකාවල බෙරිහන් දුන්නා. එහෙත් ඒක කළේ නැහැ. ඒ වෙනුවට මුදල් ඇමතිතුමා අවුරුද්දෙන් අවුරුද්ද දුම්කොළ බද්ද වැඩි කළා. පිරිවැටුම් බදු මගින් හෝ සුරා බදු මගින් හෝ කෙළින්ම දුම්කොළවලින් කෝටි 40 ක ආදායමක් ආණ්ඩුව ලබනවා. දුම්කොළ වවන්නාට කිසිම සහනයක් නැහැ. කම්කරුවන්ගේ පඩි වැඩි වෙලා. දර යාරයක මිල එදා වගේ හතර ගුණයක් නැගලා. හැම පාරිභෝගික ද්‍රව්‍යයකම මිල වැඩි වෙලා.

මීට කලින් දුම්කොළ සමාගම් දෙකක් අතර තරඟයක් තිබුණා. අද තියෙන්නේ එක සමාගමයි. ඒ නිසා ඔවුන්ගේ හිතුවක්කාර ක්‍රියා වැඩි වෙලා තියනවා. මුළු ලංකාවේම දුම්කොළ වවන්නන් එකතු වී රැස්වීම් පවත්වා තීරණයක් ගෙන තිබෙනවා. ඔවුන්ට දැනට තිබෙන තත්ත්වයෙන් මිදීම සඳහා සැහෙන මිලක් නොගෙව්වොත් දුම්කොළ වැවීම වර්ජනය කරනවාය කියා. හෙට අනිද්දා ඔවුන් තමුන්නාන්සේ සමග සාකච්ඡා කරයි. දැන් ඔවුන්ට දුම්කොළ වවා වැඩක් නැහැ. රුපියල් දහ දාහක් වියදම් කර, මහජන බැංකුවෙන් ණය අරගෙන දුම්කොළ වැව්වම, ආදායම ලැබෙන විට ණයට ගත්ත සල්ලි කපා ගත්තම හිස් අතින් ගෙදර යන්න ඕනෑ. තමන්ගේ ශ්‍රමයත්, ගෙදර තිබෙන මුදලුත් යොදවා අන්තිමේදී පාඩු විඳින්නට ඔවුන්ට වුවමනාවක් නැහැ. ගරු ඇමතිතුමා සමග සාකච්ඡාවෙන් පසු, ඔවුන් දැනට ගෙන තිබෙන තීරණය ක්‍රියාත්මක කළොත් ආණ්ඩුවටත් රුපියල් කෝටි ගණනක් පාඩු වෙනවා.

හඟුරන්කෙත, වලපනේ වැනි ප්‍රදේශවල විශාල වශයෙන් දුම්කොළ වගා කරනවා. දුම්කොළ වවන්නන් සහ කම්කරුවන් ආදායමක් ලබන ව්‍යාපාරයක් මේක. ආණ්ඩුවටත් එයින් විශාල ආදායමක් ලැබෙනවා. ඒ නිසා ආණ්ඩුවත් ඒ ජනතාවත් ආරක්ෂා කර ගැනීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිණිස ඉක්මණින්ම එඩිතර ක්‍රියා මාර්ගයක් ගන්නට ඕනෑ. දුම් කොල සමාගම් ලබන මුදලින් කොටසක් හෝ ආණ්ඩුව ලබන මුදලින් කොටසක් හෝ දුම්කොළ වවන්නන්ට දෙන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. එහෙම නොකළොත් විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙනවා. විදේශ විනිමය නැත කියන තමුන්නාන්සේලාට නැවතත් පිටරටින් සිගරැට් ගෙන්වන්නට සිදු වෙයි. ඒකට කරන්න දෙයක් නැහැ. කරුණාකර මේ ගැන පරීක්ෂා කර පියවරක් ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

වලපනේ තිබෙන ඇපල් වගාව දියුණු කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කර තිබෙන්නේ මොකක්ද කියා මා අහන්නට සතුටුයි. පුද්ගලයන් කීප දෙනකු තමන්ගේ උත්සාහයෙන් මේ වගාව දියුණු කර තිබෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව උත්සාහ කළා නම් මේ වගාව මීට වඩා දියුණු කරන්නට පුළුවන්. මොකක්ද කළේ ? කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂඥයින් ඇවිත් එහි තිබුණ හොඳ ඇපල් අතු ටික කපා ගෙන ගොස් සීතාඑළියේ තවන් කළා. අද තවානත් නැහැ. ඇපල් ගසුත් නැහැ. ඒ මිනිහත් නැහැ. අන්තිමට සිදු වුණේ එයයි. මුළු ලංකාවටම වුවමනා ඇපල් වවන්න පුළුවන් ඉඩම් ඒ ප්‍රදේශයේ තිබෙනවා. එයට සුදුසු රජයේ ඉඩම් ඕනෑ තරම් තිබෙනවා. සී. පී. ද සිල්වා ඇමතිතුමා ඒ ඉඩම්වල "රෙඩ් ගම්", "බ්ලු ගම්" කියන ගස් වවා දැන් කැලෑවට ගොස් තිබෙනවා. නමුත් ඒ ඉඩම්වල ඇපල් වැව්වොත් ලංකාවට වුවමනා තරම් ඇපල් සපයන්න පුළුවන් වෙනවා. ඇපල් වලට වුවමනා දේශගුණය ඒ ඉඩම් තිබෙන හරියෙ තිබෙනවා. වෙන කොහේවත් ඒ දේශගුණය නැහැ. ඇපල් වැවීමට ඒ ඉඩම් තීරු ඉතාමත් යෝග්‍යයි. ඒ ඉඩම්වල ඇපල් වවනවා නම් මේ හැමෝටම වුවමනා තරම් ඇපල් සපයන්න පුළුවන් වෙනවා. අද ලෙඩෙකුට දෙන්නට හෝ ඇපල් ගෙඩියක් ගන්නට රු. 2.50 ක්, 3.00 ක් පමණ ගෙවන්න සිදු වෙනවා. නමුත් ඇපල් වවන ගොවියාට ඇපල් ගෙඩියකට ලැබෙන්නේ ශත 75 ක් නැත්නම් රුපියලක් පමණයි. ඒ සම්බන්ධයෙන් කිසිම පිළිවෙළක් යොදා නැහැ. ඒ ගැන සොයා බලන්නෙත් නැහැ. පරීක්ෂණයක් පවත්වන්නෙත් නැහැ. ප්‍රදර්ශනයකට තබන්න වුවමනා වූ විට ඇමතිතුමා කරන්නේ රාගල සිටින ගොවියෙකුගේ ඇපල් ගෙඩි ටිකක් ගෙනැවිත් රහංගල ඇපල් කියා ප්‍රදර්ශනයට තබනවා. මා කියන්නේ මෙයයි. කොහේ ඇපල් වුණත් මට කමක් නැහැ. මේ ව්‍යාපාරය දියුණු කළ යුතු බවයි අප කියන්නෙ. දියුණු කරන්න පුළුවන් ව්‍යාපාරයක් තමයි මේ.

ආහාර දෙපාර්තමේන්තුව ගැනත් ඊළඟට වචනයක් දෙකක් කතා කරන්න ඕනෑ. සලාක හාල්, සලාක ද්‍රව්‍ය බෙදා හැරීම පිළිබඳව මා මීට කලිනුත් තමුන්නාන්සේට පැමිණිලි කර තිබෙනවා. තෙරීපැහැ කියන ගමේ සමුපකාර කඩයක් තිබෙනවා. මේ ගමට යන්න වාහන පහසුකම් නැති නිසා හැතැප්ම 9 ක් පමණ පයින් යන්න තිබෙනවා. ඒ ගමේ වැසියන්ට අද හාල් සලාකය හරිහැටි ලැබෙන්නේ නැහැ. පසුගිය මාසයේ මා ඒ ගමට ගිය අවස්ථාවේදී හාල් සලාකය ලැබෙන්නෙ නැත්තෙ ඇයිද කියා මා අසා බැලුවා. සමුපකාර සමිතියට හාල් ලැබෙන්නෙ නැතිලු. හේතුව හාල් ගෙන ඒමට කුලිය දෙන්න සමුපකාර සමිතියට මුදල් නැතිලු. ඇයි මොකටද මේ වගේ සමූපකාර සමිති. ? සලාක ද්‍රව්‍ය බෙදාහැරීමවත් කෙරෙන්නේ නැත්නම් මේවගේ සමුපකාර සමිතිවලින් ඇති ප්‍රයෝජනය මොකක්ද? මා කීප විටක්ම නුවරඑළියේ කච්චේරියට මේ ගැන පැමිණිලි කළා. තමුන්නාන්සේගෙන් කොතෙකුත් ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න අසා තිබෙනවා. ඒ ගමේ මිනිසුන්ට සලාක ද්‍රව්‍ය ලබා දෙන්න ඒ සමුපකාර සමිතියට බැරි නම් එය වසා දමා වෙනත් මාර්ගය කින්වත් ඔවුන්ට ඒවා ලබා දෙන්න කට යුතු කරන්න. කොහොම හරි ඒ මිනිසුන්ට සලාක ද්‍රව්‍ය ලබා දෙන්න මාර්ගයක් ඇති කරන්න. දෙන්නෙත් එක හාල් සේරුවයි. නමුත් ඒ මිනිසුන්ට ඒ හාල් සේරුවවත් ලැබෙන්නේ නැහැ. මෙය සිදු වන්නේ කලට වේලාවට කුලී මුදල් ගෙවන්නේ නැති නිසයි. මාස 3ක 4ක කුලී මුදල් එකතු වෙන විට දුප්පත් සමුපකාර සමිතියට එය උසුලන්න බැහැ. එයත් මේ තත්ත්වය ඇති වීමට එක් හේතුවක්. ඒ නිසා මේ ගැන වහා පරීක්ෂා කර බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

කැළණියේ මන්ත්‍රීතුමාට (ආර්. එස්. පෙරේරා මයා.) අද පැමිණීමට නොහැකි බැවින් තමුන්නාන්සේගෙන් අහන්නය කියා මට ප්‍රශ්නයක් එවා තිබෙනවා. එය ආහාර දෙපාර්තමේන්තුවකට අයිති ලොරියක් පෙරළී ජීවිතක්ෂයට පත් වූ අයට වන්දි මුදල් ගෙවීම පිළිබඳ ප්‍රශ්නයකුයි. 1969 ජූනි මස 28 වෙනි දින ගරු ඇමතිතුමා මේ ගැන ලියා යවා තිබෙනවා. ජීවිතක්ෂයට පත් වුණ ඒ පුද්ගලයාට වන්දි මුදල් ගෙවන්නය කියා සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාට නියම කළ බව දන්වා යවා තිබෙනවා. මෙහි ලිපි ගොනු අංකය 512101 යි. නමුත් අද වන තෙක් තමුන්නාන්සේ කිසිම දෙයක් කර නැහැ. තමුන්නාන්සේගේ ලියුමත් තියාගෙන ඒ මිනිසුන් බලා ඉන්නවා.

දැන් එක් ගරු මන්ත්‍රීවරයෙක් කියන්න යෙදුනා හාල් පොතක්වත් ගන්න බැරිය කියා. මා 27 වාරයක් ගොස් තිබෙනවා වලපනේ ආදායම් පාලක නිලධාරියා ළඟට හාල් පොතක් ගැනීමට. වත්තෙන් දෙන ලද ටෝකන් කාඩ් එකත් අරගෙන ගියා හාල් පොතක් ලබා ගන්න. නමුත් අඩු ගණනේ ඒ නිලධාරියාට පුළුවන්කමක් තිබුණේ නැහැ, හාල් සේරුව ගන්න පුළුවන් බලපත්‍රයක්වත් ලබා දෙන්න. ඇයි? ඒ නිලධාරියා ගැන තමුන්නාන්සේ දන්නවා ඇති නේ. පැල් මඩුල්ල අතුරු මැතිවරණයට මහන්සි වී වැඩ කළ නිසා තමයි, ඒ පුද්ගලයා ආදායම් පාලක නිලධාරියා වශයෙන් පත් කළේ. කලින් අස් කර සිටි නිලධාරියෙකුයි මේ. ඒ අය මහජනයා වෙනුවෙන් වැඩ කරන්න භාර ගන්නවා නම් නියම ආකාරයට ඒ වැඩ කටයුතු කරන්න ඕනෑ. ආණ්ඩුවේ නිලධාරීන්ට පහර ගසනවාය කියා සමහර මන්ත්‍රීවරුන්ට කේන්ති යනවා. නමුත් අපි මේවා කියන්න ඕනෑ. මේවා ඇත්ත කරුණු. මෙතැනදී කියන්නෙ නැත්නම් අපි කොහෙදිද මේවා කියන්නෙ?

දැන් වලපනේ සමුපකාර සංගමය විසුරුවා හැර තිබෙනවා. එය සම්පූර්ණයෙන්ම විසුරුවා හැරියා. විසුරුවා හැර දැන් අවුරුදු හතරහමාරක් තිස්සේ පරණ විධියටම කරගෙන යනවා. එක්කො මහජනයට දෙන්න ඕනෑ සමුපකාර සංගමයක් සකස් කර ගැනීමේ අවස්ථාව.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

දෙන්න පුළුවන් නමුත් හුඟක් ප්‍රශ්න තිබෙනවා.

අ. භා. 2.45

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඔව්, ඒකට කමක් නැහැ. එහෙනම් ප්‍රශ්න විසඳන්න. හැබැයි, වර්තමාන පාලනය ගැනත් සොයන්න ඕනෑ. මන්ත්‍රිවරුන්ගේ වගේම පාලක ලේකම්වරුන්ගේ වත්කම් හෙළි කරන්නත් වේවි. තමුන්නාන්සේ දන්නවාද කළුතර තොටමුණේ සමුපකාර සංගමයේ පාලක ලේකම් කවුද කියා? මේ ගරු සභාවේ මන්ත්‍රීවරයෙක්. සභාපති නොවෙයි. පාලක ලේකම්, පඩි ලබන පාලක ලේකම් කවුද? හිනිදුම ගරු මන්ත්‍රීතුමා (එම්. එස්. අමරසිරි මයා.). නැද්ද කියා සොයා බලන්න. එතුමා සමුපකාර සංගමයක පාලක ලේකම් හැටියට පඩි ලබන සේවකයෙක්. එතුමා මේ ගරු සභාවේ මන්ත්‍රීවරයෙක්. මෙහෙන් හම්බ වෙනවාට වඩා ගනුදෙනුවක් එහෙන් හම්බ වෙනවා. ඒක ඇත්ත. මෙවැනි දේවල් අපි පිරිසිදු කර ගන්න ඕනෑ.

මා සභාපති හැටියට සිටි සංගමය විසුරුවා හැරියා. කිසිම විභාගයක් කෙළේ නැහැ; අපෙන් වචනයක්වත් ඇසුවේ නැහැ. චෝදනා තිබුණා නම් ඒ ගැන අසා බලන්න ඕනෑ. විභාග කරන්න ඕනෑ. හිටි ගමන් විසුරුවා හැරියා. ඒකද ප්‍රජාතන්ත්‍රවාදය? එහෙත් උන්නැහේලාගෙ ප්‍රජාතන්ත්‍රවාදය කොහොමද? උන්නැහේලා කොහොමද කරගෙන යන්නෙ? අද වන තුරු අපෙන් වචනයක්වත් ඇසුවෙ බැලුවෙ නැහැ. දැන් අවුරුදු හතරහමාරක් වෙනවා. එය විසුරුවා හැරියෙ 1965 මැයි 2 වෙනිදා. ඒ කාරක සභාවට අද වන තුරු චෝදනා නගා නැහැ. අපි කියන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැරදිවලට දඬුවම් කරන්න එපාය කියා. එහෙත් එය කරන ක්‍රමයක් තිබෙනවා, පිළිවෙළක් තිබෙනවා. එසේ නැතුව එක් කෙනෙකුට එක විධියකටත් තව එක් කෙනෙකුට තවත් විධියකටත් ක්‍රියාත්මක වන පරිදි බලතල පාවිච්චි කිරීම සුදුසු නැහැ.

සභාපතිතුමනි, මට දී තිබෙන කාලය බොහොම සීමා සහිතයි. මට පෞද්ගලික කරුණු පැහැදිලි කිරීමක් කරන්නට තිබෙන නමුත්, එය වෙනත් අවස්ථාවක දී කිරීමට තබාගෙන මගේ කථාව අවසන් කරනවා.

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்புதெனிய)*
(Mr. R. G. Senanayake—Dambadeniya)
සභාපතිතුමනි, ඇමතිතුමාට පළමුවෙන්ම ප්‍රශංසා කළ යුතුව තිබෙනවා. ඒ මොකද, එක්තරා ප්‍රමාණයකට ආහාර අංශයෙන් රටේ සංවර්ධනයක් වී තිබෙන නිසා. එහෙත් එසේ සංවර්ධනයක් ඇති වීමට මූලික හේතුව සොයාගෙන යන විට මීට හේතු වී ඇත්තේ ආණ්ඩුවෙන් කරගෙන යන විශෙෂ වැඩපිළිවෙළක් නිසා නොව, මේ රටේ වී ගොවිතැන සම්බන්ධයෙන් විශෙෂ නිර්මාණයක් වූ එච් 4 සොයා ගත්තාට පසුව බව අපට පැහැදිලි වී යනවා. අද ආහාර අතින් ලැබී තිබෙන ප්‍රතිඵලය ලැබුණේ එච් 4 සොයා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙනුයි. එසේ නම් අපි සොයා බැලිය යුතුයි. ඒ එච් 4 වී සොයා ගත් තැනැත්තාට විශෙෂ තැනක් දී තිබෙනවාද කියා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
එයා ශිෂ්‍යත්වයක් ලබාගෙන ඇමෙරිකාවට ගියා.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
රටට මේ තරම් උසස් සේවයක් වන පරිදි විශෙෂ දෙයක් සොයාගත් ඒ තැනැත්තා අමෙරිකාවට යවලා එහෙ තිරිඟු වගාව දියුණු කරන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඒක මම දන්නෙ නැහැ. යන්න ඕනෑය කියා ඒ ශිෂ්‍යත්වය ලැබුණාම බොහොම ආශාවෙන් ගියා, ආශාවෙන් සිටි නිසා ඉඩ හැරියා.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
එයාගෙ ඕනෑකම පිරිමැසුවට වඩා හොඳයි නේද මේ රටට ඔහුගෙන් ලබාගැනීමට අවශ්‍ය සේවය ලබාගැනීම පිණිස ඔහුට පහසුකම් සැලසුවා නම්?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඔහුගේ ආශාවටත් ඉල්ලීමටත් ඉඩ නුදුන්නා නම් තමුන්නාන්සේ කියාවි ඔහුට උදව් කෙළේ නැත කියා.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
උන්නැහෙ කැමති වෙන්න ඇති යන්න. උන්නැහෙ කැමති වෙන්න ඇත්තේ එහෙන් වැඩි ප්‍රයෝජනයක් තමන්ට ලැබෙන නිසා. එහෙත් ඔහු මේ රටේ තබාගෙන පර්යේෂණ කටයුතුවලට ඔහුගේ සේවය ලබාගැනීම පිණිස ක්‍රමයක් සැලැස්වීමට අපේ ආණ්ඩුව අපොහොසත් වුණේ ඇයි? අමෙරිකාවෙන් ඒ මනුෂ්‍යයාව හොරකම් කරගෙන යන්න තමුන්නාන්සේලා ඉඩ හැරියා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඇමෙරිකාව හොරකම් කෙළේ නැහැ. ඔහුගේ කැමැත්තෙන් ගියා.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
කැමැත්තෙන් ගියා තමයි. නමුත් අපේ රටට ලබාගන්නට තිබුණ උසස් සේවයක් අපට නැතුව ගියා. එවැනි සේවයක් ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

ගැනීමට සොයා ගැනීමට අමාරුකම් තිබියදී, එවැනි කෙනෙකුට අවශ්‍ය අඩු පාඩුකම් පිරිමසා ඇයි ඔහුට නොයන්නට කටයුතු සැලැස්වීමට බැරි වුණේ? තහනම් කරන්න කියනවා නොවෙයි. අමෙරිකාව දෙන වැඩි වරප්‍රසාද දෙන්නට අපට බැරි වුණේ ඇයි?

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

ඔහු තමන්ගේ දැනුම තවත් වැඩි කර ගන්නට ශිෂ්‍යත්වයක් අරගෙන ගියා.

**ආර්. ජී. සේනානායක මයා.**

*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*

(Mr. R. G. Senanayake)

හොඳයි. මේ රටේ අය වැඩි වශයෙන් ජීවත් වන්නේ වී ගොවිතැනින් බව දන්නවානේ. එහෙත් අපට පර්යේෂණාගාර යක් නැහැ. මුළු ආසියාවටම පර්යේෂණාගාරය තිබෙන්නේ පිලිපීන්වල. ඒ පර්යේෂණායතනය මඟින් ඇති කළ විස්මය ජනක වී වර්ගයක් නිසයි මුළු ලෝකයේම ආහාර ප්‍රශ්නය විසඳන්නට පුළුවන් වුණේ. ලංකාවේ කෙනෙක් එහාට ගිහිනුයි ඒ හපන්කම් කරන්නේ. පොන්නම් පෙරුම කියා කෙනෙක් එහි ගොස් කරන හපන්කම් උඩයි එවැනි තත්ත්වයක් ඇති කරන්නට පුළුවන් වුණේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

පොන්නම්පෙරුම ඉන්නේ අමෙරිකාවේ.

**ආර්. ජී. සේනානායක මයා.**

*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*

(Mr. R. G. Senanayake)

ඒ පොන්නම්පෙරුම නොවෙයි, ඔහුගේ සහෝදරයෙක්. ඔහු තමයි මේ පර්යේෂණායතනයේ ප්‍රධානියා වශයෙන් වැඩ කරන්නේ. ඔහු විස්මයජනක ප්‍රතිඵල ගෙන දෙන වී වර්ගයක් සොයා ගෙන තිබෙනවා. වීරරත්න අමෙරිකාවට ගියා එහි හපන්කම් කරන්නට. පොන්නම්පෙරුම පිලිපීනයට ගියා. ඒ වගේ වටිනා අය මේ රටේ තබා ගන්නට මේ රජය වුවමනාවක් දක්වන්නේ නැහැ. එමෙන්ම අද වීරරත්න කියන නමවත් කියැවෙන්නේ නැහැ. මේ රටේ හැම පදුරකම ගොවි රජවරුන් නම් සිටිනවා. එවැනි රටක වීරරත්න මහත්මයා වැනි අයට ගොවි එම්ප්‍රදෝරුකමක් දෙන්න එපායැ. ඔහු විශාල සේවයක් කළ කෙනෙක් ඒ නිසා ඕහුට දෙන්න තිබෙන නම්බුනාම සියල්ලක්ම දෙන්නට ඕනෑ. මේ රටේ වගාවන් දියුණු කර බඩගින්න නැති කිරීමට විශේෂ උත්සාහයක් ගත්තා නම් ඒ ගත්තේ ඇමතිවරුන් නොවෙයි. වීර රත්න මහත්මයායි. ඒ බව මා කියන්නට ඕනෑ. අපේ බඩගින්න නැති කර මේ රට ස්වයම්පෝෂිත කරන්නට විශාල පිය වරක් ගත් පුද්ගලයාගේ නමවත් කියන්නේ නැහැ. වීරරත්න කීවාම ඒ කවුද කියා අහනවා. හැම තැනම හැම ගම කම ගොවි රජවරුන් සිටිනවා. ඒ අය රජ වරුන් කළා නම් මේ තැනැත්තා කවුරු කරන්නද? [බාධාකිරීමක්]

මෑත කාලයේදී අපි බොහෝ සේ රසායන පෝර යොදනවා. රටේ ස්වභාව ධර්මය අනුව තිබෙන පසට අලුත් ලුනු වර්ග සහිත පෝර මිශ්‍ර කිරීම නිසා පස වෙනස් වෙනවා. ඒ නිසා ඒ මඟින් පස බාලවන ආකාරය ගැන පරීක්ෂණ පවත්වන්නට ඕනෑ. එසේ නැතිව දෙන පළියට පෝර දැමීමෙන් අස්වැන්න වැඩි වේද කියන්න බැහැ. ඒ නිසා පෝර පරීක්ෂණාගාර මඟින් දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට ගොස් පරීක්ෂා කර බලන්න ඕනෑ, මේ පෝර නිසා පස නරක් වෙනවාද නිසරු වෙනවාද, පැළෑටි වර්ගවලට පෝර විෂද, නරකද කියා අපි විශාල ලෙස පෝර යෙදීමෙන් පස සම්පූර්ණයෙන්ම වෙනස් කරනවා. පසුගිය අවුරුදු කීපය තුළ පස හුඟක්ම වෙනස් කර තිබෙනවා. ඒ නිසා පෝරවලින් පස සරු වුණාද නිසරු වුණාද කියා බලන්න ඕනෑ. දිනපතාම පෝර යෙදීම වැඩි කරගෙන යනවා. ඒ නිසා පරීක්ෂණ මඟින් තත්ත්වය හොඳද නරකද කියා බලන්නට අපි මහන්සි ගන්නට ඕනෑ.

අනික් ප්‍රශ්නය මෙයයි: කිසිම පරීක්ෂණයක් නැතිව කෘමි නාශක බෙහෙත් ගහගෙන යනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
පරීක්ෂණ කරලයි ගහන්නේ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
තමුන්නාන්සේ මට බාධා නොකර අවස්ථාව ආවාම පිළිතුරු දෙන්න. ඔය ගහගෙන යන විෂ වර්ගය අමෙරිකාවේ නම් රටවල් කීපයකම තහනම් කරගෙන යනවා. ස්කැන්ඩිනේවියා රටවල ඩී.ඩී.ටී. ගැසීම තහනම් කර තිබෙනවා. ස්කැන්ඩිනේවියා රටවල් ගැන බලාගෙන යන කොට ඩී. ඩී. ටී. ගැසූ ප්‍රදේශයේ සුළඟෙහි විෂ තිබුණේ සියයට 0.000003 යි. වර්ෂාව නිසා ඩී. ඩී. ටී. මුහුදට සේදී ගියා. අන්තිමේදී මුහුදු මාලු කන කුරුල්ලන් සම්බන්ධයෙන් සලකා බලන විට ඒ විෂ සියයට 25 දක්වා වැඩි වී තිබුණු බව පෙනුණා. මේ නිසා දැන් සමහර රටවල් ඩී. ඩී. ටී. පාවිච්චිය තහනම් කර තිබෙනවා. මා මෙසේ කියන විට ගරු ඇමතිතුමා හිනා වෙනවා. මෙහි හිනා වන්නට දෙයක් නැහැ. ඉස්සර නම් අපේ කුඹුරුවල අනන්තවත් කොක්කුන් හිටියා. එහෙත් දැන් උන් කෝ? අද කොක්කුන් දකින්නවත් නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
දැන් කොක්කුනුත් කනවා නොවැ?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
වතුරට විෂ ද්‍රව්‍යයන් සේදී ගොස් ඇති නිසා වතුරේ තිත්තයන් නැහැ. තිත්තයන් නැති නිසා කොක්කුන්ට ජීවත් වන්නට ක්‍රමයක් නැහැ. එසේ නැත්නම් විෂ මාලු කා දැන් කොක්කුන් විනාශ වෙලා. ඉතින් මේ වතුර තමයි, ගැමියා බොන්නේ. ජල නළ ක්‍රම ගම්බද ප්‍රදේශවලට නැහැ. ළිංවලින් ඇළවලින් තමයි ගම්බද ජනයා වතුර බොන්නේ. මිනිසුන් බොන ඒ වතුරේ මේ විෂ කොතරම් ප්‍රමාණයක් අඩංගු වී ඇද්දැයි දැනගැනීම සඳහා පර්යේෂණ පවත්වා තිබෙනවාද? වතුරට විෂ ද්‍රව්‍ය මිශ්‍ර වී තිබෙනවාද යන්න දැනගැනීමට පර්යේෂණ පැවැත්විය යුතුයි. වෙනත් රටවල් නම් ඒ සම්බන්ධයෙන් පර්යේෂණ පවත්වනවා. අවුරුදුපතාම පර්යේෂණ පවත්වාගෙන යනවා. අප නම් අපට පිටරටින් විෂ වර්ග ලැබුණු විට, කිසිවක් හොයන්නෙ බලන්නෙ නැතිව අප ඒවා පොළවට ගහනවා. එයින් සිදු වන ප්‍රතිඵල ගැන කල්පනා කර බලන්නේ නැහැ. අනාගතය ගැන කල්පනා කර බලන්නේ නැහැ. ඒ නිසා පිටරටින් පෝර ලැබුණු පලියට ඒවා පසට යොදා නිසොල්මන් වී නොසිට, ඊට පසු පසේ ක්‍රියාකාරිත්වය ගැන සොයා බැලීම පිණිස හැම දිස්ත්‍රික්කයේම පර්යේෂණාගාර පිහිටුවිය යුතු බව ගරු ඇමතිතුමාට අවවාදයක් වශයෙන් මතක් කරන්නට කැමතියි. මේ ගහන විෂ වර්ග මනුෂ්‍යයාට කැවෙනවාදැයි සොයා බැලීම අවශ්‍යයි. යුරෝපීය රටවල් නම් මෙය අලුත් ප්‍රශ්නයක් හැටියට සලකා ක්‍රියා කරනවා. විශේෂඥයන් යොදවා මේ ගැන පර්යේෂණ පවත්වනවා. අවුරුදුපතා මේ පර්යේෂණ සඳහා විශාල මුදලක් වියදම් කරනවා. මේ පර්යේෂණවල ප්‍රතිඵලයක් වශයෙන් අද සමහර රටවල් ඩී. ඩී. ටී. පාවිච්චිය තහනම් කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ කඳුකර ගොවියා අර්තාපල් වගාවෙන් විශාල සහනයක් ලැබුවා. අර්තාපල් වගා නොකළ යුගයේදී ඒ ගොවියා ගෝවා ආදිය වගා කළා. ඒ කාලයේදී ගෝවා ආදිය ටොන් ගණන් කුණු වී ගියා. එහෙත් අර්තාපල් වගාව නිසා ඒ කඳුකර ප්‍රදේශයේ සිංහලයන් රැකුණු බව මතක් කරන්නට ඕනෑ. තේ වතුවලින් මැදි වුණු ගම් ටිකේ සිංහල ගොවියාට අර්තාපල් වගාව ලොකු සහනයක් වුණා. එහෙත් අද කඳුකරෙන් අල වගාව අහෝසි වෙමින් පවතිනවා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා කථා කරන විට, වාර්තා ඉදිරිපත් කරමින් අපේ අදහස් වැරදි බව පෙන්වන්න. මා කියන්නේ අද කඳුකරේ අල වගාව නැති වෙමින් පවතින අතර, කඳුකරේ අල ටික යාපනේට යන බවයි. එදා කන්දේ අල වගාව කොහොමද, අද කන්දේ අල වගාව කොහොමද, එදා යාපනේ අල වගාව කොහොමද, අද යාපනේ අල වගාව කොහොමදැයි පරීක්ෂණයක් කර බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

අ. භා. 3

ඊළඟට, රෝග වැළඳුණු බිත්තර අලයි ආණ්ඩුවෙන් මෙවර බෙදා හැර තිබෙන්නෙ. එම නිසා අල වගාව එහෙම පිටින්ම විනාශ වී ගියා. මෙහිදී ගරු ඇමතිතුමාට මතක් කර දිය යුතු වැදගත් කාරණයක් තිබෙනවා. යම්කිසි වගාවක් කරන විට, නැති නම් යම්කිසි කර්මාන්තයක් ආරම්භ කරන විට, ඊට අවශ්‍ය බිත්තර වර්ගයන් පිටින් ලබා ගැනීමට කටයුතු සලස්වන්නේ මන්ද කියා ඇමතිතුමාගෙන් දැනගන්න කැමතියි. පිටින් බිත්තර වර්ග ලබාගෙන තම රට කර්මාන්ත සරුසාර අන්දමින් පවත්වාගෙන යන්න බැහැ. එම නිසා තමාගේ රටේම නිපදවන බිත්තර වර්ගවලින් කර්මාන්ත ගෙන යන්න පටන් ගන්න ඕනැ. පිටින් ලබා ගත් බිත්තර වර්ගවලින් අපේ කර්මාන්ත දියුණු කරන්න බැහැ. එම නිසා කර්මාන්තයක් වශයෙන් අල වගාව පටන් ගන්නවා නම්, මුල් කාලය යොදවන්න ඕනැ රටට අවශ්‍ය බිත්තර වර්ග සපයා ගන්නටයි.

මට වගාවෙන් විශාල හානියක් වුණු නිසයි විශේෂයෙන්ම මේ කාරණය ගැන හොඳාකාරවම දන්නේ. ටොන් පහක පමණ අල තොගයක් විනාශ වී යාමෙන් මට රුපියල් හත් දහසක පමණ පාඩුවක් වී තිබෙනවා. ආණ්ඩුවෙන් රෝග වැළඳුණු බීජ අල බෙදා හරින්නේ මොන කාරණයක් නිසා දැයි ඇමතිතුමාගෙන් මා ප්‍රශ්න කරනවා. මා වගා කළේ ත්‍රිකුණාමල ප්‍රදේශයේයි.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
සුදුසු නැති පළාත්වල සිටුවනවා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
තමුන්නාන්සේගේ නිලධාරීන්ගේ උපදෙස් පිටයි වගා කළේ. ඒ අය දිනපතාම වාගේ ඇවිත් මට උපදෙස් දුන්නා. නමුත් සිදු වුණු දේ බලන්න. තමුන්නාන්සේලාගේ නිලධාරීන් දෙන උපදෙස් අනුව ක්‍රියා කරන්න ගොස් වගාව විනාශ වී ගියාම නුවුමනා ප්‍රදේශයක වගා කළේ මන්දැයි ඇමතිතුමා ප්‍රශ්න කරනවා. ප්‍රදේශය අල වගාවට සුදුසු නැති නම් නිලධාරීන්ට ඒ බව කියන්න තිබුණා. නමුත් නියම අන්දමට තමුන්නාන්සේගේ නිලධාරීන් උපදෙස් නුදුන් නිසා මට රුපියල් හත් දාහක් පාඩු වුණා. තමුන්නාන්සේගේ නිලධාරීන්ගෙන් උපදෙස් ලබා ගත් නිසා පාඩුයි. උපදෙස් ලබා නොගත්තා නම් වගාව සරුයි. මින් ඉදිරියට ආණ්ඩුවෙන් බෙදා දෙන බිත්තර අල මා ලබා ගන්නේ නැහැ. මට ඒවා ඕනැ නැහැ. වෙළඳපොළෙන් ලබා ගන්න ඒවා ආණ්ඩුවෙන් බෙදා දෙන ඒවාට වඩා හොඳයි, විශ්වාසයි.

ගරු සභාපතිතුමනි, එක්තරා ද්‍රවිඩ මන්ත්‍රී වරයෙක් සඳහන් කළා, යාපනේ ප්‍රදේශයෙන් ලබා ගන්න සහල්වලට වැඩි පුර ගාස්තුවක් ගෙවන්න සිදු වී තිබෙනවාය කියා. ඒ අතරම එම ප්‍රදේශය සම්බන්ධයෙන් නිකුත් කරන වාර්තාවල සඳහන් වෙනවා, ප්‍රදේශයට වුවමනා කරන සහල් එම ප්‍රදේශයේම නිපදවනවාය කියා. උතුරු පළාතට වුවමනා හාල් උතුරු පළාතේම නිපදවනවා නම්, සහල් අතින් එම ප්‍රදේශය ස්වයම්පෝෂිත බව පිළිගන්න ඕනැ. එය එසේ නම්, කුරුණෑගල, මඩකලපුව, මන්නාරම, අම්පාරේ, වැනි දිස්ත්‍රික්කවල අස්වැන්න කැපුවාට පසු, එම අස්වැන්නෙන් වැඩි ප්‍රමාණයක් යාපනය දිස්ත්‍රික්කයට ගෙන යන්නේ මොන කරුණක් නිසාදැයි දැන ගන්න කැමතියි. දිනපතාම පාහේ සහල් හෝ වී පටවාගත් ලොරි විශාල සංඛ්‍යාවක් උතුරට යනවා. මෙතරම් විශාල ප්‍රමාණයක් වී හෝ සහල් යාපනයට ගෙන යන්නේ මොන කාරණයක් නිසා දැයි ගරු ඇමතිතුමා සොයා බැලුවාද? මේ සහල් යන්නේ කොහාටද? ප්‍රදේශය සරුසාරයි. ස්වයම්පෝෂිතයයි කියනවා නම්, ප්‍රදේශයට අවශ්‍ය සහල් ප්‍රමාණය ඒ ප්‍රදේශයේම නිපදවා ගන්නවා යයි කියනවා නම්, පිටින් සහල් හෝ වී ගෙන යන්නේ මොනවාට දැයි සොයා බැලුවාද?

ඒ අතරම, ගරු සභාපතිතුමනි, කොපමණ වී මෝල් සංඛ්‍යාවක් එම ප්‍රදේශයේ තිබෙනවාද? මෙපමණ සංඛ්‍යාවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වුවමනා කරන්නෙ මොන කාරණයක් නිසා දැයි සොයා බැලුවාද? අවශ්‍යතාවට වඩා මෝල් සංඛ්‍යාවක් තිබෙන්නේ මොන කාරණයක් නිසාදැයි පරීක්ෂා කර බැලුවාද?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

මාතරත් තිබෙනවා.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

උතුරු පළාතට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා විශාල සංඛ්‍යාවක් වී කොටන මෝල් තිබෙනවා. මේවායේ කෙටීම සඳහා පිටින් වී ගෙන්වනවා යයි කියනවා නම්, නිපදවන සහල් යන්නේ කොහාටද? යාපනයෙන් ආපසු හාල් එන බවක් ගැන නම් මා දන්නෙ නැහැ. එය එසේ වුණත් යාපනය ප්‍රදේශය වගාව අතින් ස්වයම් පෝෂිත වී තිබෙනවා යයි වාර්තාවලින් හෙළි කරනවා. ස්වයම්පෝෂිත නම් ත්‍රිකුණාමලය, මන්නාරම, කුරුණෑගල, ආදි ප්‍රදේශවලින් යාපනයට වී ගෙන යන්නේ මොනවාටද? එහෙම නම් මෙහි යම්කිසි රහසක් තිබෙන්න ඕනෑ නොවෙද? ගරු සභාපතිතුමනි, හාල් විශාල තොග වශයෙන් මෙරටින් පිට කරන බව කාලයක් තිස්සේ මා ගරු සභාවේදී හෙළිදරව් කළා. මුතූර් නමැති ස්ථානයෙන් සහල් හොරෙන් පිට කරනවා මා ඇසින් දැක්කා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ඇයි ඉතින් ඇල්ලුවෙ නැත්තෙ?

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා. (මීගමුව)**
*(திரு. எம். டென்சில் பெர்னாண்டோ—நீர்கொழும்பு)*
(Mr. N. Denzil Fernando—Negombo)

ඇටයක්වත් පිට වෙන්නෙ නැහැ, ඒක බොරුවක්.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

මට බෝට්ටුව බඳා ගන්න පුළුවන්කමක් නැහැ. මෙවැනි ඇමතිවරුන් සිටින නිසා තමයි, ඒ විධියේ ක්‍රියා අල්ලන්න බැරි. නිලධාරීන් විසින් පාලනය කරන ඇමතිවරුන් සිටින නිසා මෙවැනි ක්‍රියා වළක්වාගන්න ක්‍රියා කරන්නෙ නැහැ. මන්නාරමේ ගරු මන්ත්‍රීතුමාගේ (අලගකෝන් මයා.) සටන්කාමී කථාවට මා ප්‍රශංසා කරනවා. "යාපනේ අධිරාජ්‍යවාදීන්ට" විරුද්ධව එතුමා තදින් කථා කළා. ඒ කරුණු සම්පූර්ණයෙන්ම ඇත්ත බව මා දන්නවා. ත්‍රිකුණාමලයත් මන්නාරමත් යාපනේ යටත් විජිත ප්‍රදේශ දෙකක්ය යන හැඟීම යාපනේ වාසීන් තුළ තිබෙනවා. මන්නාරමටත් ත්‍රිකුණාමලයටත් යම් ආධාරයක් උදව්වක් ලැබෙන්නට යනවා නම් ඒ සෑම අවස්ථාවකදීම කෙසේ හෝ යාපනේ උදවිය ඒක කොටා ගන්නවා. ත්‍රිකුණාමලයට යම් නිලධාරියෙක් පත්ව ආවොත් ඔහු යාපනේ දෙමළෙක්. ඒ වාගේම මන්නාරමට යම් නිලධාරියෙක් පත්ව ආවොත් ඔහු යාපනේ දෙමළෙක්. මන්නාරමේ දෙමළෙක් කවදාවත් පත්වෙන්නෙ නැහැ. ත්‍රිකුණාමලේ දෙමළෙක් කවදාවත් පත් වෙන්නෙ නැහැ. එනවා නම් එන්නේ යාපනේ දෙමළෙක්. ඉතාම සුළු වැඩකට වුණත් එන්නේ යාපනේ දෙමළෙක්. ගුරුවරයකු ආවත් යාපනේ දෙමළෙක්. මරච්චිකට්ටි කියන ගම ගැන මා දන්නවා. ඒක තනිකර මුස්ලිම් ගමක්. නමුත් ඒ ගමේ ගම්මුලාදෑනියාත් යාපනේ දෙමළෙක්. තැපැල් මහත්මයාත් යාපනේ දෙමළෙක්. සමුපකාර සමිතියේ කළමනාකාරවරයාත් යාපනේ දෙමළෙක්. ඒ මොකද?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

කොහේද?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

මරච්චිකට්ටි කියන ගමේ. ඒ වාගේම නිලාවලිය කියන ගමේත් එවැනිම තත්ත්වයක් තිබෙනවා. ඒ ගමේ මැතක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

වන තෙක්ම ත්‍රිකුණාමලේ උපන් දෙමළ සේවකයෙක් සිටියා. නමුත් ඒ සේවකයාත් ඉවත් කර දැන් යාපනේ දෙමළෙක් ගෙනවුත් සිටිනවා. එමනිසා මන්නාරමේ ගරු මන්ත්‍රීතුමා කිව්වේ ඇත්තයි. එතුමාගේ කථාව මා අනුමත කරනවා. එතුමා පෙඩරල් පක්ෂයට අයිති වුණත් මේ ප්‍රශ්නයේදී එතුමාට අපේ සහයෝගය ලැබෙනවා. යාපනේ දෙමළ අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව එතුමා ගෙන යන සටනට මගේත් සහයෝගය ලැබෙනවා. අද මන්නාරමේ දෙමළෙක්ය, ත්‍රිකුණාමලේ දෙමළෙක්ය කිව්වාට ඒ තරම් ගණන් ගන්නේ නැහැ. ඒ තරම් ආශ්‍රයක් නැහැ. උතුරේ විසූ පරණ සිංහලයින්ටත් අත් වුණේ ඔය ඉරණමයි. හරිජනයින්ය කියා උතුරේ විසූ පරණ සිංහලයිනට අද කෝවිලකටවත් ඇතුළු වන්නට දෙන්නේ නැහැ. නව අවුරුදු කිපයක් ගත වන විට සමහර විට ත්‍රිකුණාමලේත් මන්නාරමේත් දෙමළු හරිජනයින් වශයෙන් හඳුන්වා කෝවිලකටවත් ඇතුළු කර නොගන්නට පුළුවනි. එමනිසා මන්නාරමේ ගරු මන්ත්‍රීතුමා කළ කථාවට මා ප්‍රශංසා කරමින් මගේ කථාව අවසාන කරනවා.

**ඩී. පී. අතපත්තු මයා.**
*(திரு. டீ. பீ. அத்தபத்து)*
(Mr. D. P. Atapattu)

ගරු සභාපතිතුමනි, දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවට උත්තර දෙන්නට ගියොත් මට මේ අමාත්‍යාංශය ගැන කථා කරන්නට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. අනනිත් මෙතැනින් ගිහින් අවසානයේදී දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා යන්නේ ඉන්දියාවට බව අප දන්නවා. නමුත් ඒ ගරු මන්ත්‍රීතුමා කරුණු නොදැන කථා කරනවා නොවෙයි. මෙරටින් ඉන්දියාවට හොරෙන් බඩු යැවීම පිළිබඳවත් ඒ වාගේම ඉන්දියාවෙන් මෙරටට හොරෙන් බඩු ගෙන්වීම පිළිබඳවත් ආණ්ඩුව ශකති පමණින් රැකවල් දමා තිබෙන බව එතුමා දන්නවා. නොයෙකුත් සංවිධාන ඇති කර තිබෙන බව එතුමා දන්නවා. මන්ත්‍රීතුමා බලාගෙන සිටියදී මුතුර්වලින් හාල් පටවා ගත් බෝට්ටුවක් ඉන්දියාවට ගියාලු. ඒක සත්‍යයක් නම් ඒ අවස්ථාවේදී මන්ත්‍රීතුමා ගත යුතුව තිබුණු පියවර කුමක්ද? වහාම පොලිස් මූලාදැනියකු හෝ ඒ ප්‍රදේශයේ රාජකාරිය කරන වෙනත් නිලධාරියකුට හෝ දැන්වීමයි. එසේ කළා නම් ඒ බෝට්ටුවත් හාල් තොගයක් අල්ලා ගන්නට පුළුවන් වෙනවා පමණක් නොව ගරු මන්ත්‍රීතුමාට ලොකු තෑග්ගක් ලබා ගන්නටත් පුළුවන් වෙනවා. දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා කොයි දෙයක් ගැන මෙතැන කථා කළත් අවසානයේදී කියන්නේ ඒකයි. එමනිසා දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමාගේ කථාව ගැන මා වැඩි විවේචනයක් කරන්නට යන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශය ගැන කථා කරන විට අපට අමතක නොකළ හැකි කරුණු දෙක තුනක් තිබෙනවා. මේක අපේ ආණ්ඩුවේ අවසාන අයවැය ලේඛනයයි. පසුගිය අවුරුදු හතර හමාර තුළ මේ අමාත්‍යාංශය මොන විධියට ක්‍රියා කළාද යන්න තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. ඒ වාගේම මේ අමාත්‍යාංශය ගෙන ගිය ක්‍රියා මාර්ගවලින් මොන ප්‍රතිඵල ලැබුණාද, මොන විධියේ සමාජ විපර්යාසයක් ඇති වුණාද යන්න තමුන්නාන්සේලා දන්නවා. විශේෂයෙන්ම වගා ව්‍යාපාරයෙන් රටේ යම් තත්ත්වයක් ඇති වී තිබෙන බව මහජනතාව පිළිගෙන අවසානයි. ප්‍රසිද්ධියේ මොන අදහස් ප්‍රකාශ කළත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුත් රහසිගතව ඒක පිළිගෙන අවසානයි. වගා ව්‍යාපාරයෙන් ආහාර වැඩි වූවා පමණක් නොවෙයි, තවත් නොයෙක් අංශවලින් යහපතක් අත් වී තිබෙන බව මා පෙන්වා දෙන්නට සතුටුයි. වගා ව්‍යාපාරයෙන් පිටිසර බද ගොවිතැනෙහි යෙදෙන සාමාන්‍ය ජනතාවට පමණක් නොව ඔවුන්ගේ පවුල්වල උදවියත් ඔවුන් හා ආශ්‍රය කරන සියලු දෙනාටමත් යම් තත්ත්වයක් ලැබී තිබෙනවා. ජාතික රජය සෑම ව්‍යාපාරයක්ම කරගෙන යන්නේ මේ රටේ දියුණුව සඳහාම බව කවුරුනුත් අවිවාදයෙන් පිළිගන්නවා. මා කියන්නේ, මට අසන්නට දකින්නට ලැබුණු දේවල්. සාමාන්‍යයෙන් තරුණ පරපුර විප්ලවකාරී අදහස් දරන බව අප කවුරුනුත් පිළිගන්නවා. ඒ විප්පලවකාරී අදහස් උඩ ක්‍රියා කරන්නට බැරි වුණාම ඔවුන්ගේ හිත් නොයෙකුත් දූෂිත ක්‍රියා මාර්ගයන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙරෙහි යොමු වෙනවා. ජාතික රජය ගෙන යන ව්‍යාපාරය කෙරෙහි ඒ තරුණ පරපුරේ, බාල පරපුරේ සිත් කොයි තරම් ඇදී ගොස් තිබෙනවාද කීවොත්, ජාතික කැක්කුමකින් යුතුව ඔවුන් ඒ ව්‍යාපාර යට සහයෝගය දෙනවා. ඒ වගා ව්‍යාපාර යට හවුල් වන්නට තරම් ශක්තියක් නැති කුඩා ළමයින් තුළ පවා ඒ පිළිබඳ දැඩි ඇල්මක් පවතින බව ප්‍රකාශ කරන්නේ සන්තෝෂයෙන්.

1965 අවුරුද්දේදී ඇති වුණු දුර්භික්ෂය, ආහාර හිඟය නිසා ආහාර වගාව කෙරෙහි රජයේ අවධානය දැඩි ලෙස යොමු වුණා. රජයේ ඒ ආහාර වගා ව්‍යාපාරය වඩ වඩාත් සාර්ථක කර ගැනීම සඳහා ආහාර හා සමුපකාර දෙපාර්තමේන්තුවල පමණක් නොව අනෙකුත් සෑම දෙපාර්තමේන්තුව කම පාහේත් නොමසුරු සහයෝගය රජයට ලැබුණා. එම ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා ගත් දැඩි උත්සාහය පිළිබඳව ගරු ඇමතිතුමාටත්, කෘෂිකම් හා ආහාර ඇමතිතුමාට සහ එතුමාගේ කාර්ය මණ්ඩලයටත් මගේ ඡන්දදායකයන් වෙනුවෙන් මේ අවස්ථාවේදී කෘතඥතාව පළ කරනවා. සමහරුන් නම් කියනවා ඔය ව්‍යාපාරය පටන් ගත්තේ මේ කාලයේ නොව අර කාලයේ යි කියා. කොයි කාලයේ පටන් ගත්තත් මහජනතාව තුළ හැඟීම් හා වැදෙන අන්දමින් සාර්ථකව මේ ව්‍යාපාරය ගෙන යෑම ආරම්භ වුණේ නම් 1965 අවුරුද්දේදීයි.

ආහාර අතින් මේ රට ස්වයම්පෝෂණය කිරීම පිණිස ජාතික රජය ඇරඹූ ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා පසුගිය අවුරුදු 4 1/2 තුළම නියම පියවර ගෙන තිබෙන බව කවුරුනුත් පිළිගන්නවා. එහෙත් අප ලැබූ අත්දැකීම් අනුව ආහාර ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කිරීම සඳහා වචන කීපයක් කිව යුතුව තිබෙනවා. පොල්ගොල්ල හා තවත් මධ්‍යස්ථාන කීපයක් මගින් ගැණු හා පිරිමි ළමුන්ට සමුපකාර පුහුණුවක් ලබා දෙන බව අප දන්නවා. එසේ පුහුණුවන්නවුන් අතර ඉතාමත් දක්ෂ අය අනන්තවත් ඉන්නවා. අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් රසායන විද්‍යාව ඇතුළුව විද්‍යා විෂයයනට සම්මාන හතර පහ ලැබූ අයත්, ඒ පුහුණු සහතික ලැබූවන් අතර ඉන්නවා. එහෙත් ඔවුන් අද ජීවිතය ගෙන යන්නේ ඉතා අමාරුවෙන්. ඔවුන්ට ගොවිපොළවල් ඇති කර දීම සඳහා අපේ පළාත්වල නම් සෑහෙන බිම් ප්‍රමාණයක් නැහැ. ළඟකදී මා හමුවට පැමිණි එක්තරා ළමයකුගේ සහතික දැක මා පුදුම වුණා. ඔහු දුප්පත් පවුලක ළමයෙක්. ඔහුට තව සහෝදරියන් හතර පස් දෙනෙකුත් ඉන්නවා. තමාට මාසයකට රුපියල් හැට හැත්තෑවක් ලැබුණොත් ප්‍රමාණවත් බව කී ඒ ළමයා, අවස්ථාවක් ලබා දෙනවා නම් දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික වැඩවලට හවුල් වී තමාගේ කාර්යශූරත්වය ඔප්පු කිරීමට පුළුවන් බවත් ප්‍රකාශ කළා. අපේ දිසාපතිතුමාත් මේ කාරණය පිළිබඳව හුඟක් අනුකම්පාව ඇතුව සිතා බැලුවා. එතුමා වාගේම මාත් ඒ වෙනුවෙන් යම්කිසි ක්‍රියා මාර්ගයක් ගත්තා. නුදුරු අනාගතයේදී ඒ ළමයාගේ ජීවිතය සඵල කරවීම සඳහා සෑහෙන දෙයක් කෙරේවියයි අපි විශ්වාස කරනවා.

අ. භා. 3.15

මේ අන්දමින් ඉල්ලීම්වත් කරන්නේ නැතුව නිශ්ශබ්දව දුක් විඳින උදවිය මේ රටේ බෙහෙවින් වෙසෙන බව අප දන්නවා. කෘෂිකර්මය පිළිබඳව රටේ උනන්දුවක් ඇති කරන අතරම, කුමන විධියකින් හෝ මේ ළමයින්ගේ අනාගතය දීප්තිමත් කර දීම සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් ගතහොත් එය ඉතාමත් වැදගත් වන බව මෙහිලා සඳහන් කළ යුතුයි. මා දන්නේ නැහැ, මේ පිළිබඳව ගත යුතු ක්‍රියා පිළිවෙළ කුමක්ද කියා. තමුන්නාන්සේටත් මේ ගැන තනිවම කල්පනා කරන්නට බැරිවිය හැකියි. මේ ගැන කල්පනා කරන්නට හැකි මොලේ තිබෙන විශේෂඥ පිරිස් තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවෙහි සිටින බව අප දන්නවා. ඒ හැම දෙනාත් එකතු කරගෙන මේ පිළිබඳව කල්පනා කර බලා සුදුසු ක්‍රියා මාර්ගයක් ගතහොත් එය ඉතා වැදගත් දෙයක් වන බව මා නැවතත් මතක් කළ යුතුයි.

කෘෂිකර්මය සඳහා උපයෝගී කර ගත හැකි වැව් අපේ ප්‍රදේශවල තිබෙනවා. මා නියෝජනය කරන ආසනය වැනි ආසනවල වැඩිපුර තිබෙන්නේ ගොවිජන සේවා කොමසාරිස්තුමාගේ දෙපාර්තමේන්තුවෙන් පාලනය වන වැව් බව මතක් කළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

පාලනය වන ලොකු වාරිමාර්ග කටයුතු සඳහා නොයෙකුත් ආකාරයේ නිලධාරීන් සිටිනවා. Technical officers, irrigation engineers, divisional engineers යනාදී වශයෙන් නොයෙකුත් නිලධාරීන් එම කටයුතු සඳහා පත් කර සිටිනවා. එහෙත් එම නිලධාරීන්ගෙන් වැඩක් කරවාගන්නට ගිය විට තරමක ප්‍රමාදයන් සිදු වන බව පෙනෙනවා. කාර්මික උපදෙස් —technical advice—දීම පිණිස සෑහෙන තරම් නිලධාරීන් අපේ පළාත්වල නොමැති නිසා සමහර අවස්ථාවලදී අපට මාස ගණන් ලත වන්නට සිදු වන බව කිව යුතුයි. එසේ හෙයින් එවැනි කටයුතු පිළිබඳව මීට වඩා හොඳ සැලැස්මක් ඇති කර ක්‍රියාත්මක කරන මෙන් මා ඉල්ලා සිටිනවා. එය එම පළාත්වලට විශාල සේවයක් ගෙන දිය හැකි කාරණයක් වෙනවා ඇති. කෘෂිකර්ම අංශය පිළිබඳව ඉදිරිපත් කරන්නට තව බොහෝ කරුණු තිබෙන නමුත්, ලැබී තිබෙන කාලය සීමා සහිත නිසා මා වැඩි දුර කතා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මෙවැනි අවස්ථාවකදී එසේ කාලය සීමා කළ යුතුයි. තවත් උදවිය කතා කරන්නට බලාපොරොත්තුවෙන් සිටින හෙයින් එය ඉතා වැදගත් දෙයක් වෙනවා. එම නිසා සමුපකාර ව්‍යාපාරය පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කොට මගේ කථාව අවසාන කරන්නට කල්පනා කරනවා.

ගරු සභාපතිතුමනි, සමුපකාර ව්‍යාපාරය පිළිබඳව සිතා බලන විට අවුරුදු 20 ක පමණ ඉතිහාසයක් මෙම අවස්ථාවෙහිදී මට මතක් වෙනවා. අපේ පළාතේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳව ප්‍රමුඛස්ථානයක් ලබාගෙන කටයුතු කළ පුද්ගලයෙකු වශයෙන් මට මේ ගැන හොඳ වැටහීමක් තිබෙන බව කිව යුතුයි. සමුපකාර ව්‍යාපාරයෙහිදී පමණක් නොව, වෙනත් ව්‍යාපාරවලදීත් ලොකු දේශපාලන ගැටීම්වලට මුහුණ දුන් කෙනෙකු වශයෙන් මා හඳුන්වන්නට පුළුවනි. දකුණු ගිරුවාපත්තු සමුපකාර සමිතිය ඉතා දිළිඳු තත්ත්වයකට පැමිණ තිබුණු කාලයක් ගැන මා මතක් කර දෙන්නට කැමතියි. එම සමිතිය ණය බරින් මිරිකී මුදල් එකතු කර ගන්නත් බැරි තත්ත්වයට වැටී සිටි එම අවස්ථාවෙහිදී මගේ කිසිදු වුවමනාවක් නැතුවම බලහත්කාරයෙන් වාගේ එහි සභාපති ධුරයට මාව පත් කර ගන්නට යෙදුණා. මට හුඟක් වැඩ කටයුතු තිබුණු නිසයි මා ඒ ගැන වුවමනාවක් නොදැක්වූයේ. කෙසේ වෙතත්, ඉන් පසු මා එම සමිතිය දියුණු තත්ත්වයකට ගෙනාවා. වරක් එක්තරා ආණ්ඩුවක් බලයට පැමිණියායින් පසු මා එහි සභාපති ධුරයෙන් අස් කරනන්ට එම ආණ්ඩුවට වුවමනා වුණා. ඒ බව දැනගත් මා එවකට සිටි ඇමතිතුමා මුණගැසෙන්නට අවුත් මගෙන් වැඩක් නැති නම් මා අස් වන්නට සූදානම් බව කියා සිටියා. හැංගි හැංගි වැඩ කරන්නේ නැතුව අස් වන්නට වුවමනා නම් මට ඒ බව කියන්නැයි මා එතුමාගෙන් ඉල්ලා සිටියා. එහෙත් ඒ පිළිවෙළට ක්‍රියා කරන්නේ නැතුව මාව රහසිගතවම අස් කරන්නට ඒ උදවියට වුවමනා වුණා. අන්තිමේදී අස් වන්නට සිදු වුණේ මට නොවෙයි; සමුපකාර කොමසාරිස් මහතාටයි.

තව ටික කලක් ගත වූ පසු වෙනත් ඇමතිවරයෙක් පත් වුණා. ඔහුගේ කාලයේදී දකුණු ගිරුවාපත්තුවේ සමුපකාර සමිතියේ ලාබවලින් කොච්චරද ගණනක් අඩු වුණාය කියා—[බාධා කිරීමක්] කල බල තත්ත්වයක් උදා වුණා. ඒ කාලය වන විට මාත් ටිකක් පැරණි බවට පත් වෙලයි හිටියේ. මේතරම් පෙට්රල් පුච්චා ගෙන මහන්සි වන්නේ කුමටදැයි මට කල්පනා වුණු හෙයින් මම එය අත්හැර දමා නිකම් සිටියා. ඒ කෙසේ වෙතත් අවුරුදු කීපයක පටන් එම සමිතිය ඉතා හොඳ තත්ත්වයකට පැමිණ තිබෙන බව මා කියන්නට සතුටුයි. දැන් ඊට හොඳ කාරක සභාවක් පත් වී සිටිනවා. රුපියල් ලක්ෂයක් පමණ වැය කර සාදනු ලබන ගොඩනැගිල්ලක් විවෘත කිරීම සඳහා හෙට අනිද්දාම සමුපකාරය භාර ගරු ඇමතිතුමාට එම සමිතිය මගින් ආරාධනය කරනවාට කිසිම අනුමානයක් නැහැ. ඒ සමුපකාරය ඉතා ලස්සණට පවත්වාගෙණ යන එකක්. බෙලිඅත්ත ආසනයටත් මුල්කිරිගල ආසනයටත් දෙකටම තිබුණේ ඔය සමුපකාරය පමණයි. මුල්කිරිගල ආසනයටත් සමුපකාරයක් වෙනම ඕනෑය කියා දේශපාලන ප්‍රශ්නයක් ඇති කරගෙන උතුරු ගිරුවාපත්තු සමුපකාර සංගමය නමින් තවත් සමුපකාරයක් මුල්කිරිගල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආසනය තුළ පිහිටුවා ගත්තා. එය පිහිටු වාගෙන වැඩි කලක් යන්නට පෙර එහි පාලනයට විරුද්ධව නොයෙක් චෝදනා ඉදිරිපත් වුණු නිසා ඒවා ගැන පරීක්ෂා කර බැලීමෙන් පසු එය විසුරුවා හරින්ට ගරු ඇමතිතුමා නියෝග කළා. දැන් එයත් දෙපාර්තමේන්තුවේ පාලනය යටතට පවරාගෙන හොඳට වැඩ කරගෙන යනවා. ඒ කටයුත්ත එතැනින් ඉවර කරන්නට එපා කියා මා ඉල්ලා සිටිනවා. කලින් සිටි නිලධාරීන් කළ වංචා ආදී සියල්ලම පොත් පත්වල වාර්තා වී තිබෙන නිසා ඉතා ඉක්මනින් ඒ වරුදි කළ පුද්ගලයන්ට දඬුවම් පමුණුවන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

ගරු අමතිතුමනි, මේ රටේ සමුපකාර ව්‍යාපාරය ගැන මම නම් සෑහීමකට පත් වී නැහැ. අපි මුලදී සමුපකාර ව්‍යාපාරය ආරම්භ කළේ, පස්කුළු බඩු ටික බෙදා දීමටයි. අදත් සමුපකාරය ඊට වඩා එහාට ගිහින් නැහැ. එක ස්ථානයක දෙකක ණය දෙන සමිති තිබුණත්—ඒවායෙ නිලධාරීන් හොඳට වැඩ කර ගෙන යනවා—අපේ සමුප කාර ව්‍යාපාරය කඩ සමිතිවලටත් සමිති සංගම්වලටත් පමණක් සීමා වෙලයි තිබෙන්නෙ. මේ සුළු සමිතිවල අවංකවම සමුපකාර ව්‍යාපාරයක තතත්වයක් දැකීම අමාරුයි. සමහර විට මුදල් ටිකක් යොදවා මේ කටයුත්ත කරගෙන යන්නේ ගමේ අය වුණත්, බොහෝ විට ඔවුන්ට සමුප කාර ව්‍යාපාරය පිළිබඳ නියම අවබෝධයක් නැහැ. පිටිසරබද පළාත්වල මිනිසුන් තුළ සමුපකාර ව්‍යාපාරය පිළිබඳව ඇති දැනීම ඉතා අඩුයි. ඒ නිසා පුළුවන්කමක් තිබෙනවා නම් එක දිස්ත්‍රික්කයකට එක ප්‍රචාරක නිලධාරියා ගණනේවත් පත් කර ඔවුන් ගමක් ගමක් පාසා යවා නැවතත් මේ සමුපකාර ව්‍යාපාරය ප්‍රකෘතිමත් කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නට ඕනෑ. එසේ නැත්නම් සමුපකාර ව්‍යාපාර යේ නියම තේරුම පවා මිනිසුන් තුළින් නැති වී යන්නට ඉඩ තිබෙනවා. මා ඒ කාරණය කියන්නට හේතුව මේකයි. අද මේ සමාජය පෙරළීගෙන යන හැටියට සමුප කාර ව්‍යාපාරයට හොඳ අනාගතයක් තිබෙන බව පෙනී යනවා. දියුණු රටවල් දෙස බලන විට සමුපකාර මාර්ගයෙන් හොඳ සැලැස්මක් ක්‍රියාත්මක කළොත් මේ රටේත් මේ දුප්පත්-ධනපති භේද වැනි දේවල් නැති කරන්නට පුළුවන් වෙනවාට කිසිම අඩමානයක් නැති බව පෙනී යනවා. මේක ලෙහෙසියෙන් කරන්නට පුළුවන් කටයුත්තක් නො වෙයි; බොහොම හෙමින් සීරුවේ කළ යුතු කටයුත්තක්.

ගරු සභාපතිතුමනි, එක මන්ත්‍රීවරයෙක් හාල් ප්‍රශ්නයක් ගැන සඳහන් කළා. මා හිතන්නේ රත්තොට මන්ත්‍රීතුමා (යාලේ ගම මයා.) කියායි. අපේ පළාත්වල නම් ආණ්ඩුවේ මෝල්වලින් හෝ පෞද්ගලික මෝල්වලින් හෝ ඒ විධියේ හාල් බෙද න්නේ නැහැ. මටත් ඒ විධියේ ආරංචි යක් ලැබී මාත් හැමතැනම වාගේ සොයා බැලුවා. මඩකලපුව, මොනරාගල ආදී පළාත්වලින් නම් හුඟක් ඒ වගේ හාල් එනවා කියා ආරංචියි.

ඇමතිතුමා සම්බන්ධ තවත් එක පෞද් ගලික කාරණයක් කියා මාගේ කථාව අව සාන කරන්නටයි මා බලාපොරොත්තු වන්නේ. මේවා ගැන කතා කරන්නට හොඳ නැති වුණත් මේ කාරණය නොකියා බැහැ. මිනිසුන් කියන කතා අහගෙන, අපේ ඇමතිතුමා කථා කරන්නට බැරි, වැඩක් හරි හැටි කරන්නට බැරි කෙනෙක් ය කියන අදහසක් මා තුළත් ඇති වී තිබුණා. මම ඕක හිතේ තියාගෙන හිටියා මිස එතුමා හමු වන්නට ගියෙත් නැහැ; ඒ ගැන කිව්වෙත් නැහැ. එහෙම ඉන්න අතර එක්තරා ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මට ඇමතිතුමා හමු වන්නට යන්නට සිද්ධ වුණා. මගේ පළාතේ මෝල් හිමියන්ගේ විශේෂ ඉල්ලීමක් පිට—මම මෝල්කරු වන් සමග යන්න වැඩි කැමැත්තක් දැක් වුවෙත් නැහැ; ඔවුන් සමග මගේ සම් බන්ධයකුත් නැහැ—මම ඇමතිතුමා හමු වන්නට ගියා. ඒ ගියෙත් බයෙනුයි. ඇමති තුමාට කිව්වු වෙන්න අමාරුය කියා බොහොම දෙනෙකු තුළ වැරදි අදහසක් තිබෙනවා.

වාසනාවකට වගේ, ඇමතිතුමා සමග කථා කරන්නට ඉස්සරවෙලා ස්ථිර ලේකම් තුමා හමු වී මේ ගැන සාකච්ඡා කළා. මේ මිනිසුන්ට අයිතිවාසිකමක් තිබෙන බවත්, ඔවුන්ට දෙපාර්තමේන්තුවෙන් ඉටු කළ යුතු යුතුකමක් තිබෙන බවත් ස්ථිර ලේකම්තුමා පිළිගත්තා. එහෙත් රෙගුලාසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

අනුව ඒක තමාට කරන්නට බැරි බවත්, ඇමතිතුමා මාර්ගයෙන් එය කර ගත යුතු බවත් කිව්වා. අපි ඇමතිතුමා ළඟට ගියා. ඇමතිතුමා පටන් ගත්තේ අපේ පැමිණිල්ල හොඳ විධියට නිරාකරණය කරන්නට පුළුවන් කොහොමද කියාගෙනයි. සම හරෙකු නම් පැමිණිල්ලක් කරන්නට ගියාම පටන් ගන්නේ කොහොමද මේක නො කරන්නෙ කියා හිතාගෙනයි. ඒ නිසා ප්‍රසිද්ධියේ තමුන්නාන්සේට මේ මල් වඩම පුද කරන්න කැමතියි. ඔනෑම අමාරුවක් ගැන ඉතාම දුප්පත් මනුෂ්‍යයකු වුණත් තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට ඇවිත් පැමිණිලි කළාම, තමුන්නාන්සේ නැතත් තමුන්නාන්සේගේ ඉහළ මුලාදැනීන්වත් ඒ ගැන සාකච්ඡා කර සැනසිලිදායක වචනයක් කියා පිටත් කර හරින පුරුද්දක් තිබෙනවා. මා සමග ගිය මෝල් කරුවන්ට ප්‍රයෝජනයක් ලැබුණාදැයි මා දන්නෙ නැහැ. එහෙත්, එයින් මට ලොකු ප්‍රයෝජනයක් ලැබී තිබෙනවා. එදා ගියාට පස්සේ අප ඉල්ලූ දේවල් අපට නොලැබුණත් කමක් නැහැ කියලා අපට හිතුණා. අපට ගරු ඇමතිතුමා බොහොම හොඳට සංග්‍රහ කරලා පිටත් කළා. මට මිනිත්තු දෙකකට අවසරය දීම ගැන ගරු සභාපතිතුමාට මගේ ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය යටතේ කරුණු දෙක තුනක් ගැන පමණක් කථා කරන්නට කැමතියි. පුළුවන් තරම් කෙටියෙන් මම ඒ කරුණු ඉදිරිපත් කරන්නම්.

අවුරුදුපතාම ඉදිරිපත් කරන ප්‍රශ්නයක් තිබෙනවා. දැන් අවුරුදු පහක් ගත වුණා. හැමදාම පිළිමයක් යොදනවාය කියනවා මිස නිසි පිළියමක් නම් තවමත් යොදා නැහැ. පසුගිය වතාවේ මේ ප්‍රශ්නය ඉදිරිපත් කළ විට එය කැබිනට් මණ්ඩලය මගින් තීරණයක් ගනු ලැබීම සඳහා ඉදිරිපත් කරන්නට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වන බව කියා සිටියා. ඒ නිසා මම එයින් ඒ වෙලාවේ සෑහීමට පත් වුණා. එහෙත් අද වන තුරු එහි කිසිම වෙනසක් වෙලා නැහැ. මේ රටේ පොල් නැවත වගා කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරනවාදැයි මම ඇහුවා. අදත් මට අහන්නට තිබෙන්නේ පොල් නැවත වගා කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කරනවාද නැද්ද යන්නයි. තේ නැවත වගා කිරීම සඳහා අපි දැන් අක්කරයකට රු. 3,750 ක් ගෙවනවා. රබර් සඳහා රු. 1,400 සිට 1,800 දක්වා ගෙවනවා. එහෙත් පොල් වලට කිසිම දෙයක් නැහැ. ඒ නිසා නැවතත් අහන්නට කැමතියි, ගරු ඇමතිතුමා ඇත්ත වශයෙන්ම අවංක වම සිතට අරන් ස්ථිර වශයෙන්ම වැඩ පිළිවෙලක් යොදනවාද නැද්ද යන ප්‍රශ්නය. පොල් නැවත වගා කිරීම සඳහා වැඩ පිළිවෙළක් ඇති කරනවාද නැද්ද? ඒකයි මගේ ප්‍රශ්නය. මා දැන් ඒ ප්‍රශ්නය නැවතත් අහනවා. ගරු ඇමතිතුමා තරහ නැති නිසා මම අනෙක් ප්‍රශ්නයත් අහනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

පිළිගන්නා. මගේ පිළිතුරු කථාවේදී විස්තර ඇතිව කියන්නම්.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

පොල් වගා කරන උදවියට දෙන පොහොර ගැනයි මගේ ඊළඟ ප්‍රශ්නය. පොල් ඉඩම් හිමියන්ටත් අනෙකුත් ඉඩම් හිමියන්ටත් සියේට පනහක මිල අඩු කිරීමකට යටත්ව පෝර බෙදා දෙනවාය කියනවා. එහෙත් අපට නම් ඒ මිලට පෝර ලැබෙන්නෙ නැහැ. මා එසේ කියන්නේ පෝර සම්බන්ධයෙන් මා ලත් අත්දැකීම් අනුවයි. ලංකා රජයේ පෝර කර්මාන්ත නීතිගත සංයුක්ත මණ්ඩලයෙන් මම පෝර ලබා ගත්තා. ඒ ආයතනයෙන් නිකුත් කරන ලද මිළ ගණන් දැක්වෙන ලැයිස්තුවක් මා ළඟ තිබෙනවා. මම එය ඉදිරිපත් කරන්නම්. යූරියා ටොන් එකක් රු. 840යි. සුපර්පොස්පේට් පෝර ටොන් එකක් රු. 518 යි. මියුරියේට් ඔෆ් පොටෑෂ් ටොන් එකක් රු. 575යි. සියේට පණහේ මිල අඩු කිරීම යටතේ යූරියා ටොන් එක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කට ගෙවන්නට සිදු වන්නේ රු. 420 යි. සුපර්ෆොස්ෆේට් පෝර ටොන් එකකට මිල අඩු කිරීමේ ක්‍රමය යටතේ ගෙවන්නට සිදු වන්නේ රු. 250 යි. ඒ වාගේම මියුරියේට් ඔෆ් පොටෑෂ්වලට සියේට හැටේ මිල අඩු කිරීමේ ක්‍රමය අනුව ගෙවන්නට සිදු වන්නේ රු. 277 යි. එහෙත් ඒ මිලට පෝර ලැබෙන්නේ නැති එකයි අපේ පැමිණිල්ල. මිශ්‍රණයේ මිල ගණන් නිසයි එසේ සිද්ධ වන්නේ.

සී. ආර්. අයි. ඒ., සී. ආර්. අයි. සී. ආදී වශයෙන් පෝර මිශ්‍රණ තිබෙනවා. සම්පූර්ණ මිශ්‍රණයේ වටිනාකම රු. 510 කට වඩා ගියොත් සියේට පණහක් පමණයි ලැබෙන්නෙ. මිශ්‍රණයේ වටිනාකම රු. 510 කට වඩා නොගියොත් සියේට 50 හම්බ වෙන්නෙ නැහැ. වෙන් වෙන් වශයෙන් පෝර ඉල්ලුවා. එසේ කෙළේ පෝරවල පිරිසිද්ධ භාවය ගැන විශ්වාසයක් තිබෙන නිසයි. ඒ නිසා ඒ අනුව පෝර දුන්නා. මිල ගණන ගණන් බැලීමේදී තමයි පෙනී ගියේ මෙහි තිබෙන වෙනස. සියේට පණහක් දීමේ ක්‍රමයට මම නම් සම්පූර්ණයෙන්ම විරුද්ධයි. මීට වඩා ලාභයට ගන්න පුළුවන් තැන් මොනවාදැයි මම කියන්නම්. එහෙත් එය වෙනම කාරණයක්. සියේට පණහක් දෙනවාය කියනවා නම් සියේට පණහක්ම දෙන්නට කටයුතු කරන්නැයි මම ඉල්ලා සිටිනවා.

තුන්වැන්න මේ ආණ්ඩුව කළ ලොකුම වරදක් ගැනයි. එය ඉතාමත් භයානක වරදක්. වී කියන වර්ගයත්, අර්තාපල් කියන වර්ගයත් දේශපාලන භෝග වර්ගයන් කිරීමයි මේ ආණ්ඩුව කළ ලොකුම වරද. ආණ්ඩුවේ තමුන්නාන්සේලා මේ රටේ වී කියන භෝග වර්ගයත්, අර්තාපල් කියන භෝග වර්ගයත් දේශපාලන භෝග වර්ග බවට පරිවර්තනය කර තිබෙනවා. දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන කථා කළා. යාපන යේ ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන ඒ ආකාර යට කථා කරන්නේ ඒ නිසයි. ඊට හේතුව කුමක්දැයි මම කියන්නේ නැහැ. තමුන්නාන්සේ දන්නවා ඒ කුමක්ද යන්න. "මා වගේ මෝඩයෙක් නැත" කියා තමුන්නාන්සේ කිව්වාය කියා "දිනමිණ" පත්‍රයේ තිබුණා. මේ ප්‍රශ්නය නිසා තමුන්නාන්සේත් අමාරුවේ වැටී සිටිනවා. මේ දෙවර්ගයම දේශපාලන බෝග කර ගැනීම නිසා අනාගතයේදී මේ දෙවර්ගයටම—වී නිෂ්පාදනයට සහ අර්තාපල් නිෂ්පාදනයට—පහර වදිනවා.

අ. භා. 3.30

වී නිෂ්පාදනය සඳහා මුළු රටටම සැලැස්මක් හදන්නට ඕනෑ. යායෙන් යායට පස ගැන පර්යේෂණ කරන්න ඕනෑ. යායෙන් යායට අවශ්‍ය පෝර ගැන පර්යේෂණ කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම ගොවිතැන් කිරීම ගැන පොදු සැලැස්මක් නැහැ. පොල්ගහවෙල ප්‍රදේශයම ගත්තත් එක තැනක කුඹුරු හානවා; තවත් තැනක කුඹුරු වපුරනවා; තවත් තැනක පෝර දමනවා; තව තැනක පොඩි ගොයම් පැළ; තවත් තැනක ලොකු ගොයම් පැළ. ඒ අන්දමට සැලැස්මක් නැතිව ගොවිතැන් කිරීමෙන් නොයෙකුත් පාඩු සිද්ධ වන බව කියන්නට ඕනෑ.

රජයේ වී ගොවිපොළවල් කීපයක් තියෙනවා. හිඟුරක්ගොඩත්, පොලොන්නරු වෙත් එවැනි ගොවිපොළවල් තිබෙනවා. ඒ වී පොවිපොළවලින් අක්කරයකට ලැබෙන බුසල් ප්‍රමාණය කොපමනද කියා මා දැන ගන්නට සතුටුයි. මා අහන්නේ පර්යේෂණ වශයෙන් කරන ඒවා ගැන නොවෙයි. ඒ රජයේ ගොවිපොළවල ලොකු හොරකම් සිදු වන බව පමණක් නොව ඒ තැන්වල වී නිෂ්පාදනය සම්බන්ධව අමුතු ගණන් හිලව් හදාගෙන යන බවත් ආරංචියි.

ගරු සභාපතිතුමනි, අද කුකුල් කෑම සඳහා අවශ්‍ය වී කුඩුවල විශාල හිඟයක් තියෙනවා. ඒ නිසා කුකුල් කෑම මිල වැඩි වී තිබෙනවා. මේ ගැන විමසිලිමත් වන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ නිසා බිත්තර නිෂ්පාදනයටත් කිරි ආහාර නිෂ්පාදනයටත් පහරක් වදින්න පුළුවන්. ඒ නිසා වී කුඩු ලබා ගැනීමට දැනට වඩා පහසුකම් ඇති කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

අද එළවළු මිල ඉතාමත් අධිකයි. එයට හේතුව කුමක්ද කියා සොයා බලන්නට ඕනෑ. ඒ මුදල ගොවීන්ට ලැබෙනවාය කියා ගරු ඇමතිතුමා සන්තෝෂ වන්නට පුළුවන්. ඇත්ත වශයෙන්ම එහෙම ලැබෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]
නෙ නැහැ. වෙළඳ දෙපාර්තමේන්තුවේ එළු වළු මිලත් ඉතා අධිකයි. මා කථා කරන්නේ උඩරට එළුවළු වගී ගැන නොවෙයි. පහත රට එළුවළු වගී ගැනයි. ශත 50 කට අඩු වෙන් කිසිම වගීයක එළුවළු රාත්තලක් ගන්න බැහැ. අමු මිරිස් රාත්තල රු. 1.20 යි. නිපදවන්නාත්, පාරිභෝගිකයාත් අතර මැද සිටින කෙනෙක් තමයි, ගසාකෑම කරන්නේ. මේ ගැන සොයා බලා සුදුසු පිය වරක් ගන්න ඕනෑ. මීට අවුරුදු 5 කට පමණ පෙර සමූපකාර ව්‍යාපාරය මගින් එළුවළු වෙළඳාම පටන්ගත්තා. එය කොයි තරම් දුරට දියුණු වී තිබෙනවාද කියා සොයා බලන්න ඕනෑ.

ගරු ඇමතිතුමාගේ කාලයේදී ට්‍රැක්ටර් සම්බන්ධව සොයා බැලීමට ඉඹුලාන කොමිටිය සහ මහින්ද සිල්වා කොමිටිය යනු වෙන් කොමිටි 2ක් පත් කළා. මේ කොමිටි දෙකේ වාර්තා අපට ලැබී නැහැ. මේ වාර්තා දෙක සංසන්දනය කර බැලීමට මා ඉතා මත් ආශාවෙන් සිටිනවා. ෆෝඩ් වර්ගයේ ට්‍රැක්ටර් සුදුසු නැත කියා ඒ එක කමිටු වාර්තාවක තිබෙන බව මට ආරංචියි, එහා ට මෙහාට බඩු ගෙන යාමට නම් ඒවා හොඳයි. කුඹුරට ඒවා හොඳ නැහැ. කුඩා ට්‍රැක්ටර් පාවිච්චිය ලොකු ට්‍රැක්ටර් පාවිච්චි යට වඩා හොඳ බව එහි කියා තිබෙනවා. පටන් ගත්තෙ කවදා සිටද ? අශ්වයා පැන ගියාට පසුව ඉස්තාලය වසා ඇමීමෙන් වැඩක් වන්නේ නැහැ. වෙන්න වුවමනා හරිය සිදු වී අවසාන නිසා. ඒ නිසා මා ඉල්ලා සිටින්නේ කරුණාකර මේ කමිටු දෙකේ වාර්තා දෙක මේ ගරු සභාවට ඉදිරි පත් කරන්නය කියායි. මොකක් ද වෙලා තිබෙන්නෙ කියා එවිට අපට දැනගන්න පුළුවනි.

තවත් ගරු ඇමතිතුමාට අමතක වී ගොස් තිබෙන දෙයක් තිබෙනවා. එනම් සැල්වීනියා ව්‍යාපාරයයි. මට කියන්නත් කනගාටුයි. මා දැක්කා බොගවන්තලා වේත් සැල්වීනියා වැවී තිබෙනවා. මෙය ලංකාවේ තිබෙන ඉතාම උස් කඳුකර ප්‍රදේ ශයක්. එහිත් සැල්විනියා වැවී තිබෙනවා. මල්වතු ඔයේත්, මහවැලි ගඟ දෙවුරේත් සැල්වීනියා වැවී තිබෙනවා. දැන් අවුරුදු තුන හමාරක් පමණ කාලය තුළ සැල්වීනි යා මර්ධන ව්‍යාපාරය ගැන එතුමාට අමතක වී තිබෙන බවයි පෙනෙන්නෙ. මෙය අමත ක කරන්න පුළුවන් දෙයක් නොවෙයි. අනික් කරුණ නම් වල් පැලෑටි බෝවීමයි. මේ රටේ වල් පැලෑටි මර්ධනය සඳහා අවුරුද්දකට රුපියල් 50 ලක්ෂයක් වියදම් කරනවා. එයත් සෑහෙන ගණනක් නේ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
Those chemicals are used for tea, rubber and coconut.

**ජයකොඩි මයා.**
*(திரு. ஜெயக்கொடி)*
(Mr. Jayakody)
වෙන්න පුළුවන්. නමුත් මේ වල්පැලෑටි මර්ධනය කිරීම ගැන කිසිම වැඩ්පිළිවෙලක් නැහැ. දැන් අවුරුදු 10කට පමණ කලින් " ඉෂෝමොරියම් ඔඩ්ටම් " කියන වර්ගය— සාමාන්‍ය වැසියා කියන විධියට " පොඩි සිංඤෝ මරන් " කියන වර්ගය—බෝවී ගෙන ගියා. ඒ අවස්ථාවේදී එය මර්ධනය කිරීම සඳහා කිසිම වැඩපිළිවෙලක් යෙදුවේ නැහැ. නමුත් " Euphatoria " ක්‍රම තිබෙන වා. " Biological " ක්‍රම තිබෙනවා. " Mechanical " ක්‍රම තිබෙනවා. ඔය ක්‍රම ගැන තමුන්නාන්සේ දන්නවා ඇති. නමුත් කියන්නත් කනගාටුයි, දැන් අලුත් වල් පැලෑටි වර්ග රාශියක් බෝවී ගෙන යන බවක් පෙනෙනවා. අද උතුරු මැද පළාතේ—විශේෂයෙන්ම මේ අකල් වැස්සෙන් පසුව—වල් පැලෑටි වර්ග රාශි යක් බෝවී තිබෙනවා. ඒ පැත්තට ගිය විට මට දකින්න ලැබුණා මා ජීවිතේදීවත් නො දුක්ක වල් පැලෑටි රාශියක් වැවී තිබෙන බව.

ගරු සභාපතිතුමනි, වෙන රටක නම් මෙවැනි දේ, මෙවැනි දෙයක් උද්ගත වී තිබෙන විට, එය විශාල ජාතික ප්‍රශ්නයක් විධියටයි සලකන්නෙ. අපේ රටේ ඒ විධිය ට සලකන්නේ නැහැ. යම් යම් වගාවන් කරනවා ඊට පසුව කියනවා, ජපන් ජබර, සැල්වීනියා ආදිය නිසා කරදර ඇති වෙන වාය, වගාවන් විනාශ වෙනවාය කියා. දෙවනුවයි ඒ ගැන අපි කල්පනා කරන් නෙ. ඒ නිසා මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, මේ ගැන වහාම සොයා බලන්නය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනික් කරුණ නම්, පුද්ගලික අංශයට කිරි හරක් අපනයනය කිරීමට තමුන්නාන්සේ අදහස් කර තිබෙනවා. කිරි හරක් 1,000 ක් පමණ අපනයනය කරන්න යන වාය කියා අපට දැනගන්න ලැබී තිබෙනවා. පෞද්ගලික අංශයට මෙම කටයුත්ත භාර දෙන නිසා මේ කිරි හරක් බෙදා දෙන ආකාරය ගැන මා දැන ගන්න කැමතියි. අද රටේ දියුණු කිරි පට්ටිකාරයින් සිටින වා ; නොදියුණු කිරි පට්ටිකාරයිනුත් සිටි නවා. මුදල් හදල් සොයා ගැනීමට අපහසු තත්ත්වයෙන් සිටින කිරි පට්ටිකාරයිනුත් සිටිනවා. අන්න ඒ විධියේ අපහසු තත් වයක සිටින කිරි පට්ටිකාරයින්ට තමුන් නාන්සේ පිටරටින් ගෙන්වන හොඳ වර්ගයේ හරක් බෙදා දෙන්න වැඩ කටයුතු පිළියෙල කරන්නය කියා මා ඉල්ලා සිටි නවා.

අනික් කාරණය නම්, මට කියන්නත් කණගාටුයි, තමුන්නාන්සේ දන්නවා ඇති කෘෂිකර්ම අභ්‍යාස පාඨශාලා 18 ක් තිබුණා. එයින් 5ක් හැරෙන්න අනික් 13 ම අද වසා දමා තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
වසා නැහැ.

**ජයකොඩි මයා.**
(திரு. ஜெயக்கொடி)
(Mr. Jayakody)
තමුන්නාන්සේ කියනවා වසා දමා නැත, ඒවා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාර දීලාය කියා. මම කියනවා ඒවා වසා දමා තිබෙනවාය කියා. මම ගරු ඇමති තුමාට එකක් කියන්න කැමතියි. ගුරු වරුන් කෘෂිකර්මය පුහුණු කරන්න පුළුවන් විධියේ වර්ගයක් නොවෙයි. වයසට ගිය ගුරුවරුන්ට පුළුවන්ද කෘෂි කර්මය ඉගෙන ගන්න. ? ඒ සඳහා තරුණ යන් පිරිසක් යොදවා ගන්න ඕනැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
අභ්‍යාස විද්‍යාල වසා දමා නැහැ. ඒවා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාර දී තිබෙනවා.

**ජයකොඩි මයා.**
(திரு. ஜெயக்கொடி)
(Mr. Jayakody)
මා කතා කළාට පසුව තමුන්නාන්සේ පිළිතුරු දෙන්න. පුලියංකුලම, වාරිය පොල, බිබිලෙ ආදි ස්ථානවල කෘෂිකර්ම අභ්‍යාස පාඨශාලා වසා දමා තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
එකක් වත් වැසුවේ නැහැ.

**ජයකොඩි මයා.**
(திரு. ஜெயக்கொடி)
(Mr. Jayakody)
අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාර දුන්නා. අධ්‍යාපන දෙපර්තමේන්තුවයි අපියි දන්න ගොවිකම මොකක්ද ? තමුන් නාන්සේ ඒක දන්නෙ නැද්ද ? කෘෂි කර්ම දෙපාර්තමේන්තුව යටතේ තිබෙන පාඨශාලාවක ද කෘෂිකර්මය පිළිබඳ වැඩක් කළ යුත්තෙ එසේ නැත්නම් අධ්‍යාපන දෙපාතීමේන්තුවේ පාසලකද ? තමුන් නාන්සේ කොහේද යන්නෙ ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
මම යන්නෙ හරි පාරේ.

**ජයකොඩි මයා.**
(திரு. ஜெயக்கொடி)
(Mr. Jayakody)
තමුන්නාන්සේ මොන ඇමතිතුමාද ? කෘෂිකර්මයට ලැදියාවක් තිබෙන ඇමති තුමෙක්ද ? එසේ නැත්නම් කෘෂිකර්මය නැති කරන්න ලැදියාවක් තිබෙන ඇමති තුමෙක්ද ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
පාසල්වල කෘෂිකර්මය උගන්වාගෙන යනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජයකොඩි මයා.**
(திரு. ஜெயக்கொடி)
(Mr. Jayakody)

පාසල්වල කෘෂිකර්මය උගැන්වීම නොවෙයි ප්‍රශ්නය. දැන් තමුන්නාන්සේ යටතේ යම්කිසි නිලධාරි පෙළක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිටිනවා නම් ඒ ඒ සෑම කෙනෙක්ම එක්කෝ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයෙන් එහෙම නැත්නම් පේරාදෙණියේ කෘෂිකර්ම විද්‍යාලයෙන් සමත් වූ අයයි. අද ඩී. ඒ. ඕ. ලා හැටියට ඉන්නෙත් colonization officers හැටියට ඉන්නෙත්, ඒ. අයි. ලා හැටියට ඉන්නෙත් ඔය දෙකෙන් එකකින් පාස් වී ගිය උදවියයි. ඉතින් ඒ මට්ටමට ගන්නට පුළුවන්කම තිබියදී මේ ගුරුවරුන් පුහුණු කරන්නේ කාට උගන්වන්නද? තමුන්නාන්සේ හිතන්නේ පාසල්වල කෘෂිකර්මය උගන්වනවා කියලද? මා දන්නවා තමුන්නාන්සේ තවත් වැඩක් කර තිබෙනවා. දැන් විෂයයන් පවා තමුන්නාන්සේ වෙනස් කර තිබෙනවා. ඉස්සර entomology, pathology, veterinary science ආදී විෂයයන් සෑම එකක්ම අවුරුදු දෙකක් ඇතුළතදී ඔය කෘෂිකර්ම විද්‍යාලවලදී ඉගැන්වෙනවා. එහෙත් දැන් ඒ ක්‍රමය වෙනස් කර තිබෙනවා. දැන් කුඹුරුවලට වෙනම හදනවා. Veterinary science වලට වෙනම විෂය මාලාවක්. Pathology වලට වෙනම විෂය මාලාවක්. Entomology වලට වෙනම විෂය මාලාවක්. ඒ ක්‍රමය වැරදියි; ඒක සාර්ථක නැහැ. සෑම එකක්ම දැනගන්න ඕනෑ. දැන් ඔය සිටින ඩී.ඒ.ඕ. කෙනෙකුගෙන් මොන අංශයක් ගැන වුණත් ප්‍රශ්නයක් ඇසුවොත් එකවිටම උත්තර දෙනවා. එහෙත් මේ වැඩ පිළිවෙල යටතේ තමුන්නාන්සේට මොකක්ද සිද්ධ වෙන්නෙ? සෑම එකකටම එක් කෙනෙක් බැගින් පත් කරන්න වෙනවා. Pathology ගැන දන්න එක්කෙනෙක් පත් කරන්න වෙනවා. Entomology ගැන දන්න තව එක් කෙනෙක් පත් කරන්න වෙනවා. Veterinary science ගැන දන්න තවත් එක්කෙනෙක් පත් කරන්න වෙනවා. ඔය විධියට සෑම අංශයටම එක් එක්කෙනා බැගින් පත් කරන්නයි තමුන්නාන්සේට සිද්ධ වෙන්නෙ. මේක මහා කරදරයක්. ඒ නිසා ඒ ප්‍රතිපත්තියට මා සම්පූර්ණයෙන්ම විරුද්ධයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

තමුන්නාන්සේ විරුද්ධ වෙන්න පුළුවන්. දැන් දැනිම විවිධයි.

**ජයකොඩි මයා.**
(திரு. ஜெயக்கொடி)
(Mr. Jayakody)

අවසාන වශයෙන් ආහාර දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් තව එක කාරණාවක් සඳහන් කරන්න තිබෙනවා. පසු ගිය වර්ෂයේදී ආහාර කොමසාරිස්තුමා මේ රටට බඩු ගෙන්වන අවස්ථාවේදී—විශේෂයෙන් චීනෙන් හාල් ගෙනෙන වේලාවේදී—නැව් ගාස්තු හැටියට අපේ මුදල්වලින් ලක්ෂ පහමාරයි වැය කළේ. එහෙත් මේ අවුරුද්දේ තමුන්නාන්සේ එය රජයේ නැව් සංස්ථාවට දීමෙන් ලංකා නැව් සංස්ථාවට ලක්ෂ හයහමාරක් ගෙවන්න සිද්ධ වී තිබෙනවා. මම එකක් කියන්නම්. ගිය අවුරුද්දේ තමුන්නාන්සේ ඔය නැව් ගාස්තු—freight rates—ලබාගත්තේ ඒ ඒ බ්‍රෝකර්ලාගෙන් අසාගෙනයි. එහෙත් දැන් තමුන්නාන්සේට බ්‍රෝකර්ලාගෙන් අහන්න බැහැ. තමුන්නාන්සේට සිද්ධ වී තිබෙන්නේ කෙළින්ම රජයේ නැව් සංසථාවට පැවරීමයි. කරුණාකර බලන්න තමුන්නාන්සේ ඒ අයට එම නැව් ගාස්තුව ගෙවීමෙන් තමුන්නාන්සේට ප්‍රයෝජනයක් ලැබේද නැද්ද කියා. මට ලැබී තිබෙන ආරංචියේ හැටියට රජයේ නැව් සමාගම නැව් ගන්න යන වෙලාවේදී "චාටර්" කරන්න යන වේලාවේදී නැව් අයිතිකරුවන්ට විශාල මුදලක් දෙන්න වන බවයි. හැබැයි ඒක අඩු කර ගන්නෙ තමුන්නාසෙගෙන්. තමුන්නාන්සේටයි ඒ සඳහා ගෙවන්න සිද්ධ වෙන්නෙ. අන්න ඒ නිසා තමුන්නාන්සේගේ මුදල් ටික ගැනවත් තමුන්නාන්සේ ජාංබේරා ගැනීමට කටයුතු සලස්වාගන්නය කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පී. ජී. මුතුබණ්ඩා මයා.** (ලග්ගල)
*(திரு. பீ. ஜீ. முத்துபண்டா—லக்கல)*
(Mr. P. G. Muthubanda—Laggala)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මා ඉතාමත් ආඩම්බරයෙන් ගරු ඇමතිතුමටාත් ඒ නිලධාරි මහත්වරුන්ටත් මගේ ප්‍රසංශාව පුද කරනවා. මාතලේ දිස්ත්‍රික්කයේ වී ගොවිතැන් කිරීමේ අංශයක් පසු ගිය අවුරුද්දේ තිබුණා. ඒ අංශයෙන් මාතලේ දිසාපතිතුමාත්, ආදායම් පාලක නිලධාරි මහත්මයාත් ග්‍රාමසේවක මහත්වරුනුත් ගොවිතැන් දියුණු කිරීම සඳහා ගත් මහන්සිය අප්‍රමාණයි. ඒ නිසා ඒ සැම නිලධාරියෙකුටම මා ස්තුතිවන්ත වෙනවා.

අ. භා. 3.45

ගරු සභාපතිතුමනි, අපි වී ගොවිතැන, මිරිස් ගොවිතැන, අර්තාපල් ගොවිතැන ආදී දේවල් ඉතා ඕනෑකමින් කර ගෙන යනවා. එහෙත් අපේ රටේ වැවිය හැකි කපු වගාව ගැන මෙබඳු උත්සාහයක් ගන්නෙ නැති නිසා අපේ රටේ තිබෙන පේසකර්ම බලවේග මධ්‍යස්ථානවලට හා අත් යන්ත්‍ර පේසකර්ම මධ්‍යස්ථානවලට ඉදිරි අනාගතයේදී පහරක් වදින්නට ඉඩ තිබෙනවා. මේ කාරණය සම්බන්ධව මාතලේ කච්චේරියේ පැවැති දිස්ත්‍රික් සම්බන්ධතා කමිටුවේදී දිසාපතිතුමාත් මාත් ඉතා උනන්දුවෙන් ක්‍රියා කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම ලග්ගල කොට්ඨාශයේ මිනිපේ ජනපදය කොටසේත් දඹුල්ල කොටසේත් ඉතා සශ්‍රිකව කපු වගා කරන්නට පුළුවන්කම තිබෙනවා. මේ වාරයේදී අක්කර 600 ක පමණ කපු වගා කර අත්හදා බැලීමක් කරන්නට දිසාපතිතුමාත් මාත් සාකච්ඡා කර කටයුතු යොදා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඇමතිතුමාගේ උදව්වත් අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟ කාරණය මෙයයි: සමහර ගෙවල්වලින් ලොකු ආන්දෝලනයක් ඇහෙනවා සමහර පොඩි ළමයින්ට ලදරු පොත් නැත කියා. ලදරු පොත් ඇති අයට පමණයි පිටිකිරි ලබා ගන්නට පුළුවන්. කූපන් පොත් දෙන කාලයට සමහර ළමයින් බඩෙත් නැහැ. ඒ නිසා ළමා පොත් තිබෙන අයටත් පිටිකිරි ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

රත්තොට ගරු මන්ත්‍රීතුමා (යාලේගම මයා.) මාතලේ සමුපකාර සංගමයේ පාලනය ගැන කිව්වා. ඇත්ත වශයෙන්ම මාත් දන්නවා මාතලේ සමුපකාර සංගමයේ නඩත්තුවවත් ගෙන යන්නට බැරි අවස්ථාවක මණ්ඩලයක් ඇති කර මාතලේ පළාත් පාලන උප කොමසාරිස්තුමාත් තවත් නිලධාරීන් කීපදෙනෙකුත් එකතු වී අවුරුදු ගණනාවක් වැඩ කර තිබෙන අතර ලක්ෂ ගණනක ලාභයකුත් පෙන්වා තිබෙන බව. ඒ අය තමන්ගේ රාජකාරිවලට අමතරව නිවාඩු කාලවලදී පවා සංගමයේ වැඩ කරන බව මා හොඳින්ම දන්නවා. ඒ නිසා ඒ මහත්මයා නිසා එම සංගමය දියුණු වී තිබෙනවාය කියා මේ ගරු සභාවේදී මතක් කරන්න කැමති.

ගරු ඇමතිතුමාට තවත් කරුණක් මතක් කරන්නට ඕනෑ. මිනිපේ ජනපදයේ 3 වැනි පියවරත් 4 වැනි පියවරත් ලග්ගල කොට්ඨාශයේයි පිහිටා තිබෙන්නේ. මා කියන්නට යන කරුණ ගැන මාතලේ දිසාපතිතුමාත් සාක්ෂි දරනවා ඇති. මිනිපේ ජනපදයේ මගේ කොට්ඨාශයට අයිති හරියේ සමුපකාර සමිති 7 ක් තිබෙනවා. පසුගිය කන්නයේදී ඒ සමිති 7න් පමණක් වී බුසල් 160,000 ක් රජයට බාර දී තිබෙනවා. ඒවා රජයට බාරදීමේදී ඒ සමිතිවල අයට හුඟක් හිරිහැර සිදු වුණා. ගරු සභාපතිතුමනි, මිනිපේ 3 වැනි පියවරේ සිට පල්ලෙවත්තට හැතැප්ම 18 ක් තිබෙනවා. පල්ලේවත්තේ වී ගබඩාවට වී බාර දෙන්නය කියා එතැනට සති 3ක් වී දෙන විට කිව්වා මයියංගනයේ වී ගබඩාවට දෙන්නය කියා. මයියංගනයට හැතැප්ම 30 ක් තිබෙනවා. එතැනටත් සති 2 ක් බාර දෙන විට කීවා බදුල්ලට හැතැප්ම 6ක් දුරින් ඇති ස්ථානයක තිබෙන ගබඩාවකට වී බාර දෙන්නය කියා. වී ටික අර ගෙන හැතැප්ම පණස් ගණනක් යන්නට සිදු වුණා. ඒ ජනපදයේ සමිති හතක් තිබෙනවා. වී බුසල් 1,60,000 ක් හැතැප්ම 54 ක් දුර ගෙන යන්නට කොපමණ මුදලක් වියදම් කරන්නට වුවමනාද? මේ කොටසට වී ගබඩාවක් අවශ්‍ය බව මාතලේ දිසාපතිතුමා කීප විටක්ම කියා තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ජී. මුතුබණ්ඩා මයා.]

වී ගබඩාවක් සෑදීම සඳහා ඉඩමක්ද ලබා ගෙන තිබෙනවා. ඔය කියන ලද සමිති හත පමණක් නොව, ලග්ගල පල්ලේගම, රත ඹුරේ, රඹුක්ඔළුව, හත්තොට අමුණ, මාල කොටුව, ඇටන්වල ආදී වශයෙන් තවත් සමිති හතක් තිබෙනවා. එතකොට ඔය යෝජනා කර තිබෙන ස්ථානයේ වී ගබඩාව සෑදුවහොත් සමිති 14 ක වී ඒ ගබඩාවට දෙන්නට පුළුවනි. ඒ වාගේම වී ගෙන යන්නට තිබෙන දුර හැතැප්ම හතකට අටකට වැඩි වන්නේ නැහැ. ඒ නිසා මේ අවුරුද්දේවත් ඒ වී ගබඩාව පිහිටුවීමට කටයුතු කරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ලග්ගල කොටසේ කෝරළ තුනේ කුඹුරු අක්කර 12,000 කට අධිකව තියෙ නවා. පෞද්ගලික ට්‍රැක්ටරයකින් ඒ කුඹුරු හාන්නට අක්කරයකට රුපියල් හැත්තෑවක්, අසූවක් අය කරනවා. ඒ නිසා ආණ්ඩුවේ ට්‍රැක්ටර් මධ්‍යස්ථානයක් මිනිපේ තුන් වන පියවරේ පිහිටුවන ලෙසත් මා ඉල්ලා සිටිනවා. මේ කටයුතු කිරීමෙන් ලග්ගල කොට්ඨාශයේ ජනතා වට තවත් යහපතක් උදා කර දෙන මෙන් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

**ලීලාරත්න විජේසිංහ මයා.** (පොළොන් නරුව)

*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ—பொல்ல நறுவ)*

(Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය යටතේ මාත් වචන ස්වල්ප යක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. ආණ්ඩුවේ වී මිළයට ගැනීමේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මට ලොකු සැකයක් ඇති වී තිබෙනවා. ආණ්ඩුව වී බුසලකට රුපියල් 14 ක් ගෙවනවා. එහෙත් ආණ්ඩුවට වී මිළයට ගන්නට ලැබෙන අවස්ථා අඩුයි. පෞද්ගලික වෙළෙ ඳුන් මොන උපක්‍රමයකින් හෝ ගොවියා ගේ වී ටික මිළයට ගන්නට ක්‍රියා කර නවා. පසුගිය කාලයේදී නම් ආණ්ඩුව වී මිළයට ගැනීමේ සැලැස්මක් තිබුණා. ඒ කාලයේදී විවිධ සේවා සමුපකාර සමිති වලට සෑහෙන තරම් වී ලැබුණා. එක් දිස් ත්‍රික්කයක සිට තවත් දිස්ත්‍රික්කයකට වී ගෙන යෑමේ තහනමක් තිබුණු නිසා ආණ්ඩුවට සෑහෙන වී ප්‍රමාණයක් ගන් නට පුළුවන් වුණා. ඒ වාගේම ඒ නිසා මේ රටේ සහල් මිළ එක්තරා මට්ටමක තබා ගන්නට පුළුවන් වුණා. අද පොළොන්නරුව පළාතේ වී බුසල් ලක්ෂ 10 ක් පමණ නිෂ්පාදනය කරනවා නම් එයින් ලක්ෂයක්වත් ආණ්ඩුවට ලැබෙන් නේ නැහැ. පිටස්තර වෙළෙඳුන් වී බුසල කට රුපියල් 15 බැගින් හෝ රුපියල් 15.50 බැගින් හෝ ගෙවා ඒ වී මිළයට ගන්නා නිසා ආණ්ඩුවේ ගබඩාවලට වී ලැබීම අඩුයි. මේ නිසා ගොවියාට වාසි යයි එක අතකින් කීවත් කුඹුරු ගොවි තැන් නොකරන වැඩි දෙනකු මේ රටේ සිටින බව අප කල්පනා කරන්නට ඕනෑ. වී ටික ඒ විධියට පිටස්තර වෙළෙඳුන් අතට ගියාම සහල් මිළ වැඩි වෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

ගොවියාට රුපියල් 15 බැගින් නැත් නම් රුපියල් 15.50 බැගින් ලැබෙනවාද?

**ලීලාරත්න විජේසිංහ මයා.**

*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*

(Mr. Leelaratne Wijesinghe)

ඔව්. කමතේදීම ඒ මුදල ලැබෙනවා. ගරු ඇමතිතුමා මේ ගැන සාධාරණව කල් පනා කර බලා සහතික මිළ රුපියල් 15 ක් කර හෝ වැඩි වැඩියෙන් ආණ්ඩු වට වී ගන්නට ක්‍රියා කළ යුතුයි. ඒ වාගේම දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වී ගෙන යෑම තහනම් කළ යුතුයි. එසේ කළහොත් සහල් මිළ සෑහෙන තත්ත්ව යක පවත්වාගෙන යන්නට පුළුවන් වෙනවා ඇති. දැනට පවතින පිළිවෙළටම තිබෙන්නට හැරියොත් බිත්තර වී බුස ලක් රුපියල් 20ක්, 25 ක් වන්නට පුළුවනි. හාල් සේරුව එකයි පනහට රුපි යල් දෙකට යයි. ඉන්දියාවේ හාල් සේරු වක් රුපියල් හතරක් පහක් වෙනවාය කියනවා. අපේ රටේත් එවැනි තත්ත්ව යක් උදා වන්නට හොඳටම ඉඩ තිබෙ නවා.

ලංකාවේ පැරණි වී වර්ග දැන් වඳ වී ගෙන යනවා. අයිආර්—8, එච්—4 යනාදී වී වර්ග තමයි දැන් වපුරන්නෙ. පිළිපීන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යේ පර්යේෂණ කර නිෂ්පාදනය කරන වී වර්ග මෙරටට ගෙනවුත් බෝ කරනවා. හේම බස්නායක මහත්මයාත් තායිවාන යෙන් තායි චුං නමැති වී වර්ගයක් ගෙනාවා. මේ වී වර්ගවලින් වැඩි අස්වැන්නක් ලැබෙනවාය කිව්වත්, පසුගිය කාලය තුළ වැඩියෙන්ම වසංගත බෝ වුණේ මේ වර්ගවලින් බව අපට කියන්නට පුළුවනි. මඩඇල්, හාතිලි, සම්බා, දෙවරැද්දිරි, මුරුංගා වැනි අපේ පැරණි වී වර්ග මේ රටේ පොළවට හුරු පුරුදු වී වර්ග, අද නැත්තටම නැති වී ගොස් තිබෙනවා. මගේ කල්පනාවේ හැටියට මේක ජාත්‍යන්තර කුමන්ත්‍රණයක්. ඇමරිකන් අධිරාජ්‍යවාදීන්ගේ ජාත්‍යන්තර කුමන්ත්‍රණයක්.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
එච්—4 වරදක් නැහැ නේද?

**ලීලාරත්න විජේසිංහ මයා.**
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)
ඔය සෑම වර්ගයකටම ඉක්මනින්ම ලෙඩ බෝ වෙනවා. ඒ වාගේම ඔය වී වර්ගවලට තෙල් ඉසින්නට ඕනෑ; පොහොර හුඟක් දමන්නට ඕනෑ; නා නා ප්‍රකාර දේවල් කළ යුතුව තිබෙනවා. ඉස්සර මේ තරම් වසංගත තිබුණේ නැහැ. ඉස්සර මේ තරම් ලෙඩ බෝ වුණේ නැහැ. මේ රටේ ආහාරයෙන් භාගයක් ඇමෙරිකානු අධිරාජ්‍යවාදීන් ගිල ගෙන සිටින බව අප දන්නවා. ඉදිරි කාලයේදී මේ රටේ ගොවිතැනට වසංගත බෝ වුණොත්, පිටරටින් ඔය කෘෂිකාර්මික, කෘමි නාශක බෙහෙත් වර්ග එහෙම නොලැබුණොත් අපේ ආහාරය සම්පූර්ණයෙන්ම පිටිවලින් පිරිමසා ගන්නටයි සිද්ධ වෙන්නෙ. අන්න ඒ අනතුරු හැඟවීමයි මා කරන්නෙ. මේ රටේ පැරණි වී වර්ග අද සම්පූර්ණයෙන්ම වඳ වී තිබෙන අතර අපේ ජනතාව පිටි කන්නට පුරුදු කරවා තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
ඒ වීවලින් ලැබෙන අස්වැන්න මදි.

**ලීලාරත්න විජේසිංහ මයා.**
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)
නමුත් මේ රටට ඔබින හැටියට ඒවා ගින් පර්යේෂණ කරනවා නම් හොඳ වී වර්ගයක් නිෂ්පාදනය කර ගන්නට පුළුවන් වෙනවා. ඔය පිලිපීනයෙන් ගෙනෙන වීවලට වසංගතයක් හැදුණොත් මොකද වෙන්නෙ? ඒ වාගේම පිටරටින් ඔය බෙහෙත් වර්ග නොලැබුණොත් මොකද වෙන්නෙ? මුළු ජාතියටම ජාතික ආහාරය වන බත් අමතක කර ඇමරිකන් පිටි කන්නට සිදු වෙනවා. මේ රටේ පොළවට ඔබින වී වර්ගයක් නිෂ්පාදනය කර ගන්නට පුළුවන් වුණොත් ඔය විෂ බෙහෙත් ඉසින්නට වුවමනාවක් වෙන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම විෂ බෙහෙත් වර්ග ගෙන්වීමට වැය කරන මුදල් මේ රටේ පොළවට ඔබින වී වර්ගයක් නිෂ්පාදනය කිරීමට යොදනවා නම් වඩා හොඳයි. ඉස්සර ගොවිතැනට මේ තරම් ලෙඩ රෝග තිබුණේ නැහැ. දැන් තමයි සියලුම ලෙඩ තිබෙන්නෙ. ඒ වාගේම වසංගත පැතිරෙන්නේ කොහොමද? අද එක යායක් මැරෙනවා; හෙට තවත් යායක් මැරෙනවා; දන්නෙම නැහැ. කෘෂිකර්ම ඇමතිතුමා මේ ලෙඩ රෝග මර්දනය කරන්නට මහන්සි වන බව අප දන්නවා. නමුත් ඔය අළුත් වී වර්ගවලින් තමයි මේ ලෙඩ රෝග බෝ වී තිබෙන්නෙ.

තවත් කාරණයක් තිබෙනවා. දුම්කොළවලින් රජය විශාල ආදායමක් ලබා ගන්නවා. නමුත් දුම්කොළ වවන්නාට කිසිම පහසුවක් සැලසී නොමැති බව ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇති. නියඟයක් හෝ වර්ෂාවක් හෝ ගංවතුරක් හෝ ඇති වී අලාභයක් වුණොත්, සම්පූර්ණ පාඩුව වගා කරන්නාටම දරන්නට සිද්ධ වෙන වෙනවා. රක්ෂණ ක්‍රමයක්වත් නැහැ. ඒ වාගේම දුම්කොළ වවන්නාට නියම මිළක් ලැබෙන්නෙත් නැහැ. අද මේ රටේ දුම්කොළ ව්‍යාපාරය සම්බන්ධයෙන් විශාල ඒකාධිකාරයක් තිබෙනවා. තමුන්නාන්සේට පින් සිද්ධ වෙයි, පුළුවන් නම් ඒ ඒකාධිකාරය කඩා දමන්න. මා සිතන හැටියට දුම්කොළවලින් රජයට කෝටි විස්සක පමණ ආදායමක් ලැබෙනවා. මේ රටේ දුම්කොළ ව්‍යාපාරය අද එකම කොටසක් සම්පූර්ණයෙන්ම අල්ලාගෙන සිටි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මයා.]

නවා. දුම්කොළ මිළ නියම කරන්නෙත් ඒ උදවියමයි. වර්ග කරන්නේත් ඒ උදවිය මයි; ගන්නේත් ඒ උදවියමයි. තවත් කෙනෙකුට ඔළුව උස්සන්නට දෙන්නෙ නැහැ. අපරාධෙ කියන්න බැහැ සතාර් මහත්මයා දුම්කොළවලට සෑහෙනා මිළක් ගෙව්වා; නමුත් ඒ සමාගමත් දැන් නැහැ. එක් දහස් නවසිය තිස් ගණන්වල රොත්මන් සමාගම සිටරට් නිපදවීම සම්බන්ධයෙන් මේ රටේ වැඩ පිළිවෙළක් ගෙනා ගිය බව අපට මතකයි. පසුව ඒ රොත්මන් සමාගමත් අලියා සමාගම ගත්තා. දැන් සම්පූර්ණ ඒකාධිකාරයක් පවතිනවා. ඒ අය ගොවීන් සූරා කන වැඩ පිළිවෙළක් අනුගමනය කරනවා. ගරු ඇමතිතුමා සෑහෙනා නිර්භීතකමකින් පියවරක් ගත්තොත්, ඔය මුදලින් සෑහෙන කොටසක් ජාතියට ලබා ගන්නට පුළුවන් වන බව මා මතක් කරන්නට සතුටුයි.

නොම්මර එකේ දුම්කොළ රාත්තලක් රුපියල් 4.30 යි. නොම්මර එකේ වර්ගය අද නොම්මර තුනට ගන්නවා. ඉස්සර නොම්මර එකේ රාත්තලක් රු. 4.20 යි. ඉස්සර නොම්මර එකට ගත් දුම්කොළ දැන් නොම්මර තුනට දමා ගෙවන්නේ රු. 3.90 යි. මේ වර්ගීකිරීම උඩ කොම්පැනිකාරයින් රාත්තලකට ශත 30 ක ලාභයක් ගන්නවා.

අ. භා. 4

ගිය අවුරුද්දෙදි නොම්මර එකට වර්ග කළ දුම්කොළ මේ අවුරුද්දෙදි වර්ග කරන්නෙ නොම්මර තුනටයි. මේ අන්දමින් වර්ගය වෙනස් කර ශත තිහක් ලාභ ගන්නවා. නොම්මර දෙකේ වර්ගය රාත්තලක් රුපියල් 3.95 යි. නොම්මර දෙකෙන් ඉතාමත් ස්වල්පයක් අර ගන්නවා. වැඩි හරියක් ගන්නේ නොම්මර හතර වර්ගයෙනුයි. මේ අන්දමට වගා කරන්නන් වංචා කොට දුම්කොළ කොම්පැනිකාරයන් සෑහෙන ලාභයක් ලබා ගන්නවා. එම නිසා අඩු වශයෙන් රුපියලේ වටිනාකම අඩු වීම උඩ, ඒ සත විස්සවත් හරියාකාර ලබා ගන්න පුළුවන් ආකාරයට දුම්කොළ මිල නියම කරනවා නම් දුම්කොළ වගා කරන අහිංසක ගොවියන්ට සහනයක් සැලසෙන්න ඉඩ තිබෙනවා.

දුම්කොළ කොම්පැනිවල සිංහල භාෂාව කතා කරන, දෙමළ භාෂාව කථා කරන කිසිම කෙනෙකුට ලිපිකරු වැඩක්වත් ලබා ගන්න බැරි බව පෙනී යනවා. සෑම දෙයක්ම කරන්නෙ ඉංග්‍රීසි භාෂාවෙන්. එම නිසා සිංහලෙන් වැඩ කරන්න පුළුවන් සේවකයන් බඳවා ගැනීමට ක්‍රියා කරන ලෙස නියමයක් කරන මෙන් ඉල්ලා සිටිනවා. කිසිම දුම්කොළ සමාගමක අද සිංහල භාෂාවෙන් කටයුතු කරන්නෙ නැහැ. අපේ රටේ දුම්කොළ වවන්නෙ සුද්දන් නොවෙයි.

ගරු සභාපතිතුමනි, මෙම දුම්කොළ කොම්පැනිවලට සම්බන්ධකම් නැති රටවලට අපේ දුම්කොළ යවා වැඩි මිලක් ලබාගැනීමට උත්සාහ දැරීම ඉතාමත්ම වැදගත් බව පෙන්නා දෙන්න කැමතියි. ලෝකයේ ඉතා උසස් වර්ගයට අයත් දුම්කොළ ලංකාවේ වවනවා. මෙම දුම්කොළ විදේශ රටවලට යැවිය හැකි නම් විශාල ආදායමක් එමගින් ලබාගත හැකියි. සතාර් මහතා දුම්කොළ පිටරට යැවූ කාලයේදී අවුරුද්දකට රුපියල් කෝටි හත අටක් විදේශ විනිමය වශයෙන් අප රටට ලැබුණා.

ගරු සභාපතිතුමනි, හාල් මෝල් හිමියන් අතර විශාල ජාවාරමක් පවතිනවා. මෙම සූරාකෑම කොතැනින් නතර වෙයි දැයි කාටවත් කියන්න බැහැ. හාල් බුසලකට හාල් සේරු 14 ක් ආණ්ඩුව ලබා ගන්නවා. සියයට දෙක තුනකට වඩා බොල් නැති සුද්ධ වී තමයි මෝල් හිමියන්ට ලැබෙන්නෙ. එවැනි පිරිසිදු වී බුසලකින් හාල් සේරු 16 ක් ලබා ගන්න පුළුවනි; නමුත් ආණ්ඩුව ලබා ගන්නේ හාල් සේරු 14 ක් පමණයි. ඒ ප්‍රමාණයටත් ගලුයි, වැලියි, වෙනත් රොඩුබොඩුයි එක්කාසු කර තමයි මහජනතාව අතර බෙදා හැරීම පිණිස දෙන්නෙ. මෝල් හිමියනුත් හාල් ගබඩා පාලකවරුනුත් එකතු වී දූෂණ කටයුතුවල යෙදෙනවා. ඒ කොටස් දෙකම එකතු වී නොයෙකුත් දූෂණ ක්‍රියා කරමින් සපයනු ලබන සහලුයි මහජනතාවගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාරිභෝගය පිණිස අද බෙදා දෙන්නේ. මා ගරු සභාවට ඉදිරිපත් කළ හාල් පාර්සලයෙන්ම පෙනී යනවා ඇති මහජන පාරිභෝගය සඳහා බෙදා දෙන සහල්වල තත්ත්වය. සුනු සහල්වලට සැහෙන කොටසක් යන අතර ඉතිරි කොටසේ සැහෙන ප්‍රමාණයක් වැලි ගල් ආදී ද්‍රව්‍ය තිබෙනවා. මෝල් හිමියන්, ගබඩා පාලකවරුන් වැනි පුද්ගලයන් කෙරේ විශ්වාසය තබා කටයුතු කරන්න පුළුවන් කමක් නැහැ. එම නිසා ආණ්ඩුව මගින් සෑම ප්‍රදේශයකම පාහේ වී මෝල් පිහිටුවන්න ක්‍රියා කරන්න බැරි නම් පෞද්ගලික අංශය සතු වී මෝල් ජාතිය සන්තක කර මහජනතාවට පිරිසිදු සහල් ලබා දීමට ක්‍රියා කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

මේ අතර වී මෝල්වල වැඩ කරන සේවකයන් ගැනත් සඳහන් කිරීම මගේ යුතුකමක් වශයෙන් මා සලකනවා. මෝල්වල වැඩකරන කම්කරුවන්ගේ වැටුප සම්බන්ධයෙන් නියමයක් කරන ලෙස කාලයක් තිස්සේ ඉල්ලීම් කර තිබෙනව. වී මෝල්වල සේවය කරන කම්කරුවන්ට හරිහැටි පඩි ගෙවා මේ අන්දමට රට සූරා ගෙන කනවා නම් අපට තරමක් දුරටවත් ඉවසන්න පුළුවනි. නමුත් ඒ කිසිවක් කරන්නේ නැහැ. ඒ උදවියත් අර්ධ හාමතේ තමයි අද ජීවත් වන්නෙ. මේ කාරණා ගැන නැවත නැවතත් මතක් කර දීමෙන් වැඩක් වන්නේ නැති බව කියන්න සිදු වී තිබෙනවා. අප පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් වශයෙන් පත් වූ දා සිට නැවත නැවතත් මතක් කර ඇති නමුත් කිසිම පියවරක් ගෙන නැහැ. මට පෙර කථා කළ හේවාහැට මන්ත්‍රීතුමාත් රටේ විවිධ බවබෝග ගැන සඳහන් කළා. විවිධ බවබෝග සඳහා සාධාරණ මිලක් නිෂ්පාදකයාට ලැබෙන්නෙ නැහැ. ආණ්ඩුවේ අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් ආයතනයකින්, ගම්බද ජනතාව වගා කරන විවිධ එළවලු ආදිය සාධාරණ මිලකට ලබා ගැනීමට ක්‍රියා කරන්නේ නැති නම් වගා කරන ගොවියාට හෝ පාරිභෝගිකයාට හෝ සහනයක් අත් වන්නේ නැහැ. සත 10 කට ගන්නා එළවලු රාත්තලක් නගරයේදී පාරිභෝගිකයාට ලබා ගන්න සිදු වී තිබෙන්නෙ ශත 50ට හෝ 60 කටයි. එම නිසා රජයේ ආයතනයක් මගින් ගොවියාගේ නිෂ්පාදන සාධාරණ මිලට ලබා ගෙන බෙදා හැරීමේ වැඩ පිළිවෙළක් සකස් කර දීමට රජය ක්‍රියා කරනවා නම් ගොවියාට මෙන්ම පාරිභෝගිකයාටද සහනයක් සැලසෙන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. තමුන්නාන්සේට ස්තුතියි.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

Order, please! The Sitting is suspended till 4.30 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon )

සභාපතිතුමනි, විරුද්ධ පාර්ශ්වය මොනවා කීවත්, පසුගිය අවුරුදු 4½ තුළ වගා ව්‍යාපාරය සාර්ථක ලෙස ගෙන යමින් මේ රජය ලෝක වාර්තාවක් පිහිටුවා තිබෙනවා. ඒ ගැන මහජනතාවගේ කෘතඥතාව කෘෂිකර්ම ඇමතිතුමා ඇතුළු ජාතික රජයට හා නිලධාරීන්ටත් හිමි වෙනවා. එවැනි ලෝක වාර්තාවක් පිහිටුවීම සඳහා කෘෂිකර්ම ඇමතිතුමාට දුන් සහයෝගය ගැන ගොවිජනතාවට අපේ කෘතඥතාව හිමි වෙනව. මේ අවසථාවේදී කෘෂිකර්මය ගැන වැඩිපුර කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මගේ ඡන්දදායක කොට්ඨාශයේ තිබෙන අඩුපාඩුකම්, මිනිසුන්ට මුහුණ පාන්නට තිබෙන දුෂ්කරතා පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නටයි, මා නැඟී සිටියේ.

විශේෂයෙන් උඩරට ප්‍රදේශයේ කුඹුරු වැඩ කෙරෙන්නේ වැව් පොකුණු ආදිය ආධාර කරගෙනයි. එහෙත් එවැනි වැව් පොකුණු අළුත්වැඩියා කිරීම සඳහා වෙන් කෙරෙන මුදල, අක්කරයකට රුපියල් 750 කට සීමා වී තිබෙනවා. මේ කාලයේදී එවැනි වැව් පොකුණු අළුත්වැඩියා කිරීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරකෝන් මයා.]
සඳහා ඊට වඩා මුදලක් වියදම් වන නිසා සමහර වැව් පොකුණු අළුත්වැඩියා නො කොට අත්හැර දමා තිබෙනවා. එය අපේ ප්‍රදේශයේ ගොවිතැනට විශාල පාඩුවක්. වඩ වඩාත් ගොවිතැන් කිරීමට ධෛර්ය දීම සඳහා එවැනි වැව් පොකුණු අළුත් වැඩියා කිරීම කෙරෙහි විශේෂ සැළකිල්ලක් දැක්විය යුතු බවත්, ඒවා අළුත් වැඩියා කිරීම සඳහා දැනට වෙන්කෙරෙන මුදල කොහෙත්ම ප්‍රමාණවත් නොවන බවත් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්නට කැමතියි.

මගේ ඡන්දදායක කොට්ඨාශයේ මඩුල් කැලේ ප්‍රදේශයෙන් දවසකට කිරි පයින්ට් 300ක් පමණ පල්ලේකැලේට ගෙන යනවා. ඒ ප්‍රමාණය දෙගුණ කිරීම සඳහා දැනටමත් විධිවිධාන සලසා තිබෙනවා. ඒ පිළිබඳවු ගරු ඇමතිතුමාටත්, එතුමාගේ කාර්ය මණ්ඩලයටත් මගේ කෘතඥතාව හිමි වෙනවා.

දැන් පන්විල ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ගොඩනැගිලි හදාගෙන යනවා. එහෙත් ඒ සඳහා කුලිකාරයන් බඳවාගෙන තිබෙන්නේ ඊට සැතපුම් 35 ක් 37 ක් ඈත ප්‍රදේශවලින්. සමහර කුලිකාරයන් ගෙන්වා ගන්නේ කුණ්ඩසාලයෙන්. ඔවුන් ගෙන්වා ගැනීමට හා ආපසු යැවීමටත් රජයේ වාහන පවා පාවිච්චි කරනවා. එසේ සැතපුම් ගණනාවක් ඈතින් කුලිකාරයන් ගෙන්වන්නේ, පන්විල හා අවට ප්‍රදේශයෙන් කුලිකාරයන් සොයා ගන්න බැරි නිසාද? මීට දවස් කීපයකට කලින් පවා ඒ කටයුත්ත භාර නිලධාරියා සැතපුම් ගණනාවක් ඈතින් වාසය කරන මිනිසුන් කීප දෙනකු කුලීකාරයන් වශයෙන් ලියාපදිංචි කර තිබෙනවා. මා එයින් නම් කීපයක් පමණක් කියවන්නම්. එච්. ජී. බෝධිදාස, අංකය 6672. ඩී. එම්. මුදියන්සේ, අංකය 6669. තිලකරත්න රාජපක්ෂ, අංකය 6668. පී. එච්. පැලිස්, අංකය 6660. පන්විල හා ඒ අවටින් කුලිකාරයන් ඕනෑ තරම් සොයා ගන්නට පුළුවන්කම තිබියදී, මෙසේ සැතපුම් ගණනාවක් ඈතින් වාසය කරන මිනිසුන් කුලිකාරයන් වශයෙන් බඳවා ගැනීමත්, ඔවුන්ට ගමනාගමන පහසුකම් සැලසීම සඳහා රජයේ වාහන පාවිච්චි කිරීමත් කොයි තරම් වැරදි වැඩක්ද? මේ කටයුත්ත නිසා අස්ථානයේ රජයටත්, පළාතේ මන්ත්‍රීවරයාටත් පහර වැදෙනවා. මෙසේ හිතුවක්කාර ලෙස වැඩ කරන නිලධාරියා කිසිසේත් යුක්තිසහගතව වැඩ කරන පුද්ගලයෙක් නම් නොවෙයි. එම නිසා මේ ගැන වහාම සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් මා ඉල්ලා සිටිනවා. මෙම තත්ත්වයට වග කිවයුත්තේ ආර්. ඒ. රණසිංහ නමැති නිලධාරියායි. [බාධා කිරීමක්] යූ. එන්. පී. කාරයෙක් වුවත් වෙන පක්ෂයක කෙනෙක් වුවත් කර තිබෙන්නේ වැරැද්දක්. කවුරු කළත් වරද වරදමයි, යූ. එන්. පී. කාරයෙක්ය. එස්.එල්.එෆ්.පී. කාරයෙක්ය කියා අපේ භේදයක් ඇත්තේ නැහැ. කුමන පක්ෂයේ පුද්ගලයෙක් වුවත් යුක්ති සහගත අන්දමින් කටයුතු කළ යුතුයි.

ගරු සභාපතිතුමනි, මේ ඇමතිතුමාටත් ඉඩම් ඇමතිතුමාටත් මා මෙම අවස්ථාවෙහිදී ප්‍රශංසා කරනවා රටේ සංවර්ධනය උදෙසා කර තිබෙන වැඩ කටයුතු සම්බන්ධයෙන්. එක් තැනෙක අක්කර 1,500 ක් පමණ බිම් ප්‍රමාණයකුත් තවත් තැනෙක අක්කර 2,000 ක් පමණ ඉඩම් ප්‍රමාණයකුත් එනසාල් වැවීම සඳහා වෙන් කර තිබෙනවා. එම ව්‍යාපාරයෙන් විශාල ආදායමක් දැන් ලැබෙන බව මතක් කළ යුතුයි. උඩුම්බරගිරි එනසාල් සමුපකාර සමිතිය නමින් එක්තරා සමුපකාර සමිතියක් එහි පිහිටුවාගෙන තිබෙනවා. එනසාල් වේලා ගැනීම ආදී කටයුතු සඳහා මධ්‍යස්ථානයක් ඇති කර ගන්නට එම සමිතියට මුදල් වුවමනා කරනවා. ඒ සඳහා යම්කිසි ආධාරයක් දෙන්නට තමුන්නාන්සේට පුළුවන්කම තිබෙනවා ඇයි කරුණාකර කල්පනා කර බැලුවොත් හොඳයි. එම ස්ථානයෙහි වැඩ කටයුතු සඳහා එන උදවියට විශාල හිරිහැරයකට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. ඇතැම් වතු මැදින් ඔවුන්ට ගමන් බිමන් කරන්නට ඉඩකඩ දෙන නමුත්, කීප දෙනෙක්ම තමන්ගේ වතු මැදින් වැටී ඇති මාර්ග වසා දමා තුවක්කු පවා අටවාගෙන සිටිනවා. දිසාපතිතුමාට ප්‍රාදේශීය ආදායම් නිලධාරිතුමාට සහ පොලිසියට එහෙම මේ ගැන කියා තිබෙන නමුත් ප්‍රතිඵලයක් ලැබී නැහැ. එම වතුවල සේවය සඳහා එන කුලිකාරයන් පවා අර උදවිය වවා තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එනසාල් ටික හොරෙන් කඩාගෙන එන බව කියනවා. එම ව්‍යාපාරය දියුණු කරන්නට වුවමනා නම් එහි වැඩ කරන උදවියට අර විධියේ වතු මැදින් ගමන් බිමන් කරන්නට පුළුවන් තත්ත්වයක් ඇති කර දිය යුතුයි.

විශෙෂයෙන් සීත ප්‍රදේශවල වැඩෙන පළතුරු වර්ග මෙම ප්‍රදේශයෙහි වැවීම සඳහා කටයුතු කරගෙන යනවා. ඇපල්, ග්‍රේප්ස් සහ පැෂන් ෆෘට් වැනි දේ වැවීම සඳහායි බොහෝදුරට වැඩ කටයුතු සකස් කරගෙන යන්නේ. ඒ සඳහා ආධාරදීමක් වශයෙන් හැකිපමණ ඉක්මණින් පල්ලෙ කැලේ කැනිං පැක්ටරියක්—canning factory—ඇති කරන්නැයි මා ඉල්ලා සිටිනවා. ඩොක්ටර් රත්නායක නමැති මහතෙක් එහි පැක්ටරියක් සාදන්නට අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලා තිබෙනවා. යම් යම් බාධක තිබෙන නිසා එතුමාට එම කටයුත්ත කර ගැනීම දුෂ්කර වී තිබෙනවා. එවැනි පුද්ගලික ආයතනයක් සෑදීම සඳහා ආණ්ඩුව මගින් සහන සලසා දුන් නොත් ඒ හේතුකොටගෙන අපේ දුප්පත් ගොවි ජනතාවගේ රැකියා ප්‍රශ්නයත් බොහෝ දුරට විසඳෙන්නට පුළුවනි. එම නිසා මේ පිළිබඳව තමුන්නාන්සේගේ අංශයෙන් ආධාරයක් දීමට වැඩ පිළිවෙළක් යොදන මෙන් මා නැවත වරක් ඉල්ලා සිටිනවා. මගේ ආසනය ගැන මීට වඩා කියන්නේ නැහැ.

මෙම රජය මගින් ලැබුණු යම් යම් ආධාර ක්‍රම නිසා අපේ ප්‍රදේශයේ විශාල අන්දමින් ආදායම් මාර්ග සකස් වී තිබෙන බව කිවයුතුයි. සාමාන්‍ය ගොවි ජනතාවට එය ඉමහත් සහනයක් වී තිබෙනවා. අපේ එනසාල්වලට දැන් හොඳ මිලක් ලැබෙනවා. ඒ වාගේම සාදික්කා වලටත් හොඳ මිලක් ලැබෙනවා. කරාබු නැටි වලටත් හොඳ මිලක් ලැබෙන අතර පුවක් වැනි දේටත් හොඳ මිලක් ලැබෙනවා. මෙම රජයේ වෙළඳ ප්‍රතිපත්තිවල ප්‍රතිඵල වශයෙන් තමයි අපට ඒ අන්දමේ සැනසිලිදායක තත්ත්වයක් ඇති වී තිබෙන්නේ, අවසාන වශයෙන් තමුන්නාන්සේට සහ තමුන්නාන්සේගේ නිලධාරී මහතුන්ට, මේ ව්‍යාපාර දිනෙන් දින දියුණු වන අන්දමින් පවත්වා ගෙන යන්නට අවස්ථාව ලැබේවායි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.**
(සොරනාතොට)

*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொறநதொட்ட)*

(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

ගරු සභාපතිතුමනි, මේ රටට ඉතාම වැදගත් අමාත්‍යාංශයක් වන කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට මටත් අවස්ථාවක් ලබා දීම ගැන මා තමුන්නාන්සේට ස්තුති කරනවා.

ගොවීන් අවුරුද්දෙන් සෑහෙන කාලයක් පමණයි කුඹුරු ගොවිතැන්වල යෙදෙන්නෙ. ඔවුනට අවුරුද්ද පුරාම ගොවිතැන් කරන්නට පුළුවන් තත්ත්වයක් නැහැ. ඒ නිසා කුඹුරු වැඩ කරන ගොවීන්ට ඊට අමතරව ගොඩ ගොවිතැනක් කර ගැනීම සඳහා යම්කිසි වැඩ පිළිවෙලක් සකස් කර දෙන්ට කියා මා ගරු ඇමතිතුමාට යෝජනා කරන්නට කැමතියි. කරාබු නැටි, එන්සාල් වගේ ද්‍රව්‍ය වවන්නට ඒ ප්‍රදේශයේ ජනතාවට අවස්ථාවක් ලබා දුන්නා කියා වත්තේගම ගරු මන්ත්‍රීතුමා (වීරකෝන් මයා). ගරු ඇමතිතුමාට ප්‍රශංසා කළා. ගොවීන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කරන්න ඕනෑය. අනාගත සැලැස්මක් සකස් කරන්න ඕනෑය කියා දැන් බොහොම කාලයක් තිස්සේ කෑ ගහනවා. කුඹුරු කරන කාලසීමාවෙන් පසු, ඉතිරි කාලයේදී යම්කිසි ස්ථිර වැවිල්ලක් කර ගන්නට ඔවුන්ට අවස්ථාවක් සළසා දෙනවා නම්, ඊට වඩා බොහොම පහසු වෙන් "පෙන්ෂන්" ක්‍රමයක් නැති වුණත්, ගොවීන්ගේ අනාගතය සමෘද්ධිමත් කරන්නට පුළුවන්.

අද අත පය හයිය තිබෙන තුරු මහ පොළොව සමඟ පොර අල්ලල තමුන්නාන් සෙලා දෙන රජකමවත් අරගෙන සැන සෙන්නට පුළුවනි. එහෙත් මහලු වයසට පත් වීමෙන් පසු පොල්කටුවක් අරගෙන පාරට බහින්නටයි, ගොවීන්ට සිදු වෙන්නෙ. ඒ නිසා ගොවීන්ට ශක්තිය



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

තිබෙන අවස්ථාවේදී අනාගත දියුණුවට වැඩ පිළිවෙලක් සකස් කර ගන්නට පුළුවන් වෙනවා, ප්‍රයෝජනවත් ස්ථිර වගාවක් කරගෙන යන්නට ඔවුන්ට සැලැස්මක් සකස් කර දෙනවා නම්. ඒ මගින් සවි බල නැති කාලයේදී ජීවත්වීමේ මාර්ගයක් හදා ගන්නට ගොවීන්ට පුළුවන් වෙනවා. මා මේ ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්නේ ඉතා වැදගත් බර පතළ ප්‍රශ්නයක්. මා ගොවීන් මැද ජීවත් වන මිනිහෙක් වයස 60 පිරුණායින් පසු උදැල්ල අරන් පොළව කොටන්නට බැරි වන විට, ගොවියාට ජීවත් වන්නට ක්‍රමයක් නැහැ.

ගරු එම්. ඩී. බණ්ඩා

(கௌரவ எம். டீ. பண்டா)

(The Hon. M. D. Banda)

මොනවද එහෙ කරන්නට පුළුවන් අමතර වගාව ?

විජේරත්න බණ්ඩා මයා.

(திரு. விஜேரத்ன பண்டா)

(Mr. Wijeratne Banda)

අන්නාසි වගේ වගාවක්. අක්කර එක හමාරක් වගේ තිබෙන අයට හොඳයි.

ගරු එම්. ඩී. බණ්ඩා

(கௌரவ எம். டீ. பண்டா)

(The Hon. M. D. Banda)

මාරුවක් සිදු වෙන්න ඕනෑ.

විජේරත්න බණ්ඩා මයා.

(திரு. விஜேரத்ன பண்டா)

(Mr. Wijeratne Banda)

මා කියන්නෙ මාරු වන එකක් නොවෙයි; ගොඩ ගොවිතැනක් වශයෙනුයි. එක ගොවියෙකුට අක්කර දෙකක වගේ ඉන්නාසි වගා කර ගන්නට ආධාර ක්‍රමයක් සකස් කර දුන්නොත්, ඒ ගොවියාට කුඹුරෙන් ලැබෙන අස්වැන්නට අමතරව ගොඩ බිමෙන් ලැබෙන අස්වැන්නෙන් ඉතා හොඳට ජීවත් වෙන්න පුළුවනි. ඒ වගේම කුඹුරු කරන්නට බැරි කාලය වන විට ඒ ගොඩ ගොවිතැනෙන් ලැබෙන ආදායමින් ජීවත් වෙන්නට පුළුවනි. අන්නාසි පමණක් නොවෙයි, ඒ ඒ ප්‍රදේශයට ඒ ඒ වකවානුවට උචිත වගා මොනවාදැයි තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තු මගින් පරීක්ෂා කර බලා ඒ විධියේ වගාවලට ආධාර දෙන්න ඕනෑ. ඒ වධියේ සැලැස්මක් පිළියෙල කර අහිංසක ගොවියා අනාගතයේදී හිඟමනට වැටී මෙන් වළක්වන්නට ක්‍රියා කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට ගම්බද කුඩා ඇළ අමුණු පිළිබඳව මතක් කරන්නට ඕනෑ. අක්කරයක් වෙනුවෙන් වර්ෂයකට රු. 750 ක් වියදම් කිරීම ප්‍රමාණවත් මදි බව වත්තේගම ගරු මන්ත්‍රීතුමා කිව්වා. මා දන්න තරමින් එක අවුරුද්දකට එක ගොවි කාරකසභාවකට ආධාර දෙන්නෙ එක ඇළක් හෝ අමුණක් බැඳ ගැනීමට පමණයි. විශේෂයෙන් සොරනාතොට ආසනයේ තිබෙන්නෙ වැඩිපුරම සුළු වාරිමාර්ගයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් නඩත්තු වන එකම ඇලක් හැටියට ඒ කොට්ඨාශයේ තිබෙන්නේ තල්දෙන ඇළ පමණයි. අනික් සෑම කුඩා වාරිමාර්ගයකම කටයුතු කෙරෙන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ආධාර යටතේයි. ඒ නිසා එක ගොවි කාරකසභාවකට එක ඇළක් හෝ අමුණක් බැඳ ගැනීම සඳහා ආධාර දීම ප්‍රමාණවත් මදි.

අපේ ගොවීන් අක්කර බද්ද ගෙවන්නට තරමක් දුරට මැළියි. අක්කර බද්ද අය කර ගොවි කාරකසභාවේ නිලධාරීන් කරන වැඩ ගැන ගොවීන් පුදුම වෙනවා. මේ අය කරන්නේ ගමන් යාමත්, කන්තෝරු යාමත් ලියුම් ලිවීමත් පමණයි. ඒ හැරෙන්නට අක්කර බද්දෙන් ගොවීන්ට කිසිම යහපතක් වන බව කොහෙත්ම පෙනෙන්නට නැහැ.

ගරු එම්. ඩී. බණ්ඩා

(கௌரவ எம். டீ. பண்டா)

(The Hon. M. D. Banda)

හැම ගොවි කාරක සභාවකම ආදායමෙන් සියයට 30 ක් ගොවිතැනේ දියුණුව සඳහා වන ස්ථිර ව්‍යාපාරයකට යොදවන්න කියායි නියම කර තිබෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විජේරත්න බණ්ඩා මයා.**

*(திரு. விஜேரத்ன பண்டா)*

(Mr. Wijeratne Banda)

අර ඔර්ලෝසුවේ කටුව දිව්ව හැටියේ ගරු සභාපතිතුමා නිතරම මුහුණ දිහා බලනවා. වාඩි වෙන්න කියන්න. ඒ නිසා තමුන්නාන්සේ පිළිතුරු දෙන අවස්ථාවේ දී මට සෑහෙන පිළිතුරක් දෙන්න. මේ අන්දමට මගේ කාලය තමුන්නාන්සෙත් ගත්තොත් මට සෑහෙන පාඩුවක් වෙනවා.

අ. භා. 4.45

එකතු කරන බදු මුදලින් මේ තරම් ප්‍රමාණයක් ඒ ඒ වාරයේදී යොදන්නැයි ගොවි කාරක සභාවලට ගරු ඇමතිතුමා නියෝග කරනවා නම් ඉතා හොඳ බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නට කැමතියි. ගරු ඇමතිතුමා ඒ විධියේ නියෝගයක් නිකුත් කළොත්, ගෙවන්නට නියම කරන බදු මුදල උනන්දුවෙන් ගෙවන්නට ගොවීන් එතකොට ඉදිරිපත් වෙනවා ඇතැයි මා විශ්වාස කරනවා.

දුම්කොළ වවන්නන් ගැන ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප පොළක් කරුණු ඉදිරිපත් කළා. මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියා මාර්ග ඇති නොකළොත් ගරු ඇමතිතුමා වෙත විශාල උද්ඝෝෂණයක් ඉදිරිපත් වන්නට හොඳටම ඉඩ තිබෙන බව මට පෙනෙනවා. පසුගිය 10 වැනිදා පවත්වන ලද මහා සභා රැස්වීමකදී මේ ප්‍රශ්නය දීර්ඝ ලෙස සාකච්ඡාවට භාජන වුණා. එහිදී ගන්නා ලද තීරණයකට අනුව දුම්කොළ වවන්නන් යම්කිසි වැඩ පිළිවෙළක් අනුගමනය කරන්නට බලාපොරොත්තු වෙනවා. දුම්කොළ වවන්නන්ගේ යහපත සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ඇති නොවෙනවා නම් ඒ උදවිය දුම්කොළ වගාව සම්පූර්ණයෙන්ම අත් හරින්නට ඉඩ තිබෙනවා. ඒ විධියටයි මට ආරංචිය ලැබී තිබෙන්නේ.

දුම්කොළ වවන්නන්ගේ දුක් ගැනවිලි එන්ට එන්ටම උග්‍ර අතට හැරී එන බව පෙනෙන්නට තිබෙනවා. අද පවතින තත්ත්වය එදා තිබුණු තත්ත්වයට වඩා බෙහෙවින්ම උග්‍ර බව මට කියන්නට පුළුවනි. දුම්කොළ වවන්නන්ට අද මුහුණ පෑමට තිබෙන ප්‍රශ්න විවිධාකාර බව පෙනෙනවා. එක් අතකින් බලන විට දුම්කොළ වවන ඉඩම්වල මිළ බොහොම ඉහළ ගොස් තිබෙන බව පැහැදිලියි. දුම්කොළ වැවීමට යොදන කම්කරුවන්ට ගෙවිය යුතු පඩිනඩිත් පෙරට වඩා දැන් බොහොම වැඩියි. එපමණක් නොව, උපකරණත් පෝර ආදියත් දැන් පෙරට වඩා විශාල මුදලක් ගෙවා ලබා ගත යුතුව තිබෙනවා. මේ තත්ත්වය බොහෝ දුරට වෙනස් වී බැරෑරුම් අතට හැරී ඇත්ත්, දුම්කොළ වෙනුවෙන දුම්කොළ සමාගම් ගෙවන මිළ ප්‍රමාණයේ නම් වෙනසක් ඇති වෙලා නැහැ. ඒ නිසා දුම්කොළ සමාගම් මගින්කරගෙන යනු ලබන අක්‍රමිකතා වන් නැති කිරීම සඳහා ගරු ඇමතිතුමාට යම්කිසි පියවරක් ගන්නට වැඩි කලක් ගත වන්නට පෙර සිදු වෙනවා ඇති. රටට විශාල ආදායමක් ලබා දෙන දුම්කොළ වැවිල්ල ඉතාමත් වැදගත් වගා ව්‍යාපාරයක් බව ගරු ඇමතිතුමා පිළිගන්නවාට කිසිම සැකයක් නැහැ. මේ ගැන ගරු ඇමතිතුමා යම්කිසි ප්‍රයෝජනවත් වැඩ පිළිවෙළක් ඇති කළොත් මේ ආණ්ඩුව මේ අවුරුදු පහේ කාල සීමාව ඇතුළත වැදගත් වැඩක් කළා යයි සන්තෝෂයෙන් කියන්නට හැකි වෙනවා ඇති. ඒ නිසා ගරු ඇමතිතුමා වෙත ඉතාමත් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරන්නට මම කැමතියි. කරුණාකර හැකි තාක් ඉක්මණින් දුම්කොළ ව්‍යාපාරය ජාතික කර්මාන්තයක් කරන්න. විශාල වශයෙන් දුම්කොළ නිෂ්පාදනය කර පිටරට යවන්නට වැඩ පිළිවෙළක් සකස් කරන්න. එතකොට ඒ මගින් අපේ රටට විශාල විදේශ විනිමයක් ලබා ගන්නටත් පුළුවන් වෙනවා ඇති. ඒ නිසා ඒ ගැන සලකා බලන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා.

සමුපකාර ව්‍යාපාරය ගැනත් වචනයක් දෙකක් කථා කරනන්ට ඕනෑ. ගරු මන්ත්‍රීතුමන්ලා කීප පොළක්ම සමුපකාරය ගැන කථා කළා. අද සමුපකාර ව්‍යාපාරය බොහෝ දුරට පිරිහී ගොස් තිබෙන බව බලවත් කනගාටුවෙන් සඳහන් කරන්නට අපට සිදු වී තිබෙනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) මේ ගැන එතුමාගේ කථාවේදී සඳහන් කළා. එතුමා සඳහන් කළ කරුණු සැබෑ බව මටත් කියන්නට පුළුවනි. එතුමා ප්‍රකාශ කළ පරිදි, අපේ රටේ ගොවිතැනත් සමුපකාරයත් දෙක එකට අත්වැල් බැඳගෙන යන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැදගත් ව්‍යාපාර දෙකක් බව පිළිගත යුතුයි. ගරු ඇමතිතුමාත්, සෙසු ගරු මන්ත්‍රීතුමන්ලාත් ඒ බව පිළිගන්නවා ඇති. එය සත්‍යයක් බව මට පැහැදිලිවම කියන්නට පුළුවනි.

අද සමුපකාර ව්‍යාපාරයට නීතියෙන් ලැබී තිබෙන බලතලවලින් විශාල ප්‍රමාණයක් ගරු ඇමතිතුමා එතුමාගේ අතට අරන් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මේ ආකාරයට තව ටික කලක් වැඩ කටයුතු කරගෙන ගියාම, මා දන්නා හැටියට නම්, අපට සිදු වන්නේ සමුපකාරය සම්පූර්ණයෙන්ම ගරු ඇමතිතුමාටම භාර දී ගෙවල් බලා යන්නටයි. ගරු ඇමතිතුමා ප්‍රශංසා කටයුතු බොහොම හොඳ වැඩ රාශියක් කර තිබෙනවා තමයි. එහෙත් ඒ අතරම නරක දේත් කර තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

මගේ බලතල ඉවරයි ; පවරා ගත් සමිති ටික හැර ඉතිරි ඒවා ඒ විධියට තිබෙනවා.

**විජේරත්න බණ්ඩා මයා.**
*(திரு. விஜேரத்ன பண்டா)*
(Mr. Wijeratne Banda)

මොහොතකට ඉවසන්න, ගරු ඇමතිතුමනි. මගේ වේලාව ඉවර වේගනයි එන්නේ. මා මීට පෙරත් කිව්වා වාගේ, තමුන්නාන්සේ දැන්මම පිළිතුරු දෙන්නට ගියොත් ඒ සඳහා ගත වන්නේ මට නියම කර තිබෙන මිනිත්තු කීපයෙනුයි. ඒ නිසා කරුණා කර මගේ කථාව අවසන් වුණාට පස්සේ තමුන්නාන්සේ පිළිතුරු දෙන්න.

ගරු ඇමතිතුමා බොහොම හොඳ වැඩ කර තිබෙන බව විරුද්ධ පාර්ශ්වයත් පිළිගන්නවා. බදුල්ලේ විවිධ සේවා සමුපකාර සමිති සංගමය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා ගත් පියවර ගැන අපේ ජනතාව එතුමාට ප්‍රශංසා කරනවා. සංගමයේ පාලනයේ වැරදි තිබෙන බව එතුමාට දැනගන්නට ලැබුණාට පස්සේ එතුමා ඒ ගැන පරීක්ෂණයක් කරන්නට විධිවිධාන යෙදුවා. වැරදිකරුවන් හොයා ගන්නටත් එයින් පුළුවන්කමක් ලැබුණා. යකඩ හොරු එහෙමත් අවසානයේදී අහු වුණා. තමන්ගේ උදවිය නිසාය කියලා කිසිම සමාවක් නොදී එතුමා ඒ අය කණින් අල්ලා දොට්ට දැම්මා. එය බොහොම හොඳයි. මගේ වුවත් වරදක් දුටුවොත් ගරු ඇමතිතුමා නිසි පියවර ගන්න. එය එතුමාගේ යුතුකමක්. අයිතිවාසිකමක් මෙන්ම වරප්‍රසාදයක්. 1965 සිට මාත් බදුල්ලේ විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ කාරක සභිකයකු හැටියට ඉන්නවා. ගරු ඇමතිතුමා ඒ කාරක සභාවට පත් කළ තුන් දෙනාගෙන් එක් කෙනෙකු වන ජයා හේරත් මහත්මයා බදුල්ලෙන් මාරු වී වෙනත් තනතුරකට ගියා. බදුල්ලේ වෙළෙඳ ව්‍යාපාරිකයකු වන බී. එච්. පී. ද සිල්වා මහත්මයා මේ සංගමයට ගරු ඇමතිතුමා විසින් පත් කර තිබෙනවා. ඒ මහත්මයාට මම දොස් කියන්නේ නැහැ. ඒ මහත්මයා බදුල්ලේ වෙළෙඳ ව්‍යාපාරිකයෙක්. ඒ ගැන එපමණයි මම කියන්නේ. ඒ මහත්මයා වෙළෙන්දෙකු බව පමණයි මම මේ අවස්ථාවේ කියන්නේ. ඒ මහත්මයා සමුපකාරිකයෙක් නොවෙයි. අපට මුලින්ම ලැබුණු ආරංචියේ හැටියට ගරු ඇමතිතුමා මේ සංගමයේ සභාපතිවරයා හැටියට පත් කරන්නට අදහස් කරගෙන සිටියේ රත්වත්තේ මහත්මයායි. ඒ මහත්මයා නම් සමුපකාර සමිතියක කාලයක් තිස්සේ කටයුතු කර තිබෙන කෙනෙක්. ඒ ගැන කිසිම විරුද්ධත්වයක් දක්වන්නේ නැහැ. කාරක සභාවේ ඉන්න උදවිය කෙරෙහි විශ්වාසයක් තබන්නට ගරු ඇමතිතුමාට බැරි නම් තමන්ට විශ්වාසයක් තබන්නට පුළුවන් කෙනෙකු පත් කරන්නට ඕනෑ තමයි. ඒ ගැන මොකවත් කියන්නේ නැහැ. මේ වගේ වැඩ කරන විට, සමුපකාරිකයන් හැටියට අප කොහොමද තමුන්නාන්සේගේ ගුණ වර්ණනා කරන්නෙ ? බදුල්ලේ විවිධ සේවා සමුපකාර සමිතිය මේ සම්බන්ධයෙන් එවූ ලිපිය බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (බී. එච්. බණ්ඩාර මයා.) කියවන්නට ඇති. මටත් මේ ගැන ලිපියක් ලැබී තිබෙනවා. ඇමතිතුමාටත්, සමුපකාර කොමසාරිස්තුමාටත්, උප කොමසාරිස්තුමාටත් මේ ලිපි පිටපත් යවා තිබෙනවා. සමුපකාර සංගමයක කාරක සභිකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් බල පාන ව්‍යවස්ථාවක් තියෙනවා. මාත් එය හොඳට කියවා තිබෙනවා. ඒ ව්‍යවස්ථාවේ හැටියට කොන්ත්‍රාත් කරුවකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙළෙන්දෙකු හෝ සල්ලි පොලියට දෙන කෙනෙකු කාරක සභිකයෙකු වශයෙන් තෝරා ගන්න බැහැ. නමුත් බදුල්ලේ සමුපකාර සංගමයේ සභාපතිකමට ඒ වගේ කෙනෙකු හොඳයි. මේ වගේ වැඩ කරන විට අපට ඒවා හරිය කියන්න පුළුවන්ද? සමුපකාර සංගමය පාලනය කරන්න පුළුවන් දක්ෂ සභාපතිවරයෙකු තෝරා ගන්නට දැනට තිබෙන කාරක සභාවට බැරිය කියා ගරු ඇමතිතුමා කල්පනා කරනවද? එසේ කල්පනා කරනවා නම් ඒක වැරදියි.

ගරු සභාපතිතුමනි, බදුල්ලේ ආසනයේත්, සොරනාතොට ආසනයේත්, මහියංගන ආසනයේත්, පස්සර ආසනයෙන් වැඩි කොටසකත් සමුපකාර සමිති ඒකාබද්ධ වෙලයි බදුල්ලේ සමුපකාර සංගමය පිළියෙළ වී තිබෙන්නෙ. ඒ වගේ සංගමයකට හොඳ සභාපතිවරයෙකු තෝරා ගන්නට බැරි ඇයි? මේ වගේ කටයුතු සිදු වන විට තමුන්නාන්සේ චෝදනා ලබනවා. ගම්සභාවේ වැඩ කටයුතු වගයක් තිබුණු නිසා පළමුවැනි රැස්වීමට මට යන්නට ලැබුනෙ නැහැ. පසුගිය 2 වැනිදයි, ඒ රැස්වීම තිබුණේ. මට ලැබුණේ දේශපාලන පත්වීමක් තමයි, කියා ඒ පළමුවැනි රැස්වීමේදීම ඒ සභාපතිවරයා කියා තිබෙනවා. ඒ සභාපතිවරයාගේ ඒ ප්‍රකාශය ගැන ඇත්ත වශයෙන්ම අප කණගාටු වන්නට ඕනෑ. ඒ නිසා මේ පත්වීම ගැන මගේ අප්‍රසාදය, මගේ කණගාටුව පළ කරනවා. මේ පත්වීම කරන්නට පෙර මා ගරු ඇමතිතුමාට විදුලි පුවතකුත් එවා තිබෙනවා.

ඊළඟට සුළු තේ වතු හිමියන්ගේ තත්ත්වය ගැන ගරු ඇමතිතුමාට මතක් කරන්න ඕනෑ. අද ඔවුන්ගේ තේ දළු විකුණා ගැනීම ඉතාමත් අමාරුයි. තේ මිල අඩු වන විට සුළු තේ වතු හිමියා කබලෙන් ලිපට වැටී සිටිනවා. ඒ අයට ඔවුන්ගේ තේ දලු සාධාරණ මිළකට විකුණා ගැනීමට අවස්ථාව සලසා දෙන්න ඕනෑ.

උදළු පිළිබඳවත් මා මතක් කරන්න ඕනෑ. ගොවි පෙරමුණට පුළුවන් වී තිබෙනවා, ඒ පෙරමුණට සම්බන්ධ අයට කිඹුලා උදැල්ල සපයන්නට. ඇයි සංස්ථාවේ ඒවා නරකද, කියා තමුන්නාන්සේලා අහන්න පුළුවන්. සංස්ථාවේ උදළු අඟල් 8 × 10 ඒවා. ගොඩ ගොවිතැන් සඳහා පමණයි, ඒවා යොදා ගන්නට පුළුවන්. කුඹුරු ගොවිතැනට අඟල් 10 × 10 උදැල්ල ඕනෑ. සංස්ථාවෙන් ඒ උදළු සාදා නැහැ. ඒ නිසා ගොවිතැන් කරන අයට සැහෙන කරදරයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. ගොවි පෙරමුණේ හේමබස්නායක මහත්මයා ඒ පෙරමුණේ අයට කොයි තරම් උදළු වුවමනාද කියා පත්‍ර මාර්ගයෙන් සොයා දැනගෙන ඒවා සපයා තිබෙනවා. ගරු ඇමතිතුමා කෘෂිකර්ම ඇමති හැටියට කිඹුලා වුණත් මොන යකා වුණත් කමක් නැහැ—අලියා වුණත් කමක් නැහැ—අඟල් 10 × 10 උදැල්ල ගොවියාට සපයා දෙන්න ඕනෑ.

සලාක සහල් බෙදා දීමේ වැඩ පිළිවෙල ගැනත් ඊළඟට මතක් කරන්න ඕනෑ. දැන් තියෙන්නේ පෝය නිවාඩු ක්‍රමයයි. සලාක සහල් බෙදා දෙන්නේ සති ක්‍රමය අනුවයි. සඳුදා හාල් ගෙනෙනවා. ඊට පසු ඉරිදා දක්වා හාල් බෙදනවා. පෝය ක්‍රමය යටතේ සඳුදා නිවාඩු දවසක් වුණොත් හාල් ගෙනෙන්නේ අඟහරුවාදයි. ඒ නිසා සඳුදට මිනිසුන්ට බඩගින්නේ ඉන්න සිදු වෙනවා. ඒ නිසා පෝය නිවාඩු ක්‍රමය යටතේ සලාක සහල් බෙදීමේ ක්‍රමය එක්තරා විධියකින් වෙනස් කිරීමට අවශ්‍ය වී තිබෙනවා. එසේ නැත්නම් සලාක සහල් බෙදා දෙන ස්ථානවලට පරණ නිවාඩු ක්‍රමයම වලංගු කරන්නට ඕනෑ. එවැනි වෙනසක් නොකළොත් විශාල ගැටලුවකට මුහුණ පාන්න සිදු වෙනවා. සමහර සතිවලට දවස් දෙක තුනක්ම ගබඩා වසා තැබීමට සිදු වෙනවා. සඳුදට හාල් ගෙන ආවොත්, අඟහරුවාදා පෝය දවසක් නම් එදින ගබඩාව වසනවා. ඔන්න ඔය වගේ අවස්ථාවල් ඇති වෙනවා. ඒ නිසා මේ හාල් සලාකය බෙදන ආකාරයත් මේ පෝය නිවාඩුව එයට බලපාන ආකාරයත් ගැන පරීක්ෂා කර බලා යම්කිසි විධියේ වැඩ පිළිවෙලක් යොදන්නය කියා මා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මා මුලින් කී පරිදි ගොවියන්ගේ තත්ත්වය ගැන සලකා ඔවුන්ගේ අනාගත දියුණුව කෙරෙහි සැලකිල්ල යොමු කර යම්කිසි වැඩපිළිවෙලක් යොදන ලෙසත් ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩොනල්ඩ් ජේ. රණවීර මයා.** (නුවර එළිය)
(*திரு. டொனல்ட் ஜே. றனவீர—நுவரெலியா*)
(Mr. Donald J. Ranaweera—Nuwara Eliya)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කතා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. නුවරඑළියේ මගේ ඡන්ද කොට්ඨාශයේ වැඩිපුරම ඉන්නේ එළවළු නිපදවන අයයි. මේ එළවළුවලට මුළු අවුරුද්ද තුළදීම නියම මිලක් ලැබෙන්නෙ නැහැ. රාබු, බීට්රූට්, ගෝවා ආදී උඩ රට ප්‍රදේශයේ—කඳුකරයේ—වැවෙන එළවළුවලට මුළු අවුරුද්ද තුළම නියම මිලක් ලැබෙන්නෙ නැති නිසා ඒ ගොවි මහතුන් අද මහත් අධෛර්‍ය්‍යමත් තත්ත්වයකට පත් වී සිටිනවා. ඒ නිසා මා ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටින්න කැමතියි. ඒ එළවළු නිපදවන අයට අවුරුද්ද තුළම නියම මිලක් ලබා ගත හැකි වන අන්දමේ වැඩ පිළිවෙලක් කෙසේ හෝ සකස් කර දෙන්නය කියා.

ඊළඟට නුවරඑළිය ප්‍රදේශයේ වවන එළවළු වර්ගවල ඇට ගැන වචනයක් කියන්න ඕනෑ. නුවරඑළිය ප්‍රදේශයේ වවන එළවළු වර්ග වැලිමඩ, වලපනේ ආදී ප්‍රදේශවල වවන්න බැහැ. ඒ නිසා ඒ එළවළු ඇට වර්ග නියමම පළාත්වලට නියම කාලයට බේදා දීමට කටයුතු යොදන ලෙසත් මා ඉල්ලා සිටිනවා. ඒ ඒ ගොවි මහත්වරුන් සමග සාකච්ඡා කර ඒ ඒ ප්‍රදේශවලට ගැළපෙන එළවළු ඇට වර්ග නියම අන්දමට නියම වෙලාවට එළවළු වවන ගොවි මහත්වරුන්ට ලබා දෙන්නට කටයුතු යෙදිය යුතුව තිබෙනවා.

ඒ සමගම මතක් කර දෙන්න කැමතියි. ඒ ප්‍රදේශයේ එළවළු මිලට ගන්නා මධ්‍යස්ථානය ගැන. එය ප්‍රතිසංවිධානය කළ යුතුව තිබෙනවා. එම මධ්‍යස්ථානයට ගෙන එන එළවළු සියල්ලම මොන ක්‍රමයකින් හෝ අරගෙන ඒ එළවළු ගෙන එන අයගේ හිත් අධෛර්‍ය්‍යමත් නොවන අන්දමට ඒ අයට නියම මිලක් දීමටත්, නියම වේලාවට ඒවා මිලදී ගැනීමටත් කටයුතු සලස්වන්න ඕනෑ. අවුරුද්ද තුළම ඒ අයට ඒවාට නියම මිලක් ලබා ගත හැකි තත්ත්වයක් ඇති කරන්න ඕනෑ. එම එළවළු මිලදී ගැනීම ප්‍රතිසංවිධානය කර එවැනි තත්ත්වයක් ඇති කරන මෙන් මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම වැඩිපුර එළවළු නිපදවන කාලයට ඒවා තැන්පත් කර තැබීමට ශීත ගබඩාවක් ඇති කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව ගරු ඇමතිතුමාට පෙන්වා දෙන්න කැමතියි.

ඊළඟට අර්තාපල් වගාව සම්බන්ධයෙන්ද යමක් කිව යුතුයි. නුවරඑළිය ප්‍රදේශයේ අර්තාපල් වගාවට විශේෂ තැනක් ලැබෙන නිසා මා ඒ ගැන මතක් කරන්න ඕනෑ. අර්තාපල් වගාව සඳහා වුවමනා කරන බීජ අල නියම වෙලාවට නියම අන්දමට ලැබෙන්නේ නැහැ. පසුගිය කාලයේදී වෙන වෙන රටවලින් බීජ අල ගෙන්වන්න යෙදුනා. නමුත් ඒවා නරක් වූ බීජ අලයි. ඒ නිසා ඒ බීජ අර්තාපල් වලින් නියම ප්‍රයෝජනය ලබා ගන්නට බැරි වුණා. "ආකයි" සහ "ගිනිකෙ" යන වර්ග දෙක පමණයි, සාර්ථකව නුවරඑළිය ප්‍රදේශයේ හැදෙන්නෙ. ඒ නිසා නුවරඑළිය දිස්ත්‍රික්කයේ වැවීමට සුදුසු ඒ වර්ග දෙක පමණක් ගෙන්වන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා. අනික් ජාති ඒ ප්‍රදේශයට ගැලපෙන්නෙත් නැහැ; එහි හැදෙන්නෙත් නැහැ.

අ. භා. 5

නුවරඑළිය දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, ආගරපතන, තලවකැලේ, කොටගල, බෝපත්තලාව, පතන, බෝගහවත්ත, වටගොඩ ආදී සෑම ප්‍රදේශයකම අර්තාපල් වගාව ටික ටිකවත් කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කැමති ගොවි මහත්වරුන් ඉන්නවා. එහෙත් ඒ වගාව සඳහා අවශ්‍ය ඉඩම් නැතිකම නිසා ඔවුන්ට ඒ වගාව කිරීමට අපහසු වී තිබෙනවා. එම නිසා ඒ අවශ්‍යතාව ඉටු වන පරිදි ඒ අවට තිබෙන ඉඩම් වලින් අක්කර 10 බැගින්වත් අවුරුදු 33 බදු ක්‍රමය යටතේ අර්තාපල් වගා කිරීමට ගොවීන්ට ලබා දෙන ලෙස මා ගරු ඇමති තුමාගෙන් ඉල්ලනවා.

ඒ සඳහා ඉඩම් ගැනීමේදී තේ ඉඩම් වලින් ගත්තත්, ඒ අර්තාපල් වගා කිරීමට දෙන අක්කර 10 වෙනුවට අක්කරය කට රාත්තල් 600 කට 700 කට වඩා ගන්නට බැරි ඒ පරණ තේ උදුරා අක්කර 3ක පමණ රිකිලි තේ වගා කිරීමෙන් අල වගාව සඳහා දෙන පරණ තේ අක් කර 10න් ලැබෙන අස්වැන්නටත් වැඩි අස්වැන්නක් ලබාගන්නට පුළුවන් වෙනවා. විශේෂයෙන් අපේ තේ විදේශ විනිමය කෙරෙහි විශාල වශයෙන් බල පාන නිසා තේවලටත් හානියක් නොවන පරිදි, අර්තාපල් සඳහා දෙන අක්කර 10 වෙනුවට රිකිලි තේ අක්කර තුනක් වගා කිරීමෙන් ඒ දෙගොල්ලන්ටම විශාල වාසියක් ලබා ගන්නට පුළුවන් වෙනවා. ඒ නිසා වැඩි කල් යන්නට මත්තෙන් ඉඩම් අත්පත් කර ගැනීමෙන් හෝ බදු ක්‍රමයට ලබා දීමෙන් හෝ මේ වගා කට යුතු කරන්නට වැඩ පිළිවෙළක් යොදන්නය කියා මා ඉල්ලනවා.

කිරි සම්බන්ධයෙන් මා තමුන්නාන්සේට කරුණක් දෙකක් පැහැදිලි කළ යුතුව තිබෙනවා. 1965 අවුරුද්දේ නුවර එළිය දිස්ත්‍රික්කයෙන් නිෂ්පාදනය වුනේ කිරි පයින්ට් 19,000 ක් පමණයි. එහෙත් දැන් ඒ ප්‍රමාණය 50,000ටත් වැඩි වී තිබෙනවා. එම නිසා මේ අවස්ථාවේදී මා ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි සමුපකාර ගව පට්ටි ඇති කිරීමට අවස්ථාව ලබා දෙන්නය කියා. සමුපකාර සමිති පිහිටුවා දැන් පිට රටින් ගෙන්වන්නට බලාපොරොත්තු වන ගවයන්ගෙන් සමන්විත කිරි පට්ටි සාද ගැනීමට අවස්ථාවක් සලසා දුන්නොත්, මා හිතනවා, එයින් විශාල ප්‍රයෝජනයක් සලස්වා ගන්නට පුළුවන් බව. එසේ කිරීමෙන් වැඩි පුර කිරි නිපදවීමට අවස්ථාවක් සලසා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, බෝපත්තලාවේ ගොවිපොළේ සිටින සේවකයින්ගේ නිවාස ගැනත් මා මතක් කරන්නට කැමතියි. මා එම ස්ථානයට ගිය අවස්ථාවලදී ඒ නිවාසවල තත්ත්වය ඔවුන් මට පෙන්නුවා. ඒ නිවාස කිසිම එළියක් නැහැ. ජීවත් වීමට සුදුසු අන්දමින් ඒවා සකස් වී නැහැ. ඒ නිවාසවල පිටුපස තිබෙන කානුවේ වතුර බහින්නේ නැහැ. එයට එක් වූ වතුර සදාකාලිකවම එහි තිබෙනවා. ඒ නිසා මදුරු විමානයක් වී තිබෙනවා. ඔය අන්දමේ අඩුපාඩු රාශියක් බෝපත්තලාවේ සත්ව ගොවිපොළේ වැඩ කරන සේවකයින්ගේ නිවාසවල තිබෙනවා. ඒ නිවාස සම්බන්ධව කිසිම දෙයක් අවුරුදු ගණනාවකින්ම කර නැහැ. ඒ නිසා එම නිවාස අලුත් වැඩියා කර මැස්සන් මදුරුවන් බෝවීම වැළැක්වෙන අන්දමේ වැඩ පිළිවෙළක් යොදන හැටියට මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තේ වගා කිරීම සම්බන්ධවත් ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. විශේෂයෙන් මැදරට තේවලට සෑහෙන මිලක් නොලැබෙන නිසා අඩි 2,500 සිට 4,000 දක්වා වූ මැදරට තේ වගාව කෙරෙන ප්‍රදේශයේ තේ වෙනුවට එම ප්‍රදේශයේ ඉතා සශ්‍රීකව වැවෙන කරද මුංගු වැවීම සම්බන්ධව සුදුසු වැඩ පිළිවෙළක් ඇති කළොත් හොඳයි කියා මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රණවීර මයා.]

කියනවා. කරදමුංගු වැවීමට හුඟ දෙනෙක් මැලි වෙනවා. එයට හේතුව තේ ගළවා රිකිලි තේ වැවීමේදී දෙන අන්දමේ ආධාර යක් තේ ගළවා කරදමුංගු වැවීමේදී නො ලැබීමයි. තේ නැවත වගා කිරීමට දෙන ආධාර මුදල දෙනු ලබන්නේ තේ පිටරට යැවීමේදී තේ රාත්තලකින් යම් මුදලක් අඩු කර ගැනීමෙන් එකතු කර ගන්න මුදලකින්. එසේ අඩු කර ගන්නා ප්‍රමාණය වැඩි කර හෝ කරදමුංගු වගාවට ආධාර දුන්නොත් අඩි 2,500 ත් 4,000 ත් අතර උස් වූ ප්‍රදේශයේ තේ ගළවා කරදමුංගු වැවීමට ගොවීන් උනන්දු වේවි. අද කරද මුංගු රාත්තලක් රුපියල් 30 ක් හෝ 35 ක් පමණ වෙනවා. ඒ මගින් විශාල විනිමයකුත් ලබාගන්නට පුළුවන්කම තිබෙනවා. එමෙන්ම කරදමුංගු වගාව නඩත්තු කිරීමටත් වැඩි වියදමක් යන් නේ නැහැ. ඒ නිසා ආධාර ක්‍රමයක් තිබෙනවා නම් මැදරට තේ උගුලා කරද මුංගු වැවීමට හුඟ දෙනෙක් කැමති වේවි. තේ උදුරා රිකිලි තේ වැවීමට යම්කිසි ආධාර මුදලක් දෙනවා වාගේ, කරදමුංගු වගාවටත් එවැනිම මුදලක් දෙනවා නම්, තේ ගළවා කරදමුංගු වගා කිරීමට කවුරුත් සූදානම් වේවි.

ඒ සමගම පහතරට තේ ගැනත් කියන් නට කැමතියි. පහතරට තේ වලටත් සෑහෙන මිලක් නොලැබෙනවා නම් පහත රට තේ උගුලා කුරුඳු වවනවා නම් හොඳයි. විශේෂයෙන් කොළඹ දිස්ත්‍රික් කයේ සිට මුහුදුබඩ හා දෙනියාය හරිය දක්වා තරමක් රට ඇතුළට වන්නටත් ඇති පහතරට තේ වගාව පවතින ප්‍රදේ ශයේ හොඳින් කුරුඳු වැවෙනවා. දැන් කුරුඳු රාත්තලකුත් රුපියල් 5 ක් පමණ වෙනවා. ඒ මගිනුත් විදේශ විනිමය විශාල කොටසක් ලැබිය හැකි බව මා ඇමතිතුමාට මතක් කරන්න ඕනෑ. කිසිම ආදායමක් නැති, සෑහෙන මිලක් නො ලැබෙන තේ ගලවා, ඒවායේ කුරුඳු වගා කිරීම සඳහාද තේ ගළවා රිකිලි තේ වගා වට දෙන ආධාරය වැනි ආධාරයක් දෙනවා නම්, එයට ජනතාව උනන්දුවක් දක් වාවි. ඒ කරුණ ගැනත් ගරු ඇමතිතුමා ගේ අවධානය යොමු කරවනවා.

ගරු සභාපතිතුමනි, තවත් වචනයක් මතක් කරන්න කැමතියි. රුපියලේ අගය අඩු කළාට පසු කම්කරුවන්ගේ වේතනයත් දිනකට සත 40 කින් පමණ වැඩි වී තිබෙනවා. එහෙත් ඊට කලින් තේ උදුරා රිකිලි තේ වගා කිරීමට දුන් ආධාර මුදල වන රුපියල් 3,750 මයි තවමත් දෙන්නේ. රුපියලේ අගය අඩු කිරීම නිසා හා කම්කරුවන්ගේ වේතනය දිනකට සත 40 කින් වැඩි කිරීම නිසා තේ නැවත වගා කිරීමට දෙන රුපියල් 3,750 ඒ සඳහා ප්‍රමාණවත් නොවන බව ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. ඒ නිසා තේවල "සෙස්" එක තවත් සතයකින් දෙකකින් හෝ වැඩිකර තේ වගා කිරීම සඳහා දෙන ආධාර මුදල රුපියල් 5,000 දක්වා වැඩි කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එතකොට වැඩි වැඩියෙන් අලුතෙන් තේ වගා කිරීමට වතු අයිතිකාරයන් පෙළඹේවි. එහි ප්‍රති ඵලයක් වශයෙන් රැකීරක්ෂා ප්‍රශ්නයත් සෑහෙන දුරට විසඳන්නට පුළුවන් වෙනවා. විශේෂයෙන්ම පාතරට පරණ තේ ගස් උදුරා රිකිලි තේ සිටුවීම සඳහා දැනට දෙන රුපියල් 3,750 ආධාර මුදල වෙනුවට රුපියල් 5,000 ආධාර මුදලක් දුන්නොත් අලුතෙන් තේ වගා කිරීමට ලොකු වතු අයිතිකාරයන් මෙන්ම සුළු වතු අයිතිකාරයන්ද සූදානමින් සිටින බව මතක් කරන්නට කැමතියි. මා විසින් ඉදිරිපත් කරන ලද මෙම කරුණු ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වේවායි බලාපොරොත්තුවෙන් මගේ කථාව අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
(Mr. Neal de Alwis—Baddegama)

ගරු සභාපතිතුමනි, එළවළු නිපදවන උදවියගේ තිබෙන අමාරුකම් ගැන මට පෙර කථා කළ නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. එළවළුවලට නියම මිළක් නොලැබෙන බව එතුමා සඳහන් කළා. ඊට කලින් කථා කළ තව සමහර ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කෙළේ නම කොළඹ ප්‍රදේශවල එළවළු මිළ අධික බවයි. මෙය අවුරුදු පතාම මෙම ගරු සභාවේදී මතුවන ප්‍රශ්නයක්. එළවළු නිපදවන උදවියට නියම මිළක් නොලැබෙන අතර පාරිභෝගිකයා එළවළු සඳහා අධික මිළක් ගෙවන්නට ඕනෑ. එළවළු බෙදා හැරීම සම්බන්ධයෙන් සුදුසු වැඩ පිළිවෙළක් මෙතෙක් මේ රටේ ඇති කර නැහැ. පසුගිය අවුරුදුවලදී මෙන්ම මේ අවුරුද්දේදීත් මේ ප්‍රශ්න මෙම ගරු සභාවේදී මතු කිරීමෙන් අපට පෙනී යන්නේ මෙම ඇමති අංශයෙන් මේ ප්‍රශ්න ගැන නියම වැඩ පිළිවෙළක් යොදා නැති බවයි. සමහර පළාත්වල එළවළු මිළ වැඩි කමේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන්කම තිබුණත් එය කෙරී නැහැ.

මේ ආණ්ඩුව බලයට පත් වුණායින් පසුව ලොකු ප්‍රචාරයක් ඇතිව වගා ව්‍යාපාරයක් පටන් ගත්තා. සමහර පළාත්වල යම් යම් උදවිය කියන්නේ ඒ වගා ව්‍යාපාරය සඳහා විරුද්ධ පාර්ශ්වයේ සහයෝගය ලැබෙන්නේ නැත කියායි. ඒ අතර වගා ව්‍යාපාරය සාර්ථක යයි විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුනුත් කියනවා යයි සමහර පළාත්වලදී සමහරුන් කියනවා. කෙසේ වුවත් වගා ව්‍යාපාරය සාර්ථකද නැද්දැයි අපට දැන ගන්නට පුළුවන් වන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන ඉලක්කම්වලින් නොවන බව මතක් කරන්නට කැමතියි. මහජනයාට පහසුවෙන් වුවමනා බඩු ටික ලබා ගන්නට පුළුවන්කම තිබෙන්නට ඕනෑ. ඒ වාගේම සාධාරණ මිළකට ඒ බඩු ටික ලබා ගන්නට පුළුවන්කම තිබෙන්නට ඕනෑ. මේ කරුණු දෙක යථා පරිද්දෙන් නැත්නම් ආණ්ඩුව කොතරම් වාර්තා ඉදිරිපත් කළත්, ඉලක්කම් ඉදිරිපත් කළත් මේ පටන් ගෙන ඇති වගා ව්‍යාපාරය සාර්ථක වී ඇතැයි කියන්නට පුළුවන්කමක් නැහැ. වගා ව්‍යාපාරයේ සාර්ථකත්වය සම්බන්ධයෙන් ගුවන් විදුලිය මඟින් උදේ සිට රෑ වන තුරු කීවත්, ධනපති පුවත්පත් මඟින් ඒ ව්‍යාපාරය හොඳ යයි කීවත්, ජනතාවට වුවමනා ආහාර ටික සාධාරණ මිළකටත් පහසුවෙනුත් ලබා ගන්නට බැරි නම් ඒ වගා ව්‍යාපාරය සාර්ථක යයි කියන්නේ කොහොමද?

අ. භා. 5.15

විරුද්ධ පක්ෂයේ සහයෝගය ගැන වචනයක් දෙකක් කියන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම වගා ව්‍යාපාරය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට උපදෙස් දෙන්නට අප නිතරම ලැස්තියි. 1968 ජනවාරි මාසයේදී මා වැදගත් යෝජනා දෙකක් ඉදිරිපත් කළ බව තමුන්නාන්සේලාට මතක ඇති. වගා ව්‍යාපාරය සාර්ථක කර ගන්නට නම් පෝර ටික නොමිලයේ බෙදා දිය යුතුය කියා මා යෝජනාවක් ඉදිරිපත් කළා. කුඹුරු වගාවට හෝ වේවා තේ, පොල්, රබර්, වගාවලට හෝ වේවා පෝර ටික නොමිලයේ බෙදා දීමේ වැඩ පිළිවෙළක් සකස් කළයුතුය කියා මා යෝජනාවක් ඉදිරි පත් කළා. කුඹුරු ගොවිතැන් කරන අයට පෝර නො මිලයේ දිය යුතු නම් නොමිලයේ දෙන අතර තේ, රබර් සහ පොල් වගාවලට දෙන පෝරවලට මුදල් අය කර ගන්නට වුවමනා නම් තීරු බද්දක මාර්ගයෙන් ඒක අය කර ගත හැකි බවත් මා පෙන්වා දුන්නා. පෝර කියන ද්‍රව්‍යය කන දෙයක් නොවෙයි. ඒක පොළවටම දැමිය යුතුයි. පොළවට දැම්මාට අපට ප්‍රතිඵල ලැබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නීල් ද අල්විස් මයා.]

නමුත් ඇමතිතුමා ඒ යෝජනාව භාර ගත්තේ නැහැ. ඇමතිතුමා සිනහ වුණා. දැනුත් සිනහ වෙනවා. නමුත් ඇමතිතුමාගේ වැඩ පිළිවෙළ ගැන දැන් අප සිනහ වෙනවා. එදා මා ඉදිරිපත් කළ යෝජනාව ගැන මෙතැන පැය එකහමාරක් තිස්සේ කථා කළා. ඇමතිතුමාට ඒක විහිළුවක් ඇමතිතුමා ඒ යෝජනාව භාර ගත්තේ නැහැ. නමුත් අද ඇමතිතුමා මොකක්ද කරන්නෙ? අද පෝරවලට අය කරන්නේ සියයට 50 යි. සියයට 50 ක් ආණ්ඩුවෙන් ලැබෙනවා. කොටින්ම කියනවා නම් ගොවිතැන් කරන අයට ගෙවන්නට තිබෙන්නේ සියයට 50 යි.

එදා මා ඉදිරිපත් කළ යෝජනාව ගැන ඇමතිතුමා සිනහ වුණා. ඒක විහිළුවක් හැටියට භාර ගත්තා. නමුත් අද වටිනා ක්‍රමෙන් භාගයක් පමණක් අය කිරීමේ වැඩ පිළිවෙළක් අනුගමනය කරනවා. ඒ භාගයවත් දුන්නේ නැත්නම් තමුන්නාන්සේලාට අද ඔය ලැබෙන අස්වැන්නවත් ලැබෙන්නේ නැහැ. නමුත් සම්පූර්ණයෙන්ම නොමිලේ දුන්නා නම් වගා ව්‍යාපාරය මීට වඩා සාර්ථක වන බව අපට පැහැදිලිවම පෙනෙනවා. ඒකට මුදල් අය කරගත යුතු නම් ආණ්ඩුවට අය කරගත හැකි මාර්ග තිබෙනවා. තේ, රබර්, පොල් පිටරට යවනවා. තීරු බද්දක මාර්ගයෙන් ඒ වගාවලට දෙන පෝරවල මුදල් අය කරගත හැකි බව මා පෙන්වා දුන්නා. ඇත්ත වශයෙන්ම එවැනි වැඩ පිළිවෙළක් යොදන්නට පුළුවන්කම තිබුණා. නමුත් ආණ්ඩුව මගේ යෝජනාව පිළිගත්තේ නැහැ. සුළු තේ වතු අයිතිකරුවන්ටත් අද ආධාර සහිතව පෝර දෙනවා. නමුත් මොකක්ද වෙන්නෙ? ඒ බලපත්‍රය ඔවුන් විකුණනවා. ලොකු වතු අයිතිකරුවන් ඒවා ගන්නවා. කුඩා වතු හිමියාට ඒ පෝර ටික යන්නේ නැහැ. නමුත් කාටත් මුලින් පෝර ටික නොමිලේ දුන්නා නම් වගාව මීට වඩා සාර්ථක වෙනවා. නිෂ්පාදනය මීට වඩා වැඩි වෙනවා. විරුද්ධ පක්ෂයේ අප බොහොම කල්පනා කරලයි එවැනි යෝජනා ඉදිරිපත් කරන්නෙ. නමුත් ඇමතිතුමා අපේ යෝජනා විහිළුවක් හැටියට භාර ගන්නවා. ඒකෙන් මොකක්ද වෙන්නෙ? අපේ සහයෝගය නොලැබී යාමයි.

එදා මා තවත් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. ඒකත් ආණ්ඩුව භාර ගත්තේ නැහැ. ඒ යෝජනාව මොකක්ද? වගාවට වුවමනා කරන ට්‍රැක්ටර් ටික පිටරටින් ගෙන්වා වුවමනා කරන ස්ථානවල ට්‍රැක්ටර් මධ්‍යස්ථාන පිහිටුවා වැය වූ මුදලත් නඩත්තුවට යන මුදලත් ගැන කල්පනා කර බලා සෑහෙන ගාස්තුවකට ට්‍රැක්ටර් වුවමනා උදවියට ට්‍රැක්ටර් සැපයීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කළයුතුය කියා මා යෝජනා කළා. එදා මා කළ යෝජනා ඇමතිතුමා භාර ගත්තෙ නැහැ. දැන් මොහොතට පෙර කථා කළ මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළේ ට්‍රැක්ටර් සඳහා අය කරන කුලිය සම්බන්ධවයි. ට්‍රැක්ටර් කුලිය අඩු කිරීමට පියවර ගන්නා මෙන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් පවා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

තමුන්නාන්සෙ එක වෙලාවකට කියනවා පෝරවලට විශාල මුදලක් වියදම් කළාය කියා. විනිමය හුඟක් යනවාය කියලත් කීවා. අනික් පැත්තෙන් කියනවා. පෝර ගෙන්වීම සඳහා විදේශ විනිමය ලබා ගන්න හැටි කියනවාය කියා.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி. அல்விஸ்)*
(Mr. Neal de Alwis)

පෝරවලට කොපමණ මුදලක් වියදම් කර තිබෙනවාද කියා මම පෙනවා දෙන් නම්. නමුත් මේ මුදල ලබා ගන්නා ආකාරයත් පෙන්වා දෙන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා කථා කරගෙන ආවේ පෝර සම්බන්ධයෙන් නොවෙයි. ට්‍රැක්ටර් සම්බන්ධයෙනුයි. ට්‍රැක්ටර් මුදලාලිලා බිහි කරන්න මේ ආණ්ඩුව ක්‍රියා කළා. මා එදා යෝජනා කළා ආණ්ඩුව මගින් ට්‍රැක්ටර් ලබා ගෙන, ට්‍රැක්ටර් ලබා ගැනීම සඳහා යන මුදලත්, නඩත්තුව සඳහා යන මුදලත්, යන දෙකම ගණන් බලා සාධාරණ කුලියකට ආණ්ඩුව මගින් ගොවියන්ට ට්‍රැක්ටර් ලබා දීමට ක්‍රියා කරන්නටය කියා. ඒ ඉල්ලීමට කන් දුන්නේ නැහැ. ඒ වෙනුවට ට්‍රැක්ටර් ජාවාරම්කාරයන් පිරිසක් බිහි කර තිබෙනවා. වගා ව්‍යාපාරයේ නමින් මෙ බඳු ජාවාරමක් ගෙන යන බව අප නොයෙක් අවස්ථාවලදී පෙන්නා දුන්නා මතක ඇති. එදා මා කළ යෝජනා දෙක ආණ්ඩුව පිළිගත්තේ නැහැ. එසේ පිළිගත්තා නම් තමුන්නාන්සෙලාගේ මන්ත්‍රීවරුන්ගෙන්ම අද එල්ල වන චෝදනා එල්ල වන්නේ නැහැ නේද? ඇත්ත වශයෙන්ම වගා ව්‍යාපාරයෙන් අද ප්‍රයෝජන ලබන්නේ ගොවිතැන් කරන උදවිය නොවෙයි; වගා ව්‍යාපාරයේ නාමයෙන් ජාවාරම් කරන පිරිසයි: වගා ව්‍යාපාරයේ නාමයෙන් පිටරටින් බඩු ගෙන්වන පිරිසයි.

ඒ කෙසේ වුණත් සියයට පණහක් මිළ අඩුවෙන් පෝර ලබෙනවා නම් මා 1968 දී කීවා වාගේ 1969දීත් කියනවා, ඉතුරු ටික වත් හරියට කරන්න උත්සාහ කළොත් මෙම වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න පුළුවන් වන බව. නමුත් තව මාස හයයි තිබෙන්නෙ. සාර්ථක කර ගන්න වේලාවක් නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
සාර්ථක වෙලා ඉවරයි.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
දැන් බස් එක ගිහින්, එදා හාල් සේරුව කැපූ අවසථාවේදී ආණ්ඩුව කීවේ මොකක්ද? ලංකාවේ මුදල් තත්ත්වය ඉතාමත් භයානක අතට හැරී තිබෙනවා, එම නිසා මුදල් තත්ත්වය යහපත් අතට හැරෙන තුරු මෙම පියවර ගන්න සිදු වී තිබෙනවාය කියා නොවේද? එහෙම නම් ඒ තත්ත්වය කොපමණ දුරට හරි ගස්සා තිබෙනවාදැයි ප්‍රශ්න කරන්න කැමතියි. හාල් සේරුව කැපීමෙන් වගාව සාර්ථක වී තිබෙනවාද? හාල් සේරුව කපන්න පෙරත් හාල් සේරුවක් වික්කෙ රු. 1.25 ට. වගාව සාර්ථක වුණාය කියන මේ අවධියේදීත් හාල් සේරුවක මිල රු. 1.25 යි. එහෙම නම් ඔය කියන සාර්ථක භාවය ඇති වී තිබෙන්නේ කොහේද? [බාධාකිරීමක්] පෝර මිල දී ගන්න ආකාරය ගැනත්, ඒ සඳහා මුදල් ලබා ගන්නා ආකාරය ගැනත්, මා කීවා, අපේ තේ, පොල්, රබර් ආදී ද්‍රව්‍ය පිටරට යැවීමේදී තීරු බද්දක් ඇති කර මුදල් ලබා ගන්න ආකාරය ගැනත් කරුණු පැහැදිලි කර දුන්නා [බාධාකිරීමක්] විනිමය ලබා ගන්න අපහසුවක් නැහැ. තමුන්නාන්සේලා විනිමය ප්‍රවේසම් කරගෙන තිබුණු ආකාරය ගැන ඊයේ පෙරේදා ඇති වුණු සිද්ධියෙන් හොඳ හැටි පැහැදිලි වුණා. සමහර උදවියට විනිමය සමග ඕනෑ අන්දමින් සෙල්ලම් කරන්න ඉඩ දී තිබුණා. විදේශ විනිමය ගැන මහ ලොකුවට කිය නවා. එහෙත් නොයෙකුත් දූෂණ ක්‍රියා මගින් විදේශ විනිමය වංචා කොට ස්විට්සර්ලන්ත බැංකුවල තැන්පත් කරන අය ගැන කිසිවක් නොකර ඇස් පියාගෙන ඉන්නවා.

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon)
මේ රජය නොවෙයිද, ඒවා නැවැත්තුවේ?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
මුලින්ම පැමිණිලි ලැබුණේ කොයි කාලයේද? ඒ ගැන සොයා බැලුවේ කවදාද? අදත් හාල් සේරුවක මිළ රු. 1.25 යි. ආරෝග්‍යශාලාවල ඉන්න ලෙඩුන්ට තවමත් බත් ටික ලැබෙන්නේ නැහැ. ජනතාවගේ අමාරුකම් දැන් එදාටත් වැඩියි. ඔය කියන තරම් අස්වැන්න වැඩි වී තිබෙනවා නම් හාල් මිළ බහින්නේ නැත්තේ ඇයි?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජෝර්ජ් කොතලාවල මයා.** (බණ්ඩාර ගම)
(திரு. ஜோர்ஜ் கொத்தலாவல—பண்டார கம)
(Mr. George Kotelawala—Bandaragama)

දැන් පොල් කුඩුත් විකුණන්න පුළුවනි.

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

පොල් කුඩු විකුණන්න බැරි නම් කැවත් මට කමක් නැහැ. තමුන්නාන්සේලා කොයි තරම් කෑ ගැහුවත් ඒ කෑ ගහන තරමට අස්වැන්න වැඩි වී නැති බව මා මීට පෙරත් ඔප්පු කර තිබෙනවා. 1957 සිට 1968 දක්වා වූ අවුරුදු 12, අවුරුදු හතරේ කොටස් තුනකට වෙන්කොට දක්වමින් මා නැවතත් එය ඔප්පු කරන්නට කැමතියි. 1957 සිට 1960 දක්වා වූ අවුරුදු හතරේ වී නිෂ්පාදනය බුසල් ලක්ෂ 1,475 යි. 1961 සිට 1964 දක්වා වූ අවුරුදු හතරේ වී නිෂ්පාදනය බුසල් ලක්ෂ 1,908 යි. 1965 සිට 1968 දක්වා වූ අවුරුදු හතරේ වී නිෂ්පාදනය බුසල් ලක්ෂ 2,014 යි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

තමුන්නාන්සේ ඉංග්‍රීසි "මිලියන්" සහ සිංහල "ලක්ෂ" පටලවාගෙනයි, කථා කරන්නේ

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

මේ ගණන් අනුව අපට පෙනෙනවා. 1957 සිට 1960 දක්වා වූ අවුරුදු හතරේ වී නිෂ්පාදනයට වඩා, 1961 සිට 1964 දක්වා වූ අවුරුදු හතරේ නිෂ්පාදනය වී බුසල් ලක්ෂ 433 කින් වැඩි වී තිබෙන බව. එහෙත් 1961 සිට 1964 දක්වා වූ අවුරුදු හතරේ නිෂ්පාදනයට වඩා 1965 සිට 1968 දක්වා වූ අවුරුදු හතරේ නිෂ්පාදනය වැඩි වී තිබෙන්නේ බුසල් 106 කින් පමණයි.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
(திரு. டென்சில் பெர்ணாண்டோ)
(Mr. Denzil Fernando)

ඒ, බිත්තර වී.

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

තමුන්නාන්සේ දන්නේ නැති නම් කට වහගෙන ඉන්න. ධනපති ප්‍රවෘත්ති පත්‍ර වලිනුයි, ගුවන් විදුලි පටවලිනුයි, මහජන තාව රවටන්නට තමුන්නාන්සේලාට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

**සභාපති**
(அக்கிராசனர்)
(The Chairman)

This is the Committee stage of the Budget. The hon. Member is making a Second Reading speech.

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

I am speaking on the Votes of the Ministry of Agriculture and Food. All that I am saying is that, even though it is said that there is an increase in production, there is no visible increase.

**සභාපති**
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Member should have taken that matter up during the Second Reading Debate.—[*Interruption*].

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

The hon. Member is confusing the whole thing.

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

These figures are from the Department of Census and Statistics.—[*Interruption*].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

තේරෙන්න කියන්න එපායැ ?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

තමුන්නාන්සේට තේරෙන්න කියන්න ඕනෑ හැටි අප දන්නවා. හෙට පැය දෙකක් අනම්මනම් දොඩවයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ඉංග්‍රීසියෙන් ලියාගෙන තිබෙන ඒවා සිංහලෙන් කියවන්න ගියාම සිංහලටත් නෑ. ඉංගිරිසියටත් නෑ.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

දැන් වෙන අවුරුදුවලට වඩා පෝර සඳහා විශාල මුදලක් වියදම් කරනවා. ඒසේම පාසල් ළමුන් ලවා කුඹුරුවල වල් නෙලනවා ඒ හැරෙන්නට බෙහෙත් වගී සඳහාත් විශාල මුදලක් වියදම් කරනවා.

අ. භා. 5.30

ගරු සභාපතිතුමනි, මෙම වාර්තාවන්හි පවා සඳහන් නොවුණු මුදල් Invisible Expenditure වශයෙන් වැය කර තිබෙන බව අප දන්නවා. Rs. 10.6 million මේ අවුරුදු හතර තුළ වැඩි කර තිබෙන්නේ මෙවැනි කටයුතු සඳහා බව කිව යුතුය. [බාධාකිරීමක්]

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

Please do not interrupt the hon. Member who is on his feet.—[*Interruption*].

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I am speaking of the total four years.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

The hon. Member is wasting the time of the House. There are a number of other hon. Members down to speak.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I am keen on giving these figures because the radio and the newspapers speak a lot about their achievements.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

This is the Committee stage of the Budget. We went into all those figures during the Second Reading Debate. The hon. Member was not here at that time, and now he wants to go into the whole thing.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I do not know whether we went into these figures.

1965 ට ප්‍රථම මේ රටට අවශ්‍ය කෑම ද්‍රව්‍ය ගෙන්වීම සඳහා යම් තරමක මුදලක් වැය කළා නම් එයිනුත් විශාල කොටසක් මෙම ව්‍යාපාරවලට යොදවා තිබෙනවා. එහෙත් මෙම වගා ව්‍යාපාර සාර්ථකද නැද්ද යන්න අපට අවබෝධ කර ගන්නට පුළුවනි. ආහාර ද්‍රව්‍ය ටික පහසු ආකාරයට ලැබෙනවාදැයි අපි තමුන්නාන්සේලාගෙන් ප්‍රශ්න කරනවා. කොතරම් දුරට ගණන් හිලව් පෙන්නුවත් මෙම වගා ව්‍යාපාරය සාර්ථක වී තිබෙනවා යැයි ජනතාව පිළිගන්නේ නැහැ.

අද තේවලට සෑහෙන මිලක් ලබා ගන්නට අමාරුයි. ඒ ගැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පවා කිව්වා. මගේ ආසනයේ කුඩා තේ වතු හිමියන්ගේ තේ කර්මාන්ත ශාලාවක් තිබෙනවා. වෙනත් තේ කර්මාන්ත ශාලාවලින් කුඩා තේ වතු හිමියන්ගේ තේ දළු සඳහා නියම මිලක් ගෙවනවාද කියා සොයා බලන්නට වරින් වර දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂකවරුන් යවන බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නීල් ද අල්විස් මයා.]
අප දන්නවා. මෙම කර්මාන්තශාලාවෙන් ඒ උදවියට නියම මිලක් ලැබෙන්නේ නැති බවට පැමිණිලි රාශියක් ලැබී තිබෙනවා. පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් එම පැමිණිලි තේ පාලන දෙපාර්තමේන්තුවට පමණක් නොව සමුපකාර දෙපාර්තමේන්තුවටත් මවිසින් දන්වා යවනු ලැබුවා. තේ පාලන දෙපාර්තමේන්තුවෙන් ඒ පිළිබඳව කියන්නේ පුද්ගලික කොම්පැණියකට අයත් ස්ටෝරුවක නම් මෙම තත්ත්වය හුගක් දුරට හරිගස්සන්නට පුළුවන්කම තිබෙන නමුත් මෙය සමුපකාර ස්ටෝරුවක් වන හෙයින් එසේ කරන්නට තමන්ට බලයක් නැති බවයි.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
මොකක්ද එහි නම ?

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)
Gangaboda Pattu Tea Smallholders' Co-operative Tea Factory.

දෙපාර්තමේන්තුවට තිබෙන බලතලවලට අනුව එම ස්ටෝරුව මගින් ඒ ජනතාවට නියම මිලක් ලබා දෙන්නට බැරි නම් එය ඉක්මණින්ම වසා දමන්නට සිදු වෙනවා. ඇති. ඊයෙ පෙරේදා මට ආරංචියක් ලැබුණා එම කුඩා තේ වතු හිමියන්ගේ තේ කර්මාන්තශාලාව හෙට අනිද්දාම වසා දමන්නට යන බව. එසේම එම සාමාජිකයන්ගේ තේ දළු පුද්ගලික සමාගමකට අයත් ස්ටෝරුවකට භාර දෙන්නට සිදු විය හැකි බවටත් ආරංචි පැතිර ගොස් තිබෙනවා. මෙවැනි වැඩ කොටසක් පුද්ගලික කොම්පැණිකාරයන්ගේ ස්ටෝරුවකට භාර දෙන්නට සිදු වෙනවා. නම්, සමුපකාර දෙපාර්තමේන්තුව හරියාකාර වැඩ කරනවා යයි කියන්නට බැහැ. පිට දළු ගන්න තේ කර්මාන්තශාලාවල පාඩුවට කටයුතු සිදු වන්නට කිසිම හේතුවක් ඇත්තේ නැහැ. පුද්ගලික වතුකාරයෙකුට නම් තමන්ගේ තේ දළු ටික හදා ගැනීමට යාමේදී යම් යම් අලාභ හානි සිදු විය හැකියි. එහෙත් පිට දළු ලබා ගන්න කර්මාන්තශාලාවක් මගින් එම දළු ලබා ගන්නේ ඒවා නිපදවීම සඳහා යම්කිසි මිලක් නියම කිරීමෙන් පසුවයි. මේ තේ කර්මාන්තශාලාවේ වැඩ ගැන හොඳින් සොයා බලා ඉක්මණින් ඒ තත්වය වෙනස් කරන්නය කියා මා මේ සභාව මාර්ගයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට වගාව සම්බන්ධයෙනුත් කියන්නට ඕනෑ. ඒ සම්බන්ධයෙන් කථා කරන විට තමුන්නාන්සේත් හිනා වෙනවා ; එදා අගමැතිතුමාත් හිනා වුණා. ඔය වගාව ගැන රේඩියෝ එකේ කථා කරන විට මිනිසුන් හිනාවෙන්ට පටන් ගන්නවා, මේ මොන විහිළුවක්ද කියා. මේක විහිළුවක් බවට පත් කරන්නෙ නැතිව නියම තත්ත්වය එළි කරන්න ඕනෑ. ගණන් හිලව් ඉදිරිපත් කළාට මදි, ඒවා හරියට බෙදෙනවාද කියා බලන්න ඕනෑ. වගා ව්‍යාපාරය සාර්ථක නම් ජනතාවට නියම මිලකට භාණ්ඩ ලැබෙනවාදැයි සොයා බලා වාර්තා කරන ලෙස ඉල්ලමින් මගේ කථාව මෙයින් නවත්වනවා.

සී. එෆ්. ඩබ්ලිව්. එදිරිසූරිය මයා. (තිස්ස මහාරාමය)
(திரு. சீ. எப். டபிள்யு. எதிரிசூரிய—திச மகராம)
(Mr. C. F. W. Edirisuriya—Tissamaharama)

විශේෂයෙන් බද්දේගම මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසු මට කථා කරන්නට අවස්ථාව ලැබීම මගේ වාසනාවක්. එතුමා මගේ කල්‍යාණ මිත්‍රයෙක්. 1952 සිට 1956 දක්වා කාලය තුළ අපි දෙදෙනා එකට සිටි කාලයේදී එතුමාගේ වැඩ පිළිවෙල ගැන මා දන්නවා. මා ඒවා මෙහිදී කියන්නෙ නැහැ. [බාධා කිරීමක්] උන්නැහේව ආරක්ෂා කර ගෙන ඉන්න අවධියේදී සිදු වූ දේවල් මා කියන්නේ නැහැ. මට මේ ඉඩ ප්‍රස්ථාව ලබා දීම ගැන මා ගරු සභාපතිතුමාට ස්තුති කරනවා. මා නියෝජනය කරන තිස්සමහාරාම කොට්ඨාශයේ සියයට 75 ක් වී ගොවිතැන් කරන ප්‍රදේශයක්. කලින් අක්කරයකින් බුසල් හත-අටකටවත් අස්වැන්න නොලැබුණු එහි කුඹුරුවලින් මේ කරලේදී බුසල් 110ක, 115 තරම අස්වැන්නක් ලැබුණු බව මා මතක් කරන්නට සතුටුයි. මේ වගා ව්‍යාපාරයේ දියුණුව බොරුවක්ය කියා පෙන්වා දීමට තමුන්නාන්සේලා කවුරු මහන්සි ගත්තත් ඒක ඔප්පු කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැහැ. අපි ගමේ රටේ ඇවිදින විට අපට පෙනියනවා, කලින් පොල්අතු පැළවල් වල ජීවත්වුණු දුප්පත් මිනිසුන් අද හොඳ රට උළු දමූ ගෙවල් හදාගෙන පදිංචි වී සිටින බව. කැලෑ මැද ගෙවල්වල රේඩියෝ ශබ්ද වෙනවා අපට ඇහෙනවා. බොහොම ගෙවල්වල මහන මැෂින් තිබෙන බව අපට පෙනෙනවා. ඒ ගැන මා ආඩම්බර වෙනවා. ඒ මිනිසුන් අත හොඳින් මුදල් ගැවසෙන බව එයින් පෙනී යනවා.

මේ වාරයේ ජලය හිඟ කමින් කුඹුරු ඇරෙන්න ගියා. ඒ වෙලාවේදී ඇමති තුමාගේ විශේෂ නියෝගයක් උඩ ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව ඉතාම උනන්දුවෙන් ක්‍රියා කර වතුර මාර්ග සකස් කර දුන්නා. සම්පූර්ණයෙන්ම ජබරවලින් පිරී තිබුණු බස්නා සියල්ලම ශුද්ධ කර දුන් කලමැටිය කලපුවේ බොහොම හොඳින් ගොවිතැන් කටයුතු කරගෙන යනවා. ගරු සභාපතිතුමනි, 1965 දී හා 1966 දී ඉදිරිපත් කළ රාජාසන කථාවලින් අපි පොරොන්දුවක් දුන්නා, අද ගොවීන්ට ඔවුන් වැඩ කරන කුඹුරු සින්නක්කර වශයෙන් පවරා දෙනවා කියා. අක්කර විස්ස, තිහ, පනහ, හැට තිබෙන, දරුවන් හත් අටදෙනා සිටින උදවියගේ කුඩා කුඹුරු නොවෙයි; ධනපතියන්ගේ විශාල කුඹුරු. මාමඩලවිල, පාදිලිගම කියන ඉඩම් දෙක ආණ්ඩුවට අරගෙන කැබලිවලට කඩා මහජනයා අතර බෙදා දී ඒවායේ වටිනාකම කොටස් වශයෙන් ඔවුන් ගෙන් අය කර ගැනීමේ වැඩ පිළිවෙලක් සකස් කර දීමට මා ලොකු මහන්සියක් ගත්තා. එහෙත් ඒ ලියුම්වලට මොනව වුණාද කියා මා දන්නෙ නැහැ. මා ඒ ගැන කනගාටු වෙනවා. මාමඩවිලෙත්, පාදිලිගමත් තිබෙන අක්කර 400 ක් තරම වූ ඒ ඉඩම් මා කලින් සඳහන් කළ විධියට ගොවීන් අතර බෙදා දී, ඔවුන් ඒවායේ වටිනාකම ගෙවීමෙන් පසු සින්නක්කර ඔප්පු මගින් ඔවුන්ට පවරා දෙන්නට මේ කෙටි කාලයේදීවත් වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

අපි කුඹුරු පනත ගෙනාවේ ගම්බාර පූට්ටුව නැති කිරීමටයි. සමහර අය ලොකු ඉඩම් බදු ගන්නවා. පන්සියයක් පමණ ගෙවන්නට වේය කියලායි ඉදිරිපත් වෙන්නේ. ඒ වුණාට තරඟයකට මුහුණ පාන්නට සිදු වන නිසා දාහට, එක්දාස් පන්සියයට තමයි ගන්න ලැබෙන්නේ. ඉතින්, ඒ තරම් ප්‍රමාණයක් ගෙවන්නට අමාරුයි. එතකොට වෙන්නෙ මොකක්ද? කමතටම ගිහිල්ලා කැට වැලි ටික පවා හුරා ගන්නවා. කමත් දැති ටිකත් ගන්නවා. බිහි අඩි, හුළං ගහලා අරන් යනවා. ඔය විධියට ගොවියා සූරාකන සිරිතක් තිබෙනවා. ඒ නිසා මේ ගම්භාර ක්‍රමය සම්පූර්ණයෙන්ම නැති කර දමන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තිස්සමහාරාමයේ නරක සිරිතක් තිබෙනවා. අමුණට බුසල් හතයි. නියම ගණන බුසල් හයයි, එහෙම නැත්නම් කුරුණී 48 යි. හතක් අල්ලන එකෙනුයි මිම්ම ගන්නේ. සල්ලිකාරයෝ කල් මත්තෙන් ඇඩ්වාන්ස් හැටියට රුපියල් පණහට, හැටට අස්වැන්න ටික ගන්නවා. අන්තිමේදී බුසලක් රුපියල් පහළොව බැගින් විකුණනවා. පහළොව බැගින් වික්කත් රු. 105 ක් හම්බ වෙනවා. මේ කල් මත්තෙන් ගන්න ක්‍රමය නිසා බුසල් හතටම වුණත් ලැබෙන්නේ රුපියල් පණහයි නැත්නම් වැඩිම වුණොත් රුපියල් හැටයි. එය අසාධාරණයි. කුරුණිය සම්පූර්ණයෙන් ම නැති කර දමන්නැයි මම ඉල්ලනවා. කාර්තු 27 කුරුණීත් තිබෙන අතර කාර්තු 28 ඒවාත් තිබෙනවා. මේ කුරුණී ක්‍රමය නිසා දුප්පත් ගොවියා තමයි දුක් විඳින්නේ. ඒ නිසා මා ඉල්ලා සිටිනවා බුසලෙන්ම වී මනින්නට රෙගුලාසි ඇති කරන ලෙස. කුරුණිය තමයි අසරණ ගොවියා නහන්නේ.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව ගැන බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නිල් ද අල්විස් මයා.) කථා කළා. දුප්පත් ගොවියාට කිසිම සහනයක් ඇති කර නැතැයි ඒ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයේ නම් අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව දුප්පත් ගොවියාට විශාල සහනයක් ලබා දෙනවා. ඒ ප්‍රදේශයේ ලොරි බොහොම හිඟයි. ලොරි කුලිය ගෙවන්නත් අමාරුයි. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව හේනටම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එදිරිසූරිය මයා.]

ගිහිල්ලා සහතික මිලට ගොවි ද්‍රව්‍ය ගන්නවා. වෙළෙන්දෝ, ලොරි තිබෙන උදවිය, ගේන්වලටම ගිහිල්ලා රුපියල් පහක් වටිනා ගොවි ද්‍රව්‍ය ගන්නේ ශත පණහට නැත්නම් ශත හැටටයි. ගේන් කාලයේදී අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලොරි ගේන්වලටම යනවා. ගිහිල්ලා සහතික මිලට ඒවා ගෙන යනවා. ජාතික පොළක් ඇති කර තිබෙනවා. ඔය ක්‍රමවලින් ගොවියාට දැන් විශාල සහනයක් ඇති කර තිබෙන නිසා අසරණ ගොවීන් සූරා කන්නට පෞද්ගලික වෙළෙන්දන්ට ඉඩ ලැබෙන්නේ නැහැ. ඒ නිසා මට නම් කියන්නට පුළුවනි, මා නියෝජනය කරන ප්‍රදේශයට නම් අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් අති විශාල සේවයක් සිදු වන බව. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව ඉතාමත් හොඳට වැඩ කරන බවත් මතක් කරන්නට කැමතියි.

සමුපකාර ව්‍යාපාරය ගැනත් කියන්නට කැමතියි. කොහොලන්ගල සමුපකාර සමිතියක් තිබෙනවා. හොරකම් කරලාම දැන් ඒ සමිතියේ කිසිම දෙයක් නැහැ. වාර්තා ලැබී තිබෙනවා දෙපාර්තමේන්තුවට. දැන් සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා ඒ ගැන හොඳින් ක්‍රියා කරගෙන යනවා. මම පත්දම් අල්ලනවා එහෙම නොවෙයි. දැන් ඉන්න සමුපකාර කොමසාරිස්වරයා බොහොම දක්ෂයි. ඒ බව මම ප්‍රකාශ කරන්නට ඕනෑ. සුදුස්සාට සුදුසු තැන දෙන්න මම මැලි නැහැ, කවදාවත්. හොඳ කියන්නට තිබෙන තැන හොඳ කියන්නට ඕනෑ. ඒ වගේම නරක කියන්නට තිබෙන තැන නරකත් කියන්නට ඕනෑ, කිසිම පැකිලීමක් නැතිව. අලෙවි කිරීමේ කොමසාරිස්තුමාත් බොහොම හොඳ කෙනෙක්. ඒ වාගේම ගොවිජනසේවා කොමසාරිස්තුමාත් බොහොම හොඳ කෙනෙක්. මට නම් ඒ තුන් දෙනාම බොහොම හොඳයි. මට පමණක් එතුමන්ලා හොඳ අය හැටියට පෙනෙනවාදැයි මම දන්නේ නැහැ. මගේ කොට්ඨාශයේ අයත් ඒ කොමසාරිස්තුමන්ලාට බොහොම කැමතියි. ඒ අය හොඳට වැඩ කරගෙන යනවා. නිතරම සහයෝගයෙන් වැඩ කරගෙන යනවා. නිලධාරි මණ්ඩලයත් සමග එකට එකතුවෙලා සහයෝගයෙන් වැඩ කරනවා. ඒ බව කියන්ට කැමතියි.

ආණ්ඩුවේ හාල් මෝල් ගැනත් වචනයක් දෙකක් කියන්නට ඕනෑ. අපේ ප්‍රදේශයේත් හාල් මෝලක් තිබෙනවා. පෞද්ගලික හාල් මෝල් හිමියන් බාර දෙන්නේ කොපමණද, ආණ්ඩුවේ හාල් මෝල් භාර දෙන්නේ කොපමණදැයි සල්පනා කර බලන්නට ඕනෑ. පෞද්ගලික මෝල් කාරයන් දෙනවා සියේට 53ක්. ආණ්ඩුවේ මෝලෙන් සියේට 49 ක් දෙනවා. සාමාන්‍යයෙන් මාසයකට රු. 35,000ක් පමණ මෝලේ මැනේජර්ලා හාල්වලින් හම්බ කරනවා.

අ. භා. 5.45

ඒ කාලයේත් මේ හොරකම තිබුනා. 1947 දී—ජාතියේ පියා වූ අතිගරු ඩී. එස්. සේනානායක මැතිතුමාගේ කාලයේදී—බැසට් නමැති ආහාර කොමසාරිස්වරයකු සිටියා. ඒ කාලයේදී මේ ගැන සොයා බැලුවම ලක්ෂ 12 ක සොරකමක් අසු වුණා. රුපියල් 250, 300 පඩි ලබන මැනේජර්වරුන් අවුරුදු දෙක තුනක් යන විට කාර් දෙක, තුන ගන්නවා, කුරුඳුවත්තේ ඉඩකඩම් ගෙන උඩුමහල් සහිත ගෙවල් සාදා ගන්නවා. මේක ජාතික විපතක්. කොමසාරිස් කියා හෝ වෙනත් උසස් නිල නාමයක් දී හෝ හොඳ අවංක සිවිල් සේවකයකුට හෝ වෙනත් උසස් නිලධාරියකුට මේ කටයුත්ත භාර දී මාසයකට රුපියල් 3,000 ක් 4,000 ක් හෝ 5,000ක් ගෙව්වත් කමක් නැහැ. රෑ දවල් දෙකේ කරන මේ බරපතළ සොරකම නවත්වන්න ඕනෑ. වැඩි වී බුසල් 5,000 ක් එකතු වුණාම දෙර පලනගේ දලියාමා බුසල් 3,000 යි, චාලි එදිරිසූරිය බුසල් 2,000 යි කියා කාගෙන් හෝ කඩදාසි පමණක් අරගෙන බුසලට රුපියල් 14 බැගින් සල්ලි ගන්නවා. ඔය පිළිවෙළට මේක තමන්ගේ අම්මගේ අප්පගේ බූදලය වගේ පාවිච්චි කරන අය ඉන්නවා. මේ හොරකම නැවැත්වීම සඳහා රුපියල් 3,000 ක්, 4000 ක් හෝ පඩි ගෙවා ලජ්ජා භය ඇති, පගා නොගන්නා, සොරකම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිලධාරීන් පත් කරන ලෙස මා ඉතා ආදරයෙන්, ගෞරවයෙන් බැගෑපත්ව ඉල්ලා සිටිනවා. මේ හොරකම අපට පෙනෙනවා. අපට මේ ගැන ලැජ්ජයි.

වගා ව්‍යාපාරය සාර්ථක නම් කැපූ හාල් සේරුව නොදෙන්නෙ ඇයි කියා ප්‍රශ්න කරනවා. හාල් සේරු දෙක දෙන කාලයේ අපේ කොස්, දෙල් කුණු වෙලා ගස් පල්ලේ වැටුණු බව තමුන්නාන්සේලා දන්නවා. බත් කියන ජාතිය බඩට මහා ගොඩක් දැම්මට ඒකෙ ඇති ගුණයක් නැහැ. කොස්, දෙල්, බතල ආදියේ තමයි ගුණයක් තියෙන්නේ. දැනට අවුරුදු 3 කට පෙර තිබුණාට වඩා අද අපේ ජාතිය ශක්ති සම්පන්නයි. අද අපේ ජාතියට ලෙඩ අඩුයි. ඒකට හේතුව කොස්, දෙල්, බතල ආදිය හොඳට කෑමයි. ඒක එක කාර ණයක් පමණයි. අනික් කාරණය මේකයි. ඕනෑම දෙයක් අඩු වුණාම තමයි, ඒ දේ නිපදවා ගැනීමට මාර්ග සොයා ගන්නේ. මේ හාල් සේරුවත් කැපුවොත් ගොවිතැන තවත් දියුණු වෙනවා. අපි හැම එකම පිනට දෙනවා. මේ වගේ පිනට හාල් දෙන්නේ ලෝකයේ වෙන කොහේද කියා මා අහන්නට සතුටුයි. මේක වෙස්සන්තර යුගයක් ; බෝධිසත්ව යුගයක්. හැම එකම නිකම් දෙනවා. [බාධා කිරීමක්] මේව හරි යන විට තමුසෙලාට බොහොම අමාරුයි ; බොහොම කැක්කුමයි ; බොහොම රුදවයි. ජාති ද්‍රෝහීන් ; දේශ ද්‍රෝහීන්. රට ජාතිය සුන් කරන දේශද්‍රෝහීන්. මහජනයා රවටා ඡන්දය ලබා ගෙන දැන් මහජන යාගේ මාළු කන්න ලෑස්ති වෙලා විරුද්ධ කම් කරනවා. රටට හානි කරන්න ලෑස්ති වූ හොර යෝධයන් ටික හංග වේවා!

**ආර්. එම්. අප්පුහාමි මයා.** (බණ්ඩාර වෙල)

*(திரு. ஆர். எம். அப்புஹாமி—பண்டார வெல)*

(Mr. R. M. Appuhamy—Bandarawela)

ගරු සභාපතිතුමනි, ආහාර හා කෘෂිකර්ම ඇමති අංශය යටතේ වචන සවල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. පළමුවෙන්ම මා සමුපකාර ව්‍යාපාරය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට බලාපොරොත්තු වෙනවා. සමුපකාර සමිති දිනෙන් දිනම පරිහාණිය කරා ගමන් කරන බව මට පෙනෙනවා. අනික් පළාත්වල මා දන්නේ නැහැ. මගේ කොට්ඨාශයේ නම්, අද ක්‍රියාත්මක වන සමුපකාර සමිති ඇත්තේ 10ක් 15ක් පමණයි. අනික් සමිති තියෙන්නේ ඉතා මත් දුර්වල තත්ත්වයකයි.

මෙම සමුපකාර සමිති දුර්වල තත්ත්වය කට වැටුණේ මොන හේතුවක් නිසාද කියා කල්පනා කර බලන්න ඕනෑ. විවිධ සේවා සමුපකාර සමිති ආරම්භ කළාට පසුව ඒ සමිති මාර්ගයෙන් නොයෙකුත් කටයුතු ආරම්භ කළා. පාරිභෝගික අංශ, ඒ වගේම කෘෂිකර්ම කටයුතු, වෙළඳ ණය ගනුදෙනු, කොන්ත්‍රාත්, ඔය ආදී කරුණු රාශියක් ඒ සමුපකාර සමිති මගින් ආරම්භ කළා. අද අපි දන්නවා තමන්ගේ පාරිභෝගික බඩු භාණ්ඩ ටික ගැනීමට තරම්වත් මුදල් නැති තත්ත්වයට පත් වුණ, ඉතාමත් පහත් තත්ත්වයකට වැටුණු , සමහර සමුපකාර සමිති තිබෙන බව. මා හිතන විධියට ඒ සමුපකාර සමිති පාරිභෝගික වෙළඳ සැල් වශයෙන් පව තින නිසයි, ඒවායේ නඩත්තුව ගෙන යන්නට බැරි තත්ත්වයකට පත් වී තිබෙන්නෙ. ලාභ ලැබෙන අන්දමට, සැහෙන ආදායමක් ලැබෙන විධියට, ඒවා පවත්වා ගෙන යා නොහැක්කේ අවශ්‍ය බඩු භාණ්ඩ නොමැති කම නිසා විය හැකියි. එම වෙළඳ සැල් ඉතාමත් දුර්වල තත්ත් වයකට වැටී තිබෙන්නේ ඒ නිසා විය හැකියි. දවසින් දවසම ඒ සමුපකාර සමිති දුර්වල තත්ත්වයකට පත් වෙමින් යනවා. බොහෝ තැන්වල සමුපකාර සංගම් මාර්ග යෙන් පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීම ටත් සිදු වී තිබෙනවා. මා දන්නවා, බණ්ඩාරවෙල සමුපකාර සමිති සංගමයට ඒ ප්‍රදේශයේ විවිධ සේවා සමුපකාර සමිති ගණනාවක්ම—පාරිභෝගික අංශ ගණනා වක්ම—පවරා දී තිබෙන බව. සමුපකාර සංගමය මගින්ම පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීමට සිදු වී තිබෙනවා. ඒ ඒ වෙළඳ සැල්වල පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීම කරන්නේ ඒ සමුපකාර සමිති සංගමය මගිනුයි. ගොවි ජනතාවගේ යම්කිසි ජීවන තත්ත්වයක්, යම්කිසි දියුණුවක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. අප්පුහාමි මයා.]

කිරීමට මෙම විවිධ සේවා සමුපකාර සමිති මගින් ලොකු සේවයක් වෙන බව නමුන් නාන්සේලාත් පිළිගන්නවා ඇති.

ගරු සභාපතිතුමනි, විවිධ සේවා සමුපකාර සමිති ලංකාවේ පිහිටුවීමට කලින් මේ රටේ හැම ප්‍රදේශයකම වාගේ සමුපකාර ණය දෙන සමිති පිහිටුවා තිබුණා. විවිධ සේවා සමුපකාර සමිති ආරම්භ කිරීමෙන් පසුව, මේ ණය දෙන සමිතිවල ක්‍රියාකාරිත්වය දිනෙන් දිනම හීන වුණා. එසේ වූයේ ඒ ණය පහසුකම් විවිධ සේවා සමුපකාර සමිතිවලින් ලබා ගත හැකි වූ නිසයි. නමුත් අද දෙකම නැති වී තිබෙනවා. විවිධ සේවා සමුපකාර සමිතිත් නැහැ. ණය දෙන සමුපකාර සමිතිත් නැහැ. විවිධ සේවා සමුපකාර සමිති ඉතාමත් පහත් තත්ත්වයකට දුර්වල තත්ත්වයකට වැටී තිබෙනවා.

මහ පළාත විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ පාලනයේ තිබෙන දුර්වලකම් නිසා, වැරදි නිසා, පසුගිය කාලයේදී එහි පාලනය මණ්ඩලයකට පැවරුවා. නමුත් ඒ පාලක මණ්ඩලයේ තිබෙන දුර්වලකම් නිසා, යම් යම් වැරදි නිසා එය විසුරුවා හැර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ වෙනත් මණ්ඩලයක් පත් කළා. මේ මණ්ඩලය ඉතාම හොඳින් වැඩ කරගෙන ගියා. දහස් ගණනින්, මා සිතන විධියට ලක්ෂ ගණනින්, පසුගිය කාලයේ ඇති වුණු අලාභ සියල්ලම මගහරවා ගෙන සෑහෙන දියුණුවක් ඇති කිරීමට ඒ මණ්ඩලයට හැකි වූවා. ඇත්ත වශයෙන්ම, පසුගිය දිනවලදී එම සමුපකාර සමිති සංගමයට සෑහෙන දියුණුවක් ලබන්නට පුළුවන් වුණේ, එය පාලනය කළ පාලක මණ්ඩලයේ දක්ෂකම නිසයි. නමුත් මේ මෑතදී ඒ මණ්ඩලය නැවතත් වෙනස් කර තිබෙනවා. මට දැනගන්නට ලැබුණු අන්දමට ඒ මණ්ඩලයේ සිටි සමහර නිලධාරීන්ට එම මණ්ඩලයෙන් ඉල්ලා අස්වෙන්නය කියා බල කර තිබෙනවා. දෙපාර්තමේන්තුවේ බල කිරීම නිසා ඒ අය තමන්ගේ ඉල්ලා අස්වීම් ඉදිරිපත් කර තිබෙන බව මට දැන ගන්න ලැබුණා. මොන හේතුවක් නිසා ඒ විධියේ බල කිරීම් කළාද කියා මා දන්නේ නැහැ. ඊටපසු අලුතින් නැවත පාලක මණ්ඩලයක් පත් කර තිබෙනවා. ඒ මගින් යම්කිසි දියුණුවක්— වැඩි දියුණුවක්—ඇති වෙනවා නම් අප එයට විරුද්ධ වන්නේ නැහැ; අපි හැකි තරම් සහයෝගය දෙනවා. නමුත් යම් යම් බලපෑම් උඩ මෙවැනි දේ කිරීම සුදුසු නැහැ. මට ආරංචි හැටියට, එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක මහත්මයෙකු විසින් මේ පාලක මණ්ඩලයේ නම් ලැයිස්තුව ඇමතිතුමාටත් දෙපාර්තමේන්තුවටත් ඉදිරිපත් කර තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකයෙකු හැටියට ක්‍රියා කරන ආර්. ඇම්. අප්පුහාමි මහතාලු මෙය කර තිබෙන්නෙ. ඇත්ත වශයෙන්ම මෙය කනගාටුවිය යුතු කාරණයක්. සමුපකාර ව්‍යාපාරය පොදු මහජන ව්‍යාපාරයක්. එම නිසා, එවැනි පාලක මණ්ඩලයකට පත් කරන පුද්ගලයන් අපක්ෂපාතව ක්‍රියා කරන අය වෙන්න ඕනැ. මට දැනගන්න ලැබුණා, ඒ මණ්ඩලයට පත් කළ යුතු සුදුසු අය කවුද කියා සමුපකාර උප කොමසාරිස්වරයා විසින් ඒ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක මහතාගෙන් අසා තිබෙන බව. දේශපාලන පක්ෂයකට සම්බන්ධ, ඒ වාගේම එක පැත්තක් ගන්න, පිරිසක් පත් කෙරෙනවා නම් ඇත්ත වශයෙන්ම එහි වැරදි සහ අයථා ක්‍රියා සිද්ධ වෙනවා. එම නිසා සමුපකාර උප කොමසාරිස්වරයා ඒ විධියට ඇසුවා නම්, ඇත්ත වශයෙන්ම ඒ ගැනත් කනගාටු විය යුතුයි.

සභාපතිතුමනි, උඩ රට ප්‍රදේශයේ බණ්ඩාරවෙල පළාත් එළවළු වගා කරන ප්‍රදේශයක්. එළවළු විශාල වශයෙන් වගා කරන විශාල ගොවි පිරිසක් සිටින ප්‍රදේශයක්. මේ කාරණය මා කීප වතාවක්ම ගරු ඇමතිතුමාට මේ ගරු සභාවේදී ඉදිරිපත් කර තිබෙනවා. අද එළවළු ඇටවල මිල වැඩි වී තිබෙන නිසා ගොවීන්ට විශාල අමාරුවකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. රුපියල් 15 කට තිබුණු බෝංචි ඇට රාත්තලක් අද රුපියල් 24ක් වී තිබෙනවා ඒ විධියට සෑම එළවලු ඇට වර්ගයකම මිල නැග තිබෙන නිසා දුප්පත් ගොවි ජනතාවට තම ගොවිතැන් කටයුතු කරගෙන යාමට අපහසු වී තිබෙනවා. අනික් පැත්තෙන් පෝර මිල ඉහළ නැග තිබෙනවා. කෘමිනාශක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බෙහෙත් ද්‍රව්‍යවල මිල නැග තිබෙනවා. කෘෂිකර්ම උපකරණවල මිල වැඩි වී තිබෙනවා. ඉතින් ගම්බද දුප්පත් ගොවියා තමන්ගේ ජීවනෝපාය සලස්වා ගන්නේ කොහොමද ?

අනික් අතින් එළවලු සාධාරණ මිලකට විකුණා ගන්නට බැහැ. නුවරඑළිය ගරු මන්ත්‍රීතුමාත් (ඩොනල්ඩ් ජේ. රණවීර මයා.) ඒ ගැන සඳහන් කළා. සමහර විට තමන් නිපදවන එළවලුවලට සාධාරණ මිලක් නොලැබෙන නිසා ණය බරින් මිරිකී තම සහල් සලාක පොත් පවා නැති වී යනවා. එම නිසා විශෙෂ යෙන් එළවලු බහුලව ඇති කාලයේදී ඒවා ගබඩාකර තැබීම පිණිස ශීත ගබඩා ඇති කළ යුතු අතර එළවලු හිඟ කාලයට ඒවා බෙදා හැරීමට කටයුතු සලස්වන්න ඕනෑ. එසේ කරන්නේ නම් ගොවීන්ට සාධාරණත්වයක් සිදු වෙනවා ඇති ; එවිට ඔවුන්ගේ එළවලුවලට සැහෙන මිලක් ඔවුන්ට ලැබෙනවා ඇති. එම කාරණය කෙරෙහි රජයේ අවධානය යොමු වෙනවා ඇතැයි මා විශ්වාස කරනවා.

අර්තාපල් ගැනි කියන්නට මා බලාපො රොත්තු වෙන්නෙ නැහැ. ඒ මොකද ? අර්තාපල් ගැන කථා කරනවාට ගරු ඇමති තුමා අකැමැති නිසා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
අකමැත්තක් නැහැ. තමුන්නාන් සේලා කියන දේවල සත්‍යතාවයක් තිබෙන්න ඕනෑ.

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)
මා වැඩි විස්තරයක් ඒ ගැන කියන්න බලාපොරොත්තු වන්නෙ නැති නමුත්, එක් කාරණයක් කියන්නම්. 1964 සිට මේ දක්වා බීජ අර්තාපල් මිල ශත 45 කින් වැඩි වී තිබෙනවා. එහෙත් ගොවියාට සහනයක් ඇති වී නැහැ. අර්තාපල් හොණ්ඩරයක් රුපියල් 45 කට හෝ 50 කටවත් විකුණාගන්නට බැරි වී තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඇයි හුඟක් නිපදවා තිබෙන නිසාද ? තමුන්නාන්සේ කියන විධියට රාත්තල ශත 50 යි. එහෙම නම් නිෂ්පාදනය වැඩි වී තිබෙන්න ඕනෑ.

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)
ඒක නොවෙයි හේතුව. දැන් අල උගුල්ලන කාලය නිසා මිල පහත බැස තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
සමහර අය කියනවා, අල වගාව සම්පූර්ණයෙන්ම විනාශ වී තිබෙනවාය කියා. දැන් තමුන්නාන්සේ කියනවා මිල පහත බැස තිබෙනවාය කියා. ඉතින් හුඟක් තිබෙන්න ඕනෑ.

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)
බීජ අර්තාපල් මිල වැඩි වී තිබෙන නිසා එහි අසාධාරණත්වය ගැනයි මා කියන්නේ. එය වැඩියි ; එය අසාධාරණයි.

අ. භා. 6

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ලැබෙන ආදායම අඩු වී තිබෙනවා කියා තමුන්නාන්සේලා කියන්නේ. එහෙත් අල රාත්තල සත 50 ට බැස තිබෙනවාලු.

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)
වැඩි මිලකට විකුණා ගන්නට බැරි නිසා ගොවීන් අමාරුවට පත් වී සිටිනවා කියන එක පිළිගන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඒ කියන්නේ එහෙනම් වගාව, නැත් නම් නිෂ්පාදනය වැඩියි.

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)
වෙන්න පුළුවන්. වගාව වැඩියි කියා මා පිළිගන්නවා. එහෙත් ගොවියාට තිබෙන අමාරුවයි මා කියන්නේ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඒක තමයි මාත් කිව්වෙ. එහෙත් සමහර මන්ත්‍රීවරුන් කිව්වා වගාව වැඩි වී නැත කියා.

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)
ඊළඟට සුළු තේ වතු හිමියන් ගැන වචනයක් දෙකක් කියන්නට ඕනෑ. සුළු තේ වතු හිමියන් ඉතාමත්ම අමාරු තත්ත්වයකින් ජීවත් වෙනවා කියා මා කියනවා. මෙහිදී තේ ගැන කථා කළ හැම මන්ත්‍රීවරයෙක්මත් ඒ කරුණ ඉදිරිපත් කළා. අද සුළු තේවතු හිමියන්ට තමන්ගේ දළු ටික විකුණා ගන්නට සිදු වී තිබෙන්නේ ඉතාමත්ම අඩු මුදලකටයි. රජයෙන් සහනාධාර ක්‍රමය යටතේ ආධාර මුදලකුත් දෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
එහේ දළු රත්තලක් කීයක් පමණ වෙනවාද ?

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)
සත 13 කට හෝ 14 කට වඩා වෙන්නේ නැහැ.

මට මෙහිදී එක්තරා කරුණක් කියන්නට තිබෙනවා. 1967 අප්‍රේල්වල සිට ඔක්තෝබර් වන තෙක් සුළු තේ වතු හිමියන්ගෙන් තේ දළු එකතු කරන ආර්. එම්. අප්පුහාමි මහතාට ඒ බ්‍රෝකර් කොම්පැනිය—දඹතැනන් පැක්ටරියටයි දළු දෙන්නේ—දඹගොල්ල කියන ලකුණ ඇති තේවලට රුපියල් 32,960.15 ක් ගෙවා තිබෙනවා. ඒ එම මාස කීපය සඳහායි. ඊට පසුව 1968 නොවැම්බර් සිට 1969 ජූලි වන තුරු රුපියල් 10,077.97ක් ගෙවා තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඔය ගණන් ඇත්තද නැත්තද හරිද වැරදිද කියා දන්නේ කොහොමද ?

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)
මේවා මට දැනගන්නට ලැබුණු කරුණුයි. ගරු ඇමතිතුමාට ඒ ගැන බලන්නට පුළුවන් මගේ පැමිණිල්ල මෙයයි; ලැබිය යුතු මුදල් සුළු වතු හිමියන්ට ලැබුණේ නැහැ. ඒ තේ වතු හිමියන්ට දිය යුතු මුදලත්, රජයෙන් දෙන ආධාර මුදලත්, මේ දළු එකතු කරන ආර්. එම්. අප්පුහාමි මහතා නියම අන්දමට ගෙව්වා නැහැ. ඒ නිසා මේ ගැන පරීක්ෂණයක් කර මුදල් ලැබිය යුතු අහිංසක සුළු තේ වතු හිමියන්ට සහනයක් සලසන්නය කියා මා ඉල්ලා සිටිනවා. ඒ මුදල් ඔවුන්ට ලැබෙන්නට සලස්වන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඔය ගණන් හිලව් සත්‍යද කියා මා දන්නේ නැහ.

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)
මේ ගණන් නිවැරදි වෙන්න පුළුවන්. ගරු ඇමතිතුමා පරීක්ෂා කර බැලුවොත් මේ ගණන් නිවැරදි බව ඔප්පු වේවි. කෙසේ හෝ වේවා මේ කරුණ ගැන විශේෂයෙන් සලකා බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දීර්ඝ ලෙස කථා කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මට අයිති වේලාව ඉවර නිසා. මේ කරුණු ගරු ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ලට යොමු කරන හැටියට ඉල්ලමින් මගේ කථාව අවසාන කරනවා.

**ඩී. ඊ. තිලකරත්න මයා.** (රත්ගම)
*(திரு. டீ. ஈ. திலகரத்ன—றத்கம)*
(Mr. D. E. Tillekeratne—Ratgama)

ගරු සභාපතිතුමනි, අපි සන්තෝෂ වෙනවා බණ්ඩාරවෙල ගරු මන්ත්‍රීතුමා (අප්පුහාමි මයා.) අපේ වගා ව්‍යාපාර සාර්ථකයි කියා පිළිගැනීම ගැන. විශේෂයෙන්ම අල වගාව සාර්ථකයි කියා පිළිගැනීම සතුටට හේතුවක්. ඒ ගරු මන්ත්‍රීතුමා මතක් කළා දැන් සත 50 ට අල රාත්තලක් අපට ලබා ගන්නට පුළුවන්ය කියා. එයත් සතුටට කාරණයක්. අපේ වගා ව්‍යාපාරය ගැන මොන විධියට කරුණු දැක්වූවත්, ඒ සම්බන්ධව මේ ගරු සභාවේත් මින් පිටත වේදිකාවලත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් විසින් බොරු ප්‍රචාර ගෙන යන බව රහසක් නොවෙයි. එහෙත් අපේ වගා ව්‍යාපාරය සාර්ථකයි කියා දැන් මුළු ලෝකයම පිළිගෙන ඉවරයි. [බාධාකිරීමක්] තමුන්නාන්සේලා නොපිළිගත්තාට පිළිගත්තා තමුන්නාන්සේලාගේ ලොකු අය සිටිනවා. තමුන්නාන්සේලා නිකම් ළිඳේ සිටින මැඩියන් වගෙයි. මේ ආණ්ඩුව ගෙන යන වගා ව්‍යාපාරයේ සාර්ථකත්වය අද කවුරුනුත් පිළිගෙන ඉවරයි. මා නියෝජනය කරන කොට්ඨාශයට පැමිණ වගා ව්‍යාපාරයේ සාර්ථකත්වය දැකගන්න ලෙස මා සොරනාතොට ගරු මන්ත්‍රීතුමාට (විජේරත්න බණ්ඩා මයා.) ආරාධනා කරනවා. ඇත්තෙන්ම මා නියෝජනය කරන කොට්ඨාශයේ ඒ තරම් වගාවක් කරන්නට පුළුවන්කමක් නැහැ. ඒක මුහුදුබඩ බිම් තීරයක්. මේ ආණ්ඩුව බලයට පත් වන්නට පෙර අක්කර හාර පන් සියයකට වඩා එහි වගා කර නොතිබුණත් අද අක්කර දෙදාහක පමණ වී වගා කර තිබෙනවා. වේරගොඩ, කුලීගොඩ, පතන, මහහැගොඩ, අකුරල, ආදී ගම්වල අක්කර දෙදාහක පමණ වී වගා කර තිබෙනවා. වගාව්‍යාපාරය සාර්ථක බවට මෙයම සාක්ෂියක් නොවෙයිද? ඒ දුෂ්කර පළාත්වලත් සාර්ථක අන්දමින් වගා ව්‍යාපාරයේ යෙදෙන ගොවීන්ට අප යම්කිසි සහනයක් සලසන්නට ඕනෑ. ගරු ඇමතිතුමා සමහර ප්‍රදේශවල රක්ෂණ ක්‍රමයක් ඇතිකර ගොවීන්ට සහනයක් දී තිබෙනවා. අපේ පළාත්වලටත් ඒ රක්ෂණ ක්‍රමය නොයොදවන්නේ ඇයි? දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කය විශේෂයෙන්ම ජල ගැල්මට යට වෙනවා. ඒ වාගේම සමහර කාලවලදී කරදිය ගලාගෙන ඒම නිසා ගොයම් විනාශ වෙනවා. ලොකු මහන්සියකින් වගා ව්‍යාපාරය සාර්ථක කර ගන්නට කටයුතු කරන ඒ පළාතේ ගොවීන්ට රක්ෂණ ක්‍රමයක් මඟින් කිසියම් සහනයක් සැලැස්වීම අවශ්‍යයි. ඒ ගැන ගරු ඇමතිතුමා කල්පනා කර බලනැයි මා බලාපොරොත්තු වෙනවා.

විවිධ සේවා සමුපකාර සමිති ගැන ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් කථා කළා. මාත් ඒ සම්බන්ධයෙන් වචනයක් කියන්නට කැමතියි. මා නියෝජනය කරන කොට්ඨාශයටද අදාළ වන විවිධ සේවා සමුපකාර සමිති සංගමය අනෙකක් නොව අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිති සංගම්යයි. ගරු ඇමතිතුමා මේ සමුපකාර සමිති සංගමය ගැන දන්නවා. මේ සමිතියේ දූෂණ ගැන අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමාත් (වෛද්‍යාචාර්ය සද්ධාසේන) ගරු ඇමතිතුමාට මතක් කර තිබෙනවා. ඒ වාගේම ගරු ඇමතිතුමා ඒ සමිති සංගමය ගැන ක්‍රියා කළ බවත් මා දන්නවා. එහෙත් තවම අපට වුවමනා කරන පරීක්ෂණය පවත්වා නැති බව මතක් කරන්නට ඕනෑ. මේ සමිතිය සම්බන්ධයෙන් තිබෙන එකම වරද නම් මෙහි පාලකයන් මේ රජයට විරුද්ධ අය වීමයි. රජය කඩාකප්පල් කිරීමේ අදහසිනුයි, ඒ අය වැඩ කරගෙන යන්නේ. නියම වේලාවට කුඩා සමිතිවලට බඩු බෙදා දෙන්නේ නැහැ. ඒ වාගේම වුවමනා කරන පාරිභෝගික භාණ්ඩ ඒ සංගමයට ගෙන එන්නේ නැහැ. මේ විධියට රජය පිළිකුල් කිරීමේ අදහසිනුයි, මේ සංගමයේ පාලකයන් ක්‍රියා කරන්නේ. ඒ නිසා මේ සමුපකාර සමිති සංගමය ගැන විශේෂ පරීක්ෂණයක් පවත්වන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඕනෑකමින් ඉල්ලා සිටිනවා. පරීක්ෂණයක් පවත්වා මේ සමිතියේත් සමිති සංගමයේත් දූෂණ නැති කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තිලකරත්න මයා.]

ගරු සභාපතිතුමනි, දැනට විවිධ සේවා සමුපකාර සමිති සංගම් ආදායම් පාලන නිලධාරි කොට්ඨාශ අනුව බෙදා තිබෙනවා. එහෙත් ඡන්ද කොට්ඨාශ අනුව විවිධ සේවා සමුපකාර සමිති සංගම් ඇති කරන්නට අපට පුළුවන්කමක් තිබෙනවා නම්, දැනට වඩා විශාල සේවයක් ඒ ඡන්ද කොට්ඨාශ ඇතුළත කරන්නට පුළුවන් බව මා නොකිවාට ගරු ඇමතිතුමා පිළිගන්නට ඕනෑ. අපේ පළාත්වල විවිධ සේවා සමුපකාර කඩ සමිති පිහිටුවීමට මහජනයා කීප වරක්ම මහන්සි ගත්තා. හාල් සලාක පොත් 500 කට අඩු නම් අලුතෙන් විවිධ සේවා සමුපකාර සමිතියක් පිහිටුවන්නට බැරි යයි නීතියක් පනවා තිබෙනවා. එහෙත් සමහර පළාත්වල හාල් සලාක පොත් හයසීය, හත්සීය එකතු කර ගෙන විවිධ සේවා සමුපකාර සමිති පිහිටුවන්නට ලැස්ති වුණත්, සමුපකාර දෙපාර්තමේන්තුවෙන් ඊට අමාරුකම් පෙන්වා තිබෙනවා. ඒ පාරිභෝගිකයන්ට සමහර අවස්ථාවලදී සැතපුම් දෙක තුන පයින් ගමන් කරන්නට සිද්ධ වෙනවා. හාල් සලාකයත් අනෙක් බඩු ටිකත් ගන්නට ඒ දුප්පත් වැසියන්ට සමහර විට වරුවක් පමණ ගත කරන්නට සිද්ධ වෙනවා. එමනිසා මේ නීතිය ටිකක් ලිහිල් කරන්නට පුළුවන් නම් හොඳ බව කියන්නට ඕනෑ. හාල් සලාක පොත් පන්සියයකටවත් සමිතියක් පිහිටුවන්නට ඉඩ දෙන්නට පුළුවන් නම් ඒ ප්‍රදේශවාසීන්ට විශාල සහනයක් අත් වන බව මා පෙන්වා දෙන්නට සතුටුයි.

මුලින් කීවාක් මෙන්, මගේ ඡන්දදායක කොට්ඨාශයේ වේරගොඩ කුලීගොඩ වෙල් යායේ අස්වැද්දු කොටසෙන් මේ කන්නයේදී හොඳ අස්වැන්නක් ලැබී තිබෙනවා. මීට අවුරුද්දකට පමණ කලින් ආහාර ඇමතිතුමා ඉඩම් ඇමතිතුමාත් සමග මේ වෙල් යාය මුලින්ම අස්වැද්දීමේ උත්සවයට සහභාගි වුණා. මේ වෙල් යායේ අක්කර හත් සියයකින් පමණ මේ කන්නයේ අස්වැන්න ලබා ගත්තා. නමුත් තවත් අක්කර හත් සියයක් වපුරන්නට ඉඩකඩ තිබෙනවා. වේරගොඩ කුලීගොඩ ග්‍රාම සංවර්ධන සමිති දෙකට තමුන්නාන්සේගේ නිලධාරීන්ගෙන් සහයෝගය ලැබුණොත් ඒ අක්කර හත් සියයත් වපුරන්නට පුළුවන් වන බව මා මතක් කරනවා.

තවත් කාරණයක් තිබෙනවා. ඒ ප්‍රදේශයේ ගුණසේකර නම් මිල පාලක පරීක්ෂකවරයෙක් සිටිනවා. ඔහු සෑම දෙපාර්තමේන්තුවටම එපා වූ කෙනෙක්. ඒ මහත්මයාගේ රාජකාරිය කඩවලට ගිහින් තර්ජනය කර පගාව ගැනීමයි. ගාල්ලේ දිසාපතිතුමාට මේ නිලධාරියා සම්බන්ධව මං කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මොහු මුලින් සිටියේ හාල් ගබඩාවෙයි. හාල් ගබඩාවෙන් පැන්නුවාම කෙසේ හෝ දැන් සිටින තැනට රිංගා ගෙන තිබෙනවා. මොහු ප්‍රදේශයේ වෙළඳ සංගම්වලටත් කඩවලටත් ගිහින් නැති හොරකම් ගැන පොත්වල ලියමින් දුප්පත් කුඩා වෙළඳුන්ගෙන් අයුතු විදියට කැත විදියට පගාව ගන්නවාය කියා මට පැමිණිලි ලැබී තිබෙනවා. මේ නිලධාරියා ගැන පරීක්ෂණයක් කරන මෙන් මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ මහත්මයා වෙන ප්‍රදේශයකට මාරු කරන්න. හැබැයි, ඔහුට පරීක්ෂක පදවියක් දෙන්නට එපා. මා ඔහු රැකියාවෙන් අස් කරන්නටය කියන්නේ නැහැ. ලිපිකරුවකු හැටියට හෝ වෙනත් සේවකයකු හැටියට හෝ තමුන්නාන්සේගේම වෙනත් දෙපාර්තමේන්තුවකට මාරු කරන්න. මේ තත්ත්වයෙන්ම මාරු කළොත් ඔහු නැවතත් අයුතු විධියට මුදල් හම්බ කරනවා. මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නට මා අදහස් කරන්නේ නැහැ. තවත් එක කාරණයක් ගැන කියා මගේ කථාව අවසාන කරනවා.

ගොවීන් නිෂ්පාදනය කරන වී කමතේදීම මිලදී ගන්නට ක්‍රමයක් ඇති කළොත් මේ දූෂණ හුඟක් දුරට අඩු කර ගන්නට පුළුවන් වෙනවා. ගොවීන් නිෂ්පාදනය කරන වී පමණක් නොවෙයි, අනෙක් ද්‍රව්‍යත් කෙලින්ම මිලදී ගැනීමට වැඩ පිළිවෙළක් යොදන්නට ඕනෑ. ගොවීන් නිෂ්පාදනය කරන එළවළුවලට අද මොකක්ද වෙන්නෙ? මුදලාලිලා ලොරි අරන් ගිහින් බොහොම ලාභයට ඒ එළවළු ටික අරගෙන වෙළඳ පොළට ගෙනවුත් එකට තුන හතරක් ලබා තබා ගෙන විකුණනවා. ගොවීන් නිෂ්පාදනය කරන එළවලුත් අනෙකුත් කෘෂි ද්‍රව්‍යත් කෙලින්ම රජයෙන් මිලදී ගෙන බෙදා හැරීමට පුළුල් වැඩ පිළිවෙළක් සකස් කළහොත් ගොවීන්ට හොඳ මිලක් ලබා දෙන්නටත් දැනට වඩා ඉතාම අඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මිළකට මේ ද්‍රව්‍ය පාරිභෝගිකයන්ට ලබා ගන්නටත් පුළුවන් වන බව සඳහන් කරන්නට ඕනෑ.

අ. භා. 6.15

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

**අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, உபசபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *took the Chair.*

**දයා ටී. පස්කුවකුවල් මයා.** (මතුගම)
*(திரு. டயஸ் பஸ்குவல்—மத்துகம)*
(Mr. Daya T. Pasqual—Matugama)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මා නියෝජනය කරන ප්‍රදේශයට අදාළව කරුණු ස්වල්පයක් හෙළි කරන්න මා බලාපොරොත්තු වෙනවා. වගා ව්‍යාපාරයේ සාර්ථකත්වය හෝ අසාර්තකත්වය ගැන සටන් කිරීමට නොවෙයි මා උත්සාහ කරන්නේ. වගාව කවුරුන් කළත් කළ යුතුම දෙයක්. ඒ බව අවබෝධ කරගෙන, මගේ ප්‍රදේශයේ වී වගාව පවතින දුර්වල තත්ත්වය ගැන ඇමතිතුමාට කරුණු පැහැදිලි කර දීමටයි මගේ බලාපොරොත්තුව. ගරු සභාපතිතුමනි, කළුතර දිසත්‍රික්කය වී වගාව සම්බන්ධයෙන් සෑහෙන ප්‍රසිද්ධියක් උසුලනවා. ඊට යාබදව ඇති මගේ කොට්ඨාශය පිහිටා තිබෙන්නේ කළුගඟටත් බෙන්තර ගඟටත් අතරයි. බෙන්තර ගඟ දෙබඩ ඇති අක්කර දහස් ගණනක කුඹුරු කරදියෙන් පාළු වී යනවා. කළුගඟ බඩ පහත් බිම් ප්‍රදේශවල ඇති කුඹුරු සුළු ගංවතුරෙන් පවා හානි වෙනවා. ආණ්ඩු ගණනාවක්, සෑහෙන කාල යක් තිස්සේ රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරමින් ඇලවේලි බැන්දත් මෙතෙක් ප්‍රයෝජනයක් සිදු වී නැහැ. මෙ බදු මුදලක් වියදම් කරනවාට වඩා, නවීන විද්‍යාව අනුව නොයෙකුත් පර්යේෂණ කර කරදියෙන් යටවන ප්‍රදේශවලට ගැළපෙන වී වර්ගයක් සොයා ගැනීමට උත්සාහ කළා නම් හොඳ බව පෙන්වා දෙන අතරම මෙතෙක් ඒ සම්බන්ධයෙන් කිසිදු උත්සාහයක් ගෙන නොතිබීම ගැන මා කන ගාටු වෙනවා. ඇත්ත වශයෙන්ම කර දියෙන් යට වන ප්‍රදේශ බේරා ගැනීම අමාරුයි. කරදිය හිස් කිරීම පහසු නැහැ. බෙන්තර ගඟබඩ ප්‍රදේශයක පොම්ප මගින් කරදිය ඉවත් කිරීමට මෙම ආණ්ඩු වත් උත්සාහ කළා. නමුත් එය අත්හදා බැලීම්වලට හෝ උත්සවයකට සීමා වනවා මිස ක්‍රියාත්මක කරන්න පුළුවන් දෙයක් නොවෙයි. කළුගඟ බඩ උඩුගල, ඉඩම් ගොඩ, තෙබුවන, යටවර බියගම, කොවු ලාන, සේරුපිට ආදී ප්‍රදේශවල අස් වැන්න ලබා ගන්නට පෙර දෙතුන් වතා වක් ජලයෙන් යට වෙනවා. තෙබුවන තෝරගල්ල, කොහොලාන, ආදී ප්‍රදේශවල තිබෙන ඇළවලට නවීන ක්‍රමයේ දොරවල් සවි කර දෙන්නට හැකි නම් විශාල ගං වතුරෙන් කෙසේ වෙතත් සුළු ගංවතු රෙන් වන හානිය බොහෝ දුරට වළක්වා ගන්න පුළුවනි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டி. பண்டா)*
(The Hon. M. D. Banda)

වාරිමාර්ග දපාර්තමේන්තුවට නොවෙද අයිති ?

**පස්කුවල් මයා.**
*(திரு. பஸ்குவல்)*
(Mr. Pasqual)

තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ ව්‍යාපාරවලට වතුර සපයන්නට වී තිබෙන්නේ වෙනත් අමාත්‍යාංශයකින්. ගොවි තැන තමුන්නාන්සේට අයිති වුණත් වතුර සපයන්නේ වෙනත්, අංශයකින්. මෙම අංශ දෙක ඒකාබද්ධව කටයුතු කරන්න පිළිවෙළක් මෙතෙක් යොදා ගෙන නැහැ.

වගා ව්‍යාපාරය ගැන යමක් කියන්නට මා අදහස් කරන්නේ නැහැ. එසේ වුණත් කුඹුරු පනතේ තිබෙන්නාවූ දුර්වලකම් නිසා අද ගොවීන්ට සිදු වී ඇති හානිය ගැන සඳහන් කිරීම මගේ යුතුකමක් හැටි යට මා සලකනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පස්කුවල් මයා.]

මා සඳහන් කරන්නට යන මේ කාරණය සම්බන්ධයෙන් මට පෙර කථා කළ මන්ත්‍රීවරුන් දෙතුන්පළක් විසිනුත් යම් යම් අදහස් ප්‍රකාශ කරනු ලැබුවා. මතුගම, ඉද්දගොඩ, ගුරුගල වෙල් යාය, අවුරුදු සිය ගණනක් තිස්සේ අද ගොවීන් වගා කළ අක්කර 50 ක පමණ වපසරියකින් යුත් වෙල් යායක්. කුඹුරු පනත ඉදිරිපත් වූ හැටියේම මායිම් පිරිසිදු කර ආපසු දීම සඳහා ය කියමින්, ප්‍රයෝගකාරී ලෙස ඒ වෙල් යාය කුඹුරු හිමියන් විසින් වෙන්දේසිකාර බ්‍රෝකර්වරුන්ට පැවරුවා. කට්ටි කඩා විකිණීම සඳහා. ඒ අවස්ථාවේදී ඊට විරුද්ධව නැඟුණු මහජන උද්ඝෝෂණය නිසා අද ගොවීන් අතර බෙදා දීම සඳහා එය රජයට පවරා ගත්තා. මේ කට යුතු සියල්ලක් සිදු වුණේ පසුගිය රජය පැවති කාලයේදීයි. එවකටත් කුඹුරු පනතේ යම් යම් අඩුපාඩුකම් තිබුණු නිසා, ඒ කටයුතු සම්පූර්ණ වීම සඳහා කුඹුරු පනත සංශෝධනය කරන තෙක් බලාපොරොත්තු තබන්නට සිදු වුණා.

මේ රජයත් කුඹුරු පනතේ අඩුපාඩුකම් තිබෙනවාය කියමින් ඉන්නවා මිසක්, එය සංශෝධනය කිරීම සඳහා කිසිම පියවරක් ගෙන නැහැ. මා හිතන හැටියට රජය බලාපොරොත්තු වන්නේ, ඒ කුඹුරු රජයට ගෙන ගොවි කාරක සභාවලට පවරා දෙන්නටයි. එවිට ගොවි කාරක සභා යටතේ ගොවිතැන් කරන්නට අද ගොවීන්ට සිදු වෙනවා. අප ඉල්ලා සිටියේ, ඒ කුඹුරු රජයට පවරාගෙන, අවුරුදු විසි ගණනක් ඒ කුඹුරුවල වැඩ කළ අද ගොවීන්ටම ඒවා පවරා දිය යුතුය කියායි. ඒ සඳහා කොටස් වශයෙන් මුදල් ගෙවීමේ පහසුකම් ඔවුන්ට සලසා දෙන්නට පුළුවනි. එහෙත් රජය කියන්නේ, කුඹුරු පනතේ තිබෙන දුර්වලකමක් නිසා එසේ කරන්නට බැරි බවයි. ඒ දුර්වලකම මගහැරවීම සඳහා අවශ්‍ය සංශෝධනය කරනවා නම්, වතු කැබලිකර විකුණන්නා වාගේ ඒ කුඹුරුත් කැබලි කර විකුණන්නට ඒවායේ හිමියන් ගෙන යන ප්‍රයෝගකාරී වැඩ පිළිවෙළ වලක්වන්නට පුළුවන්කම ලැබෙනවා. ඒ කුඹුරු කැබලි කර විකිණීමෙන් අද ගොවීන්ට කිසිම හානියක් වන්නේ නැතැයි කුඹුරු හිමියන් ප්‍රසිද්ධියේම කියා සිටිනවා. තමන්ට වෙනත් රැකියාවක් නැත්නම් අක්කර 5 කට අඩු ප්‍රමාණයක් තබා ගැනීමේ අයිතිය කුඹුරු හිමියන්ට නීතියෙන්ම ලැබී තිබෙනවා. ඒ අනුව අද ගොවීන් ඉවත් කරන්නට පුළුවන්කම ලැබෙනවා. එම නිසා ඒ කුඹුරු කැබලි කර විකුණන්නට ඉඩ හැරීම භයානකයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டி. பண்டா)*
(The Hon. M. D. Banda)

එවැනි ඉල්ලීම් කෙරුණාම එහි සත්‍යාසත්‍යතාව කොමසාරිස්තුමා විසින් පරීක්ෂා කරනු ලැබීමෙන් අනතුරුවයි, එවැනි ඉල්ලීමකට ඉඩ ලැබෙන්නේ. එහෙත් අක්කර 5ක් ලැබෙන්නේ නැහැ. තමන්ගේ පවුලේ උදවිය—

**පස්කුවල් මයා.**
*(திரு. பஸ்குவல்)*
(Mr. Pasqual)

එහෙම තමයි. තමාගේ කුඹුරු විකුණන්නට වුවමනා වුණාම නොයෙකුත් විධියේ ප්‍රයෝග යොදන්නට පුළුවන්කම ලැබෙනවා. වතු කැබලි කර විකිණීම දැනටමත් නීතියෙන් තහනම්. එහෙත් නොයෙකුත් ප්‍රයෝග යොදා නීතියෙන් බේරී වතුත් කැබලි කර විකුණනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டி. பண்டா)*
(The Hon. M. D. Banda)

එය ප්‍රෝඩාවක්.

**පස්කුවල් මයා.**
*(திரு. பஸ்குவல்)*
(Mr. Pasqual)

එම ප්‍රෝඩා නැවැත්වීම සඳහාත්, අද ගොවීන් රැකගැනීම සඳහාත් කුඹුරු පනත වහාම සංශෝධනය කළ යුතුව තිබෙනවා. එය සංශෝධනය කිරීම දැනටමත් ප්‍රමාද වුණා වැඩියි.

ගොවි කාරක සභාවලින් සිදු වන අතපසු වීම්වලටත් සමහර විට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දඬුවම් කරන්නේ විවිධ සේවා සමුපකාර සමිතිවලටයි. වී ගැනීමේදී විවිධ සේවා සමුපකාර සමිති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැඩ කරන්නේ, ඒජන්තවරයෙක් වශයෙනුයි. ගොවි කාරක සභාවලට අය විය යුතු අක්කර බදුත් විවිධ සේවා සමුපකාර සමිති මගින් අය කර දිය යුතු තත්ත්වයක් තිබීම කොයි තරම් අසාධාරණද? ඒසේ අක්කර බදු අය කර දුන්නේ නැතැයි කියමින් මතුගම විවිධ සේවා සමුපකාර සමිතියේ වී ලොරියක් බලහත්කාරයෙන් විකුණා, ගොවිජන සේවා සහකාර කොමසාරිස් ඒ මුදල මතුගම ගොවි කාරක සභාවට පවරා දී තිබෙනවා. උසාවි මාර්ගයෙන් අක්කර බදු අය කර ගැනීමට ගොවි කාරක සභාවලට නීතියෙන් බලය ලැබී තිබෙනවා. එවැනි බලයක් තිබියදීත් ඒ අනුව ක්‍රියා නොකර, මෙසේ විවිධ සේවා සමුපකාර සමිතිවල මුදල් මංකොල්ල කන්නේ කුමක් නිසාදැයි මා ප්‍රශ්න කරනවා. අප ඒ ගැන කොතෙක් විරුද්ධත්වය දැක්වුවත් ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරයා අපේ විරුද්ධත්වයට ඇහුම්කන් දුන්නේ නැහැ. ඒසේ මංකොල්ල කා ගත් ඒ මුදල ආපසු මතුගම විවිධ සේවා සමුපකාර සමිතියට භාර දෙන ලෙස කලුතර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා පවා ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරයාට දන්වා තිබෙනවා. එහෙත් තවමත් ඒ මුදල එම සමිතියට ලැබුණේ නැහැ. සමුපකාර දෙපාර්තමේන්තුවත් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවත් මෙසේ දෙපැත්තට ඇදීම නිසා අහිංසක ගොවි ජනතාව අමාරුවේ වැටෙනවා.

ඒ සමගම කළ යුතු තවත් පැමිණිල්ලක් තිබෙනවා. ගොවිජන සේවා කොමසාරිස්වරයා යටතේ ඇති වී ගබඩාවල සහ පෝර ගබඩාවල කොතෙකුත් අක්‍රමිකතා සිදු වෙනවා. වී ගබඩාවලට වී ගෙන ගියාම ඒවා මැනීම සඳහා බුසල අල්ලන්නේ අඟුරක් දෙකක්වත් පිටතට යන විධියටයි. වී ගෝනි ගිහින් ඇම්මාම, මා කලින් සඳහන් කළ පරිදි පිටතට හැළුණු වී ටිකත් අහුවන සේ වී ගෝනි ඇදගෙන යනවා. ඒ විධියට වී බුසල් සියයක් පමණ එහා මෙහා කරන විට, බුසල් දෙක තුනක්වත් වංචා කර ගැනීමට ඔවුන්ට පුළුවන්කම ලැබෙනවා. ඒවයේ අඩුපාඩුකම් ගැන කියන්නටවත් පුළුවන්කමක් නැහැ. එවිට කම්කරුවන් ලවා තර්ජනය කරවනවා. මේ ගැන අප කොතෙකුත් ගොවිජන සේවා කොමසාරිස්වරයාට කරුණු දක්වා තිබෙනවා. මේ වී ගැනීම ස්ටෝර්කීපර්වරුන්ට නොපවරා විවිධ සේවා සමුපකාර සමිතිවලට පවරන්නට බැරි ඇයි?

ඒ ගබඩාවලට එකතු වන වී, මෝල් හිමි කොන්ත්‍රාත්කාරයන්ට පවරා කියනවා, වී බුසලකින් මෙපමණ හාල් සේරු ගණනක් බලාපොරොත්තු වෙනවාය කියා. විවිධ සේවා සමුපකාර සමිති සංගම්වලට වී මෝල් තබා ගැනීමේ බලය දෙන්නට බැරි මන්දැයි මා අහනවා. අපේ ප්‍රදේශවල දැන් එකම වී මෝලක්වත් නැහැ. එම පළාත්වල උදවියට වී අරගෙන දුරබැහැර ප්‍රදේශ කරා යන්නට සිදු වී තිබෙනවා. එම ප්‍රදේශයේ තිබෙන විවිධ සේවා සමුපකාර සමිතිවලට යථෝක්ත අන්දමේ අවසරයක් දෙනවා නම් එක පැත්තකින් පළාත්වාසීන්ට සහනයක් ලැබෙන අතරම අනික් පැත්තෙන් සැහෙන කොටසකට රැකීරක්ෂා පහසුවත් සැළසෙනවා. වැඩිපුර සහල් ප්‍රමාණයක් ඉතිරි වෙනවානම් එම අංශයෙනුත් ඒ සමුපකාර සමිති සංගම්වලට ලාභයක් අය වෙනවා. ඒ පිළිබඳව කරුණු සොයා බලා ක්‍රියා කරන මෙන් මා ඉල්ලා සිටිනවා. එසේ කළහොත් එම කටයුත්ත නිසියාකාර කරන්නට තරම් ශක්තිය ඇති විවිධ සේවා සමුපකාර සමිති සංගම් මගින් එම වැඩ පිළිවෙළ පටන් ගන්නවා ඇති.

ගරු සභාපතිතුමනි, සමුපකාර සමිති සංගම් දෙක තුනක් ගැන කරුණු ඉදිරිපත් කරන්නට තිබෙනවා. මතුගම විවිධ සේවා සමුපකාර සමිති සංගමය නැතිනම් මතුගම පිහිටි බටහිර පස්යොදුන් කෝරළේ විවිධ සේවා සමුපකාර සංගමය සහ පානදුරේ විවිධ සේවා සමුපකාර සමිති සංගමය, ගැනත්, අගලවත්තේ විවිධ සේවා සමුපකාර සමිති සංගමය ගැනත් මෙම අවස්ථාවෙහිදී කරුණු කිවයුතුව තිබෙනවා. මේ කියන විවිධ සේවා සමිති සංගම් කීපය රජයට පවරා ගෙන දැනට අවුරුදු 4ක් ගත වී තිබෙනවා. කිසිම නීත්‍යානුකූල හේතුවක් නොපෙන්වා මේවා රජයට පවරා ගත් බවයි කියන්නට තිබෙන්නේ. මේවා ආපසු නොපවරන්නේ මන්දැයි මහජනතාව කොතෙක් ප්‍රශ්න කළත් වැඩක් වී නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පස්කුවල් මයා.]

උප කොමසාරිස්තුමාත් දිසාපතිතුමාත් ප්‍රමුඛ පිරිස දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාවෙහිදී මේ කාරණය පිළිබඳව සාකච්ඡා පවත්වා ඒවා ආපසු දෙන්නැයි කීප වතාවක්ම නිර්දේශ කර තිබෙනවා. මේවා බදාගෙන ඉන්නේ මන්දැයි එක් වතාවක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාවෙහිදී විමසූ විට, මතුගම අගලවත්ත සහ පානදුර සී. ආර්. ඩී. මහත්වරුන් තිදෙනාම කියා සිටියේ තමන් කැමැත්තකින් එම කටයුත්ත නොකරන බවයි. "අපි කැමැත්තකින් මෙය කරනවා නොවෙයි; අපි බැරිය කියද්දීත් බලෙන්ම වාගේ අපේ ඇඟපිට දමා තිබෙනවා; මේවා ගැන වැඩ කරන්නට අපට විවේක ඇත්තේත් නැහැ; මේ කරන්නේ වරදක් බව අපි හොඳින්ම දන්නවා; එහෙත් රජයේ ප්‍රතිපත්ති අනුව මේවා අපට පවරා තිබෙන හෙයින් අපට බැරි වගක් කියන්නත් බැහැ" යනාදී පිළිවෙළටයි එදා ඔවුන් කිව්වේ. මේවා වහාම ආපසු දෙන්නැයි උප කොමසාරිස්වරයා නිර්දේශ කර තිබෙනවා. මතුගම විවිධ සේවා සමුපකාර සමිති සංගමය කිසිම පාඩුවක් සිදුවූ නිසා නොවෙයි අල්ලාගෙන සිටින්නේ. පානදුරේ එකත් ඒවගියටයි. ඒ දෙකම අල්ලාගෙන තිබෙන්නේ බලහත්කාරයෙනුයි.

අගලවත්තේ සංගමයේ තත්ත්වය මෙයයි: බුලත්සිංහල සහ අගලවත්ත කියන ආසන දෙකේම සමිති විශාල සංඛ්‍යාවක් ඇති ප්‍රදේශයක් පාලනය වන මෙම සංගමය අද එහෙමපිටින්ම එක මණ්ඩලයකට පවරා තිබෙනවා. බුලත්සිංහල සහ අගලවත්ත කියන ආසන දෙකට වෙනම සංගම් දෙකක් පිහිටුවන්නට බැරි ඇයි? අද තමුන්නාන්සේ පත් කර තිබෙන මණ්ඩලය මගින් එය පවත්වාගෙන යන නමුත් එහි ශුද්ධ පාඩුව ලක්ෂගණනකැයි කියන්නට පුළුවනි. එවැනි තත්ත්වයකින් පාලනය කිරීමේ තේරුම කුමක්දැයි මා අහන්නට කැමතියි. මහජනතාවගේ දේ උදුරාගෙන තමුන්නාන්සේලාගේ මණ්ඩලයක් මගින් පාලනය කරන එක පමණයි සිදු වන්නේ.

මතුගම සංගමයෙහි දැන් පවත්නා තත්ත්වය ගැන මා පුද්ගලික වශයෙන් දන්නවා. හාල් ටික, පිටි ටික, සීනි ටික, උම්බලකඩ ටික සහ මිරිස් ටික බෙදා දෙනවා හැරෙන්නට අනිකුත් ආහාර වර්ග සහ වෙනත් ද්‍රව්‍ය කිසිවක් සාධාරණ මිලකට ලබාගන්නට නොහැකි තත්ත්වයකුයි එහි පැනනැගී තිබෙන්නේ. මේ ගැන මා විටින් විට පුද්ගලිකව පවා පැමිණිලි කර තිබෙනවා. කඩවීදියේ ඇවිද පුද්ගලික තොග වෙළෙන්දන්ගෙන් මෙම සංගමයේ මිලට වඩා අඩු මිලට බඩු ලබාගන්නට අපට හැකි වෙනවා. පුද්ගලික තොග වෙළෙන්දන්ගෙන් නානා අන්දමේ බඩු සංගමයට වඩා අඩු මිලකට ලබාගෙන පළාතේ අනිකුත් සිල්ලර වෙළෙන්දන්ට වඩා අඩුවෙන් විකුණන්නට අපට සිදු වී තිබෙනවා. මේ තත්ත්වය උඩ මෙම කටයුතු කරගෙන යාමේ කිසිම පලක් නොමැති බව කිවයුතුයි. හාල්, පිටි, සීනි සහ මිරිස් යනාදී බඩු හැරෙන්නට අනිකුත් සෑම දෙයක්ම වාගේ එම ස්ථානයට වඩා අඩුවෙන් වෙනත් ස්ථානවලින් ලබා ගත හැකියි. වෙන දෙයක් තබා එක්සයිස් පොත්, කඩදාසි, සව් හාල්, බාර්ලි, රතු ලූනු සහ රට ලූනු පවා අපි ලබා ගන්නේ පිට ස්ථානවලිනුයි. ඒ උදවිය සමහර අවස්ථාවලදී රතු ලූනු ගෙනැවිත් බෙදා දෙන්නේ නැතිව දින තුන හතරේ ගබඩා කර ගෙන සිටින බව පෙනෙනවා. සංගමයට අයත් ලොරි යනාදියෙහි සේවය වැඩියෙන් යොදන බව පෙනෙන්නේ සන්ලයිට් ප්‍රචාරය වැනි දේටයි. ඒ උදවිය සන්ලයිට් ඒජන්සියක් බදාගෙන සිටින නිසා එහි ප්‍රචාරක කටයුතුවලට ලොරි යොදවන හෙයින් කරවල, රතුලූනු සහ රට ලූනු වැනි දේ අනිකුත් සමිතිවලට බෙදා හරින්නේ නැතුව කුණු වෙන්නට දමා තිබෙනවා.

මෙම තත්ත්වය නිසා එහි සමිති ඉතා අසරණ තත්ත්වයකට වැටී තිබෙනවා. එහි සිටින නිලධාරීන් තිදෙනා මහජනයාට ප්‍රශ්න කරන්නට හැකි තත්ත්වයක සිටින උදවිය නොවෙයි. ඒ උදවිය එකිනෙකා හමු වන්නේත් නැහැ. එසේ හෙයින් මෙම වැරදි ගැන පැමිණිලි කරන්නට ක්‍රමයක් ඇත්තේත් නැහැ. එක් වතාවක් සමිති සියල්ලක්ම එකතු වී සංගමයේ පාලක මණ්ඩලයෙන් ඉල්ලීමක් කර සිටියා. ගබඩා හතරක් තිබෙන නිසා එම ගබඩා හතරට සමිති නියෝජිතයන් දෙදෙනා බැගින් පත් කොට අඩුපාඩු පිළිබඳව උපදෙස් දීමේ මණ්ඩලයක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන ලෙසයි. ඔවුන් ඉල්ලා සිටියේ. එහෙත් එම උපදේශක මණ්ඩලය කැදෙව්වේ එක දවසයි. ඉන් පසු අද වන තුරු එය කැදෙව්වේ නැහැ. මෙවැනි වැඩවලින් පෙනෙනවා ඔවුන් කොතෙක් දුරට අත්තනෝමතිකව ක්‍රියා කරනවාද යන්න. එහි වැඩ කටයුතු ඔවුන්ගේම අභිමතය පරිදි මිස ජනතාවගේ යහපත පිණිස සිදු වන්නේ නැහැ. ආහාර පිණිස ගන්නා දේ පමණක් නොවෙයි, අනිකුත් ද්‍රව්‍ය පිළිබඳ තත්ත්වයත් ඒකයි. සිමෙන්ති පවා පිටින් ගෙනැවිත් සංගමයේ ඒවාට වඩා ලාභයට දෙන්නට අපට සිදු වුණා. සංගමයෙන් තොග වෙළඳ මිල ගණන්වලට අනුව සිමෙන්ති කොට්ටයක් දෙන්නේ රුපියල් 13.25 ගණනේයි. එහෙත් කඩ වීදියේ සිමෙන්ති කොට්ටයක් රුපියල් 13යි. කඩ වීදියෙන් සිමෙන්ති මිළ දී ගෙන රු. 13 වත් අඩුවෙන් සිමෙන්ති විකිණීමට අපට පුළුවන් වී තිබෙනවා. හැම ද්‍රව්‍යයක් පිළිබඳවම තත්ත්වය ඒකයි. මේ ගැන කිව්වාම ඔවුන් අප විහිළුවට ලක් කරනවා මිස ඇහුම්කන් දෙන්නෙ නැහැ. මන්ද, රජයේ බලය ඇතිව තමන් සිටින බව ඔවුන් දන්නවා. ඔවුන්ට විරුද්ධව යමක් කිව්වාට එයින් ප්‍රයෝජනයක් නැති බව දැනගෙන ඔවුන් හිතුවක්කාර ලෙස කටයුතු කරන බව මා මතක් කරනවා.

අ. භා. 6.30

විශේෂයෙන් පානදුරේ සහ මතුගම සංගම් දෙකේ පාඩුවක් නොවූ බව මා පෞද්ගලිකව දන්නවා. මේ සමුපකාර සමිති සංගම් දෙක මහජන පහසුව තකා වහාම මහජනයාට පැවරිය යුතු බවට කළුතර දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරක සභාව මගිනුත්, දිසාපතිතුමාගෙනුත්, සමුපකාර උප කොමසාරිස්තුමාගෙනුත් නිර්දේශ ලැබී තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ සමුපකාර සංගමය මගිනුත් මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මහජන මුදලින් මහජනයා විසින් පාලනය කරන සමිති සමාගම් උදුරාගෙන දීර්ඝ කාලයක් රජය මගින් පාලනය කරගෙන යාමේ තේරුමක් නැහැ.

විවිධ සේවා සමුපකාර සමිති බවට පත් වුණායින් පසු කොන්ත්‍රාත් කිරීමට යාම නිසයි මේ හැම සමිතියකටම වගේ පාඩු සිදු වෙන්නට පටන් ගත්තේ. මේ පාඩුව හැම සමිතියකටම වගේ සිදු වුණා. ඊට හේතුව කොන්ත්‍රාත් පිළිබඳව උපදෙස් දීමට දැනීමක් ඇති නිලධාරීන් ඒවායේ නොසිටීමයි. ඒ නිසාම මේ කොන්ත්‍රාත් අත්හරින්නට වුවමනාවකුත් නැහැ; ඒ නිසාම දඩුවම් කිරීම වටින්නෙත් නැහැ. පළාත් පාලන මණ්ඩලවලට නිලධාරීන් පත් කරන්නා වගේ කොන්ත්‍රාත් වැඩ ගැන දැනීම ඇති උදවිය මේ සමුපකාර සමිති සංගම්වලටත් පත් කරන්න ඕනෑ. ඒ අන්දමට සංගම් රැක ගන්නවා හැරෙන්නට ඒවාට දඩුවම් කර ඒ දඩුවමෙන් තෘප්තියට පත් වන්නට හොඳ නැහැ.

මේ සමුපකාර සංගම් තුන රජයේ පාලනයේ පවතින නිසා එයින් පෙළෙන්නේ සාමාන්‍ය පාරිභෝගිකයායි. මිනිසුන් ප්‍රකාශ නොකළාට, මේ සමිති සංගම් රජයේ පාලනය යටතේ පවත්වාගෙන යාමෙන් රජය කරන්නේ ලොකු අපරාධයක් යයි මිනිසුන්ගේ හදවත්වල ලොකු ද්වේෂයක් තිබෙන බව මා පෞද්ගලිකව දන්නවා. කරුණාකර මේ ගැන කල්පනා කර, ඒ සංගම් ආපසු මහජන පාලනයට පත් කිරීමට ක්‍රියා කරනවා ඇතැයි මා විශ්වාස කරනවා.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

යම් යම් හේතු උඩයි, 1964 දී මේක කරල තිබෙන්නෙ.

පස්කුවල් මයා.
(திரு. பஸ்குவல்)
(Mr. Pasqual)

හේතු ප්‍රකාශ කර නැහැ. විශේෂ හේතුව කොන්ත්‍රාත්වලින් සිදුවූ පාඩුවයි. කොන්ත්‍රාත්වලින් හැම සංගමයකටම වාගේ පාඩු සිදු වුණා. දැනට මහජන පාලනයේ තිබෙන කළුතර තොට මුණ සහ හොරණ සංගම්වලත් පාඩු සිදු වුණා. එහෙත් මේ දෙක විතරයි විසුරුවා හැරියේ.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

විසුරුවා හැර තිබෙන්නේ කරුණු කීපයක් උඩයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පැස්කුවල් මයා.**
*(ஜனாப் எம். ஸி. எஸ். ஹமீது)*
(Mr. Pasqual)

වෙන්න ඇති. කරුණු තිබුණු පලියට හැමදාම ඒවා රජයේ පාලනයෙ තබා ගන්නෙ නැහැ. පළාත් පාලන ආයතන වුණත් රජයෙ පාලනයට ගත්තාම යම් කිසි කාලසීමාවක් ඇතුළත ආපසු දෙනවා. සදාකාලිකව ඒ පාලනයේ තබා ගන්නෙ නැහැ. ඇයි මේවා විතරක් එහෙම තබා ගන්නෙ කියායි මා අහන්නේ. කරුණු කොයි තරම් තිබුණත් මහජනයාගේ දේ මහජනයාට ආපසු භාරදීම යුතුකමක්. මා මීට වැඩි කාලයක් ගන්නෙ නැහැ. නියමිත කාලයට වඩා ටිකක් වැඩිපුර කාලයක් ගැනීමට සිදු වීම ගැන මා කන ගාටු වෙනවා.

**පර්සි සමරවීර මයා.** (වැලිමඩ)
*(திரு. பேர்ஸி சமரவீர—வெலிமடை)*
(Mr. Percy Samaraweera—Welimada)

ගරු සභාපතිතුමනි, මේ ශීර්ෂය යටතේ මට වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාවක් නොලැබේදෝ කියා මා බොහොම සිත් වේදනාවකිනුයි හිටියෙ. ඒ මොකද, සියයට සියයක්ම ගොවි ජනතාවක් සිටින වැලිමඩ ආසනයේ මන්ත්‍රීවරයා හැටියට මේ අමාත්‍යාංශය යටතේ වචනයක් දෙකක් ප්‍රකාශ කළේ නැත්නම් මගේ ඡන්දදායකයන් වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකමක් මා පැහැර හැරියා යයි යමෙකු කල්පනා කරන්නට පුළුවනි. ඒ නිසා මට මේ අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වන අතර, යම් යම් ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවලදී ප්‍රකාශ වුණු සමහර අදහස් කිහිපයක් ගැන ප්‍රථමයෙන් මා වචන කිහිපයක් කියන්නට අදහස් කරනවා.

වලපනේ ගරු මන්ත්‍රීවරයා (ටී. බී. එම්. හේරත් මයා.) ගරු ඇමතිතුමා වෙත බරපතල චෝදනාවක් එල්ල කළා. වලපනේ සමුපකාර සමිති සංගමය ගැන තමුන්නාන්සේ ඒ චෝදනාවට ලක් වුණේ වලපනේ සංගමය පිළිබඳ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට තමුන්නාන්සේගේ අමාත්‍යාංශය තවම ඉදිරිපත් නොවූ නිසයි. එසේ නැත්නම්, ඒ කථා කළ ගරු මන්ත්‍රීවරයා හිටපු කාලයේදීම ඒ සංගමයේ රුපියල් දස ලක්ෂයක පමණ මුදල් අඩු වීම් පිළිබඳව ඒ පරීක්ෂණ වාර්තාවෙන්ම මීට කලින් කරුණු ඉදිරිපත් කරන්නට අමාත්‍යාංශයට පුළුවන්කම තිබුණා. වැලිමඩ සමුපකාර සමිති ගැන මෙන්ම වලපනේ සමුපකාර සමිති සංගමය ගැනත්, නුවරඑළියේ සමුපකාර දිසා සංගමය ගැනත් මම දන්නවා. සමහර බඩු බාහිර ආදිය නැතිවීම ගැන ඇති වූ පරීක්ෂණ අවසන් වී දැන් සම්පූර්ණ වාර්තාවක් සකස් කර තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී ඒ ගැනත් කරුණු ඉදිරිපත් කළොත්, මේ මේ හේතු නිසා ප්‍රමාද වුණායයි ගරු ඇමතිතුමා ප්‍රකාශ කළොත්, සුදනන් වශයෙන් මේ ගරු සභාවේ පෙනී සිටිමින් කථා කරන උදවියගේ නියම තතු දැනගන්නට පුළුවන් වේවි. මේවා ප්‍රමාද කරන්නට හේතු වූ කරුණු මොන විධියේ ඒවාදැයි කියා දුන්නොත් නියම තත්ත්වය අවබෝධ කර ගන්නට පුළුවන් වේවි. මතුගම ගරු මන්ත්‍රීතුමා (පැස්කුවල් මයා.) සඳහන් කළ කාරණා දෙක තුනත් ඒ විදියේ ඒවාම විය හැකියි. ඒ නිසා ඔය පරීක්ෂණ වාර්තා ගැන ක්‍රියා කිරීම හැකි පමණින් ඉක්මන් කරන්නැයි මතක් කරන්නට ඕනෑ.

බදුල්ලේ සංගමය ගැන උඩරට ප්‍රදේශ නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලා තුන් දෙනෙක් අදහස් කීපයක් ප්‍රකාශ කළා. දැන් පත් වී සිටින, බදුලු සංගමයේ සභාපතිවරයා ගැන ඒ උදවිය කරුණු ඉදිරිපත් කළා. මෙවැනි කාර්යයක් සඳහා මුළු බදුලු පළාතෙන්ම සොයා ගන්නට පුළුවන් හොඳම පුද්ගලයා ඒ මහත්මයා බව ගරු ඇමතිතුමනි, මම මේ අවස්ථාවේ ඔබතුමාට කියනවා. හොඳම එක්කෙනා තමයි ගරු ඇමතිතුමා සොයා පත් කර ගෙන සිටින්නේ. වියුඩර් විජේසේකර මහත්මයා බදුල්ලේ ප්‍රධාන පුරවැසියා වශයෙන් කාලයක් කටයුතු කළා. ඊයේ පෙරේදා ඔය තුන් හවුල් පාලනයක් තිබුණු කාලයේ බදුලු මහ නගර සභාවේ දූෂිත පාලනය ගැන දවස් තුනක් කථා කළ පුද්ගලයා තමයි, බදුලු සංගමයේ අභිනව සභාපතිවරයා වශයෙන් ගරු ඇමතිතුමා තෝරා පත් කළේ. මම තරයේම කියනවා ඒ මහත්මයා මොනම හේතුවක් නිසාවත් ඔය පදවියෙන් නම් ඉවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නට එපා කියලා. වැඩි කාලයක් ගත වන්නට පෙර වියුඩර් විජේසේකර මහත් මයා ඉතාමත් යහපත් පාලනයක් ගෙනැවිත් දෙනවා ඇතැයි මා තදින්ම විශ්වාස කරනවා.

හාල්සලාක පොත් ගැන මතක් කෙළේ, මා හිතන හැටියට, රත්නොට ගරු මන්ත්‍රීතුමා (යාලේගම මයා.) වෙන්නට ඇති. හාල් සලාක පොත් නැති වුණාම ඒ වෙනුවට අලුතින් පොත් නිකුත් කිරීමේදී ඇති වන ප්‍රමාදය ගැන ඒ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. මේ ගැන මම පුදුම වෙනවා. සමහර ගරු මන්ත්‍රීතුමන්ලා සාමාන්‍ය වැඩ කටයුතු ගැන ඒ තරම් හොඳ අවබෝධයක් නැතිව මේ ගරු සභාවේදී යම් යම් අදහස් ප්‍රකාශ කිරීම ගැන මම පුදුම වෙනවා. හාල් සලාක පොත නැති වුණාය කිව්වාම ඒ වෙනුවට අලුතින් පොතක් නිකුත් කිරීම බොහොම කල්පනාකාරීව කළ යුතු දෙය කැයි මම කියනවා. ගරු ඇමතිතුමාත් එය පිළිගන්නවා. හාල් සලාක පොත නැති වුණා, නැති වුණා කියමින් අලුත් පොත් සඳහා ඉල්ලා සිටින තරම් කඩිනමින් ඒ අයට අලුත් පොත් දෙන්නට විධියක් නැහැ. පොත නැතිවුණාය කිව්වාම, හා බොහොම හොඳයි, එහෙම නම් මේ පොත් තියා ගන්නැයි අලුතින් පොත් නිකුත් කරන්නට දිගට හරහට ලැස්ති වුණොත් එයින් ලොකු අපරාධයක් රටට සිදු වෙනවා. යම්කිසි කාල සීමාවක් ඒ ගැන සොයා බලන්නේ ඉතාම වැදගත් හේතු නිසයි. සමහර විට නැති වුණාය කියන පොතක් නැවත හම්බ වෙන්නට පුළුවනි. එහෙම කාලයක් සොයා නොබලා අලුත් පොත් නිකුත් කිරීමෙන් මා හිතන හැටියට සමහර විට ඒ පොත් ඉදිරිපත් කර වෙනත් පුද්ගලයන් හාල් ගන්නවා වෙන්නට පුළුවනි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
බොහෝ විට.

**සමරවීර මයා.**
*(திரு. சமரவீர)*
(Mr. Samaraweera)
බොහෝ විට නැති වූ පොත්වලින් වෙනත් උදවිය හාල් ලබා ගන්නවා. ලාංකිකයන් පමණක් නොවෙයි, සමහර විට මේවා තමයි ඔය කල්ලතෝනීන් අතටත් යන්නේ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
හුඟක් එහෙම යනවා.

**සමරවීර මයා.**
*(திரு. சமரவீர)*
(Mr. Samaraweera)
ඒ නිසා දැන් අනුගමනය කරන ක්‍රියා මාර්ගය ඉතාමත් හොඳ බව මතක් කරන්නට කැමතියි. හාල් පොතක් නැති වීම නිසා යම් අවස්ථාවක යම් පුද්ගලයෙකුට අමාරුකම් ඇති වෙනවා නම් එවුන්නන්ට විශේෂ බලපත්‍රයක් උඩ හාල් ටිකක් ලබා ගන්නට සැලැස්සීම වෙනම කාරණයක්. එහෙත් සලාක පොත් නිකුත් කිරීම නම් බොහොම කල්පනාකාරීව කළ යුතු දෙයක් බව අවධාරණයෙන්ම මතක් කරන්නට ඕනෑ.

මා විශේෂයෙන් වැලිමඩ ප්‍රදේශය ගැන, එහෙම නැත්නම්, උඩරට ප්‍රදේශය ගැනත් යමක් කියන්නට ඕනෑ. පසුගිය අවුරුදු කීපය තුළ තිබුණාට වඩා ඉතාමත් වැඩි, ඇඩි උනන්දුවකින් දැන් අපේ පළාත් වාසීන් ගොවිතැන් කටයුතුවල යෙදෙනවා. ගරු අගමැතිතුමාගේ මාර්ගෝපදේශකත්වය යටතේ ගරු කෘෂිකර්ම ඇමතිතුමා ප්‍රධාන දෙපාර්තමේන්තු නිලධාරීන්ද ඇතුළු පිරිස මේ තරම් විශාල පරිශ්‍රමයක් දරමින් මේ රටට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය මේ රටේම නිපදවන්නට ඕනෑය යන අවංක පරමාර්ථය උඩ කරගෙන යන මේ සටන ගැන විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට පෙනෙන්නේ නැති එකයි මෙතන තිබෙන ලොකුම පුදුමය. නොපෙනෙනවා නොවෙයි. මේ උදවිය මේ ගරු සභාවට පැමිණ නොයෙක් විධියේ වාර්තා කියවා ඒවා පත්‍රයේ පළ කරවාගෙන, මේ රජය කරන්නේ ලොකු ප්‍රෝඩාවක් බව මහජනයාට ඒත්තු ගැන්වීමට උත්සාහ කරනවා. එහෙත් වචන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සමරවීර මයා.]

පුද්ගලයන් දන්නවා, ඔවුන් මොන ආකාරයටද වවන්නේ කියා. ඒ නිසා වගාව ඒ තරම් දියුණු වී නැත කියා කී පමණින් ඇති වැඩක් වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විරුද්ධ පාර්ශ්වයේ නායිකාව දවසක් මේ ගරු සභාවේදී ප්‍රශ්න කළා, හාල් තියෙනවා නම් ආරෝග්‍යශාලාවේ බත් නොදෙන්නේ ඇයි කියා. ආරෝග්‍යශාලාවල බත් දීම සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යම්කිසි ක්‍රියා මාර්ගයක් අනුගමනය කරනවා. මේ රටේ නිෂ්පාදනය වැඩි වූ බව ඔප්පු කරන්නට වුවමනා නම් තව කරුණු රාශියක් ඉදිරිපත් කරන්නට පුළුවන්.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) හාල් මිල ගැන කථා කළා. මේ රටේ නිෂ්පාදනය කළ හාල් ප්‍රමාණය කොපමණද කියා සොයා ගන්නට පුළුවන් වුණා නම් පිටරටින් ගෙන්වන හාල්වල වටිනාකම කොපමණද කියා ඒ මන්ත්‍රීතුමාට මේ ගරු සභාවට මතක් කරන්නට බැරි වුණේ ඇයි කියා මා අහන්නට කැමතියි. 1965 දී හාල් ටොන් එක ලබා ගත්තේ රන් පවුම් 33 ටයි. එහෙත් අද ලෝක වෙළඳපොළේ හාල් ටොන් එකක මිල රන් පවුම් 77 දක්වා වැඩි වී තිබෙනවා. ලෝකයේ හාල් නිපදවන අනික් රටවල් ලංකාවට හාල් සැපයීමට බැඳීමක් නැති බව පිළිගන්නටත් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් සූදානම් නැහැ. ඒ රටවල් කරන්නේ වෙළඳාමක්. අප ඉල්ලන ගණනට වඩා වැඩි මිලකට වෙන යම් කිසි රටක් ඒ අයගේ හාල් ගන්නට සූදානම් නම් ඒ අය අප ඉල්ලන ගණනට අපට හාල් දෙයිද? අපේ ජයග්‍රහණය මේකයි. අපේ කෘෂිකර්ම ඇමතිතුමා මීට අවුරුදු දෙකකට පෙර දේශදේශාන්තරවල ගිය අවස්ථාවලදී, චීන-ලංකා හාල් ගිවිසුම අත්සන් කරන්නට චීනයට යන්නට සිදු වුණා. එහෙත් මේ වතාවේදී එතුමාට චීනයට යන්නට වුවමනාවක් තිබුණේ නැහැ. චීන දූත පිරිස ලංකාවට ඇවිත් අපේ රබර්වලට සැහෙන මිලක් දීමටත්, සාධාරණ මිලට අපට හාල් සැපයීමටත් අප කී පිළිවෙළට ගිවිසුම අත්සන් කළා. ගරු ඇමතිතුමා ලබා ගත් ලොකුම ජයග්‍රහණය ඒකයි. ගරු ඇමතිතුමා ගත් නට බලාපොරොත්තු වූ හාල් ප්‍රමාණයට වඩා සෑහෙන තරම් ප්‍රමාණයක් අඩුවෙන් ගැනීමට ගිවිසුම් අත්සන් කළ බව අපට පත්‍ර මාර්ගයෙන් දැන ගන්නට ලැබුනා. මේ රටට ගෙන්වන හාල් ප්‍රමාණය අඩු කර මේ රටේ නිෂ්පාදනය කරන ප්‍රමාණය ඒ සඳහා යොදවාගෙන කටයුතු කරන අවස්ථාවකදී වී නිෂ්පාදනය දියුණු වී නැතැයි කිව්වොත් එය විහිළුවක් හැටියටයි, අපට සලකන්නට සිදු වී තිබෙන්නේ. මේ ගැන හොඳින් සොයා බලා හරි වාර්තා සොයා ගන්නට පුළුවන් අය මේ ගරු සභාවට ඇවිත් අදහස් ප්‍රකාශ කරනවා නම් මීට වඩා හොඳයි.

අල වගාව ගැන සඳහන් කරමින් දඹදෙනියේ මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) කිව්වා, එතුමාට බීජ අල ටොන් 5 ක් ලැබුනාය කියා. මීට කලින් කථා කරන්නට මට අවස්ථාව ලැබුනා නම් ඒ ගැන එතුමාගෙන් ප්‍රශ්න කරන්නටයි, මා සිටියේ. දැන් එතුමා මේ සභාවේ නැහැ. බීජ අල සීමිත ප්‍රමාණයක් බෙදා හරින මේ අවස්ථාවේදී එතුමාට බීජ අල ටොන් 5 ක් ලැබුනේ කොයි නිලධාරියාගෙන්ද කියා මා අහන්නට සතුටුයි. ඒ නිසා බීජ අල ටොන් 5 ක් වවා රුපියල් 7,000 ක් පාඩු වුණාය කියා එතුමා කී කථාව විශ්වාස කරන්න පුළුවන්ද කියා මා අහන්නට සතුටුයි. බීජ අල සම්බන්ධව පැමිණිලි රාශියක් ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබුනා. පසුගිය කාලයේදී ඒ ගැන පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණයේදී හෙළි වී තිබෙන්නේ මෙරටට ගෙන්වූ ටොන් 1,200ක් පමණ වූ බීජ අල වලින් ටොන් 40 ක් පමණක් නරක් වී ඇති බවයි. නරක් වෙන්න හේතුවත් ඒ පර්යේෂණ අනුව, පරීක්ෂණ අනුව, සොයා ගෙන තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

**(The Hon. M. D. Banda)**

පළමුවැනි නැවෙන් ගෙන ආවේ ටොන් 600 යි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 6.45

**සමරවීර මයා.**

(திரு. சமரவீர)

(Mr. Samaraweera)

ඔව්. දෙවතාවකට ගෙන ආ බීජ අල ප්‍රමාණයන් යම්කිසි කොටසක් නරක් වුණා. සිංහල අවුරුදු දවසේ ලංකාවට ගෙන ආ බීජ අල දවසක් දෙකක් පමණ වරායේ තිබෙන්න හැරිය නිසා, ඒවා වැසි සුළං ආදියට අසු වුණා. බීජ අල නරක් වීමට හුඟක් දුරට හේතු වූයේ ඒ තත්ත්වයයි. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ මතය එයයි. නමුත් ඔය කියන විධියට, අර්තාපල් වගාව මේ රජය විසින් කඩාකප්පල් කළාය කියන චෝදනාවට රජය ලක් කිරීම වටින්නේ නැහැ. කොයි විධියට කිව්වත් මා ඇමතිතුමාට කියන්න කැමතියි, හෙට අනිද්දා වන විට තමුන්නාන්සේට සමහර විට අර්තාපල්වලට සෑහෙන මිලක් ලබා දීමට අමාරු වෙන්නත් ඉඩ තිබෙනවා. ඒ තරම් විශාල අර්තාපල් තොගයක් කොළඹ ප්‍රදේශයට එන්න පුළුවනි. අර්තාපල් වගාවෙන් සියයට 85 ක පමණ සාර්ථක ප්‍රතිඵල ලබා තිබෙනවා. ඒ නිසා මා තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි, මේ අවස්ථාවේදී ටිකක් සූදානමින් ඉන්නය කියා. අර්තාපල් වගා කරන ගොවියා අධෛර්යවීමත් නොකර ඔවුන්ට යම්කිසි සහනාධාර ක්‍රමයක්වත් දෙන්න කටයුතු සලස්වන්න. තමුන්නාන්සේ සූදානමින් ඉන්න. ඒ තරමටම අර්තාපල් අස්වැන්නක් තිබෙනවා. ඒ හේතුව නිසා අර්තාපල් මිල පහත වැටෙනවාට කිසිම සැකයක් නැහැ. මේ අර්තාපල් බෙදා හැරීම පිණිස යම්කිසි වැඩ පිළිවෙළක් ඇති කර ඒ අනුව කටයුතු නොකළොත් සමහරවිට සහනාධාර ක්‍රමයක් ඇති කරන්නත් සිදු වේවි. නිපදවන අර්තාපල් අල ප්‍රමාණය බෙදා හැරීමට සෑහෙන වැඩ පිළිවෙළක් යොදා ගතහොත් අපට යම්තම්වත් සෑහීමකට පත් වෙන්න පුළුවනි. යම්තම්වත් සතුටු වෙන්න පුළුවනි. මිල පහත වැටීමෙන් අමාරුවට පත් වන, අර්තාපල් වගා කරන ගොවියන්ව එයින් බේරා ගත්තාය කියා අපට සෑහීමට පත් වෙන්න පුළුවනි.

මගේ කතාව අවසන් කරන්නට කලින් තවත් මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. මා මීට කලින් වතාවක් මේ ගරු සභාවේදී මෙය ප්‍රකාශ කර තිබෙනවා. අනික් හැම නිෂ්පාදනයකටම වාගේ, නැත්නම් නිෂ්පාදන ද්‍රව්‍යයන් වැඩිගණනක් සඳහා දැනට සංස්ථා පිහිටුවා තිබෙනවා. ඒ විධියට ඒ නිෂ්පාදනයන් සම්බන්ධයෙන් සංස්ථා පිහිටුවා වැඩ කට යුතු කර ගෙන යන අවධියක මේ එළවලු සම්බන්ධයෙනුත් එවැනි සංස්ථාවක් වැනි දෙයක් පිහිටුවන්නය කියා මා ගරු ඇමතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මේ එළවලුවලට කවදාවත් සාධාරණ මිලක්, ස්ථිර මිලක් ලබා ගන්න බැහැ. මෙයට තිබෙන එකම පිළියම උඩරට ප්‍රදේශයේ වගා කරන එළවලු රට හැම තැනම බෙදා හැරීමට හැකි ක්‍රමයක් ඇති කිරීමයි. එසේ කළොත් සමහර විට එළවලු වවන්නන්ටත්, පාරිභෝගිකයාටත් සේවයක් සැලසෙන්න පුළුවනි.

මීට ප්‍රථම මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු විසින්ම කියන්න යෙදුනා, උඩරට එළවලුවලට නියම මිලක් ලැබෙන්නෙ නැත කියා. සමහර මන්ත්‍රීවරුන් කියන්න යෙදුනා, කොළඹ ප්‍රදේශයේ එළවලු මිල ඉතාමත් අධිකය කියා. ඒ නිසා මේ සඳහා ධීවර සංස්ථාව වැනි සංස්ථාවක් පිහිටුවන්න ඒ ඒ ප්‍රදේශවල අල්ලන මාලු පැය 7 ක් 8 ක් ඇතුළතදී ලංකාව පුරා බෙදා හැරීමට පුළුවන් වී තිබෙන්නා වාගේම එළවලු සංස්ථාවක් ඇති කළහොත් උඩරට ප්‍රදේශයේ නිපදවන එළවලු ලංකාව පුරා බෙදා හරින්න පුළුවන් වේවි. ඒ විධියට මේ එළවලු ලංකාව පුරා බෙදා හැරීමට වැඩ පිළිවෙලක් යොදා ගතහොත්, එළවලු වගා කරන ගොවියන්ට ස්ථිර මිලක් නැත්නම් හොඳ මිලක් ලබා දීමට යම්කිසි පිළියමක් යෙදුවා වෙනවා.

ඒ වගේම සොරනාතොට ගරු මන්ත්‍රීතුමා මතක් නොකළත්, ඒ ආසනය මගේ ආසනයට අල්ලපු ආසනය නිසා, විශේෂයෙන්ම මතක් කළ යුතු කරුණක් තිබෙනවා. සාමාන්‍යයෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ ඉතාමත් සරු වගාවක් හැටියට අන්නාසි වගාව කරගෙන යනවා. මට ආරංචියක් ලැබී තිබෙනවා අන්නාසි ටින් කිරීමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සමරවීර මයා.]

කර්මාන්ත ශාලාවක් ඇති කිරීමට තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුව අදහස් කර තිබෙනවාය කියා. එම ආරංචිය කොයි තරම් දුරට සත්‍යයද කියා මා දන්නේ නැහැ. කෙසේ වුණත් ඉතාමත් වැදගත් කාර්යයක් තමයි, ඒ. ඒ නිසා සෑහෙන තරමකින් අන්නාසි වගාව කරන ඒ ප්‍රදේශයේ අන්නාසි ටින් කිරීමේ නැත්නම් පළතුරු ටින් කිරීමේ කර්මාන්ත ශාලාවක් ඇති කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේ මට පෙරේදා මුණ ගැසුණ වෙලාවේ—මා ඒ කාරණය මේ ගරු සභාවේදී මතක් කරන්න කැමතියි—සඳහන් වුණ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානය පිළිබඳ වැඩ පිළිවෙළ ගැන තමුන්නාන්සේ ස්ථිරව කල්පනා කර ඇති. අද කිරි මණ්ඩලය කරගෙන යන ඒ වැදගත් වැඩපිළිවෙළ අනුව, මා හිතනවා, සාර්ථක ප්‍රතිඵල ලබාගන්නට පුළුවන් වේවි, ඒ ආකාරයට කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන ඇති කර කිරි මණ්ඩලයට උදව් කිරීමෙන්.

මා විසින් ඉදිරිපත් කළ කරුණු සියල්ලම කෙරෙහි තමුන්නාන්සේගේ අවධානය යොමු වෙනවා ඇතැයි මා විශ්වාස කරනවා.

**වී. ධර්මලින්ගම් මයා.** (උඩුවිල්)
*(திரு. வி. தர்மலிங்கம்—உடுவில்)*
(Mr. V. Dharmalingam—Uduvil)

கௌரவ அக்கிராசனர் அவர்களே, விவசாய, உணவு அமைச்சருடைய மானிய விவாதத்தில் சில வார்த்தைகள் பேசுவதற்கு எனக்கு இடம் தந்தமைக்காக நான் முதற்கண் உங்களுக்கு நன்றிகூற விரும்புகிறேன். இலங்கை ஒரு விவசாய நாடு என்பதில் நாம் பெருமை அடைகிறோம். இலங்கையின் விவசாயத்தை நாம் இருவகையாகப் பிரிக்க முடியும். வெளிநாட்டுச் செலாவணியை எங்களுக்குத் தேடித்தரும் தேயிலை, இறப்பர், தென்னை போன்றவை இலங்கையின் ஒரு பகுதி விவசாயம்; மற்றப் பகுதி நமது உணவு உற்பத்திப் பொருட்களுடன் சம்பந்தப்பட்டதாகும்.

முதலில், நான் இங்கே தென்னைச் செய்கையைப் பற்றி இரண்டொரு குறிப்புக்கள் கூற விரும்புகிறேன். இன்று தேயிலை, இறப்பர் செய்கைக்காக அரசாங்கம் போதிய உதவிகளைச் செய்கின்றது. பல்வேறு துறைகளில் பல்வேறு வழிகளில் தேயிலை, இறப்பர் தோட்டச் சொந்தக்காரர்களுக்கு அரசாங்கம் உதவி செய்து வருகின்றது. அதாவது, தேயிலை, இறப்பர் செய்கைகளுக்கு அரசாங்கம் ஊக்கம் அளிக்கின்றது. ஆனால், தென்னைச் செய்கையைப் பொறுத்த அளவில் அரசாங்கம் அவ்வளவு தூரம் உதவவில்லை. 1965 ஆம் ஆண்டு இக் கௌரவ சபையிலே வரவுசெலவுத் திட்ட விவாதத்தில் கௌரவ அமைச்சர் பேசுகையில் "தென்னைச் செய்கைக்குப் போதிய உதவி செய்யப்படவில்லை என்பதை ஏற்றுக் கொள்ளுகிறேன். தென்னைச் செய்கைக்கு அதிக உதவியை அளிப்பதற்காக ஒரு திட்டத்தைத் தயாரித்து அமைச்சரவைக்கு சமர்ப்பித்து இருக்கிறேன். அமைச்சரவையினர் அதையிட்டு நடவடிக்கைகள் எடுப்பார்கள் என்று நம்புகிறேன்" என்று கூறினார். ஆனால் அரசாங்கம் தென்னைச் செய்கைக்காக 1965 ஆம் ஆண்டிற்கு முன்பிருந்ததிலும் பார்க்க எதையும் கூடுதலாக இதுவரை செய்யவில்லை என்பதைச் சுட்டிக்காட்ட விரும்புகிறேன்.

தற்பொழுது தென்னைக்குப் பசளையிட மானியம் அளிக்கப்படுகின்றது. இருபது ஏக்கருக்குக் குறைந்த செய்கையாளர்களுக்கு ஐம்பது சதவிகிதமும் மற்றைய செய்கையாளர்களுக்கு முப்பத்துமூன்று சதவிகிதமும் பசளைக் கொள்வனவைப் பொறுத்த அளவில் மானியமாக வழங்கப்படுகின்றது. தென்னை பயிரிடுவதற்குச் சிறு கன்றுகளை ஒன்று முப்பத்தைந்து சதவீதமும் வாங்கக்கூடியதாக இருக்கின்றது. இவற்றைவிட தென்னைச் செய்கைக்காக எந்தவிதமான உதவியையும் அரசாங்கம் செய்யவில்லை என்பதைச் சுட்டிக் காட்டி இவ்விடயத்தில் அதிக உதவிகள் வழங்கப்பட வேண்டுமென்று வற்புறுத்திக் கேட்டுக் கொள்ளுகிறேன்.

யாழ்ப்பாணத்தில் உணவு உற்பத்தியைப் பொறுத்த அளவில் மிகத் தடையாக இருப்பது நீர் வசதி இல்லாக் குறைதான். யாழ்ப்பாணம் நதிகளோ வாவிகளோ நீர்ப்பாசனத்திற்கான குளங்களோ இல்லாத ஒரு பகுதியாகும். இன்றைக்கு யாழ்ப்பாணத்தில் உணவு உற்பத்திக்கு நிலத்துக்குக்கீழ் இருக்கும் தண்ணீரைக் கொண்டே விவசாயம் செய்ய வேண்டி இருக்கின்றது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இஸ்ரேலிய அறிஞர்கள் சில மாதங்களுக்கு முன் இங்கே வந்து ஆராய்ச்சி செய்தபொழுது இன்னும் சில ஆண்டுகளிலே நிலத்துக்குள்ளிருக்கும் தண்ணீர் வரண்டு யாழ்ப்பாணம் ஒரு வேளை வனுந்தரமாக மாறினாலும் மாறிவிடும் என்று கூறினார்கள். ஆதலால் யாழ்ப்பாணத்திலே பெய்யும் மழைநீரை நாம் பேணிக் காக்க வேண்டும். பெய்கின்ற மழைநீர் வீணுகக் கடலுக்கு ஓடிச் செல்லக் கூடாது என்பதை அரசாங்கம் உணர வேண்டும். யாழ்ப்பாணத்திலே வழுக்கியாறு என்று ஒரு வாய்க்கால் இருக்கிறது. அந்த வாய்க்கால் ஏழு குளங்களைத் தொடுத்திருக்கிறது. அந்த வாய்க்கால் இன்று யாழ்ப்பாணத்திலே வலிகாமம் வடக்கு, வலிகாமம் மேற்கு பகுதிகளில் பெய்யும் மழை நீரைக் கடலுக்குக் கொண்டு போக உதவுகிறதே தவிர, அந்த நீரைப் பேணிக் காப்பதற்கு உதவவில்லை.

1966 ஆம் ஆண்டு இந்த அரசாங்கம் தமது தொகுதியின் அபிவிருத்திக்காக குறுகிய காலத்தில் செய்யக்கூடிய ஒரு திட்டத்தைத் தயாரித்துத் தரும்படி அரசாங்கப் பாராளுமன்றக் குழுவில் இருக்கும் ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினரையும் கேட்டது. நான் அறிந்த வரையில் அன்றிருந்த எல்லாப் பாராளுமன்ற அரசாங்கக் குழுவைச் சேர்ந்த எல்லாப் பாராளுமன்ற உறுப்பினர்களும் அப்படியொரு ஏழு அம்சத் திட்டத்தை தயாரித்துக் கொடுத்தார்கள். இன்னும் அந்தத் திட்டம் பயன்படுத்தப்படவில்லை என்பதை கௌரவ அமைச்சரவர்களுக்கு அறிவிக்க விரும்புகிறேன். இப்படியாகக் குறுகிய காலத் திட்டமொன்றைச் சமர்ப்பிக்கும்படி பாராளுமன்ற உறுப்பினர்களைக் கேட்டது கௌரவ அமைச்சரவர்களுக்குத் தெரியுமோ தெரியாதோ என எனக்குத் தெரியாது. பாராளுமன்ற அரசாங்கக் குழுவைச் சேர்ந்த எல்லாப் பாராளுமன்ற உறுப்பினர்களும் தத்தமது திட்டங்களைச் சமர்ப்பித்தார்கள். அவை ஒன்றும் இதுவரை நிறைவேற்றப்படவில்லை. உடுவில் தொகுதியைப் பொறுத்த வரையில் நானும் ஒரு திட்டத்தைச் சமர்ப்பித்தேன். வழுக்கியாறு எனப்படும் வாய்க்காலினால் இணைக்கப்படுகின்ற ஏழு குளங்களையும் பதித்து, அதன் மூலம் வலிகாமம் வடக்கு, வலிகாமம் மேற்கு பகுதிகளில் பெய்யும் மழை நீரைப் பேணிக் காக்க வேண்டும் என்று ஒரு திட்டத்தை நான் சமர்ப்பித்தேன். அவ்விதம் செய்தால் நிலத்தின் கீழிருக்கும் நீர் விரைவில் வற்றிவிட முடியாது என்பதால் இதற்கு முதலிடம் கொடுத்தேன். அவ்விதம் ஏழு குளங்களையும் பதித்து, வழுக்கியாற்றைத் திருத்தி அமைத்தால் தை, மாசி, பங்குனி மாதங்களில்—மழையில்லாத நேரங்களில்—வழுக்கியாற்றுக்கு அருகில் இருக்கும் நெல் வயல்களுக்கு நீர்ப்பாய்ச்சுவது மாத்திரமன்றி வலிகாமம் வடக்கு, வலிகாமம் மேற்குப் பகுதிகளில் மழை நீர் பேணிக் காக்கப்படுவதனால் நிலத்தின் கீழிருக்கும் நீர் வற்றவிடாமல் இருப்பதற்கு உதவுவதும் ஆகும் என்பதை அறிய வேண்டும். ஆகையால், இது ஒரு முக்கியமான திட்டமாகும். இத் திட்டத்தைக் கூடிய விரைவில் நிறைவேற்றுமாறு கௌரவ அமைச்சரவர்களைக் கேட்டுக் கொள்கிறேன். இத் திட்டத்தை நிறைவேற்றுவதனால், இஸ்ரேல் அறிஞர்கள் கூறியது போல யாழ்ப்பாணக் குடாநாட்டை வனுந்தரமாகாமல் பாதுகாப்பதுமாகும் என்பதையும் குறிப்பிட விரும்புகிறேன்.

இன்னும் ஒரு விஷயத்தைக் கௌரவ அமைச்சருடைய கவனத்துக்குக் கொண்டு வர விரும்புகிறேன். இப்பொழுது நெல் உற்பத்தி செய்பவர்களுக்கு அரசாங்கம் கடன் கொடுத்து வருகிறது. கடன் பெற விரும்பிய கமக்காரர்கள் தங்கள் கூப்பன் புத்தகங்களை அடகாக வைத்துத்தான் அந்தக் கடனைப் பெற்றிருக்கிறார்கள். சென்ற ஆண்டு யாழ்ப்பாணத்திலே மழையில்லாத காரணத்தால் நெல் உற்பத்தி செய்ய முடியாமல் போனது அரசாங்கத்துக்குத் தெரியுமென நினைக்கின்றேன். முக்கியமாக தென்மராட்சிப் பகுதியிலும் என்னுடைய தொகுதியிலும் இன்னும் சில பகுதிகளிலும் எத்தனையோ பேர் கடன் வாங்கி, நேரத்துக்கு அந்தக் கடனைத் திருப்பிக் கொடுக்க முடியாமற் போய்விட்டது. அந்தக் கடனை நேரத்துக்குத் திருப்பிக் கொடுக்க முடியாதென்று அவர்கள் சம்பந்தப்பட்ட உத்தியோகத்தர்களுக்கு நேரகாலத்தோடே அறிவித்திருந்தார்கள். உதாரணமாக, “நாங்கள் வாங்கிய கடனை நேரத்துக்குத் திருப்பிக் கொடுக்க முடியாதிருக்கின்றது; மழையில்லாத காரணத்தால் இந்த முறை நெல் உற்பத்தி சரியாக இருக்கவில்லை; ஆதலால், அந்த வயல்களை வந்து பார்வையிடுங்கள்” என்று அந்தக் கமக்காரர்கள், Koyilakandy Cultivation Committee, Mattuvil South Cultivation Committee ஆகியவை ஊடாக சம்பந்தப்பட்ட உத்தியோகத்தர்களுக்குக்



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මලිංගම් මයා.]

கூறியிருந்தார்கள். அப்படிக் கூறியிருந்தும் அந்த உத்தியோகத்தர்கள் அந்த நெற்காணிகளைப் போய்ப் பார்வையிடவில்லை. அதனால் அந்தக் கமக்காரர்களுக்குக் கடனைக் கட்ட நேரம் கொடுக்க மறுத்துவிட்டார்கள். இது கமக்காரர்களின் குற்றமல்ல. உத்தியோகத்தர்களுக்கு நேரகாலத்தோடு அறிவித்திருந்தும் நேரத்துக்கு அந்தக் காணிகளை அவர்கள் பார்வையிடாத காரணத்தால் அந்தச் சலுகை மறுக்கப்பட்டது. இதற்குக் கமக்காரர்களைக் குற்றம் கூற முடியாது. அந்த உத்தியோகத்தர்கள் நேரத்துக்கு நடவடிக்கை எடுக்காத காரணத்தால் அந்தச் சலுகை மறுக்கப்பட்டது. அதனால் கமக்காரர்களுக்குப் பெரும் கஷ்டம் ஏற்பட்டதோடு, அவர்கள் தங்கள் கடனையும் கொடுக்கவேண்டியிருந்தது. அரசாங்கம் சலுகை கொடுத்தும் அந்தச் சலுகை அந்தக் கமக்காரர்களுக்குக் கிடைக்காமல் போய்விட்டது. ஆகவே, இப்படியான தவறுகள் மீண்டும் நடக்காமல் பார்த்துக் கொள்வது அமைச்சர் அவர்களின் கடமையாகும்.

அ. நா. 7 ,

உணவு உற்பத்திக்காக பலருக்கு அரசாங்கம் ஜீப், மினிமோக் போன்ற வாகனங்களைக் கொடுக்க அனுமதியளித்தது. ஆனால், இன்று அந்த வாகனங்களைப் பெற்றவர்கள் எலோரும் உணவு உற்பத்திக்காகத்தான், அல்லது தங்கள் கமத்தை—தங்கள் நிலங்களை—பார்வையிடுவதற்காகத்தான் அந்த வாகனங்களைப் பாவிக்கின்றார்களாவென்று அரசாங்கம் அவதானிக்க வேண்டும். கௌரவ தொம்பே பிரதிநிதி (திரு. டயஸ் பண்டாரநாயக்க) போன்றவர்கள் சிலவேளை குருநாகல் 'கோட்டு' க்கு அந்த வாகனத்திலே போகக் கூடும். ஆனால், ஓரளவு பால் உற்பத்திக்காக—தம்முடைய கமத்தைக் கவனிப்பதற்காக—அவர் அதனைப் பாவிக்கின்றார். எனினும் 25 ஸ்ரீ 7937 என்னும் இலக்கம் கொண்ட வாகனம் குருநாகலில் உணவு உற்பத்திக்காகக் கொடுக்கப்பட்டது. அந்த வாகனத்தின் சொந்தக்காரர் கௌரவ அமைச்சரின் நண்பரும் என்னுடைய நண்பருமான மாஜி அங்கத்தவர் திருவாளர் வீ. குமாரசுவாமி என்பவர். இந்த வாகனம் உணவு உற்பத்திக்காகப் பாவிக்கக் கொடுக்கப்பட்டது. ஆனால், சென்ற மூன்று, நான்கு மாதங்களாக சாவகச்சேரியில் அந்த வாகனம் காணப்படுகின்றது. அதை அவர் என்ன உற்பத்தி செய்கின்றாரோ எனக்குத் தெரியாது. இவ்விதம் இந்த வாகனங்களை வேறு விஷயங்களுக்காகப் பாவிப்பதற்கு அரசாங்கம் அனுமதித்திருக்கின்றதா என்பதைத் தான் நான் கேட்க விரும்புகிறேன். ஓர் அபேட்சகருக்கு இப்படி வாகனங்களைக் கொடுத்து தமக்கு விரும்பியபடி தமது தேர்தல் விஷயங்களுக்காக அவற்றைப் பாவிக்க முடியுமென்றால் குறை சொல்லவில்லை. அவ்விதமாயின் மற்றவர்களுக்கும் இப்படியான வாகனங்களைக் கொடுத்து உதவ வேண்டுமென்றுதான் இந்த அரசாங்கத்தைக் கேட்கின்றேன்.

இந்த அரசாங்கம் மக்களுக்கு இலவசமாக அரிசி விநியோகம் செய்கின்றதென்று பெருமைப்படுகின்றது. இந்த நேரத்திலே, எனது தொகுதியிலே கூப்பனுக்கு வழங்கப்பட்ட அரிசியில் இரு சாம்பிள்களை நான் என் கையில் வைத்திருக்கிறேன். இதைக் கௌரவ அமைச்சரவர்கள் பார்க்கவேண்டுமென்று கேட்டுக்கொள்ளுகின்றேன். ஆனைக்கோட்டை மக்களுக்கும் சுன்னாகை மக்களுக்கும் இந்த அரிசி விநியோகிக்கப்பட்டது. எந்த நாட்டிலிருந்து இந்த அரிசி இறக்குமதி செய்யப்பட்டதோ எனக்குத் தெரியாது. ஆனால், அந்த நாட்டிலேயுள்ள மக்கள் இதை உண்ணமுடியாத காரணத்தினாலேதான் இங்கே அனுப்பினார்களோ என்ற சந்தேகம்தான் எங்களுக்கு எழுகிறது. இதை நீங்கள் பார்வையிட்டால் நீங்களே அறிந்துகொள்ளக்கூடியதாக இருக்கும். ஆகவே, இப்படிப்பட்ட அரிசியை விநியோகித்துப் பெருமைப்படுவதில் பிரயோசனமில்லை. அரிசியை விநியோகிப்பதாகவிருந்தால் அது மக்களால் உண்ணக்கூடியதாக விருந்தால்தான் அதனால் பலன் கிடைக்கும்.

அடுத்ததாக, சில மாதங்களுக்கு முன்னர், யாழ்ப்பாணத்திலேயிருக்கின்ற சிறுபான்மையினத்தைச் சேர்ந்த சில பிள்ளைகளை—அப்படிப்பட்ட பிள்ளைகள் அங்கே ஒதுக்கப்படுகிறார்கள், அடக்கப்படுகிறார்கள் என்ற காரணத்தைக்காட்டி, அவர்களுக்கு நல்ல இடம் கொடுக்க வேண்டும், படிப்பு வசதிகள் செய்து கொடுக்கவேண்டுமென்று கூறி—சில பௌத்த பெரியார்கள் அங்கிருந்து மேளதாளங்களோடு மாத்தறை, காலி போன்ற இடங்களுக்கு அழைத்துச் சென்றார்கள். அவ்வாறு கொண்டு சென்ற சிலரைச் சிங்களப் பாடசாலைகளிலே அனுமதித்தார்கள். அனுமதிக்கப்பட்ட சில

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

நாட்களுக்கிடையில் அங்கிருந்து திரும்பி வந்த சிலர் தாங்கள் அங்கு பட்ட கஷ்டங்களைப் பற்றி எனக்குத் தெரிவித்தார்கள். 100 மாணவர்கள் இப்படியாகக் காலிக்கும் மாத்தறைக்கும் கொண்டு செல்லப்பட்டார்கள். இன்று ஒருவராவது அங்கில்லை. எல்லோரும் திரும்பி வந்துவிட்டார்கள். மாத்தறைக்குக் கொண்டு செல்லப்பட்ட ஸ்ரீ ஜெயகாந்தன் என்ற ஒருவர் மீண்டும் யாழ்பாணத்துக்குத் திரும்பி வந்து தாம் பட்ட கஷ்டங்களைப் பற்றி எனக்குக் கடிதமூலம் எழுதியிருந்தார். அவர் படித்த பாடசாலை மாத்தறை ஸ்ரீ மங்கள வித்தியாசாலையாகும். அங்கே அவர் மட்டுமல்ல இன்னும் ஐந்து பேர் மிக மோசமாக இம்சைப்படுத்தப்பட்டதுமன்றி அவர்கள் அங்கு இருக்கவும் முடியாதிருந்த காரணத்தால் இரவோடிரவாக அந்த இடத்திலிருந்து எவருக்கும் தெரியாமல் ஓடிவந்துவிட்டார்கள். அவர்கள் தங்கள் கூப்பன் புத்தகங்களையும் விட்டுவிட்டு வந்துவிட்டார்கள். அவற்றைத் திருப்பித்தாருங்கள் என்று கேட்டுங்கூட அக்கூப்பன் புத்தகங்கள் திருப்பிக் கொடுக்கப்படவில்லை. அந்தக் கூப்பன் புத்தகங்களை அந்தப் பாடசாலை அதிகாரிகள் எவ்வாறு பாவிக்கிறார்களோ எனக்குத் தெரியாது. ஆகையினாலே, இதுபற்றிக் கௌரவ அமைச்சரவர்கள் ஒரு விசாரணை நடாத்தி, அந்தக் கூப்பன் புத்தகங்களை அப்பாடசாலையிலிருந்து பெற்று, அவற்றை உரியவர்களுக்குக் கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகின்றேன்.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
What is the school ?

**ධර්මලින්ගම් මයා.**
*(திரு. தர்மலிங்கம்)*
(Mr. Dharmalingam)
Sri Mangala Vidyalaya, Matara. Some of these boys were taken to that school. They were treated so badly that they ran away from the place, leaving their ration books behind. Although later they asked for their ration books, these have not been returned. We want to know what has happened to the ration books, whether they are being used by—[*Interruption*].

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
Will the hon. Member give the names and the numbers of the ration books ?

**ධර්මලින්ගම් මයා.**
*(திரு. தர்மலிங்கம்)*
(Mr. Dharmalingam)
I shall do that.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
உங்களுக்கு நேரம் முடிந்துவிட்டது.

**ධර්මලින්ගම් මයා.**
*(திரு. தர்மலிங்கம்)*
(Mr. Dharmalingam)
நான் இத்துடன் எனது உரையை முடித்துக் கொள்ளுகிறேன்.

**එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා. (පොතුවිල්)**
*(ஜனாப் எம். ஏ. அப்துல் மஜீது—பொத்துவில்)*
(Mr. M. A. Abdul Majeed—Pottuvil)
Mr. Chairman, the Amparai District is the second largest paddy producing district in this country ; it also comes second in regard to the amount of paddy purchased under the G.P.S. But the way this district is serviced by the departments under the Minister makes us feel that we are being treated in a stepmotherly way. The Amparai District has nearly 182 private mills, the biggest government rice mill with a maximum capacity of 70,000 bushels per month. 18 G.P.S. stores, 185 M.P.C.S. societies, and a number of minor irrigation works. There is also the work connected with crop insurance and the implementation of the Paddy Lands Act. There is only one assistant commissioner of agrarian services to attend to all matters arising out of all these numerous activities. But I must say that every assistant commissioner who worked there did his best under very trying conditions, and I think that each one


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.]

of them deserves a special commendation for the manner in which they attended to all those duties.

I find that smaller districts where paddy production is much less have been given two or three assistant commissioners. The Amparai District which is the second largest paddy producing district has only one assistant commissioner. It has over 6,000 acres of paddy land. For the last two years the cultivators have been trying to form cultivation committees, but they have still not been able to do so. I am not blaming the assistant commissioenr: he just does not have the time. I would urge the Hon. Minister —I have written to him a number of times; I met the commissioner once or twice—that the Amparai District be properly serviced. I do hope that he will see to it. After all, we tell the people that we are giving priority to food production; we must live up to what we say.

Next, I would like to speak a few words about the co-operative movement. I am very happy that the Hon. Minister has devised a new scheme to eradicate corruption in the co-operative movement. I believe there are two assistant commissioners of co-operative development working in our area, one concentrating on co-operative development, and the other on audit matters. That is a very good step. I believe this has been started as a trial; but I am of the view that this should be extended to other areas as well because most co-operative societies fail through lack of supervision. I have repeatedly written to the commissioner and also to the Hon. Minister that strict supervision is very vital in the Kalmunai A.C.C.D.'s Division because that is an area in which the societies have not lived up to expectations. The Kalmunai A.C.C.D's office is under-staffed. I do hope the Hon. Minister and his officials will take note of this and see that the Kalmunai A.C.C.D's office is given adequate staff, which will enable them to exercise the necessary supervision.

Then, Sir, I would like to say a few words regarding the activities of the Milk Board. I should like to congratulate the Government because for the first time a systematic and serious effort has been made in the sphere of animal husbandry in this country.

The Milk Board has started work in a big way in the Amparai District. I believe they have started collecting centres at Amparai, Irrakkamam, Kanchikudichcha-aru, and various other places.

The cattle population in each of the D.R.O's divisions in the Amparai District is as follows: In the Panama D.R.O's division you get about 9,000 to 10,000 head of cattle, in the Akkaraipattu D.R.O's division about 11,000 head of cattle, in the Sammanturai D.R.O's division and Karawahu D.R.O's division about 15,000 head of cattle.

Now, the picture before the advent of the G.O.D.B. was this; there was enough Crown land and other land for free grazing. After the colonization of the left bank, and after most of the land in the right bank came under sugar cultivation, this large cattle population has no pasture land, no grazing ground. The G.O.D.B. surveyed the area set apart, in the left bank, about 3,000 acres of land, which is not suitable for the cultivation of paddy or subsidiary food crops, to be developed as pasture land. It is bordering the Valathapitti tank. In the right bank, near Sagaman tank, another 3,000 acres were set apart for this purpose. The district agricultural committee, chaired by the government agent, had at various times resolved that these two areas should be developed as pastures.

Now, these two extents of land come under the Hon. Minister of Land. I would request the Hon. Minister to take action to see that all the cattle are brought to these pastures because milk collecting would be faciliated.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

Are there many people occupying those lands ?

අ. භා. 7.15

එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.
(ஜனாப் எம். ஏ. அப்துல் மஜீது)
(Mr. M. A. Abdul Majeed)

No. It has been reserved. In fact there are plans. I believe G. O. D. B. Plan No. 9 refers to this pasture land. I would urge the Hon. Minister to take an interest in this matter. In fact, we are trying to form co-operatives of cattle breeders. The entire scheme will fail if we do not see to it that adequate pasture land is available. If there is delay, encroachers would occupy the land and the problem would be aggravated. The government agent is very enthusiastic about it ; the D. A. C. is enthusiastic about it. I want the Hon. Minister to discuss the matter with the Hon. Minister of Land and the R. V. D. B. because the pasture land reserved in the left bank comes under the Central Government and the land in the right bank is still under the R. V. D. B. It is necessary to see that these pasture lands are set apart. That will help the activities of the Milk Board.

Next I would tike to mention the difficulties that the officials of the Agrarian Services Department are faced with because there is only one A. C. A. S. I believe about two or three months back a storekeeper in my elecotrate sold government paddy to the tune of nearly 3 lakhs of rupees and did the vanishing trick. It is humanly impossible for one assistant commissioner to exercise supervision. I gave you the figures of the number of G. P. S. stores, the number of fertilizer stores and the number of M. P. C. S. societies. It is humanly impossible for one person to effectively supervise them. And I believe another storekeeper from another store in my area is missing for the last two weeks. I am not blaming you but I feel sorry for the assistant commissioner. I would ask the Hon. Minister, please instruct your officials to see that Amparai is adequately staffed.

I want to bring another matter to the Hon. Minister's notice—the clash of interests between the paddy cultivators and the Sri Lanka Sugar Corporation. In the Amparai District in the Hingurana area, the Sri Lanka Sugar Corporation has a farm. Contiguous to the farm there are *purana* paddy lands which have been in existence for almost a hundred years. The irrigation system which is controlled by the Irrigation Division of the R. V. D. B. Right Bank issues water both to the sugar plantation and to these *purana* paddy lands, and they even had a staggered programme to provide this water to both, but when it came to the turn of the paddy fields the sugar plantation authorities blocked the water ; not only that, when I interceded and got the irrigation water diverted through a channel that skirts the sugar farm, they used pumps and pumped the water, so much so that out of 500 acres of old paddy land called Witulamadu Kandam in Irrukamam, where a legally a cultivation meeting was held and cultivation was authorized by the Government Agent Amparai, the peasants were able to cultivate only 100 acres while the balance 400 acres could not be cultivated. I would request the Hon. Minister to take this matter up with the Miniser of Land, Irrigaion and Power and come to a definite arrangement. The Government says that food production is vital. Maybe sugar cultivation is also vital, but we know at what cost sugar is being produced.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

Are these private lands or government lands ?

එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.
(ஜனாப் எம். ஏ. அப்துல் மஜீது)
(Mr. M. A. Abdul Majeed)

Private as well as L.D.O. land. These paddy lands have been in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.]

existence and are in the specification register. The Irrigation Department is legally bound to give them water.

The same thing had happened at Kantalai where they had denied irrigation facilities to a total of nearly 15,000 acres of paddy land, both *purana* as well as L.D.O. allotments. The sugar farm came in later. The Kantalai tank and the whole irrigation system was designed to irrigate these paddy fields. These paddy lands too are under specification, and Government is legally bound to give them water. I do not want what happened in Kantalai to happen in Amparai too. This is all caused by their cussedness. I had a discussion with the irrigation engineer and he said that thes epeople are cussed and they think they are a government by themselves. Even the government agent will bear testimony to what I have stated. The R.V.D.B's activities in the valley are really a millstone around the neck of the food production drive.

Then, hon. Members of the Opposition and also some from the Government side made an attempt to say that the benefits of increased returns have not gone to the farmer. The Hon. Minister was not here when I spoke during the Second Reading Debate and I would, therefore, like to state what I said again. It is only now that the poor farmer is able to sell his paddy at the guarnteed price or even more because there is a free market price for paddy which is over and above the guaranteed price.

What really happened before the rice cut? A vast racket was in operation. There was no free market price for paddy. The only way the poor L.D.O. 3-acre farmer could dispose of his paddy was through the M.P.C.S., and from the M.P.C.S. it went to the G.P.S. store. Those who controlled the M.P.C.S. or the big landowners were able to surrender their paddy direct and get the guaranteed price. The ordinary farmer, because he had to go to various middlemen to sell his paddy and because of the harassment he was subjected to, sold his paddy at Rs. 8 or at Rs. 10 per bushel. This was purchased by the mudalalis, and with the connivance of the managers of multipurpose co-operative societies it reached the G.P.S. stores. Not merely that, even millers were involved in this business and it was a three-cornered racket. As a result of the rice ration cut you just can see how much the Government has saved. It has saved millions of rupees. In 1965-66, under the G.P.S., 28,448,096 bushels of paddy were purchased, but after the rice ration cut in 1967-68 it was only 15,374,476 buhels of paddy.

Before the rice ration cut the multipurpose co-operative societies were given a quota to purchase paddy by the A.F.C. They got these quotas saying that they had so much acreage. When you total up the acreage given by the multipurpose co-operative societies in the Amparai District, before the rice ration cut, to cover the acreage of paddy land you would have to include a good portion of the Bay of Bengal! That is what was really happening—a huge racket was going on—and as a result of the cut in the rice ration that racket got knocked off; so much so, these people are now reluctant to come to the Amparai District.

There is one other matter I would like to refer to before I conclude, which is neither a parochial nor an electoral matter; it is the question of the cost of paddy production. The cost of paddy production has risen very high. The guaranteed price that a farmer gets for a bushel of paddy is Rs. 14. It is not merely my humble opinion, but the farmers themselves wanted me to bring it to the notice of the Government, that the amount they get for a bushel of paddy is not at all sufficient. I believe the ploughing charges have gone up to about Rs. 75 to Rs. 80, threshing and harvesting costs per acre come to about another Rs. 75 to Rs. 80, in addition to other charges that they have to meet in this process. I would urge the Hon. Minister to kindly take

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

this matter up with the Cabinet and see that the farmers get at least an increase of Rs. 2 per pushel of paddy under the G.P.S.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (අගලවත්ත)

*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*

(Dr. Colvin R. de Silva—Agalawatta)

ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් තමුන්නාන්සේ ඔය ආසනයේ වාඩි වී සිටින විට තමුන්නාන්සේට ගරු කිරීමක් වශයන් මා ඉංග්‍රීසියෙන් කථා කරන්නේ වී නමුත්, මේ අවස්ථාවේදී මා කෙටියෙන් විස්තර කරන්නට යන්නා වූ කාරණා දෙක ගැන පුරුදු විධියට සිංහල භාෂාවෙන් කථා කරන්නට අදහස් කර නවා. මට මේ අදහස් දෙක ඉදිරිපත් කිරීම සඳහා කෙටි කාලයක් හෝ දීම ගැන තමුන්නාන්සේට මගේ ස්තුතිය පිරිනම නවා.

අගලවත්ත පැත්තෙන් උදාහරණ ගෙන ගරු කෘෂිකර්ම ඇමතිතුමාට මා කෙටියෙන් කරුණු දෙකක් ඉදිරිපත් කර නවා. මුලින්ම ඇත්තේ අස්වනු රක්ෂණ ක්‍රමය පිළිබඳව එක්තරා කාරණයක් ඉදිරිපත් කරන්නටයි. මේ අස්වනු රක්ෂණ ක්‍රමය හොඳ දෙයක් හැටියට රටට තිබිය යුතු වැඩ පිළිවෙළක් අව් වැසි වැරදීම නිසා ගොවියන්ගේ ගොවිතැන් පාළු වීමෙන් ඔවුන්ට සිදු වන පාඩුව මකා ගැනීම පිණිස විශේෂයෙන්ම ධනපති ක්‍රමයක් තිබෙන රටකට මෙය අවශ්‍යයි. හොඳ අදහසක් ක්‍රියාත්මක කර තිබෙන ආකාරයේ විශාල මදිකමක් තිබෙන බව මට අගලවත්ත ප්‍රදේශයේ කීප පොළකින්ම ඔප්පු වී ඇති බව මේ අවස්ථාවේදී බොහොම කනගාටුවෙන් කියන්නට සිදු වී තිබෙනවා.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ප්‍රාදේශීය වශයෙන් සිටින්නා වූ ඉහළ නිලධාරීන් කෙරේ විශ්වාසය නොතබා අස්වනු රක්ෂණ ක්‍රමයේ දැනට පවතින දුර්වලකම පිරිමැසීමට නොහැකි බව මට මේ කාරණය ඉදිරිපත් කළ ගොවි ජනතාව කෙළින්ම ප්‍රකාශ කළා. මා එක්තරා අවස්ථාවකදී මතුගම ඉත්තෑපාන ප්‍රදේශයේ විශාල කුඹුරු, යායවල් අතරින් සංචාරයක යෙදී සිටිද්දී ගොවීන් විශාල පිරිසක් මට එක්තරා තැනකදී මුණ ගැසුනා: ඔවුන් මා වෙත ඉදිරිපත් කළ කරුණු අතරින් එක කරුණක් මා හිතන හැටියට මුළු රටටම බල පාන ඉතාමත්ම වැදගත් එකකැයි මා විශ්වාස කරනවා. ඒ කාරණය මේකයි: දැනට කන්න තුනකට හෝ හතරකට උඩදී, ප්‍රදේශයේ සිටින කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන්ද පිළිගත්තා වූ ගොවිතැන් පාළු වීමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු රක්ෂණ වන්දි මුදල් තවම ඒ පළාතේ ගොවීන්ට ලැබී නැහැ.

මා මේ ගැන පරීක්ෂා කරගෙන ගියේ මෙතැන මොකක් හෝ වංචාවක් තිබෙන වාදැයි සොයා බලන්නට නොවෙයි. වංචාවක් තිබෙනවා නම් ඒක එක තැනකට සීමා වන්නා වූ දෙයක්, මේ රක්ෂණ ක්‍රමයේම වරදක් තිබෙන බව මා මේ ගැන පරීක්ෂා කරගෙන යන විට පෙනී ගියා. ඒ වරදේ විපාකයක් වශයෙන් අර ගොවීන්ට තවම ඒ වන්දි මුදල් ලැබී නැහැ. මා මේ පිළිබඳව මතුගම සහ කළුතර සිටින ප්‍රාදේශීය නිලධාරීන් සමග සාකච්ඡා කළායින් පසුවයි, ගරු ඇමතිතුමාට දැන් මේ කාරණය ඉදිරිපත් කරන්නේ. මොන යම් හේතුවක් නිසා හෝ ගොවිතැනක් පාළු වූ අවස්ථාවකදී ගොවියන් ඒ පිළිබඳව ඉල්ලීම් ඉදිරිපත් කරන්නේ තමන්ගේ ගොවි කාරක සභාව මගින් බව මුලින්ම පෙනෙන්නට තිබෙනවා. මම බොහොම කනගාටුයි කියන්න මෙම ගොවිකාරක සභා ඇති කරන කාලයේදී නීතියෙන් බලාපොරොත්තු වුන යම් කිසි පරමාර්ථයක් තිබෙනවාද, ඒ පරමාර්ථ අද ගොවි කාරක සභාවලින් ඉටු වෙන්නේත් නැහැ. ඉටු කරන්නෙත් නැහැ. මේ ගොවි කාරක සභාවල පාලනය එක්තරා කණ්ඩායම්වලට නොහොත් කොටස්වලට—ඒ මොන කොටස්ද කියා මා කථා කරන්න යන්නෙ නැහැ—අත්පත් කර ගැනීමට පුළුවන් වී තිබෙනවා. ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තුවට යැවීමේ කටයුත්තෙදීත් ගමේ තිබෙන යම් භේද අනුව මේ අය වෙනස් කම් කරනවා. ඒ වෙනස්කම දෙවිධියකට කරනවා. එක



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

3052

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

අතකින් ඇත්තටම පාළු වුණ ගොවිතැන් ගැන ඉදිරිපත් කළ ඉල්ලීම්, එසේ ඉදිරිපත් කළ අයිතිකාර ගොවීන් සමග තිබෙන යම් යම් හතුරුකම් නිසා ඒවා යවන්නෙ නැහැ. අනික් අතින් ඒ පාළු වුණ ගොවිතැනම දෙවනුව පෙන්වීම පිණිස වෙනත් අය වෙනුවෙන් වෙනින් ඉල්ලුම් පත්‍ර යවනවා. ඔය වංචාව ගැන ඒ පළාතේ ඉන්න නිලධාරීනුත් දන්නවා. එහි වැරදිකාරයන් කවුද කියා සොයන එක නොවෙයි මා දැන් කරන්නෙ. ඒක සිදු වන බවයි කියන්න. නමුත් මා අද මෙහිදී මතු කරන්න හදන්නෙ ඊටත් වඩා ප්‍රධාන දෙයක්.

අ. භා. 7.30

මෙම ඉල්ලුම් පත්‍ර ප්‍රාදේශීය නිලධාරියාට යැව්වම රක්ෂණ කටයුතු අනුව ඔහුට පැවරී ඇති මුල්ම කාර්ය නම් මෙය ඇත්තද නැත්තද කියා පරීක්ෂා කර බැලීමයි. ඒක ඉතාමත් අවශ්‍යයි. ඉතාමත් සුදුසුයි. ඉතාමත් යෝග්‍යයි. එනිසා ඔහු ඔහුගේ නිලධාරීන් ඒ කුඹුරුවලට යවා ඒ ගැන සෝදිසි කර බලා යම් කිසි මුදලක් දිය යුතුද නැද්ද කියන එක ගැන වාර්තාවක් ලබාගන්නවා. එහෙත් ඒ නිලධාරියා ලබාගන්නා වූ ඒ වාර්තාව අනුව—ඔන්න ඔතැනයි මගේ තර්කය—තඹ සල්ලියක් ගෙවන්න ඔහුට අයිතියක් නැහැ. මේක පුදුම දෙයක්. ඒ වාර්තා සමග, ඔහුගේ රෙකමදාරුවත් සමග ඒ සියලුම ඉල්ලුම් පත්‍ර මෙතැන ප්‍රධාන කාර්යාලයට එවනවා. ඉතින් මට දැනගන්න ලැබුණ හැටියට මේ ප්‍රධාන කාර්යාලයෙනුත් නැවතත් නිලධාරීන් පිරිසක් යවනවා, නවත් වාරයක් පරීක්ෂා කරන්න. ඒ වාර්තාව ලැබුණට පසුව තමයි තීන්දුවකට පැමිණෙන්නෙ ගෙවනවද, නැද්ද, කොපමණ ගෙවනවද, කාට ගෙවනවද කියන ප්‍රශ්න ගැන. මා අසන්නේ මේ ප්‍රශ්නයයි. මෙසේ දෙවතාවක් පරීක්ෂණ පවත්වන්නෙ ඇයි? දූෂනයට ඉඩ ලැබීම පසෙකින් තබා බැලුවොත් මෙතැනින් සිදුවෙන ප්‍රමාදය විශාලයි.

අපේ කළුතර ප්‍රාදේශීය නිලධාරිතුමාම පිළිගත් අවස්ථාවක් තිබෙනවා. පුදුම දෙයක් වුණා එක තැනක. අර මා කලින් සඳහන් කළ විධියේ පිරිසකගේ ඉල්ලුම් පත්‍ර, ඒවා පිළිබඳ වැඩ කරන එක්තරා නිලධාරියකුගේ ලාච්චුවේ දමා යතුරු දමා ගොස් තිබුණා. අවුරුද්දකට පමණ පසුව මිනිහ සොයා ගන්නටත් නැහැ; ඔහු ළඟ තිබුණු ඉල්ලුම් පත්‍ර සොයා ගන්නටත් නැහැ; මේස ලාච්චුවල යතුරු සොයා ගන්නටත් නැහැ. ඇත්තම් ලාච්චු කඩා ඒවා එළියට ගන්නට අවශ්‍ය තැන්වලින් බලය අරගෙන තිබෙනවලු. ඒ අන්දමට ඉල්ලුම් පත්‍ර වගයක් නැතිවී තිබුණු බව නිලධාරිතුමාත් පිළිගත්තා. ඔහුගේ කණගාටුවත් ප්‍රකාශ කළා. එවැනි වැරදීම් පැත්තකට දමමු. මේ ක්‍රමය අනුව දෙපොළකින් දෙවරක් පරීක්ෂණ කෙරෙනවා. එකක් චෙක් කිරීමක්ද මම දන්නේ නැහැ. එහෙත් මෙතැනදී ප්‍රධාන කාර්යාලයේ තීන්දුව එන තුරු මුදලක් ගෙවන්නට පුළුවන්ය කියා තඹ සතයක්වත් ගෙවන්නට ප්‍රාදේශීය නිලධාරීන්ට බලයක් නැහැ. මේ අන්දමට සමහරවිට එක කන්නකට පසුව අනික් කන්නත් ඉවර වන තුරු මෙතන තීන්දුවක් නැහැ. ඒ බව ඔප්පු කරන්නට මට පුළුවන්.

කරුණාකර මෙය හිතට ගන්න. මේ රක්ෂණ ක්‍රමයේ අර්ථය නැත්නම් මේ රක්ෂණ ක්‍රමයේ ප්‍රයෝජනය කුමක්ද? එක්තරා අවස්ථාවක තමන්ගේ ගොවිතැන පාළු වූ විට ඊළඟ කන්නයේ වැඩ කටයුතු ගෙනයෑමට උවමනා කරන මුදල මේ රක්ෂණ ක්‍රමයෙන් ලබා දීමට මාර්ගය සැලසීමයි අවශ්‍ය. සල්ලි නැති ගොවීන්ට එක කන්නයක ගොවිතැන පාළු වූ විට අනික් කන්නයේ ගොවිතැන කරන්නට අවශ්‍ය මුදල් සොයා ගන්නට බැහැ. රක්ෂණයෙන් තමයි එය ලැබෙන්නේ. ඒ නිසා එක ගොවිතැනක් පාළු වූ විට අනික් ගොවිතැන ආරම්භ කිරීමට අවශ්‍ය කරන මුදල ඔවුන්ට කල් ඇතිව මේ රක්ෂණ ක්‍රමයෙන් ලැබෙනවා නම් පමණයි එයින් ප්‍රයෝජනයක් ලැබෙන්නේ. අන්න එයයි මෙහිදී මතු කරන්නට තිබෙන්නේ. දැන් මේ සම්බන්ධව තිබෙන ප්‍රතිකර්මය මොකක්ද? මෙය හදන්නට ඕනෑ. මගේ විශ්වාසය මෙයයි: යම්කිසි මුදලක් වියදම් කිරීමට ප්‍රාදේශීය නිලධාරීන්ට බලය දීමට ඔවුන් කෙරෙහි විශ්වාසයක් තබන්නට ඕනෑ. නැත්නම් මෙය කරන්නට බැහැ. යම්කිසි සීමාවක් ඇති කළාට වරදක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ. එහෙත් යම්කිසි මුදලක් වියදම් කරන්න ඔවුන්ට බලය දෙන්නට ඕනෑ කියා මා කියනවා. ඔබ ලබා ගන්නා වාර්තාව අනුව ඔබේ පරීක්ෂාව අනුව පාළු වූ යම්කිසි ගොවිතැනක් පිළිබඳව යම්කිසි මුදලක් ගෙවීම උවමනායි, හරියි, නීත්‍යානුකූලයි කියා ඔප්පු වෙනවා නම් එක්තරා මට්ටමකට යන තුරු ගෙවීම සඳහා ඔබට මුදලක් බාර දීමත් කරනවා බලයත් දෙනවා කියා වැඩ පිළිවෙළක් හදන්නට ඕනෑ. ලොකු මුදල් පිළිබඳ ප්‍රශ්න ප්‍රධාන කාර්යාලයට ගන්නාට වරදක් නැහැ. සමහර ගොවිතැන් සඳහා ගෙවන්නට වන්නේ රුපියල් 25 යි; 30 යි; නැත්නම් 40 යි. දැනට කෙරෙන අන්දමට මෙපමණ දුරට කටයුතු කර ගෙන ගොස් එය ගෙවන විට රුපියල් 25 ක් නොවෙයි 400 ක් ලැබුණත් වැඩක් නැහැ. ඒ වන විට ඊළඟ කන්නත් වැර දීලා. පුංචි මිනිහාට පුංචියි කියන මුදල ලොකුයි. පුංචි නිලධාරීන් නොවෙයි ප්‍රාදේශීය නිලධාරීනුත් එක්තරා මට්ටමක අයයි. ඔවුන්ට නොයෙක් වගකීම් බාර දී තිබෙනවා. ගොවිතැන් දියුණු කිරීමේ කටයුතු වලට ආණ්ඩුවේ පාලනයත් උනන්දු කිරීමත් ආදී සියල්ලක්ම ඉටු කරන්නේ ඔවුන්ගේ මාර්ගයෙනුයි. එනකොට එක්තරා සීමාවක් දක්වා වූ මුදලක් ඒ කියන්නේ රුපියල් 40 ක්, 50 ක්, 60 ක්, 70 ක් වැනි මුදලක්, නියම ක්‍රමයක් පාවිච්චි කිරීමෙන් පසුව, ගෙවීමට බලය ඒ අයට දිය යුතුයි කියලයි මා ඉල්ලන්නේ. ඒ බලය දිය යුතුය කියන එකයි මගේ විශ්වාසය. එසේ වුවොත් තමන්ට ලැබෙන්නට තිබෙන පොඩි මුදල පිළිබඳ ප්‍රශ්නය පමණක් නොවෙයි ඊළඟ වාරයේ ගොවිතැන් කිරීමට වුවමනා කරන මුදල ලබා ගැනීම ප්‍රමාද නොවීමේ ප්‍රශ්නයත් විසඳෙනවා. එයයි මගේ ඉල්ලීම. ඔය ප්‍රශ්නය ගැන මීට වඩා කථා කරන්නට බලා පොරොත්තු වන්නේ නැහැ. කෙටියෙන් කථා කරන්නට මා පොරොන්දුවක් දුන්නා.

පෙරේද, මගේ දැසටම දැකගන්නට ලැබුණු තවත් ප්‍රශ්නයක් ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවිය යුතුව තිබෙනවා. මගේ කොට්ඨාශයේ දොඩම්පහපිටිය නම් ගමක් තිබෙනවා. ඔය ගම තිබෙන්නේ ඇලක දෙපැත්තෙයි. හල්වල්කැලේ කියන කඳුකරයේ පාමුලයි ඔය ගම තිබෙන්නේ. මා දැන් සඳහන් කළ දොඩම්පහපිටිය කියන ගමත් ඊට යාබදව තිබෙන්නාවූ ඌරුගොඩ කියන ගමත් හරහා මුලින් ඇලක් වශයෙන් ගලා ගිය වතුර පාර අද ඇලකට වඩා විශාල පුංචි ගඟක් හා සමාන වතුර පාරක් බවට පත් වී තිබෙනවා. මේ වතුර පාරට වැඩි වශයෙන් වතුර එන්නේ ඔය හල්වල කියන කන්දෙන්. මා ඉදිරිපත් කරන්නට යන මේ කාරණය සෝදාපාළුව පිළිබඳ ප්‍රශ්නයකට හුරු වෙනවා. නමුත් ඊට වඩා මෙතැන තත්ත්වය භයානකයි.

හල්වල්කැලේ කන්දේ දැන් නොයෙක් උද්වියා පදිංචි වී සම්පූර්ණයෙන්ම වාගේ වගා කර තිබෙනවා. ඒ වගා කටයුතු සඳහා දැන් කැලෑව සම්පූර්ණයෙන්ම කපා දමා අවසානයි. අර කැලෑව තිබෙන කාලයේ මෙන් දැන් ඒ කඳු ප්‍රදේශයට වර්ෂාවක් ඇති වුණාම ඒ වැහි ජලය පතිත වී නතර වී පොළවට උරාගෙන හෙමින් හෙමින් ගලා බසින්නේ නැහැ. දැන් ඒ කන්දට වැටෙන වැසි ජලය බෑවුම දිගේ නිකම්ම පහළට ගහගෙන එනවා. ඒ සැඩ පහර නිසා මුලින් ඇලක් වශයෙන් තිබුණු මේ වතුර පාර දැන් හැරී පළල් වී ගැඹුරු වී පුංචි ගංගාවක් වශයෙන් හැඩ ගැසී තිබෙනවා. එපමණක් නොවෙයි. යන්තමින් වර්ෂාවක් වැස්සත් එක වරම වතුර ගහගෙන අවුත් ඒ දෙපස තිබෙන්නාවූ කුඹුරු ටිකත් යට වන බව මට පෙනී ගියා. සෝදාගෙන එන ජලයට වැලි මිශ්‍ර වී තිබෙනවා. ඒ වැලි දෙපැත්තේ කුඹුරුවල තැන්පත් වෙනවා. එම නිසා දැන් හරියාකාර ඒ කුඹුරුවල ගොවිතැන් කරන්නටත් බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. එක ගොවි මහත්මයෙක් තමාගේ ගොවිතැන් පොඩ්ඩ මට පෙන්වා ඉස්සර මට එක පැලකින් ගන්නට පුළුවන් අස්වැන්න දැන් තුන් පැලකින්වත් ගන්නට බැරිය කිව්වා. මේවා ගැන වැඩිය නොතේරෙන මටත් ඒ කථාව ඇත්තක් බව පෙනුනා. අද ඒ තරම් නරක තත්ත්වයක් ඇති වී තිබෙනවා.

සාමාන්‍යයෙන් සෝදා පාළුව ගැන කථා කරන විට මතු නොවන තවත් පැත්තක් මෙතැන තිබෙනවා. මුලින් දෙපැත්තේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

තිබෙන කුඹුරු සරු කිරීමට වුවමනා කරන වතුර ආවේ මේ ඇලෙන්. පසේ තිබිය යුතු තෙත් ගතිය ලැබුණේ මේ ඇලෙන්. නමුත් දැන් මේ ඇල ගඟකට හුරු වී තිබෙන නිසා, හැරී ගැඹුරු වී තිබෙන නිසා කුඹුරුවල වතුර ටික ඇලට යනවා. මේ වතුර පාරෙන් දැන් දෙපැත්තේ කුඹුරුවලට වතුර ගන්නට බැහැ. මේ තත්ත්වය තව අවුරුදු පහක් දහයක් තිබුණොත් නිසැකවම ඒ කුඹුරු ටික නැතිව යනවා. දැනටමත් කුඹුරු කෑලි කීපයක අල බතල සිටුවා තිබෙනවා. තව ටිකක් කල් යන විට මේ ඉඩම්වල ඇනූ මිරිස් වවන්නට සිද්ධ වෙයි. මේ තත්ත්වය තව දුරටත් පවතින්නට ඉඩ හැරීමට කා තුළ වත් කැමැත්තක් නැතැයි කියා මා සිත නවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් විශාල අළුත් ව්‍යාපාරවල් ආරම්භ කරන අතරම, මේ විධියට තිබෙන කුඹුරු නැතිවීම වැළැක්වීමටත් වැඩ පිළිවෙළක් යෙදීම අත්‍යවශ්‍යයි; හදිසියි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

කාලයක් තිස්සේ මූකලාන් වනසා තිබෙනවා.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

කඳුවල මූකලාන් කපා වනසා දැම්මාම ඒකෙ සෝදාපාළුව පාමුල පහළ ඉඩම්වල ටත් බල පානවා. පහළ ඉඩම්වලටත් ලොකු හානියක් වෙනවා. එම නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නව ව්‍යාපාර ගැන කොපමණ වැඩ කළත් තිබෙන කුඹුරු ටික විනාශ වන්නට ඉඩ හරිනවා නම් ඒ නව ව්‍යාපාර ආරම්භ කිරීමේ අර්ථයක් නැති බව මා කියනවා—නැතුවා නොවෙයි හොඳ මදිය කියායි කියන්නෙ. මා අගලවත්ත ප්‍රදේශයේ සෑම තැනකම වාගේ ඇවිද තිබෙනවා. නොයෙක් පළාත්වලදී මට නොයෙක් අය කියා තිබෙනවා, මෙයට අවුරුදු දහයකට පහළොවකට පෙර නොතිබුණු අන්දමේ වතුර ගැලීමේ ගති යක් දැන් පවතිනවාය කියා.

මෙම පළාත්වල ඇති මූකලාන් විනාශ කර ඇති ආකාරය ගැන විස්තර දැන් මා කියන්න යන්නෙ නැහැ, එය මෙම අමාත්‍යාංශයට අයත් කටයුත්තක් නොවන නිසා. අද එම පළාත්වල ඇති මූකලාන් යොදාගෙන ඇත්තේ ලොකු ලොකු මුදලාලිලාට ලී හොරකම් කරගෙන විශාල ධනයක් උපදවා ගැනීමටයි. මූකලාන් වල විනාශ කර දමන ලී අප්‍රමාණයි; ප්‍රයෝජනයට ගත හැකි, එහෙත් අපතේ යවන ලී, අප්‍රමාණයි. එම නිසා අගලවත්ත ප්‍රදේශවාසීන් සංවිධානය කර, ඔවුන් නැගිටුවා, ප්‍රදේශයේ ඇති ප්‍රයෝජනයට ගත හැකි සෑම ලී කැබැල්ලක්ම ප්‍රයෝජන යට ගැනීම පිණිස, අපතේ යන ලී කැබැලි වලින් අලුත් ද්‍රව්‍යයන් සෑදීමට හැකි වන පරිදි, නවීනතම ෆැක්ටරියක් එම ප්‍රදේශ යේම පිහිටුවන්නට බලාපොරොත්තුවෙන් සිටින බව මේ අවස්ථාවේදී ගරු සභාවට හෙළිදරව් කරන්න කැමතියි.

අ. භා. 7.45

**ආර්. පී. විජේසිරි මයා. (කුණ්ඩසාලෙ)**
*(திரு. ஆர். பீ. விஜேசிறி—குண்டசாலை)*
(Mr. R. P. Wijesiri—Kundasale)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය යටතේ කථා කරන මේ මොහොතේදී මගේ මැතිවරණ කොට්ඨාශ යේ අඩුපාඩුකම් ස්වල්පයක් සම්බන්ධ යෙන් හෙළිදරව් කිරීමට අවකාශ සලසා දීම ගැන පළමුවෙන්ම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් ගරු මන්ත්‍රී වරුන් කියා සිටියා, විශේෂයෙන්ම පොළොන්නරුවේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, ආහාර වගා ව්‍යාපාරය කථාවට පමණක් සීමා වී තිබෙනවා කියා. විශේෂ යෙන්ම පොළොන්නරුව ප්‍රදේශයේ නිපද වන අස්වැන්න පිටස්තර වෙළඳුන් කමත ටම ගොස් බුසල රුපියල් 15, 16, 17 යන මිල ගණන්වලට ලබා ගන්නවාය, එම නිසා සියලුම අස්වැන්න රජයට ලබා ගැනීමට යම්කිසි ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීම රජයේ යුතුකමක්යයි එතුමා ප්‍රකාශ කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රජයේ ප්‍රතිපත්තිය ගොවියාගේ නිෂ්පාදනවලට වැඩි මිලක් ලබා දීම මිස බලහත්කාරයෙන් අස්වැන්න ලබා ගැනීම නොවන බව සමහර විට ඒ මන්ත්‍රීතුමාට අමතකව ගිහින් ඇති. නොයෙකුත් පෝර වර්ග යෙදීමෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම නොයෙකුත් පර්යේෂණ කිරීමෙන්, අලුත් වී වර්ග හඳුන්වා දීමෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට අදහස් කරනවා. නමුත් ඒ සියල්ලක්ම ඇමෙරිකානු උපක්‍රම ලෙස හඳුන්වා දෙන්නට පොළොන්නරුවේ මන්ත්‍රීතුමා උත්සාහ දැරුවා. එපමණක් නොවෙයි. පොළොන්නරු දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව ගොවිතැනින් ලාභ ප්‍රයෝජන ලබා ගන්න ආකාරය ගැන එතුමා හොඳ හැටි දන්නවා ඇති. කෘමි නාශක බෙහෙත් වර්ග යෙදීමෙන්, පොහොර වර්ග යෙදීමෙන්, කෘෂිකම් උපදේශකයන්ගේ උපදෙස් පිළිපැදීමෙන්, ඉස්සරට වඩා වැඩි අස්වැන්නක් ලබන බව එතුමාම දන්නවා ඇති. එදාට වඩා වැඩි ආදායමක් ලබනවා නම්, එදට වඩා සන්තෝෂයෙන් ජීවත් වෙනවා නම්, මේ ගරු සභාවේදී එබඳු ප්‍රකාශයක් කිරීම ගැන මා කනගාටු වෙනවා.

එපමණක් නොවෙයි, ගරු සභාපතිතුමනි, මෙරට නිපදවන සහල්වල අඩුපාඩුකම් ගැනත් එතුමා සඳහන් කළා. ආහාර දෙපාර්තමේන්තුවෙන් බෙදා දෙන මෙරට හාල්වල තත්ත්වය ඉතා කණගාටුදායක බවට එතුමා කළ ප්‍රකාශය මා අනුමත කරනවා. පොළොන්නරු හා මඩකලපු ප්‍රදේශවල මෝල් හිමියන් විසින් ශුද්ධ කර දෙනු ලබන කැකුළු හාල් මහනුවර ප්‍රදේශයේ බෙදා දෙනවා. ඒවා මහජනයාගේ ආහාරයට නුසුදුසු තත්ත්වයක පවතින බව සඳහන් කරන්නේ කණගාටුවෙන්. ආහාර දෙපාතීමේන්තුවේ නිලධාරීන්ගේ නොසැලකිල්ල නිසා මහජනයාට නොමිළයේ ලැබෙන හාල් පිකවත් නියම විධියට ලැබෙන්නේ නැහැ. මෙරට වී කොටා පිරිසිදු හාල් ලබා දීම සඳහා මෝල් හිමියන් සමඟ ගිවිසුම් ඇති කරගෙන තිබෙනවා නම්, ඔවුන්ට ඒ සඳහා ප්‍රමාණවත් ගෙවීම් කරනවා නම්, මහජනයාගේ ආහාරයට යෝග්‍ය තත්ත්වයේ හාල් ලබා දීම සඳහා දෙපාර්තමේන්තුවේ වගකීමකින් සහ උනන්දුවකින් මින් ඉදිරියටවත් කටයුතු කොට, කෑමට ගන්නට පුළුවන් තත්ත්වයේ හාල් ලබා දෙනවා ඇතැයි මා විශ්වාස කරනවා.

කුඹුරු ගොවියකු නොව මිනිසුන් ලවා කුඹුරු ගොවිතැන් කරන්නකු වශයෙන් දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) මා හඳුන්වා දුන්නා. එම නිසා මට ගොවියන් පිළිබඳව කිසි කැක්කුමක් නැති බවත්, මා ගොවි දුක නොදන්නකු බවත් එතුමා වැඩිදුරටත් කීවා. මුලින්ම ගොවියකු වශයෙන් කටයුතු කොට, එමඟින් සෑහෙන දියුණුවක් ලබා දැනට මා සතු කුඹුරු අක්කර ප්‍රමාණයේ තනිවම ගොවිතැන් කරන්නට පුළුවන්කමක් නැති නිසා නවීන යන්ත්‍රසූත්‍ර යොදවා මිනිසුන් ලවා ගොවිතැන් කරවන බව ප්‍රකාශ කරන්නේ සන්තෝෂයෙන්. ඒ අන්දමට සෑහෙන පිරිසකට ගොවිතැනින් යැපෙන්නට අවස්ථාව සලසා දෙන්නට මට පුළුවන්කමක් ලැබීම ගැන මා ආඩම්බර වෙනවා.

සමුපකාර ව්‍යාපාරය, මන්ත්‍රීවරුන් රාශියකගේම විවේචනයට ලක් වුණා. සමුපකාර ව්‍යාපාරය දවසින් දවසම දුර්වල තත්ත්වයක් කරා ඇදෙමින් තිබෙන බව කණගාටුවෙන් නමුත් කිව යුතුව තිබෙනවා. මටත් කියන්නට තිබෙන්නේ, සමුපකාර ව්‍යාපාරයෙන් අප බලාපොරොත්තු වූ ප්‍රතිඵල ලැබී නැති බවයි. දිසා සංගම් හා මහා සංගමයත් විවිධ සේවා සමුපකාර සමිති ලබන ලාභවලින් සියයට 5 ක් ලබා ගන්නවා. එහෙත් ඒ සමුපකාර සමිතිවල දියුණුව සඳහා එකී දිසා සංගම්වලින්වත්, මහා සංගමයෙන්වත් ආධාරයක් තබා ප්‍රයෝජනවත් උපදේශයක්වත් නොලැබෙන බව කණගාටුවෙන් නමුත් කියන්නට සිදුවී තිබෙනවා. විදේශ සංචාරවලට විනා සමුපකාර සමිතිවල දියුණුවට කිසිවක් කිරීම සඳහා ඒ දිසා සංගම්වල හා මහා සංගමයේත් නිලධාරීන් කිසි උනන්දුවක් ගන්නේ නැහැ. එම නිසා ලාභයෙන් සියයට 5 ක ප්‍රමාණයට ඒ දිසා සංගම්වලට හා මහා සංගමයට ලැබෙන ක්‍රමය නවත්වා, ඒ මුදල සමුපකාර දෙපාතීමේන්තුව මඟින් එකතු කොට සංවර්ධන අරමුදලක් ඇති කළ යුතු යයි මා යෝජනා කරනවා. එකී සංවර්ධන අරමුදලින් ඒ ඒ සමුපකාර සමිතිවලට ආධාර කරනන්ට

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේසිරි මයා.]
සමුපකාර දෙපාතමේන්තුවට එවිට පුළුවන් කම ලැබෙනවා. මේ මහා සංගමයේ සභාපතිතුමා ගැන ඕනෑම වේලාවක විමසුවොත් කියන්නේ රට ගිහින්ය කියන එකයි. සමුපකාර ව්‍යාපාරයේ නාමයෙන් එතුමා හැමදාම වාගේ රට යනවා. එසේ හෙයින් ගරු ඇමතිතුමාගෙන් සහ මහා සංගම්යෙන් මා ඉල්ලා සිටින්නට කැමතියි, අනිකුත් සංගම්වල නියෝජිතයිනුත් මෙම සංචාරවලට යොදවන ලෙස. අනිකුත් සංගම් වල නියෝජිතයනුත් මේ සඳහා යොදවනවා නම් මීට වඩා ප්‍රයෝජනයක් සැළසෙනවා ඇති.

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)
*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந் தோட்டை)*
(Dr. N. M. Perera—Yatiyantota)
මිනිහ කවුද ?

විජේසිරි මයා.
*(திரு. விஜேசிறி)*
(Mr. Wijesiri)
මහා සංගමයේ සභාපතිතුමා : අඹගමුව කෝරළේ.

ගරු සභාපතිතුමනි, එකම පුද්ගලයෙක් හැමදාම සංචාරක කටයුතුවල යොදවනවාට වඩා හොඳයි අනිකුත් සංගම්වල නියෝජිතයනුත් ඒ සඳහා යොදවනවා නම්. එසේ කළ විට ඔවුන් නානා දේශයන්හි පවත්නා සමුපකාර ව්‍යාපාරයන් පිළිබඳව දැන කියාගෙන ඇවිත් මීට වඩා ප්‍රයෝජනයක් ලැබෙන ලෙස කටයුතු කරනවා ඇති. මාත් සංගමයක සභාපතිකෙනෙක් වන නමුත් මෙවැනි වැඩ පිළිවෙළක් මාර්ගයෙන් සංචාරයෙහි යෙදෙන්නට බලාපොරොත්තු වෙනවායයි කල්පනා කරන්නට එපා. මේ රටේ සංගම් 120 ගණනක් තිබෙන බව අපි දන්නවා. පිට රටවලින් ලැබෙන ආරාධනා සඳහා ඒවායින් එක එක නිලධාරියා බැගින් යවන්නට කල්පනා කළහොත් නිතරම තනි පුද්ගලයකු යවනවාට වඩා ඵලදායක වන්නේ නැද්ද ? ගරු ඇමතිතුමා මේ ගැන යම් නියෝගයක් දීම අපහසු නම් සමුපකාර කොමසාරිස්තුමා මගින් හෝ මෙම යෝජනාව මහා සංගමයේ නිලධාරි මණ්ඩලයට ඉදිරිපත් කර කටයුතු කරන හැටියට මා ඉල්ලා සිටිනවා. එක් පුද්ගලයෙක් හැමදාම සංචාරක කටයුතුවල නොයොදා සමුපකාර ව්‍යාපාරයෙහි නිරතව සිටින තවත් දහස් ගණනක් පුද්ගලයන්ගෙන් සුදුසු අය තෝරා ඒ සඳහා යවනවා නම් මෙම ව්‍යාපාරයෙහි දියුණුව සඳහා එය බලවත් රුකුලක් වන බව නැවත වරක් මතක් කරනන්ට කැමතියි. සමුපකාර ව්‍යාපාරය ගැන මා කියන්නේ එපමණයි.

කෘෂිකර්ම ඇමතිතුමා එතුමාගේ කාල සීමාව තුළදී මේ රට ආහාර අතින් සවයම්පෝෂිත කිරීමාදී කටයුතු වෙනුවෙන් ගන්නා ලද බලවත් උත්සාහය සහ උනන්දුව හේතුකොටගෙන අද අපේ රට විශාල තම සංවර්ධනයක් ලබා තිබෙන බව පෙනෙනවා. ඒ වෙනුවෙන් මා එතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වන අතර අපේ ජාතික කිරි මණ්ඩලය මගින් අද කරගෙන යන්නාවූ දීප ව්‍යාප්ත වැඩ පිළිවෙළ පිළිබඳව සතුට ප්‍රකාශ කරන්නට කැමතියි. ජාතික කිරි මණ්ඩලය මගින් පල්ලෙකැලේ ඉදි කරන ලද කල් කිරි මධ්‍යස්ථානය පිළිබඳවයි, මා මුලින්ම කියන්නට කලපනා කරන්නේ. මුලින් බලාපොරොත්තු වූවාටත් වඩා ඉක්මණින් ඒ පිළිබඳ ගොඩනැගිලි සදා අවසන් කර ගෙන ජූලි මස 8 වන දින එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට අවස්ථාව ලැබුණා. මාස ගණනක් යන තුරු දිනකට කිරි පයින්ට් හත් අට දහසකට වඩා එහි නිපදවීමට බැරි වේය කියන අදහසයි ජාතික කිරි මණ්ඩලයට තිබුණේ. එහෙත් ජාතික කිරි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිතුමාගේ සහ අනිකුත් නිලධාරි මහතුන්ගේ බලවත් උත්සාහය සහ උනන්දුව හේතුකොට ගෙන මේ ඉතා කෙටි කාල සීමාව තුළදී එම මධ්‍යස්ථානයෙහි දිනකට කල් කිරි පයින්ට් 30,000 ක් පමණ නිපදවන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ වෙනුවෙන් ජාතික කිරි මණ්ඩලයට මගේ විශේෂ ස්තුතිය පුදකරනවා.

1965 දී මෙම රජය පිහිටුවන ලද අවස්ථා වෙහිදී ජාතික කිරි මණ්ඩලයට මුළු ලංකාවෙන්ම දිනකට මිලදී ලබා ගත හැකි වූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරි ප්‍රමාණය පයින්ට් 40,000 ක් පමණයි. පසුගිය අවුරුදු හතර හමාර තුළදී ගන්නා ලද නොයෙකුත් උත්සාහයන්ගේ ප්‍රතිඵල හේතුකොටගෙන අද පුළුවන් වී තිබෙනවා දිනකට කිරි පයින්ට් 1,20,000 ක් පමණ ලබා ගන්නට. එයින්ම පෙනෙනවා මෙම අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවලින් කොතරම් සේවයක් සිදු වී තිබෙනවාද යන්න. ඒවායේ සේවය කරන නිලධාරීන් කොතරම් උනන්දුවකින් හා ආසාවකින් කටයුතු කරනවාද යන්න අපට අවබෝධ කර ගන්නට මෙවැනි කරුණු උපකාර වෙනවා.

අවසාන වශයෙන් කුණ්ඩසාලේ රජයේ ගොවි පොළෙහි සේවක මහතුන් පිළිබඳව වචන ස්වල්පයක් කිව යුතුයි. ගරු සභාපතිතුමනි, අවුරුදු දහය, දොළහ මේ ස්ථානයේ වැඩ කරන රටේ නොයෙක් ප්‍රදේශ වලින් පැමිණි සේවකයන් රාශියක් මේ ස්ථානයේ සිටින නිසා ඒ සේවක මහත්වරුන් ඒ ස්ථානයෙන් මාරු කර හරින ලෙස මා මීට ප්‍රථමත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට දැනුම් දී තිබෙනවා. ප්‍රතිපත්තියක් හැටියට අවුරුදු 4 න් 5 න් සේවකයන් මාරු කර හරින ක්‍රමයක් රජය අනුගමනය කරන නමුත් අවුරුදු දහය දොළහ පැරණි සේවකයන් විශාල පිරිසක් මේ ස්ථානයේ සිටිනවා. මේ අයගෙන් වැඩි දෙනෙකු වෙනත් නොයෙක් කටයුතුවලට සම්බන්ධ වී සිටින නිසා අවුරුදු පහට වඩා මේ ස්ථානයේ දිගටම සේවය කර තිබෙන සියලුම සේවක මහතුන් මාරු කර යවා ඒ වෙනුවට ඒ ප්‍රදේශය අවට ගම්වල සේවකයන් යොදන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

**එකල්හි වේලාව අ. භා. 8 වූයෙන්, මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.**

**කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 1969 සැප්තැම්බර් 13 වන සෙනසුරාදා.**

நேரம் பி. ப. 8 மணியாகிவிடவே, குழுவின் பரிசீலனைபற்றி சபைக்கு அறிவிக்கும் பொருட்டு அக்கிராசனர், அக்கிராசனத்திலிருந்து நீங்கினர்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது : மீண்டும் கூடுவது, சனிக்கிழமை, 13 செப்ரெம்பர் 1969.

*It being 8* P.M., THE CHAIRMAN *left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Saturday, 13th September 1969.*

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

I wish to move Items 28 and 29. The Opposition has no objection.

## පරිපූරක මුදල: ගොවිජන සේවා දෙපාර්තමේන්තුව: පෝර මිළයට ගැනීම සඳහා ගොවීන්ට ආධාර

### *குறைநிரப்புத் தொகை : கமத்தொழில் சேவைத் திணைக்களம் : பசளை கொள்வனவு செய்வதற்கு விவசாயிகளுக்கு உதவி*

### SUPPLEMENTARY SUPPLY: DEPARTMENT OF AGRARIAN SERVICES: ASSISTANCE TO CULTIVATORS FOR PURCHASE OF FERTILIZERS

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

I move,

"That a supplementary sum not exceeding Rupees Six million (Rs. 6,000,000) be payable out of the Consolidated Fund of Ceylon or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the Financial Year beginning on 1st October 1968 and ending on 30th September 1969, and that the said sum may be expended as specified in the Schedule hereto :—

*Schedule*

| | Rs. c. |
|---|---|
| Head 136—Department of Agrarian Services. | |
| Vote No. 7—Economic Development—Capital expenditure .. .. | 6,000,000." |

This is a Supplementary Estimate for the Department of Agrarian Services. This is to supplement the sums voted for subsidy for fertilizer for paddy. The quantity of paddy fertilizer drawn was in excess of what was possibly anticipated or the amount that was provided for. This sum goes for that purpose.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ආහාර පාලන නියෝගය
## உணவுக் கட்டுப்பாட்டுக் கட்டளை
## Food Control Order

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

I move,

"That Food Control Order No. 283 made by the Minister of Agriculture and Food under Section 4 (1) (i) of the Food Control Act (Cap. 171), and published in Ceylon Government Gazette Extraordinary No. 14,862/6 of 15th July 1969, which was presented on August 10, 1969, be approved."

This is a renewal of a Food Control Order that comes up for periodic renewal. It is about the transport of rice.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பெற்று, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## Adjournment

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

I move,

"That the House do now adjourn."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.30 1969 සැප්තැම්බර් 8 වන දින සභාසම්මතිය අනුව, 1969 සැප්තැම්බර් 13 වන සෙනසුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

அதன்படி பி. ப 8.3 மணிக்கு, சபை அதனது 8 செப்ரெம்பர் 1969 தேதிய தீர்மானத்திற்கிணங்க 1969 செப்ரெம்பர் 13, சனிக்கிழமை மு. ப. 10 மணி வரை ஒத்திவைக்கப்பெற்றது.

*Adjourned accordingly at 8.3 P.M. until 10 A.M. on Saturday, 13th September 1969, pursuant to the Resolution of the House of 8th September 1969.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியையடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00), 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions: 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org